මනුෂ්‍යයන්ගේ සළු අබරණාදිය සිඳගත්තාහුය, චිරකල් අනුරක්ෂිතවූ කුලාචාරය බිඳහෙළුවාහුය;

අත් පා ආදිය සින්දහූය; බොහෝ මන්දිරයන් බින්දහූය; ගවමහිෂාදිය තමන් අයත්කොට බැඳ ගත්තාහුය;

ආඪ්‍යවූ මහත් ධන ඇති ජනයන් බැඳ වදකොට ඔවුන්ගේ සියලු ධනය පැහැරගෙන ඔවුන් දරිද්‍රයන් සේ කළාහුය;

පිළිම ගෙවල් බින්දහූය; දාගැප් වැනසුවාහුය; විහාරයන්හි විහරණය කළාහුය; උපාසකයන් තෙරපාලූවාහුය;

දරුකයන්ට තැළුවාහුය; පඤ්ච සහධාර්මිකයන් පෙළුවාහුය; බරගෙන යැමෙහි ජනයන් යෙදූවාහුය; බොහෝ මෙහෙය ඔවුන් ලවා කරවූවාහුය;

ප්‍රසිඩවූ ප්‍රශස්තවූ බොහෝ පුස්තකයන් ලනු මුදා තැනින් තැන විසුරුවා හැරියාහුය;

ශ්‍රද්ධාවත් රජදරුවන්ගේ කීර්ත්තිදේහ වැනිවූ යශපත්වූ මහත්වූ උස්වූ රුවන්වැලි ආදී චෛත්‍යයන් බිඳහෙළමින් වනසා ඔවුන්ගේ ජීවිතයට බඳුවූ බොහෝ ශාරීරික ධාතූන් අහෝ! අන්තර්ධානයට පැමිණවූවාහුය.

මෙසේ ක්‍රියාවෙන් මාරයොධයන් වැනිවූ ඒ ද්‍රවිඩ යොධයෝ තුමූ දුෂ්ට චෙතස් ඇත්තාහු ලොකය හා ශාසනයද නැසූවාහුය.)

මෙසේ අති භයඞ්කරවූ වෙගවත්වූ මහාමාරුතයක් සමග ප්‍රචණ්ඩවූ මහාමෙඝයක් සමුත්ථිත කාලේක්හි මෙන් රට බොහෝසේ නසා මාඝතෙමේ තවත් සෙනඟ විසිදහසක් සමග පැමිණියාවූ ජයබාහු නම් ද්‍රවිඩාධිපතියකුගේ සහායත්වයද ඇතිව ලඞ්කා රාජ්‍යයෙහි අභිෂෙකය ලැබ එයින්ද නොනැවතී පෙරසේම රටද ශාසනයද නසන්ට වන. එකල රජ රටෙහි සිටි සඞ්ඝයා වධබන්ධන භීතියෙන් ඉස් ලූ ලූ අත පලාගියාහුය. මාඝ විසින් පොලොන්නරුවෙහි වෙසෙමින් හිඳ එක්විසි හවුරුද්දක් (ක්‍රි. ව. 1211 – 1232) මෙසේ රාජ්‍යය කරනලදී නොහොත් නසනලදී.

මේ කාලයෙහි ඇතම් සිංහල අධිපතිහු ස්වකීය හිතැතියන් සමග පලාගොස් නානා දිශාවන්හි වනදුර්ගවලට පැමිණ එහි ශත්‍රූපද්‍රවයෙන් ආවරණ ඇතිව විසූවාහුය. මෙසේ විසූවන් අතුරෙන් එක් අධිපතියෙක් නම් පුරාණ ජම්බුද්වීපයෙන් ලඞ්කාවට පැමිණ එහි වාස්තව්‍යභූත චන්ද්‍රවංශික ක්ෂත්‍රියාන්වයෙක්හි සඤ්ජාතවූ ශ්‍රී සඞ්ඝබොධි මහ රජාණන්ගේ වංශයෙන් පැවති විජයබාහු නම් කුමාරයෙකි. මේ උතුමාද අන්‍ය ස්වදෙශ භක්තවීරයන්සේම වනදුර්ගයන්හි හැසිරෙමින් සිට ක්‍රමයෙන් තමාගේ පිරිස් බලය වැඩිකොටගෙන පළමුවෙන් වන්නි රට සිංහල ස්වෛරයෙහි නැවතත් පිහිටුවා ගත්තේය. ඉන්පසු අන්‍ය සිංහලාධිපතීන් හා මන්ත්‍රණයෙන් ඔවුන්ද බඳවාගෙන ක්‍රමයෙන් යුදකොට දෙමළුන් මායාරටින් උද්ධරණයකොට ලීමෙන් මුළු මායාරටට රජවී දඹදෙණිනුවර කරවා තුන්වැනි විජයබාහු නමින් අභිෂෙකය ලැබ එතැන් පටන් සතර අවුරුද්දක් (ක්‍රි. ව. 1232 – '6) එහි රාජ්‍යය කෙළේය. රුහුණුරටෙහි වනාහි භුවනෛකබාහු නම් ආදිපාද කෙනෙක් තද්දෙශපාලනය කරමින් සිටියේය. තවත් ප්‍රදෙශයන්හි තවත් අධිපතිහු පාලනය කරමින් සිටියාහුය. විජයබාහු මුළු මායාරටට රජවීමෙන් ඔහුට අනුකූලවූ මේ ප්‍රදෙශයන්

ඡින්දිංසු කරපාදාදිං - භින්දිංසු බහුමන්දිරෙ
බන්ධිංසුච නිජායත්තෙ - කත්වා ගො මහිසා දිකෙ

බන්ධිත්වාන වධිත්වාන - ජනෙ අඩ්ඪෙ මහද්ධනෙ
හරිත්වාන ධනං සබ්බං - දලිද්දෙව කරිංසු තෙ.

භඤ්ජිංසු පටිමාගාරෙ - ධංසෙසුං බහු චෙතියෙ
විහරිංසු විහාරෙසු - පහරිංසු උපාසකෙ

තාළයුං දාරකෙ පච - පීළයුං සහධම්මිකෙ
භාරයිංසු ජනෙ භාරං - කාරයුං බහුකාරියං

පසිද්ධානි පසත්ථානි - පොත්ථකානි බහූනි ච
රජ්ජුන්තො පරිමොචෙත්වා - විකිරිංසු තහිං තහිං

සඩාතං පුබ්බරාජූනං - කිත්තිදෙහ නිභෙ සුභෙ
චෙතියෙ විපුලෙ තුංගෙ - රතනාවලි ආදිකෙ

පාතයන්තා පධංසෙත්වා - තෙසං ජීවිත සන්නිභෙ
අහො අන්තරධාපෙසුං - ධාතු සාරීරිකෙ බහූ

එවං දමිළ යොධා තෙ - මාර යොධානුකාරිනො
ලොකච සාසනචාපි - නාසයිංසු දුරාසයා.

(එකල ලොකයට පීඩාකාරිවූ ක්‍රෑරවූ ඔහුගේ මහා යොධයෝ තුමූ "අපි කෙරල යොධයෝ වම්හ" යි එතැන්හි මෙතැන්හි උද්ඝොෂණය කරන්නාහු—

මනුෂ්‍යයන්ගේ සළු අබරණාදිය සිඳගත්තාහුය, චිරකල් අනුරක්ෂිතවූ කුලාචාරය බිඳහෙළුවාහුය ;

අත් පා ආදිය සින්දාහුය; බොහෝ මන්දිරයන් බින්දාහුය; ගවමහිෂාදිය තමන් අයත්කොට බැඳ ගත්තාහුය;

ආඪ්‍යවූ මහත් ධන ඇති ජනයන් බැඳ වදකොට ඔවුන්ගේ සියලු ධනය පැහැරගෙන ඔවුන් දරිද්‍රයන් සේ කළාහුය;

පිළිම ගෙවල් බින්දාහුය; දාගැප් වැනසුවාහුය; විහාරයන්හි විහරණය කළාහුය; උපාසකයන් නෙරපාලූවාහුය;

දරුකයන්ට තැළුවාහුය; පඤ්ච සහධාර්මිකයන් පෙළුවාහුය; බරගෙන යෑමෙහි ජනයන් යෙදූවාහුය; බොහෝ මෙහෙය ඔවුන් ලවා කරවූවාහුය;

ප්‍රසිඬවූ ප්‍රශස්තවූ බොහෝ පුස්තකයන් ලනු මුදා තැනින් තැන විසුරුවා හැරියාහුය;

ශ්‍රද්ධාවත් රජදරුවන්ගේ කීර්තිදෙහ වැනිවූ යහපත්වූ මහත්වූ උස්වූ රුවන්වැලි ආදී චෛත්‍යයන් බිඳහෙළමින් වනසා ඔවුන්ගේ ජීවිතයට බඳුවූ බොහෝ ශාරීරික ධාතූන් අහෝ! අනතුරඬාතයට පැමිණවූවාහුය.

මෙසේ ක්‍රියාවෙන් මාරයොධයන් වැනිවූ ඒ ද්‍රවිඩ යොධයෝ තුමූ දූෂට චෙතස් ඇත්තාහු ලොකය හා ශාසනයද නැසූවාහුය.)

මෙසේ අති භයඞ්කරවූ වෙගවත්වූ මහාමාරුතයක් සමග ප්‍රචණ්ඩවූ මහාමෙඝයක් සමුත්ථිත කලේක්හි මෙන් රට බොහෝ සේ නසා මාඝතෙමේ තවත් සෙනග විසිදහසක් සමග පැමිණියාවූ ජයබාහු නම් ද්‍රවිඩාධිපතියකුගේ සහායත්වයද ඇතිව ලඞ්කා රාජ්‍යයෙහි අභිෂෙකය ලැබ එසින්ද නොනැවති පෙරමේම රටද ශාසනයද නසන්ට වන. එකල රජ රටෙහි සිටි සඞ්ඝයා වධබන්ධන භීතියෙන් ඉස් ලූ ලූ අත පලාගියාහුය. මාඝ විසින් පොලොන්නරුවෙහි වෙසෙමින් හිඳ එක්විසි හවුරුද්දක් (ක්‍රි. ව. 1211 – 1232) මෙසේ රාජ්‍යය කරතලදී නොහොත් නසතලදී.

මේ කාලයෙහි ඇතම් සිංහල අධිපතිහු සවකීය හිතැතියන් සමග පලාගොස් නානා දිශාවන්හි වනදුර්ගවලට පැමිණ එහි ශත්‍රූපද්‍රවයෙන් ආවරණ ඇතිව විසූවාහුය. මෙසේ විසූවන් අතුරෙන් එක් අධිපතියෙක් නම් පුරාණ ජම්බුවීපයෙන් ලඞ්කාවට පැමිණ එහි වාසනවත්‍යභූත චන්ද්‍රවංශීය ක්ෂත්‍රියාන්වයෙක්හි සඤ්ජාතවූ ශ්‍රී සඞ්ඝබොධි මහ රජාණන්ගේ වංශයෙන් පැවති විජයබාහු නම් කුමාරයෙකි. මේ උතුමාද අන්‍ය සවදෙශ භක්තවීරයන්සේම වනදුර්ගයන්හි හැසිරෙමින් සිට ක්‍රමයෙන් තමාගේ පිරිස් බලය වැඩිකොටගෙන පලමුවෙන් වන්නි රට සිංහල සෛවරයෙහි නැවතත් පිහිටුවා ගත්තේය. ඉන්පසු අන්‍ය සිංහලාධිපතීන් හා මන්ත්‍රණයෙන් ඔවුන්ද බඳවාගෙන ක්‍රමයෙන් යුදකොට දෙමළුන් මායාරටින් උඬරණයකොට ලීමෙන් මුළු මායාරටට රජවී දඹදෙණිනුවර කරවා තුන්වැනි විජයබාහු නමින් අභිෂෙකය ලැබ එතැන් පටන් සතර අවුරුද්දක් (ක්‍රි. ව. 1232 –'6) එහි රාජ්‍යය කෙළේය. රුහුණුරටෙහි වනාහි භුවනෙකබාහු නම් ආදිපාදකෙනෙක් තද්දෙශපාලනය කරමින් සිටියේය. තවත් ප්‍රදෙශයන්හි තවත් අධිපතිහු පාලනය කරමින් සිටියාහුය. විජයබාහු මුළු මායාරටට රජවීමෙන් ඔහුට අනුකූලවූ මේ ප්‍රදෙශයන්

සියල්ලද ඔහුගේ ස්වාමිත්වයෙහි පිහිටියේයයි සිතිම යුක්ති සහිත බව පෙනේ.

මෙසේ ප්‍රාඥවූ බල ඇති විජයබා රජතෙමේ නානාදෙශයන්හි පලාගොස් සිටියාවූ සඞ්ඝයා හැකිපමණින් නැවතත් රැස්කරවාගෙන ශාසනය නැවතත් ස්වකීය රාජ්‍යයෙහි පිහිටුවීමෙන් ස්වස්ථකරවා ලඞ්කාවෙහි දෙමළුන් අතට අසුනොවී ශෙෂව තිබුණාවූ පොත්පත් හැකිපමණින් රැස්කරවා බොහෝ ලිපිකරුවන් යොදවා ලියවීමෙන් නැවතත් ශාස්ත්‍රය ප්‍රකෘතිමත් කරවන්ට පටන්ගත්තේය. ස්වකීය පුත්‍රයන්වූ පරාක්‍රමබාහුය, භුවනෛකබාහුය, යන කුමාරයන්ද ශිල්ප, ශාස්ත්‍ර, ධර්‍ම, විනය යනමේ සියල්ලෙහි අතිශයින් ප්‍රගුණ කරවිය.

ක්‍රි. ව. 1236 හිදී මේ රජහුගේ ඇවෑමෙන් ඔහු දෙටු පුත් පරාක්‍රමබාහු කුමාරතෙමේ රාජ්‍යශ්‍රීප්‍රාප්තව ස්වකීය පාණ්ඩිත්‍යය නිසා මහා සඞ්ඝසභාව විසින් දෙනලද කලිකාල සාහිත්‍ය සර්‍වඥ පණ්ඩිත පරාක්‍රමබාහු යන නාමයෙන් ප්‍රකට විය. මේ නාමයෙහි අර්‍ථය නම් කලියුගයට සාහිත්‍ය ශාස්ත්‍රයෙහි හෙවත් සාලඞ්කාර කාව්‍ය ශාස්ත්‍රයෙහි සමස්තවෙදිවූ පාණ්ඩිත්‍යය ඇති පරාක්‍රමබාහු යනුයි. මේ ගරුනාමය මේ රජයාහට සඞ්ඝ සභාවක් විසින් දෙනලදින් දැන් කාලයෙහිද ඇතම් සඞ්ඝයා සභාවක් පවත්වා එහිදී ගරු නාමයන් දීම ඇතම්විට කරති. මෙය හාස්‍යයට කරුණක් බව ඒ සඞ්ඝයා හෝ ඔවුන්ගෙන් ගරු නාමයන් ලබන්නාවූ අය හෝ නොදනිත්. ලොකසම්මානනය පිණිස වන්නාවූ හියලුම ගරු නාමයන්ට රාජබලය මූල්විය යුතුබව මොව්හු නොදනිති. තවද රාජයාටම යම් ගරු නාමයක් දෙනලද්දේ නම් ඒ අඞ්ගීකරණයෙන් රාජබලය එහි පිහිටන බවද තේරුම්ගැන්මට මොවුන්හට නිරාකුල බුද්ධිය නොමැත්තේය.

මේ විතිය හෙවත් පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය කාලය හවුරුදු සතලිසක් පමණ (ක්‍රි. ව. 1236–76) පැවැත්තේය. තත්කාල ප්‍රථම භාගයෙහිදී රජතෙමේ පිහිටිරට ප්‍රධානව නොයෙක් ප්‍රදෙශයන්හි කඳවුරු බැඳගෙන ඒ ඒ දිශාවන්හි බලපාමින් සිටියාවූ පෙර මාඝ හා ජයබාහුද සමග පැමිණි සතලිස් දහසක් කොරල සෙනඟ බිඳුවාපියා හරිමින් මුළු සිංහලද්වීපය නිෂ්කණ්ටක කරගැනීම පිණිස මුළු උත්සාහය යෙදුවේය. සියලු සිංහල ජනනායකයෝද මේ උදාර කාර්‍ය්‍යයෙහිදී රජයාහට මුළුභක්තියෙන් උපස්තම්භක වූහ.

අසුරයන් විජයකොට පලවාපියා ඔවුන් නිමිත්තකොට ඇතිවූ සියලු උපද්‍රවයන් නිවාරණය කරලීම පිණිස පුරාණ කථානයෙහි සියලුම මහේශාඛ්‍ය සුරයෝ යම්සේ ව්‍යාපෘත වූද එසේම මේ කාලයෙහි කෙරලයන් බිඳුවා ලඞ්කාවෙන් පලවාහැරීම පිණිස ප්‍රොත්සාහිවීම සියලුම සිංහල ජනනායකයන්ගේ උත්කෘෂ්ට ව්‍යාපාරය විය. මහේශාඛ්‍ය දෙවිකෙනෙකුන්හට සතුති කිරීමෙහිදී ඔහු අසුරයන් නැසූබව කියනුලැබේ. එසේම මේ කාලයෙහි විජෘම්භමාණ ජනනායකයන්වූ දෙවප්‍රතිරාජයන් හට සතුතිකිරීමෙහිදී ඔහුගේ මහාඝී ක්‍රියාවක්වූ මහවැලිගඟ සමීපයෙහිදී කරනලද කෙරල සංහාරය සිදත් සඟරාවෙහි "**සඳවනසිඳු**" යනාදි කවියෙන් ප්‍රකීර්ත්තිතය. සතුතියක් පිණිස පවා ප්‍රාණවධයක් කීර්තනය කිරීම සඞ්ඝයාවහන්සේ නමකට යෙදේද යන ප්‍රශ්නයක් මෙහි උපදී. ඊට උත්තරය නම් ලෝක ශාසන සංරක්ෂණය පිණිස ශත්‍රුවිජයය නරශ්‍රෙෂ්ඨයන් විසින් පිළිපැදිය යුතුවූ උතුම් ධර්මයක් හෙයින් එසේ පිළිපන් උතුමකුගේ ඒ උදාර ක්‍රියාසමපත්තිය සම්සෝදර මනස්වින් විසින් වර්ණනීය බවයි.

කෙරලයන්ගේ බලයෙහි මූලස්ථානය නම් පොළොන්නරුව විය. මීට අනුව කඳවුරු බැඳි ඇතම් ස්ථානයෝ නම්:- ගඟතලා, කවුඩාල, පදී, කුරුඳු, මානාවතු, මාවටු, මන්නාරම්, පුලච්චේරි, ගෝණාතොට, දෙබරපටුන්, හූරාතොට, යන මොවුන් හා රුහුණු රටෙහි කොටුසර යනාදීහුද වෙත්. සිංහල රජයාගේද සියලු සිංහල ජනනායකයන්ගේද, මුළු සිංහල ජනතාවගේද මොවුන්ට විරුඬව මෙහෙයනලද දෘඪොත්සාහය ඇතිහෙයින් මෙකී ප්‍රත්‍යන්ත ස්ථානයන්හි නිරුපද්‍රවයෙන් විසී මෙහි නිතර බාධා ඇති කෙරලයෝ තුමූ පුලස්තිපුරයට රාශීභූතව උනුන් සාකච්ඡාකොටගෙන සියලු කෙරලයන් සිංහල දේශය අත්හැර සියරටට යනසේ තීරණයකොට ගත්හ. ඒ තීරණය අනුව කෙරලයෝ තුමූ බොහෝ වශී ගණනක් මුළුල්ලෙහි සිංහලයන් පෙළා රාශිභූත කරගන්නාලද එකිනෙකා අයත් මහත් මහත් ධනසම්භාරයද රැගෙන සියරට බලා යන ලෙස පුලස්තිපුරයෙන් නික්මුණාහ. එසේ නික්ම යන්නාවූ කලාවැව සමීපයෙහිදී මඟ රැකඋන් සිංහල බලසෙනාවට අසුවී ප්‍රලයයට පමුණුවනු ලද්දාහුය. ඔවුන්ගේ ධනසම්භාරයද නැවත සිංහලයන්ටම අත්පත්විය.

මින්පසු රාජයාගේ එකොළොස් වන්නෙහි චන්ද්‍රභාණු නම් ජාවක සේනාපතියෙක්ද මහත් බලඇණියක් සමග ලඞ්කාවතර

ණයකොට මුහුදුබඩ ප්‍රදේශයන් විනාශකෙරෙමින් මුළු ලඞ්කා වෙහි නැවතත් භය පතුරුවන්ට පටන්ගත්තේය. මොහුගේ භටයෝ තුමූ නච්චම්බු නම් විෂ පෙවූ මූණ ඇති හී විදිති. ඒ හිමුණ වන් වන් ජනයෝ නසිත්. මෙසේ මොහුගේ සටන මහත්සේ ඝොරවිය. එහෙත් පරාක්‍රමබාහු රජහුගේ බෑන ණුවූ වීරබාහු නම් ශූරවීර කුමාරයාහට සිංහල සේනාව දී මොහුට ප්‍රතිවිරුඬව යවනලදින් ඒ කුමාරතෙමේ විසගී වළක් වාලිමෙහි තිසි ආවරණ ඇතිව ගොස් ජාවකයන්හට පහරදී ඔවුන් නැවත නැවතත් බිඳුව බිඳුවා ඔවුන්ගෙන් බොහෝ ගණන් විනාශකොට චන්ද්‍රභානු පරදවා පලවා හැරියේය. මින්පසු ලඞ්කා මහීතලය ශත්‍රුපද්‍රවයෙන් විමුක්ත විය.

මෙසේ ස්වදේශය නැවතත් ස්ථෛර්යයට හා ක්ෂේමයටද පමුණුවාගත්පසු පරාක්‍රමබාහු රජතෙමේ චිරකල් ප්‍රහීණව ආ වාවූ ස්වදේශ ශ්‍රී සම්පත්තිය හා ශාස්ත්‍රාගමයද නැවතත් වඞි තයට පැමිණවීමෙහි ප්‍රොත්සාහි විය. ආගම පක්ෂය දිවුණු වෙහි රජයාගේ භ්‍රාතෘරත්නයවූ ත්‍රිපිටක ප්‍රවීණ. විශාරද බුඞි සම්පන්න භුවනෛකබාහු කුමාරතෙමේ අතිශයින් උපස්තම්භක විය. ශාස්ත්‍රදිවුණුවෙහි වනාහි රජතෙමේද අග්‍රෙසරවූ පණ්ඩිත යෙක්ව ක්‍රියා කෙළේය. මුළු සඬර්මය හකුළුවා කරනලද **විශුඞි මාර්ග** නම් ධර්ම ප්‍රකරණයට ශාස්ත්‍රයද ධර්මයද හළලා මේ රජ තුමා විසින් අතිවිස්තරවූ විශාලවූ ව්‍යාඛ්‍යානයක් කරනලදී. එසේම ආගම පක්ෂයෙහි මෙතුමා විසින් චතවිතිස නම් ධර්ම ප්‍රකරණයට **නිස්සන්දේහ** නම් ව්‍යාඛ්‍යානයක් කරනලද බැව් කියනුලැබේ. තවද ශාස්ත්‍ර පක්ෂයෙහි දැනට විද්‍යමාන සිංහල කාව්‍ය රත්නයන් අතුරෙන් උත්කෘෂ්ට ස්ථානයෙහි බබළන් නාවූ **කව්සිළුමිණ** නම් අනගි ග්‍රන්ථය මේ රජතුමා විසින් නිපද වන ලදී.

මේ කාලයෙහි ශාස්ත්‍රාගම අචිරයෙන් බොහෝ දීප්තියට පමුණුවන ලද්දේ මෙතුමා විසින් චොලදෙශයෙන් ගෙන්වන ලද සුධීරෙශ්වර සඞ්ඝයාවහන්සේලාගේ ආධාරයෙනි. මෙකල විරාජිතවූ නොයෙක් ශ්‍රමණ පණ්ඩිතයන්වහන්සේලා විසින් නානා ග්‍රන්ථයෝ නිපදවන ලදහ. එයින් සමහරෙක් නම්:- රූපසිඞි, පජ්ජමධු, සමන්තකූට වණ්ණනා, රසවාහිනී, සික්ඛා පදවලඤ්ජන, භෙසජ්ජමඤ්ජූසා, විමුත්තිසඞ්ගහ, සාරසඞ්ගහ, මහානිපාතවණ්ණනා, පදසාධන ව්‍යාඛ්‍යා, සම්බන්ධචින්තා ව්‍යාඛ්‍යා, ධම්මපද ව්‍යාඛ්‍යා, පූජාවලී–යන මොවුහු වෙත්.

එහෙත් මේ කාලයෙහි කරනලද කුඩා මහත් සියලුම ග්‍රන්ථයන් අතුරෙන් ආධුනිකයන්හට අතිශයින් ප්‍රයෝජනවත්වූ සකල දිග් ව්‍යාප්ත කීර්තිමාලාවන්ගෙන් යුක්තවූ ග්‍රන්ථය නම් මේ සිදත් සඟරා නම් ස්වභාෂා ව්‍යාකරණ ග්‍රන්ථය වේ.

සිදත් සඟරාව නිපදවනලද්දේ ප්‍රතිරාජ පරිවෙණාධිපතිව වැඩවිසූ විබුධෙශ්වරයාණන්වහන්සේ විසින් බව ග්‍රන්ථයෙහි පෙනෙන්නාවූ—

"දෙනෙ දන මෙසිදත ප්‍රතිජර පි රු ව න
සැකෙ විනි පළකළ දනුමට ස රු ව න"

යනාදි කවියෙන් පෙනේ. මෙහි ප්‍රතිරාජපරිවෙණ නමින් කියවෙන්නේ ප්‍රතිරජයකුගේ නමින් හෝ ප්‍රතිරාජයකු විසින් හෝ කරවනලද පරිවෙණයක්යයි පිළිගතයුතුවේ. මෙහි ප්‍රස්තුතවූ ප්‍රතිරාජයා නම් ග්‍රන්ථාවසාන භාගයෙහි පෙනෙන්නාවූ—

"දකණ ලක සියල්"—

යනාදීන් ආරාධනා කාව්‍ය වශයෙන් දක්වනලද දෙවප්‍රතිරාජයන්ම බව පිළිගැනීම යුක්ති සහගත වේ. පරාක්‍රමබාහු මහරජු විසින් ස්වකීය ප්‍රතිරජයන් ලවා ශාසනාභිවෘද්ධිය පිණිස ස්වනාමයෙන් නොයෙක් කර්මාන්තයන් කරවන්ට යෙදුණුබවද එයින් එක් කර්මාන්තයක් නම් අත්තනගලු විහාරය නටබුන්ව තිබුණු තැන්හි කරවනලද ත්‍රිභූමක ප්‍රාසාදයක් බවද මහාවංසයෙන් පෙනේ. තවද ඒ ප්‍රාසාදය අනවමදර්ශි මහා ස්වාමීන් වහන්සේහට රජ නියොගයෙන් පිරිණමා දන්වැටද පිහිටවූ බව එම ග්‍රන්ථයෙහිම සඳහන්ව තිබේ. ඒ මෙසේයි:—

තතො ගන්ත්වාන සො හත්ථ - වන ගල්ල විහාරකං
රඤ්ඤා වුත්ත නියාමෙන - කත්වා බහු ධනබ්බයං

කාරාපෙත්වාන පාසාදං - තුංග සිංග තිභූමකං
අනොමදස්සි නාමස්ස - මහා සාමිස්ස ධීමතො

තං දත්වාන තතො තස්ස - මහාරාජ නියොගතො
දානවට්ටම්පි කාපෙත්වා - සිලාලෙඛ මකාරයී.

(එතැනින් හේ "ප්‍රතිරජදෙව" තෙමේ අත්තනගලු විහාරයට ගොස් රජු කී නියාමයෙන් බොහෝ ධන වියදම්කොට උස්වූ කොත් ඇති ත්‍රිභූමකවූ ප්‍රාසාදයක් කරවා අනොමදස්සි නම් ප්‍රඥාවත් මහා ස්වාමීන්හට එය දානයකොට ඉන්පසු මහා

රජයාගේ නියොගයෙන් ඊට දන්වැටද කරවා ශිලාලෙඛන යක්ද කරවිය.) දන්වැට කරවීම නම් ස්ථානයෙහි නඩත්තුව පිණිස ගම් බිම් දීමයි. එසේ ගම් බිම් දී සවස්ථානයෙහි පිහිටුවන ලදින් ඒ අභිනව ප්‍රාසාදයද විහාරයක්ම විය. පරිවෙණයන්නෙන් මේ කාලයෙහි හා ඊට පූර්වකාලයෙහිද කියනලද්දේ විද්‍යාලයක් නොව නොයෙක්විට විද්‍යාවන්ටද ආසපදවූ විහාර ස්ථානයකි. විද්‍යාලය යන විශෙෂාර්ථය ආරූඪවූයේ මෑතකාලයකදීය. ප්‍රාසාද යනුද යථොක්ත විහාරාර්ථයෙහිම යොදන ලදි. මහානෙත්‍ර ප්‍රාසාද යනු නිදසුනකි. ඉතින් ප්‍රතිරාජපරිවෙණ යන්නෙන් ප්‍රකටවූයේ මෙබඳු ප්‍රාසාදයක්ම බව යටදක්වූ කාරණයන් හා පරොපකාර නම් ජ්‍යොතිර්ග්‍රන්ථාවසානයෙහි ලැබෙන්නාවූ මේ 'පුෂ්පිතාග්‍රා' ශ්ලොකයද සසඳා බැලීමෙන් ඉපදේ :—

ප්‍රතිනෘපති මහාවිහාර නෙතා
ක්ෂිතිසුර වංශජනි ම්‍රුනීන්ද්‍ර සූනුඃ
ඉදමනවමදර්ශි නාමධෙයඃ
පරම'කරොත් කරණං පරොපකාරම්.

(ප්‍රතිරාජ මහාවිහාරයට නායකවූ අනවමදර්ශි නම්වූ බ්‍රාහමණ වංශොත්පත්ති ඇති මුනීන්ද්‍ර පුත්‍රතෙමේ පරොපකාර නම් මේ උතුම්වූ කරණය හෙවත් ජ්‍යොතිර්ග්‍රන්ථය කෙළේයි.)

මෙසේ ප්‍රතිරාජපරිවෙණය නම් මහාවංසයෙහි කී සේ ත්‍රිභූමක ප්‍රාසාදයක් අමුතුවෙන්ම තැනීමෙන් හා ඊට ගම් බිම් දීමෙන් නැවතත් චිරස්ථිතියෙහි පිහිටුවනලද අත්තනගලු විහාරයම බවද තත් පරිවෙණාධිපතීන්වහන්සේ නම් මෙහි දැක්වූ බ්‍රාහමණ වංශොත්පත්ති ඇති අනවමදර්ශි ස්වාමීන්වහන්සේ බවද සප්‍රටය. මහාවංසයෙහි මූන්වහන්සේහට මහා ස්වාමියයි කියනලදි. මහාස්වාමි යන්නෙන් කියවෙන්නේ සඞ්ඝරාජයාය. මූන්වහන්සේ සඞ්ඝරාජව විරාජමානවූ බැව් මෙසේ දක්වාතිබේ, හත්ථවනගල්ල විහාර වංසයෙහි :—

බ්‍රහමඤ්ඤයෙන්'නුගතත්ථ මනොමදස්සී
ඛ්‍යාතෙන සඞ්ඝයතිරාජ ධුරන්ධරෙන
ව්‍යාපාරිතො' හමිතිහා නුගතං කථඤ්ච
තිස්සාය පුබ්බලිඛිත ඤ්චිධ වායමාමි.

(බ්‍රාහමණ වංශ ඇති අනුගතාර්ථයෙන් යෙදෙන්නාවූ අනවමදර්ශී යන නාමධෙය ඇති සමස්ත සඞ්ඝයාහට රාජධුර

ධාරිහු විසින් මෙහෙයන ලද්දාවූ මම ඉතිහාස ගත කථාවද පූජිලිඛිතයද ආශ්‍රයකොට මේ විහාරවංශ කථනයෙහි උත්සාහ කොරෙමි.)

ඉතින් සිදත් සඟරාව කරනලද්දේ ප්‍රතිරාජපරිවෙණාධිපති සවාමීන්වහන්සේ විසිනි. ප්‍රතිරාජ පරිවෙණාධිපතීන් වහන්සේ නම් අනවමදර්ශි සඞ්ඝරාජයන්වහන්සේ බව මෙහි දැක්වූවාය. එසින් සිඩාන්ත සඞ්ග්‍රහය නිපදවනලද්දේ අනවමදර්ශි සඞ්ඝරාජ සවාමීන්වහන්සේ විසින් බව සාධිත වෙයි.

මේ අනවමදර්ශි සඞ්ඝරාජයන් වහන්සේ වනාහි එකලට පැවති ග්‍රාමවාසිය වනවාසිය යන උභය පක්‍ෂයෙහි සඞ්ඝයා අතුරෙන් ග්‍රාමවාසයෙහි සඞ්ඝයා වහන්සේ නමක් විය. පිරිවෙනෙක්හි අධිපතිභාවය ඉසිලීමෙන් ඒ පෙනේ.

එහෙත් සිඩාන්ත සඞ්ග්‍රහයෙහි කතෘවරතෙමේ තිම වන්වාසයෙහි වූ මෙකල්හිම වැඩවිසූ සුවිචක්‍ෂණ සුධීරොදර වෛදෙහ ස්ථවිරපාදයන්වහන්සේ විය යනු මෑතකාලය වනතුරුම සර්ව්‍යාපනව පැවතුණාවූද තවමත් බොහෝදෙනා විසින් අදහනු ලබන්නාවූද මතය වේ. මේ මතයට හෙතු නම් මෙසේය: රසවාහිනී පරිසමාප්තියෙහි:—

යො'කා සීහළ භාසාය–සීහළං සද්දලක්ඛණං
යො ච සමන්තකූටස්ස–වණ්ණනං වණ්ණයී සුභං
තෙන වෙදෙහ ථෙරෙන–කතා'යං රසවාහිනී.

(යමෙක් තෙම සිංහල භාෂායෙන් සිංහල ශබ්දලක්‍ෂණයක් කළේද, යළිදු යමෙක් තෙම සමන් කුළුයෙහි යහපත් වර්ණනය රචනාකළේද, ඒ වෛදෙහ ස්ථවිරයන් විසින් මේ රසවාහිනී තොමෝ කරනලදී.)

එසේම සමන්තකූට වණ්ණනාවසානයෙහි :—

තස්ස සිස්සෝසි යො විප්ප – ගාම වංසෙක කෙතුකො
ඡළභිඤ්ඤාගමො'රඤ්ඤවාසී – සීලාදි ගුණ භූසණො

යො'කා සීහළ භාසාය – සීහළං සද්දලක්ඛණං
තෙන වෙදෙහ ථෙරෙන – කතා'යං පිය සීලිනා.

(බමුණුගම් වංසයට අසදෘශ කෙතුවක් වූ දන්නාලද ශාස්ත්‍රාගම ඇති අරණ්‍යවාසිවූ ශීලාදි ගුණයන් ආභරණ කොට ඇති යමෙක් තෙම උන්වහන්සේගේ – එනම් ආරණ්‍යක රතනානන්ද මහාස්ථවිරයන්වහන්සේගේ – ශිෂ්‍ය විද,

යමෙක් තෙම සිංහල භාෂායෙන් සිංහල ශබ්දලක්ෂණයක් කළේද, ප්‍රිය ශීලිවූ ඒ වෛදෙහ ස්ථවිරයන් විසින් මේ සමන්තකූට වර්ණනා නොමෝ කරනු ලදි.)

මෙයින් බමුණුගම් වංසයෙහි ජාතවූ අරණ්‍යවාසි වෛදෙහ ස්වාමිපාදයන්වහන්සේ විසින් ස්වකීය රසවාහිනී සමන්තකූට වර්ණනා යන මාගධී ග්‍රන්ථයන්ට ප්‍රවීයෙහි සිංහල ශබ්ද ලක්ෂණ යක් ස්වභාෂායෙන්ම නිපදවූ බැව් පෙනේ. තවද කාව්‍යශෙඛර යෙහි :–

නත් වරද ලොප් වත – කිරිය අදියර සත් වත
අදෙස් හැදහිලි වත – එසඳ ලකුණෙන් සදලකුණු වත

යන මේ ශ්ලෝකාර්ධයෙන් නත්, වරද, යන ලොප නිදර්ශනයන්ද, සත්වැනි ක්‍රියාධිකාරයක්ද, ආදෙශයෙන් සිදුවූ හැද හිලි යන්නක්ද ශබ්දලක්ෂණයෙහි ඇති බව සූචිත කළහ. ඒ සලකුණු සිදත්සඟරුවෙහි ඇති හෙයින් මෙහි අභිප්‍රේතවූ ශබ්ද ලක්ෂණය නම් සිදත්සඟරුව විය යුතුයි. තවද වෛදෙහ ස්වාමීන් වහන්සේ විසින් කරන ලද ග්‍රන්ථය තෙම ශබ්ද ලක්ෂණ යයි නිර්දිෂ්ටය.

මෙසේ සිදත්සඟරුව කාව්‍යශෙඛරයෙහි ශබ්ද ලක්ෂණ යන් නෙන් ලක්ෂිත හෙයින්ද, ශබ්ද ලක්ෂණයක් වෛදෙහ ස්වාමීන් වහන්සේ විසින් නිපදවන ලද හෙයින්ද, සිදත්සඟරුවෙහි කර්තෘ නම් වෛදෙහ ස්වාමීන්වහන්සේය යන අනුමිතිය ඇතිවිය.

එහෙත් පොතෙහිම කරනලද් කර්තෘ සඳගීනයෙහි එම කර්තෘ නම් ප්‍රතිරාජපරිවෙණාධිපතිහුයයි කීහ. ඒ පරිවෙණාධි පතිහු නම් වනවාසිවූ වෛදෙහ ස්වාමීන්වහන්සේ නොව ග්‍රාමවාසිවූ අනවමදර්ශී සඞ්ඝරාජයන්වහන්සේ බව යට දක්වනලදි. එයින් වෛදෙහ ස්වාමීන්වහන්සේ විසින් කරන ලද ශබ්ද ලක්ෂණය නම් සිදත්සඟරුව නොව අන්‍යතර ව්‍යාකරණ ග්‍රන්ථයක් විය යුතුයි. කාව්‍යශෙඛරයෙහි සදලකුණු යන්නෙන් කියනලද්දේ ව්‍යාකරණ ග්‍රන්ථයක නාමයක් නොව ව්‍යාකරණ ශාස්ත්‍රයයි. එම ශාස්ත්‍රයෙහි ලකුණු එවකට පැවති එකම ව්‍යාකරණ ග්‍රන්ථයයි සැලකිය යුතුවූ සිදත්සඟරුවෙහි ප්‍රකාර කියන ලදි. වෛදෙහ ස්වාමීන්වහන්සේගේ ශබ්ද ලක්ෂණයද නිරුපද්‍රුතව පැවත ආවේනම් ලොවට මහත් ඉසුරක් වනු නිසැකය. එහෙත් අභාග්‍යයට මෙන් එය විනෂ්ටවී ගොස් තිබේ. යම් කිසි රාජ්‍යොපද්‍රව කාලයකදී අභාවප්‍රාප්ත වූණා විය යුතුයි. හෙද පළමුවෙනි රාජසිංහ රජහුගේ කාලයෙහි කරවනලද පොත් පිලිස්සීමට ප්‍රවීයෙහි වියයිද සිතිය යුතුවේ.

මෙසේ සිදත්සඟරාව කරනලද්දේ වෛදෙහ සවාමීන්වහන්සේ විසින් නොව අනවමදර්ශී සඞ්ඝරාජ සවාමීන්වහන්සේ විසින් බව සුවිනිශ්චිතයෑ.

මුන්වහන්සේ එකලට විසූ පඬිවරයන් අතුරෙන් අති විශාරද වූ පණ්ඩිත ශ්‍රෙෂ්ඨයාණ කෙනකුන්වූ බව සඞ්ඝරාජ සාධුනාන රයට තෝරාගැනීමෙන්ම පෙනේ. මේ උතුම් තනතුරට පාණ්ඩිත්‍ය යෙන් සම්පූර්ණත්වයට පැමිණ ඇත්තවුන් මිස අන්‍යයෝ තෝරාගනු නොලබත්.

සූර්‍ය්‍යසිඬ්ධාන්තයෙහි ආවාවූ ගැඹුරුවූ විශාලවූ ජ්‍යොතිඃශාස්ත්‍ර ක්‍රමය හළලා මුන්වහන්සේ විසින් කරනලද පරෝපකාර නම් ජ්‍යොතිර්ග්‍රන්ථය ලඞ්කාවෙහි අතිශයාදරයෙන් පිළිගනුලැබ මහත් කීර්ත්තියට පැමිණ බොහෝ ගෞරවයෙන් සම්භාවිත කරනලදි. අද වන තෙක් ලඞ්කාවෙහි ජනමපත්‍රයන්හි ඒ පරෝපකාරය ගෞරවයෙන් සඳහන් කරනු ලැබේ.

මේ සවාමීන්වහන්සේ විසින් දෛවඥකාමධෙනු යන නමින් වරාහමිහිරාදීන්ගේ ශාස්ත්‍රක්‍රමයන් හකුළුවා තවත් ජ්‍යොතිර් ග්‍රන්ථයක්ද නිපදවන ලදි. එහි කර්තෘසඤ්ඥීක ශ්ලොකය මෙසේය:

අනුගත ජින ශිෂ්ටිර් බ්‍රාහ්මවංශෛක දෘෂ්ටිර්
මුනි රනවමදර්ශී පාරදර්ශී කලානාම්
ප්‍රණයති සකලාං සද්ග්‍රන්ථ සාරාර්ථදෛග්ධ්‍රීං
විබුධජන නිෂෙව්‍යාං දෛවවිත් කාමධෙනුම්.

(අනුගමනය කරනලද බුඬානුශාසනය ඇති බ්‍රාහ්මණ වංශයට අසදෘශ නෙත්‍රයක්වූ කලාවන්ගේ පාරදර්ශීවූ අනවමදර්ශී නම් තපස්වී තෙමේ සව සාකල්‍යයෙන්ම යහපත් ග්‍රන්ථයන්ගේ සාරාර්ථ ප්‍රදසිනීවූ පණ්ඩිතයන් විසින් නිත්‍ය සෙවනය කටයුතුවූ දෛවඥ කාමධෙනුව නිපදවා.)

මෙහි නමස්කාර ශ්ලොකය මෙසේය :-

ප්‍රතිඵලනති ජගන්ති සමන්තතො
මහති යද් ධිෂණා මණි දර්පණෙ
ස භගවාන් මුනි රීහිත සිඬයෙ
හෘදි චිරං මම ගන්ධකුටීයතාම්.

(යමකුගේ ප්‍රඥා නැමති මහත් මණිදර්පණයෙහි හාත්පස ලොකයෝ නොහොත් ලෝවැස්සෝ ප්‍රතිබිම්බිතව පෙනෙත්ද ඒ භාග්‍යවත් මුනි තෙමේ අභිෂ්ටාර්ථ සිඬිය පිණිස මාගේ හෘදයයෙහි චිරකල් ගඳකිළියෙක්හි මෙන් වෙසේවා.)

මෙසේ කරනලද බුද්ධානුස්මරණය සිදත්සඟරා නමස්කාර පාඨයෙහිද මඳක් වෙනස්ව එම අර්ථයෙන්ම පෙනෙන හෙයින් සිදත්සඟරාවද මුන්වහන්සේගේම කෘතියක් බවට හෙද ස්ථිරවූ සාක්ෂ්‍යයකි. සිදත් සඟරාව කරනලද්දේ උසස් පඬිවරයකු විසින් බව නිඃශඞ්කිතය. හේ මුන්වහන්සේ නොවී නම් එම පඬිවරයා මුන්වහන්සේගේ නමස්කාර පාඨයක් බලාගෙන ස්වකීය ග්‍රන්ථයෙහි නමස්කාරය කළේයයි කියා හෝ එම නමස්කාරය එබඳු අන්‍ය පඬිවරයකු විසින් කලින් කරනලද්දක් නම් එය බලා ගෙන එහි අර්ථය ගතිනකොට මුන්වහන්සේ විසින් ස්වකීය ජ්‍යොතිර්ග්‍රන්ථයෙහි නමස්කාරය කරනලද්දේයයි කියා හෝ නොසිතිය හැකි හෙයිනි.

තවත් සාක්ෂ්‍යයක් නම් මෙසේය : සිදත්සඟරාවෙහි –

මැ පෙළ පමණ සිඹි – කිවිමන් දනන් ගරහන
පසසන යළිදු කම් කිම් – පඬුවෝම මෙහි පමණෝ

යන්නෙන් දෙෂ ගවෙෂින් කෙරෙහි මුන්වහන්සේගේ සැල කීමක් නොමැති බව දක්වනලදි.

දෛවඥකාමධෙනුවෙහිද –

ඊර්ෂ්‍යා පිශාචී චපලාත්මභාජෝ
නිඥනති යෙ තෙෂු මමා'සති නාඃසථා
ආරාධකො'හං මහතානනු තෙෂාං
යෙ'ත්‍ර ශ්‍රමඥශව පරාර්ථ කාමාඃ.

(ඊර්ෂ්‍යා නමැති යක්ෂිණියගේ චපල ස්වභාවය ඇති යම් අය තුමූ මෙහි නිඳු කෙරෙත්ද ඔවුන් කෙරෙහි මාගේ සැලකීමක් නොමැත්තේය. මෙහි පරිශ්‍රමය දන්නාවූ පරාර්ථකාමිවූ යම්හු තුමූ වෙත්ද මම්වූකලී ඒ මහතුන්ගේ ආරාධක වෙම්, හෙවත් ඔවුන් සතුටු කිරීමෙහි නියැළි වෙමි.)

මෙහිද මූණුවර යට කී සේමය.

මෙසේ මුන්වහන්සේගේම කෘතියයි ප්‍රභාස්වරව පෙනෙන් නාවූ සිද්ධාන්ත සඞ්ග්‍රහය මුන්වහන්සේ විසින් කරනලද්දේ ප්‍රති රාජ පරිවෙණය පිහිටුවා එහි ප්‍රධානත්වය උන්වහන්සේට පිළි ගැන්වීමෙන් පසුය. ප්‍රතිරාජ පරිවෙණය කරනලද්දේ යථොක්ත විතීය පරාක්‍රමබාහු රජතුමා විසින් ලඞ්කාවෙහි සියලුම ශත්‍රැපද්‍ර වයන් නිවාරණයකොට ශාස්ත්‍රයත් ශාසනයත් නැවත වඩවනු පිණිස දෘඪොත්සාහයෙන් ක්‍රියාකරනු ලබන්නාවූ කාලයෙහිය. ඉනුත් රාජයාගේ රාජ්‍යකාලයෙහි අවසාන භාගයෙහිදී පමණ

වියයි මහාවංසයෙහිද පූජාවලියෙහිද ආවාවූ කථා තයින් පෙනේ. මේ රාජයාගේ නිධනය වූයේ ක්‍රි. ව. 1275 හි දීය. එහෙයින් මේ ග්‍රන්ථයෙහි නිර්මාපණය වූයේ ඊට අවුරුදු ස්වල්පයකට පූර්වයෙහි විය යුතුයි. ක්‍රි. ව. 1250 වද 1275 වද අතරෙහිවූ පඤ්චවිංශති වර්ෂයෙන් යම්කිසි කාලයකදී මෙය කරනලද්දේයයි පිළිගැනීම යොග්‍ය සේ පෙනේ.

මේ කාලයෙහි නිපදවනලද සියලුම ග්‍රන්ථයන්ගේ නිර්මාපණයට මූලහෙතු වූයේ කෙරලයන් විසින් කරනලද පොත්පත් විනාශය කරණකොටගෙන අභාවප්‍රාප්තවූ ශාස්ත්‍රය නැවතත් දිවුණුකරගැනීම පිණිස හැකි පමණින් මාගීයන් සලස්වාගැනීමෙහි අභිලාෂය වේ. සංස්කෘත පක්ෂයෙහිද මාගධී පක්ෂයෙහිද ධර්මවිනය පක්ෂයෙහිද තිසි මාගීයන් සලස්වාගැනිම ජම්බුද්වීපයෙන් ලබනලද ආධාරොපකාරයෙන් සුකර විය. කියනලද මැයි :-

අථාගම ධරාථෙරා – දීපෙසම්ං විරලා ඉති
පොත්ථකානිපි සබ්බානි – ආනෙත්වා ජම්බු දීපතො.

ආගමෙසු තථා සබ්බ – තක්ක ව්‍යාකරණා'දිසු
සික්ඛාපෙත්වා බහු භික්ඛු – කාරාපෙසි විචක්ඛණෙ.

(තවද ආගමධාරිවූ ස්ථවිරයෝ මේ ද්වීපයෙහි විරලයයි එබඳු ස්ථවිරයන්ද, සියලු පුස්තකයන්ද ජම්බුද්වීපයෙන් ගෙන්වා –
ආගම ධර්මයන්හිද එසේ තර්ක ව්‍යාකරණාදි ශාස්ත්‍රයන්හිද බොහෝ භික්ෂූන් ශික්ෂිත කරවා විචක්ෂණයන් කරවී.)

මෙසේ ජම්බුද්වීපයෙන් ගෙන්වාගත්තාලද සියලුම පොත්පත් නම් සංස්කෘත, මාගධි, ප්‍රාකෘත, ද්‍රවිඩ, ග්‍රන්ථයන් මුත් සිංහල ග්‍රන්ථයන් විය නොහැකි. එහෙයින් සිංහල භාෂාවෙහි පුනරුද්දීපනය පිණිස කටයුතුවූ සඞ්ග්‍රහයන් ඒ භාෂාවෙන්ම ශෙෂව තිබුණාවූ යම් යම් ග්‍රන්ථයන්ගේ සමවලොකනයද ඇතිව කටයුතු බැව් ප්‍රත්‍යක්ෂය. මෙසේ සමවලොකනය පිණිස ශෙෂව තිබුණාහු යයි දැනට දන්නාලද ග්‍රන්ථයෝ නම් මූවදෙව්දාවත, සසදාවත සියබස්ලකර, එළුසඳස, දහම්ගැටය, දම්පියාඅටුවා ගැටපදය, මහාබෝධිවංශ ගැටපදය හා දැනට අවිද්‍යමානවූ අසක්දා කව, මියුරුසඳෙස – යන මොව්හු වෙත්. මේ නොයෙක් ග්‍රන්ථයන්ගේ අවලොකනයෙන් ප්‍රකෘතිමත් කරගත්තාලද ශාස්ත්‍රාගම ඇති පරාක්‍රමබාහු රජතුමා විසින් යටකීසේ අතිශයින් ජෙකවූ කව්සිළුමිණ නම් මහාකාව්‍යය නිපදවනලදී. විශුද්ධිමාර්ගයට විස්තර

සන්නයක්ද ලියනලදී. එසේම මයුරපාද පරිවෙණාධිපති ස්වාමීන්වහන්සේ විසින් පූජාවලිය නම් මධුරවූ ධර්මප්‍රකරණය කරනලදී. අරණ්‍යවාසි වෛදෙහ ස්වාමීන්වහන්සේ විසින් ස්වභාෂා ශබ්දලක්‍ෂණයක් හෙවත් සිංහල ව්‍යාකරණයක් කරනලදී. එසේම අනවමදර්ශි මහා ස්වාමීන්වහන්සේ විසින් සිදත්සඟරා නම් මේ හෙළ වියරණය නිපදවනලදී.

උද්දිෂ්ටවූ ග්‍රන්ථයන් අතුරෙන් ප්‍රථම කී කව්සිළුමිණ කරන ලද්දේ සිදත් සඟරාවට පූර්වයෙහිය. ඒ බව සිදත් සඟරාවට ඒ උතුම් ග්‍රන්ථයෙන් නිදසුන් ගෙනහැර දක්වීමෙන් පෙනේ. ඒ කාව්‍යය අතිශයින් උත්කෘෂ්ටමැයි. එතකුදු වුවත් එබන්දක් නිපද වීම සාහිත්‍ය ශාස්ත්‍රයෙහි හසළාවූ විශාරද බුද්ධි ඇති උසස් ජේක යකුහට බැරෑරුම්වූ කර්තව්‍යයක් නොවේ. ඒ පිණිස ගුරූපදෙශ යන් ගැනීමට දඹදිවින් ගෙන්වනලද සියලුම සංස්කෘත මාගධී ග්‍රන්ථයන් තිබුණු හෙයිනි. එහෙත් සිංහලභාෂාවෙහි පෙර සිට පැවත ආවාහුයයි සිතිය යුතුවූ සියලුම ව්‍යාකරණ ග්‍රන්ථයෝ මේ කාලයෙහි විනාශභාක්ව තිබුණාහුයයි සිතිය යුතුබව පෙනේ. ගෞරවාහී උසස් පඬිවරයන්වහන්සේලා දෙනමක් විසින්ම ව්‍යාකරණ යුග්මයක් නිපදවීමට හෙතුව නම් එයින් පැවති මහත් හානිය හැකි පමණින් තාවත් වශයෙන් පිරිමසා ලීමේ අභිලාෂය විය යුතුයි. මූන්වහන්සේලාගේ මේ ප්‍රයත්නය ගැන කටයුතුවූ ස්තුතිය නම් අප්‍රමාණ වේ. භාෂාවම බලා එය විග්‍රහ කොට එහි සඞ්කීර්ණත්වයෙන් පැවති සියලු නානාවිධ ක්‍රමයන් නිරවුල් කොට පිළිවෙළ යොදා එකිනෙක වෙන් වෙන්ව පෙන්වමින් අලුතුවෙන් ශාස්ත්‍රයක් නිපදවාලීම ලෙහෙසි පහසුවූ වැඩක් නොවේ. මෙසේ වෛදෙහ ස්වාමීන්වහන්සේ විසින් කරනලද ව්‍යාකරණය දැනට අවිද්‍යමාන හෙයින් ඒ ගැන යමක් කියනොහැකි නමුත් අනවම දර්ශි ස්වාමීන්වහන්සේගේ සිද්ධාන්ත සඞ්ග්‍රහය දැනට ෂට් ශත වර්‍ෂාධික කාලයක් සියලු පඬිවරයන්ගේ ගරු සම්මානය ලබමින් එන හෙයින්ද, මේ දීර්ඝකාලය තුළෙහි ඊට අධිකයෙන් ගරුවූ ව්‍යාකරණ ග්‍රන්ථයක් තවමත් නොනිපන් හෙයින්ද, එහි ඇත් තාවූ සාරත්වය හා සම්භාවනීය භාවයද ප්‍රතීත වේමැයි.

මේ ග්‍රන්ථය කරන ලද්දේ බොහෝ සෙයින්ම කාව්‍යශාස්ත්‍රාභි ලාෂිවූ ආධුනිකයන්ගේ ප්‍රයොජනය පිණිස බව පොතෙහි සැම තන්හි කාව්‍ය ප්‍රබන්ධයෙහි ප්‍රයොජනවත්වූ උපදෙස් දීමෙන් හා ඉෂ්ටාතිෂ්ටාධිකාරය අලඞ්කාරාධිකාරයයි සාහිත්‍යයෙහි ඉවහල්වූ අධිකාර වයක්ද පොතට ඇතුළත් කිරීමෙන් පෙනේ. යථාර්ථකතා

හෙතුවෙන්ම පොත කිසි තැනෙක ගද්‍යයෙන්ද යුක්ත නමුදු සාමාන්‍ය වශයෙන් පද්‍ය රචනා මුඛයෙන් නිපදවනලදි. පද්‍යද එකලට කාව්‍යබන්ධයෙහි පැවති ගී විය. එම හෙතුවෙන්ම පොතෙහි රචනාව පිණිස යොදාගන්නාලද භාෂාවද ඉතා පුරාණ කාව්‍ය භාෂාව මුත් එකලට පැවති සාමාන්‍ය සිංහල භාෂාව නොවන බව පූජාවලිය හා සමකර බැලීමෙන් පෙනේ.

මේ ග්‍රන්ථයෙහි ප්‍රශංසාව අප්‍රමාණ බැව් කලින් කීමු. මේඋසස් ග්‍රන්ථය කළාවූ අනවමදර්ශි ස්වාමීන්වහන්සේගේ කීර්තිකදම්බය හැමකල් උද්දීපනව බබළාමැයි.

මෙසේ මේ ග්‍රන්ථය අතිශයින් ප්‍රශස්ත නමුදු උසස් නමුදු හැමකල් ආදරණීය නමුදු එහි නිෂ්පත්ති කාලය දෙස බලනකල ඒ ග්‍රන්ථයෙහි යම් යම් ස්ඛලිතයන් ශාස්ත්‍රාලොකය බොහෝ දීප්තියෙන් බබළන්නාවූ මේ කාලයෙහි දක්නා ලැබෙත්හොත් ඒ විසමයට කරුණක් නොවියයුතු. එසේ යමක් දක්නා ලැබේ නම්, තවද ග්‍රන්ථය නිපදවූ ස්වාමීන්වහන්සේ කෙරෙහි අපගේ සැබෑ ගෞරවාදරයක්ද පවතිනම්, අපගේ යුතුකම වන්නේ එබඳු ස්ඛලිතයන් වසා තබාගැනීම නොව ප්‍රසිද්ධයේ ඒවා ශොධනය කොට ලීම හෝ එසේ නොහැකි තැන්හි ලොකයාගේ නුමුළාව පිණිස පෙන්වා දීම හෝ වේ. එයින් මුන්වහන්සේගේ මේ ග්‍රන්ථනිර්මාපණයෙන් අභිප්‍රෙතවූ විපුලාර්ථසිද්ධියට අපිද ඉවහල් වමු, අනභිප්‍රෙතවූ අනර්ථසිද්ධිය වළක්වමෝමැයි.

එහෙත් පුරාණ ග්‍රන්ථයෙක්හි දොෂයන් විද්‍යමාන විය හැකියයි සිතීම මෙරටෙහි බොහෝ අයවලුන්හට අතිශයින් දුෂ්කරවූ කාර්‍යයකි. මේ සඞ්ඛ්‍යාවෙහි බොහෝ උසස්වූ පඬිවරයෝද ඇතුළත් වෙති. එසේ යම්දොසක් තිබුණත් වර්තමාන කාලයෙහි යමකු විසින් එය කෙසේ සොයාගතහැකි වන්නේදැයි ඔව්හු සිතත්. ඔවුන්ගේ තර්කප්‍රබන්ධය මෙසේ හෙයින් සිද්ධාන්ත සඞ්ග්‍රහයෙහි කර්තෘවරයන්වහන්සේ හට කිසිවක් වැරදුණේය යන සඞ්කල්පය පවා අපගේ පණ්ඩිතාපණ්ඩිත සියලු සිංහල ජනතාවට කිසිකලෙක චිත්තාරූඪකරගත නොහැකිවූ චෙතනාවක්ව පවතී. මේ උතුම්

අර්ථකථනයෙහි කිසිතැන පසුකල සඤ්ජාත වූහයි සිතිය යුතුවූ දූෂණයන් තවමත් ඇති බව පෙනේ.

අපගේ මේ පරීක්‍ෂණයෙහිදී පළමුකොට සිදත්සඟරුවෙහි ආචාර්‍ය සම්ප්‍රදායයෙන් ඉතා මැනවියයි පිළිගෙන එන්නාවූ පාඨය දක්වා තදනන්තරව පුරාණ සන්නය සාමාන්‍යයෙන් අනුගමනය කෙරෙමින් දූෂිතවූ තැන්හි පමණක් එය අනුවනොගොස් අර්ථ කියා ඊළඟට ආශය ග්‍රහණය සුකරවනු පිණිස එම පුරාණ සන්නයෙහි ඉගැන්වීමට අනුරූපසේ විස්තරයක්ද කරනු ලැබේ.

එසේම යොග්‍ය තන්හි අපගේ පරීක්‍ෂණයක් කෙරෙමින් ඒ මගින් සවභාෂායෙහි ශාස්ත්‍රීය ධර්මයන් සාරාංශමාත්‍රයෙන් දක්වමින් ව්‍යාකරණ මීමාංසාවක්ද කරනුලැබේ. ඒ මේ ක්‍රියමාණ මීමාංසා විධිය නීතින්ගේ සාරදර්ශිනයක් හෙයින් ඊට අන්වර්ථ වශයෙන් නිතිසාර යයි කියනු ලැබේ.

යට දක්වූ කරුණු විසින් මේ පරීක්‍ෂණයෙහිදී සම්ප්‍රදායයෙන් පිළිගෙන එන්නාවූ පාඨයෙහිද සන්නයෙහිද එකසේ පෙනෙන්නාවූ ශාස්ත්‍රරීතියකට හෝ නීතියකට හෝ වඟකිය යුතු වන්නේ ලේඛකයන් විසින්යයි නොදක්වනු ලැබේ.

# ප්‍රථම පරිච්ඡේදය.

## සංඥා ධිකාරය.

### සූත්‍ර පාඨය. 1-5 වියරණ විදි.

1. මහද ගඳ කිළි කර–සව්නෝ ගෙවා දත්හට
දුහුනන් දැනුම් සඳහා–කරනෙම් සිදත් සහරා.

2. සඳරුත් විදි සියල්–අනුරූ සේ පියෝනන්
ඉති සන් සඳ සමස් ඈ–වහරනු සෙරෙන් සපයා.

3. මෙ සබඳ සිදත් පිරියත් හිමි.

4. එබැවින් සන් සඳ–ලිඟු විබත් සමස් පියවි
පස කිරිය ලොප'දෙස්–අගම් පෙර රූ දෙරූ පෙරළි

5. වැඩි අඩු නිපා නියම්–අනියම් අවිදුමන් විදි
වී විසි වැදූරූම්–වියරණ විදි සපයා.

### 1–5 ව්‍යාඛ්‍යා.

1. සව්නෝ ගෙවා දත්හට, සකල ඥෙය මණ්ඩලය නිශ්ශෙෂ කොට දත් තැනැත්තහුට හෙවත් සර්වඥයන්වහන්සේහට; මහද, මාගේ හෘදය; ගඳ කිළි කර, ගන්ධකුටිකාවක් කොට; දුහුනන් දැනුම් සඳහා, අාධුනිකයන්ගේ ඥානය පිණිස; සිදත් සහරා, සිද්ධාන්ත සඞ්ග්‍රහ (නම් ප්‍රකරණයක්); කරනෙම්, නිපදවන් නෙමි.

2. සියල් සඳරුත් විදි, සකල ශබ්දාර්ථ විධිහු; සේ පියෝනන්, ඡෙකයන්ගේ ප්‍රයොගයන් හා; අනුරූ, අනුරූප වෙත්; ඉති, මෙසේනුයි; සන්, සඥ්ඥය; සඳ, සන්ධිය; සමස්, සමාසය; ඈ, යන මේ ආදිය; වහරනු සෙරෙන්, ව්‍යවහාරානුසාරයෙන්; සපයා, සම්පාදනය කරව්.

3. සිදත් පිරියත් හිමි, සිද්ධාන්තයන්ගේ පර්‍ය්‍යාප්තය ඓහෝ නොහොත් මේ සිදත් සහරුවෙහි කෙළවර දක්වා; මෙසබඳ, මේ අඩහසූත්‍රය සම්බන්ධ වේ.

4. එබැවින්, එසේ හෙයින්; සන්, සඤ්ඥය; සඳ, සන්ධිය; ලිඟු, ලිඞ්ගය; විබත්, විභක්තිය; සමස්, සමාසය; පියවි, ප්‍රකෘතිය; පස,ප්‍රත්‍යයය; ලොප්, ලොපය; අදෙස්, ආදෙශය; අගම්,ආගමය; පෙර රු, පූර්වරූපය; දෙරු, ද්වෛරූප්‍යය; පෙරළි, විපර්‍ය්‍යාසය;—

5. වැඩි, වෘද්ධිය; අඩු, හානිය; නිපා, නිපාතනය; නියම්විදි, නියමවිධිය; අනියම්විදි, අනියමවිධිය; අවිදුමන්විදි, අවිද්‍යමාන විධිය; වී, කියා; විසිවැදෑරුම්, විංශතිප්‍රකාරවූ; වියරණවිදි, ව්‍යාකරණ විධීන්; සපයා, සම්පාදනය කරව්.

## 1–5 විස්තරය. ව්‍යාකරණ විධි.

### 1. මහද ඈ.

(1) සියලු කර්තව්‍යයන්ගේ ආරම්භයෙහිදී ඉෂ්ට දෙවතානු සමරණය ශිෂ්ටාචාර හෙයින් මේ ග්‍රන්ථය නිපදවන්නාවූ ආචාර්‍ය්‍යපාදයෝ මෙහි "මහද ගඳකිළි" යනාදියෙන් ස්වකීය ඉෂ්ට දෙවතානුසමරණය කළහ. සර්වඥයන්වහන්සේහට ස්වකීය හෘදය සුවඳ ගෙයක් කරනලද්දේ උන්වහන්සේ එහි වැඩහිඳුවා ගැනීම පිණිසයි. සුවඳ ගෙයෙක්හි මෙන් ස්වකීය හෘදයයෙහි සර්වඥයන් වහන්සේ වැඩහිඳුවා ගැනීම නම් භක්ත්‍යාදරයෙන් උන්වහන් සේ මෙනෙහිකර ගැනීමයි. නමස්කාරයද ඒ වේ.

(2) මෙහි **දක්හට** යයි කියූ තන්හි දක් යනු නාම විශෙෂණයක් නමුදු මෙහි නාමාර්ථයෙහිම යොදා ඉන් පරව 'හට' යන ප්‍රත්‍යය යෙදූ සැටි සලකනු.

(3) ග්‍රන්ථාරම්භකවූ මේ වාක්‍යය ඉෂ්ටාර්ථසිද්ධිය පිණිස හෙයින් සුබලකුණෙන් ප්‍රාරබ්ධවිය යුතුව තිබුණේය. එහෙත් මෙය අපායාක්ෂරයක්වූ 'ම' යන්නෙන් ආරබ්ධ කරනලදී.

දෙවතා වාචකාඃ ශබ්දා–යෙච භද්‍රාදි වාචකාඃ
තෙ සර්වේ නෛව නින්ද්‍යාඃ ස්‍යුර්–ගණතො ලිපිතොපිවා

යන මේ ආචාර්‍ය්‍යොක්තියද මෙහි නොයෙදේ. එහි අර්ථය නම් ග්‍රන්ථාරම්භයෙහි දෙවතා වාචකවූද භද්‍රාදි වාචකවූද යම් ශබ්ද කෙනෙක් ඇත්ද ඒ සියල්ලෝ ගණ වශයෙන් හෝ වර්ණ වශයෙන් හෝ නින්ද්‍ය නොවන්නාහුමය යනුයි. නමුත් මෙහි "මහද"

යනු දෙවතා වාචකවූ හෝ භද්‍රාදි වාචකවූ හෝ ශබ්දයක් නොවේ. එයින් මූන්වහන්සේ ඉෂ්ටානිෂ්ට ලක්ෂණයන් මේ පොතෙහිම අන් තැනක ඉගැන්වූ නමුත් ඔවුන් ගැන කිසිම විශ්වාසයක් නොකළ බව පෙනේ.

(4) 'කරනෙම්' යනු කරන්නෙම් යයි කියයුතුතන්හි පූර්ව නකාරයාගේ ලොපයෙන් සිදු බැව් දතයුතුයි. එකමාත්‍රයක් පූර්වස්ථකල්හි මේ ලොපය සිදු නොවේ. යන්නෙම්, එන්නෙම්, දෙන්නෙම් යනාදීහු යනෙම්, එනෙම් යනාදි වශයෙන් නොසිටිත්.

(5) 'සිදත් සඟරා'යයි යූ තන්හි සිද්ධාන්තයන්ගේ සඞ්ග්‍රහය සිද්ධාන්ත සඞ්ග්‍රහ නම්වේ. සිද්ධාන්තයෝ නම් ශඞ්කාවෙන් එකාන්ත විනිර්මුක්තවූ පසස්නාලද ධර්මයෝ වෙත්. එයින් සිදත් සඟරා තෙම එකලට පැවති අශඞ්කිත ව්‍යාකරණ ධර්මයන් සඞ්ග්‍රහකොට කරනලද ග්‍රන්ථයකි. හොයි ශාස්ත්‍රීය ග්‍රන්ථයත් මෙසේම හෙයින් මීට මේ නම කෙසේ තබන ලද්දේද යනු පසුව මතිමාත්‍රයෙන් දක්වනු ලැබේ.

## 1-5 නිති සාරය. ව්‍යාකරණවිධි.

(1) ව්‍යාකරණය විධි විස්සකින් යුක්ත බව මෙහි කියා තිබේ. මේ විධි යන්නෙන් කියවෙන්නේ ව්‍යාකරණයෙහි ශාස්ත්‍ර ක්‍රමද නැතහොත් ව්‍යාකරණ ග්‍රන්ථයෙහි කාණ්ඩදැයි පැහැදිලිව නොපැනේ. සන් යයි වර්ණ විභාගාදිය පිණිස කීතන්හි පෙනෙන්නේ ව්‍යාකරණ කාණ්ඩයකි. විබත්යයි කී තන්හි පෙනෙන්නේ නාමය සම්බන්ධවූ ව්‍යාකරණ ක්‍රමයකි පස ඉසි කීතැන පෙනෙන්නේ මේ දෙකම නොව ව්‍යාකරණයෙහි ප්‍රස්තුතවූ එක් තරා වාගන්ත විෂයයකි. මෙසේ මේ විධි යනු විෂමාර්ථ හෙයින් සිංහල ව්‍යාකරණය විධි විස්සකින් යුක්තයයි කී තන්හි එයින් ගත යුතුවූ සාරාර්ථයක් නොපැනේ. මෙහි එම විධීන් සැලකිය හැකි වන්නේ ග්‍රන්ථ විෂයයන් වශයෙන් පමණකි. එසේ ගත්කල්හි ඔව්හු තූමූ ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි විධීන් නොව මේ ග්‍රන්ථයෙහි විෂයයෝ හෙවත් කාණ්ඩ අනුකාණ්ඩාදීහු වෙත්. පටුනෙහි දක්විය යුතුවූ ශිර්ෂය, අනුශිර්ෂය, යන මොවුන් වශයෙති.

(2) තවද මෙහි විධි යන්නෙන් කවර නම් අර්ථයක් හෝ අර්ථ කිහිපයක් හෝ ගන්නාලද්දේ වීනමුදු මෙහි කී ව්‍යාකරණ විධි විස්ස නම් ශාස්ත්‍රානුකූලවූ බෙදීමක් නොවේ. වෘක්ෂයක් වර්ණනය කරන කල්හි එහි ප්‍රධානාඞ්ගයෝ නම් මූලය, කඳය, ශාඛාවෝය, ත්වක්යයි පළමුකොට බෙදා පෙන්වා පසුව මේ එක් එක් අඞ්ගයෙහි ප්‍රත්‍යඞ්ගයන් ප්‍රපඤ්චයෙන් විස්තර කිරීම ශාස්ත්‍රීය වේ. එසේ නොව ගසක් නම් කඳය, රෙණුය, මල්ය, මූල්ය යනාදි වශයෙන් නානාභෙද වන්නේයයි සඞ්කරයෙන් දක්වා ලීම ශාස්ත්‍රීය නොවේ. අඞ්ගය, ප්‍රත්‍යඞ්ගය, අනුප්‍රත්‍යඞ්ගය යන මොවුන් කෙරෙහි ක්‍රමයෙන් කටයුතුවූ මනොගමනය වියවුල්වන හෙයිනි.

(3) තවද සත් යනුවෙන් මෙහි පෙන්වන ලද්දේ එකම ව්‍යාකරණ විධියක් නොව සන්ධියෙහි පටන් අවිද්‍යමාන විධිය දක්වා ව්‍යාකරණ කාණ්ඩ දශකවයක් වෙන් වෙන් වශයෙන් හඳුන්වා දී ඔවුන්ට නාමාරොපණය කිරීම වේ. මේ හඳුන්වා දීමට ප්‍රථම වර්ණ විභාගයක්ද කරනලදි. එම වර්ණ විභාගය සම්බන්ධවූ ව්‍යාකරණ කාණ්ඩයට කිසිම නාමයක් දී නොමැත්තේය. ඒ මහත් ඌනතාවකි. එහෙයින් එම ඌනතාපූරණය පිණිස යම් නාමයක් යොදාගැනීම රුසිවේ. වණ විබායයි අප විසින් මෙ ග්‍රන්ථයෙහි යොදනුලැබේ. වර්ණ විභාගය හෙවත් වර්ණයන් සම්බන්ධ වූ පරීක්ෂණය යනු එහි අර්ථයයි.

(4) වර්ණ විභාගය ව්‍යාකරණයෙහි ප්‍රථම කාණ්ඩයවූ කල්හි න්‍යායානුකූලව ගතයුතුවූ ද්විතීය කාණ්ඩයනම් නිරුක්තිය හෙවත් පදයන්ගේ ව්‍යුත්පත්තිය සම්බන්ධවූ විභාගය වේ. ලොප්, අදෙස්, අගම්, පෙරරූ, දෙරූ, පෙරළි, වැඩි, අඩු, නියම්, අනියම, අවිදු මන් යනමේ සියලුම විධීහු එහි අඞ්ගයන් වශයෙන් ඇතුළත් වෙති.

(5) එසේම ව්‍යාකරණයෙහි න්‍යායානුකූලව ගතයුතුවූ තෘතීය කාණ්ඩය නම් පදසිද්ධියයි. උපසග, පියවි, නිපා (නිපාත), සමස් යනු මෙහි ප්‍රධානාඞ්ගයෝ වෙත්. ධාතු ශබ්ද දෙදෙනා පියවි ප්‍රසඞ්ගයෙන් ලැබෙත්; පස යනු ද පියවි ප්‍රසඞ්ගයෙන්

උපලක්ෂ්‍ය වේ; ලිඟු, විබත්, යනු සද පියවි ප්‍රසඞ්ගයෙන් ලැබෙත්; එක් ක්‍රමයකින් විබත්, පස, යනු මේ උභය පක්ෂයට සාධාරණද වෙති.

(6) එකවචන බහුවචන යන වචනවයද, ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ යන පුරුෂත්‍රයද, කාරක, කාල යනාදි වෙනත් නොයෙක් ධර්මයන් හා ඉතා විශෙෂයෙන් සැලකිය යුතුවූ නිපාතය හා යටකී උපසර්ගයද විසි විධියෙන් මගහැරී ගොස් තිබේ. ඔව්හුද පදසිඞි ප්‍රස්ථානයෙන් දර්ශිතියයෝ වෙත්.

(7) චතුර්ථ ව්‍යාකරණ කාණ්ඩය නම් වාක්‍ය යොජනාවයි. ව්‍යාකරණයෙහි පරමාර්ථයද මේ පිණිස මග පහදා දීම වේ. වාක්‍යයක් පිණිස් නම් උක්තවස්තුවය, උක්තිය නොහොත් නිර්දෙශයයි අඞ්ගදෙකක් අත්‍යවශ්‍යක වෙති. කිසිවිටෙක අනුක්තියය, විශෙෂණයයි තවත් අඞ්ගදෙකක් හෝ ඉන් එකක් හෝ අතිරෙකයෙන් ලැබේ. එයින් වාක්‍යයක් තෙම අඞ්ග දෙකකින් හෝ තුනකින් හෝ සතරකින් හෝ යුක්තවෙයි.

(8) මෙහි වර්ණ විභාගය, නිරුක්තිය, පදය, වාක්‍යය යන කාණ්ඩසතරෙන් ව්‍යාකරණ ශාස්ත්‍රය තෙම සම්පූර්ණ වෙයි. ඒ සතරෙහි සියලුම ව්‍යාකරණක්‍රමයෝ අඞ්ග ප්‍රත්‍යඞ්ගාදි වශයෙන් ඇතුලත් වෙති. ඒ මෙසේයි:—

### ව්‍යාකරණ ශාස්ත්‍රය.

| කාණ්ඩ. | 1<br>වර්ණ විභාගය. | 2<br>නිරුක්තිය. | 3<br>පදය. | 4<br>වාක්‍යය. |
|---|---|---|---|---|
| අනුකාණ්ඩ | වණ<br>සද | ලොප් පෙරළි<br>අදෙස් වැඩි<br>අගම් අඩු<br>පෙරරූ නියම<br>දෙරූ අන්‍යම<br>අවිදුමත් | උපසග<br>පියවි: { ද, සද }<br>නිපා (නිපාත)<br>සමස් | උත් (සිඳෙ)<br>නිදෙස්(සිදත්)<br>අනුත්<br>පවසෙසුත් |

සංලක්ෂ්‍යය 1.—මෙයින් ව්‍යාකරණයෙහි චතුරඞ්ගයවූ කාණ්ඩ සතර එක් එක් අඞ්ගයෙහි ප්‍රත්‍යඞ්ගයත් සමග දක්වන ලදි. මෙහි සන්දර්ශිත නුවූ අනු ප්‍රත්‍යඞ්ගාදි වශයෙන් ලැබෙන්නාවූ තවත් ව්‍යාකරණ ලක්ෂණයන් බොහෝ බැව් සලකනු.

සංලක්ෂ්‍යය 2.—සිදතෙහි "නිපා" යන්නෙන් කියනලද නිපාතනය මෙහි නොදක්වනලදි. එබඳු ව්‍යාකරණ විධියක් නොමැති හෙයිනි. කොයි කොයි ව්‍යාකරණ ක්‍රමයටත් අනනුරූපභාවයෙන් වන්නාවූ සිද්ධිය නිපාතනය වේ. එහි නියම තැනක් හෝ නියම් සවභාවයක් හෝ නොමැත්තේය.

2. සදරුත් විදි සියල්
අනුරූ සේ පියෝනත්.

මෙයින් ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි මූලාධාරය දක්වනලදි. පුරාණ හෝ වර්තමාන හෝ උසස් පඬිවරයන්ගේ ප්‍රයෝගයන්හි නොහොත් ග්‍රන්ථරචනාවන්හි විද්‍යමානවූ යම් සාධාරණවූ වාග් ව්‍යවහාරයෙක් ඇත්ද ඒ ව්‍යවහාරය බලා එයින් ගතයුතුවූ ශබ්දාර්ථ රීතීන් අනු පිළිවෙළ යොදා දැක්වීමෙන් නිපදවනු ලබන්නාවූ ශාස්ත්‍රය තෙම ව්‍යාකරණ ශාස්ත්‍රය වේ. එයින් මේ ශාස්ත්‍රය වනාහි යම් පුද්ගලයකුගේ ප්‍රඥප්තියක් නොවේ. භාෂා ධර්මයන් නාමාරූඪ කොට ගෙනහැර පෑමකි. ඔවුන්ගේ හඳුන්වාදීම ශිෂ්ටව්‍යවහාරයෙහි පෙනෙන්නාවූ සේය. එයින් ඊට ප්‍රමාණයු නම් ශිෂ්ටප්‍රයොගයමැයි. ඒ සම්බන්ධයෙන් "ශිෂ්ට ප්‍රයොගඃ සාධවඃ" යයි පුරාණ වෛයාකරණයෝ කීහු. ශිෂ්ට ප්‍රයොගයෝ යගපත්‍ය යනු එහි අර්ථයි. මේ ශාස්ත්‍රය පිණිස යනු ශෙෂයි.

## සූත්‍ර පාඨය. 6–10. වර්ණ විධා.

6. පණකුරු ගතකුරු ඈ නම් ලකුණෙන් හඳුන්වනු සන්නම්.
7. පණකුරු පසෙක් එද-ලුහුගුරු බෙයින් දස වේ
ගතකුරුද වේ විස්සෙක්-වහරට යුහු සිය බසැ.
8. අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ මෙ දස පණකුරු නම්.
9. ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව ස හ ළ අං
මෙ විසි ගතකුරු නම්.
10. ආ ඊල් ඌල් ඒල් ඕනා ඈහි හුදුවද
සා සී සූ සේ සෝ ඈහි ගත් අරුණු කර උසුරු වනු
හෙයින්ද ගුරු පසද-
තමා වදනය පොමින්-තොඉකතැයි හැංගේ;
කරනිඳුහු ඉංගෙන්-සසමෙනද තැසී පැසැහී;—
මේ ඈ කව් ලැකියෙහිදු-
හං මැටි වංඇපල ඈ ලෙව් ලැකියෙහිදු සපුරු උසුරුමනු
හෙයින්ද-

රඟ බහහර ඇඟි උනුමතින් උසුරුවනු හෙයින්ද-
මෙහි බිඳුද් රුසි. මේ ඇඟි.

## 6-10. ව්‍යාඛ්‍යා.

6. පණකුරු ගතකුරු ඈ, ප්‍රාණාක්ෂර ගාත්‍රාක්ෂර යනාදිය; නම් ලකුණෙන්, නාමයෙන් හා ලක්ෂණයෙන්; හඳුන්වනු, සංඥාපනය කිරීම, සන් නම්, සඤ්ඥා නම්.

සියබසැ, ස්වකීය භාෂායෙහි; වහරට යුහු, ව්‍යවහාරයට යොග්‍යවූ; පණකුරු, ප්‍රාණාක්ෂරයෝ වනාහි; පසෙක්, පඤ්චකයෙකි. එද, ඒ පඤ්චකයද; ලුහුගුරුබෙයින්, ලඝුය, ගුරුය යන භේදයෙන්; දසවේ, දශකයෙක් වේ. ගතකුරුද, ගාත්‍රාක්ෂරයෝද; විස්සෙක් වේ, විංශතියක් වෙත්මැයි.

8. අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ මෙදස, අ-ආ, ඉ-ඊ, උ-ඌ, එ-ඒ, ඔ-ඕ, යනමේ දශකය වනාහි; පණකුරු නම්, ප්‍රාණාක්ෂර නම් වෙති.

9. ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව ස හ ළ අං, ක-ග, ජ, ට-ඩ-ණ, ත-ද-න, ප-බ-ම, ය-ර-ල-ව, ස-හ-ළ, අං—යන; මෙවිසි, මේ අක්ෂර විංශතිය තොමෝ; ගතකුරු නම්, ගාත්‍රාක්ෂර නම්වෙති.

10. ආ, ආයුෂ්වාචිවූ ආ ශබ්දය; ඊල්, ඉලා වාචිවූ ඊල් ශබ්දය; ඌල්, ප්‍රස්‍රවණ වාචිවූ ඌල් ශබ්දය; ඒල්, ඒලවාචිවූ ඒල් ශබ්දය (ඒල නම් ඉදුණාවූ මිගෙඩියයි-පාළියෙනි); ඕනා, පතනාර්ථවාචිවූ ඕනා ශබ්දය; ඈහි-යනමේ ආදියෙහි; හුදුවද, කෙවල වශයෙන්ද;—

සා, ශාබාදි වාචිවූ සා ශබ්දය; සි, සිංහාදි වාචිවූ සි ශබ්දය; සූ, සූත්‍රාදි වාචිවූ සූ ශබ්දය; සේ, ශේකාදි වාචිවූ සේ ශබ්දය; සෝ, ශෝකාදි වාචිවූ සෝ ශබ්දය;—ඈහි, යනමේ ආදියෙහි; ගත් අරුණුකරු, ගාත්‍රාක්ෂරරූකොට; උසුරුවනු හෙයින්ද, උච්චාරණය කරන හෙතුවෙයන්ද; ගුරුපසද, ගුර්වක්ෂර පඤ්චකයද;—

තමා වදනය, තමාගේ වචනය; පොමින්, ප්‍රභුත්වහෙතුයෙන්; නොඉකතුැයි, නොඉක්මවත්යයි; හැංගේ, සඤ්ඥාත කාලේයි

හෙවත් සිතුයේයි; නරනිඳුහු, නරෙන්ද්‍රයාගේ; ඉඟෙන්, ඉංගිත යෙන් හෙවත් අභිප්‍රායයෙන්; සෙමෙන්, මන්දව; අද, ආගමනය කොට; පැසැහි, පාර්ශ්වයෙක්හි; නැසී, සමීපස්ථව;—මේ ඈ, යන මේ ආදිවූ; කව් ලැකියෙහිදු, කාව්‍ය ලක්ෂ්‍යයෙහිද;—

හංවැටි, තෘණෛණක විභාග වාචිවූ හංමැටි ශබ්දය (සම්මැටි වයි); වංඇපල, ඖෂධෛක විශෙෂ වාචිවූ වංඇපල ශබ්දය (පාවට්ටායි);—ඈ, යනමේ ආදිවූ; ලෙව් ලැකියෙහිදු, ලෞකික ලක්ෂ්‍යයෙහිද; සපුරා, සම්පූර්ණත්වයෙන්: උසුරුවනු හෙයින්ද; උච්චාරණයකරන හෙතුයෙන්ද;—

රඟ, නෘත්‍යාදිවාචිවූ රඟ ශබ්දය; බහහර, සුරාවාචිවූ බහහර ශබ්දය;—ඈහි, යනමේ ආදියෙහි; උනුමතින්, ඌන මාත්‍රයෙන්; උසුරුවනු හෙයින්ද; උච්චාරණයකරන හෙතුයෙන්ද;—

මෙහි, මේ අක්ෂර මාලායෙහි; බිඳුද, බින්දුවද; රුසි, අභිමතවේ.

මේ ඈයි, (අක්ෂර විචාරණය තෙම) මේ ආදි ආකාරයි.

## 6–10. විස්තරය. වර්ණ විභාගය.

(1.) මෙහි වනාහි ස්වකීය භාෂා ව්‍යවහාරයෙහි ඉවහල්වූ අක්ෂර මාලාව දක්වූහු. ස්වකීය භාෂා යන්නෙන් මෙහි ශුද්ධ සිංහල භාෂාව හෙවත් හෙළබස කියනලදී. සව්සිළුමිණ ආදි කාව්‍ය ග්‍රන්ථයන්හි පෙනෙන්නාවූ භාෂාවයි. මේ භාෂාවෙහි මහා ප්‍රාණාක්ෂරයෝ නොමැත්තාහ. සුළං යනාදි තන්හි හල් ඞ කාරයාගේ ශ්‍රැතිය ඇතත් එම අක්ෂරය ව්‍යවහාරයෙහි නොලැබේ. පඤ්ච යනාදි තන්හි පෙනෙන්නාවූ ඤකාර චකාරයෝ වර්ණවශයෙන් හෝ ශ්‍රැති වශයෙන් හෝ නොලැබෙත්. එසේම ශ ෂ යන දෙදෙනාද නොලැබෙත්.

තවද සංස්කෘත වර්ණමාලායෙහි පෙනෙන්නාවූ ඍ ඎ ඏ (ඐ) ඓ ඖ යනමේ ස්වරයන් හා "ඃ" යන විසර්ගයද එසේම සිය බසෙහි නොලැබෙත්.

(2.) අතික් අතට සංස්කෘත, මාගධී, ද්‍රවිඩ යනමේ භාෂාවන්හි නොපැනෙන්නාවූ අර්ධවර්ණාන්තයෙක් සිය බසෙහි පෙනේ. මෙය [illegible] නාමයෙන් සාමාන්‍ය ව්‍යවහාරයෙහි කියනුලැබේ.

පාලි සඤ්ඤොග යන්නෙති. සංයොග යනු එහි අර්ථයි. අන්‍යවර්ණයක් හා සංයුක්තව පවත්නා හෙයිනි. මේ අර්ධවර්ණාන්තයට නිදසුන් වශයෙන් රඟ, බඟහර යනමොවුන් දක්වූහු. මේ දෙතන්හිම ග කාරයා හා සංයොගයෙන් පෙනෙන්නේ හල් ඞ කාරයාගේ අර්ධයයි.

(3.) භාෂාවෙහි ලැබෙන්නාවූ අක්ෂරයන් ගෙනහැර බලන කල ඇතම්හු ස්වශක්තියෙන් උච්චාරණය කළ හැක්කෝ වෙත්. අ-ආ යනාදිහුයි. මොවුන්ට ප්‍රාණාක්ෂරයයි කියනුලැබේ. ඇතම්හු ප්‍රාණාක්ෂරයන්ගේ ආධාරයෙන් මිස උච්චාරණය කළ නොහැක්කෝ වෙත්. ක්-ග් යනාදීහුයි. ක් ග් දෙදෙනාට අ කාර රූඪකොට ගත්කල්හි කග යයි උච්චාරණය කළහැකි.

(4.) සිය බසෙහි වනාහි ප්‍රාණාක්ෂරයෝ ලඝු වශයෙන් පසෙක්ය ගුරු වශයෙන් පසෙක්දූයි දශයෙක් වෙති. ඒ මෙසේය :—

| | | | | | |
|---|---|---|---|---|---|
| ලඝු :— | අ | ඉ | උ | එ | ඔ |
| ගුරු :— | ආ | ඊ | ඌ | ඒ | ඕ |

(5.) ගාත්‍රාක්ෂරයෝ විස්සෙකි. ඒ මෙසේයි :—

ක ග, ජ, ට ඩ ණ, ත ද න, ප බ ම,
ය ර ල ව, ස හ, ළ, (අ) ං.

(6.) මේ එක් එක් අක්ෂරයට නියමවූ ශ්‍රාවයක් (ශ්‍රැති මාත්‍රයක්) ඇත්තේය; එහෙත් එරඹු කද යනාදී තන්හි පෙනෙන්නාවූ අර්ධ වර්ණාන්තය ඒ ඒ ආශ්‍රිතවූ වර්ණයෙන් තොරව දක්විය හැකිවූ නියත ශ්‍රාවයකින් වියුක්ත හෙයින් හෝ මෙහි පෘථග් වර්ණයක් වශයෙන් නොදක්වන ලදී.

(7.) මෙසේ හෙළු වර්ණ මාලාව අකුරු තිසකින් යුක්තයයි දක්වූහු.

(8.) මේ වර්ණයන්ගේ හෙවත් අක්ෂරයන්ගේ උච්චාරණය වන්නේ මුඛයෙනි. වර්ණයෝ තුමූ මුඛයෙහි පස් පළක උපදිත්. ඒ පස් පළට පඤ්ච ස්ථානයයි කියනුලැබේ. පඤ්ච ස්ථානය නම් මෙසේය:—

| | | එහි උපදින අකුරු. |
|---|---|---|
| කණ්ඨ ... | ගෙල නොහොත් උගුර | ... කණ්ඨජ |
| තාලු ... | යටිතල්ල නොහොත් දිවමුල | ... තාලුජ |
| මූර්ධන් ... | මුදුන නොහොත් උඩුතල්ල | ... මූර්ධජ |
| දන්තාඃ ... | දත් නොහොත් දත්මුල | ... දන්තජ |
| ඔෂ්ඨ්‍ය ... | දෙතොල | ... ඔෂ්ඨජ |

(9.) මේ උත්පත්ති ස්ථාන වශයෙන් බලනකල සිය බසෙහි වර්ණ විභාගය මෙසේය :—

| | | ප්‍රාණාක්ෂර. | ගාත්‍රාක්ෂර. |
|---|---|---|---|
| කණ්ඨජ | ... | අ ආ | ක ග ං හ |
| තාලුජ | ... | ඉ ඊ | ජ ය |
| මූර්ධජ | ... | ... ... | ට ඩ ණ ර ළ |
| දන්තජ | ... | ... ... | ත ද න ල ස |
| ඔෂ්ඨජ | ... | උ ඌ | ප බ ම ව |

අ ඉ දෙදෙනාගේ අත්‍යන්ත සම්මීලනයෙන් එ යන්නද එහි දීර්ඝාක්ෂරයවූ ඒ යන්නද සෑදෙත්. එසින් මොව්හු කණ්ඨතාලුජ වෙත්.

අ උ දෙදෙනාගේ අත්‍යන්ත සම්මීලනයෙන් ඔ යන්නද එහි දීර්ඝාක්ෂරයවූ ඕ යන්නද සෑදෙත්. එසින් මොව්හු කණ්ඨෞෂ්ඨජ වෙත්.

(10.) සංස්කෘත ව්‍යාකරණයෙහි වනාහි මේ පස් තැන්හි උපදින්නාවූ වර්ණයන් ස්වරය (ප්‍රාණාක්ෂරයයි) ව්‍යඤ්ජනය (ගාත්‍රාක්ෂරයයි) දෙකොටසකටද ව්‍යඤ්ජනයන් ස්පර්ශවර්ණය, අන්තඃස්ථය, ඌෂ්මවර්ණයයි තුන්කොටසකටද බෙදා දක්වූහු. ඒ මෙසේයි:—

| | කණ්ඨ | තාලු | මූර්ධන් | දන්තාඃ | ඔෂ්ඨ්‍ය. |
|---|---|---|---|---|---|
| ස්වර | අ ආ | ඉ ඊ | ඍ ඎ | ඏ (ඐ) | උ ඌ |
| ස්පර්ශවර්ණ | කඛගඝඞ | චඡජඣඤ | ටඨඩඪණ | තථදධන | පඵබභම |
| අන්තඃස්ථ | (හ) | ය | ර | ල | ව |
| ඌෂ්මවර්ණ | ඃ (හ්) | ශ | ෂ | ස | (f) |

මෙසින් ස්පර්ශ වර්ණයන් ස්ථානානුවර්ති පඤ්චවර්ගයක්වූ හෙයින් ඔවුන්ට පස්වගකුරුයයි කියනුලැබේ. ඒ එක් එක් වර්ගයෙහි

පෙනෙන්නාවූ අනන්තවර්ණයට වර්ගාන්තයයි කියනුලැබේ. ගේ වනාහි නාසිකාවෙහි ආධාරයද ඇතිව උසුරුවනු ලැබේ. එයින් ඊට අනුනාසික යනුද නම්.

(11.) තවද එක් එක් වර්ගය ඒ ඒ වර්ගයෙහි මූලකුර අනුව කවර්ග, චවර්ග, යනාදි වශයෙන් කියනුලැබේ. සියබසෙහි වූකලී මහාප්‍රාණාක්ෂරදීන්ගේ ඌනත්ව හෙතුවයෙන් මේ පස්වග එහි පෙනෙන්නේ මෙසේය :—

කවර්ගය ... ක ග ං
චවර්ගය ... ජ
ටවර්ගය ... ට ඩ ණ
තවර්ගය ... ත ද න
පවර්ගය ... ප බ ම

(12.) මෙයින් චවර්ගාන්තවූ අනුනාසිකය සියබසෙහි නො ලැබේ.

(13.) කවර්ගාන්තවූ අනුනාසිකය නම් ඞ යන්නයි. මෙය සිය බසෙහි ව්‍යවහාරයෙන් ලැබේ. වර්ණමාලාවෙහි ලක්ෂණයෙන් නොලැබේ. ලිපියෙහි ඒ වෙනුවට ලැබෙන්නේ නම් බින්දුවයි. බින්දු තෙම සංස්කෘත ව්‍යාකරණයෙහි අනුස්වාරයයි කියනු ලැබේ. නිතරම ස්වරයක් අනුව හෙවත් ස්වරයකට අනතුරුව ගමනය කරන හෙයිනි. එහි ඊට නියමිතවූ එකම ශ්‍රාවයක් නො මැත්තේය. යම් අක්ෂරයක් ඉදිරියෙහි සිටිද ඒ අක්ෂරය හා සමස්ථානවූ වර්ගාන්තයාගේ ශ්‍රාවය ගෙන දේ.

(14.) එයින් සකුබසෙහි බින්දුවට ශ්‍රාවයෝ පසෙකි. මාගධි යෙහිද එසේමය. එහෙත් සියබසෙහි බින්දුවට ඇත්තේ එකම ශ්‍රාවයකි. එනම් කවර්ගාන්තවූ ඞ යන්නෙහි අනුනාදයයි. එයින් බින්දුව සියබසෙහි කවර්ගාන්තයයි සැලකිය යුතුවූ තන්හි ඊට යෝග්‍යවූ උදාහරණ පමණක් මෙහි දක්වූහු. එහි ඌන මාත්‍රය පිණිස දක්වන ලද්දේත් එබඳුවූම උදාහරණ පමණකි. මේ උදාහරණ යන් දැක්විමෙහි අර්ථය නම් බින්දුව වර්ණමාලාවෙහි දැක්විය යුතු බව පහද දීම වේ. ගුරු අකුරු පස ගැනද නිදසුන් දෙනලද්දේ එම අර්ථයෙනි. මීට හෙතු කවරදයත් ඇතම් පූර්වාචාර්ය කෙනෙක්

ආ ඊ ආදි ගුරු පඤ්චකය අ ඉ ආදි ලඝු පස දීර්ඝකරගැනීමෙන් ලැබෙන්නේයයි කියාද, බින්දුව නම් අක්ෂරයක් නොව සලකුණු මාත්‍රයකැයි කියාද මේ අක්ෂර ෂට්කය වර්ණමාලාවෙන් තොර කොට සියබසෙහි වර්ණමාලා තොමෝ අකුරු සූවිස්සකින් යුක්ත වන්නීයයි කිහ; ඒ මතෙහි නිරාකරණය මේ නිදසුන් දක්වීම මෙහි අර්ථය විය.

(15.) "නමා වදනය පොමින් නොඉකනැයි හැංගේ" යනමේ නිදර්ශනය අසක්ද කව නම් පුරාණ කාව්‍යයකින් ගත්බව සිදත් සඟරා පුරාණ සන්නයෙහි කියාතිබේ. එම අසක්ද කව දැනට විද්‍යමාන බවක් නොපැනේ. "නරනිඳුහු ඉංගෙන්" යනාදි නිදසුන ගන්නාලද්දේ කව්සිළුමිණෙනි. එහි සම්පූර්ණ ගීය මෙසේය:-

නරනිඳුහු ඉංගෙන්-සෙමෙනද නැසී පැසැහී
විලස කල ළඟ කප්තුරු-මඳ ලෙළ හෙම් ලිය කලඹ.

මේ කියන ලද්දේ කුස කුමරුහට පබවත් කුමරිය වරනු පිණිස රාජදූතයන් යැවූ සමයෙහි මදුරද විසින් දියණිය තමා වෙතට කැඳවන ලදින් සුකුමාරවූ ඒ කුමරිය පැමිණ සිටි ආකාරයයි.

නරනිඳුහු, නරේන්ද්‍රයාගේ; ඉංගෙන්, අභිප්‍රායයෙන්; සෙමෙන්, ආලස්‍යයෙන්; අද, ආගමනය කොට; පැසැහී, පාර්ශ්වයෙහි; නැසී, සමීපස්ථව; කප්තුරුළඟ, කල්පවෘක්ෂ සමීපයෙහි; මඳලෙළ, මන්දලොලිතවූ; හෙම්ලිය කලඹ, හේමලතා කලාපයෙක්හි; විලස, ආකාරය; කල, නිපදවී.

## 6–10. නීතිසාරය. වර්ණවිභාගය.

(1.) ගුරුපඤ්චකය හා බින්දුවද උදෙසා නිදසුන් දක්වන ලද්දේ ප්‍රතිපක්ෂවාදීයන්ගේ මතය නිරාකරණය පිණිස වී නම් දක්වනලද නිදර්ශනයන්ගේ තාර්කික ප්‍රයෝජනයක් නොපැනේ. නිදසුන් වලින් පෙනෙන්නේ ප්‍රශ්නගත වර්ණයන්ගේ ශ්‍රැතිය භාෂා ව්‍යවහාරයෙහි ලැබෙන බවයි. මීට ප්‍රතිපක්ෂ මතයෙහි විරෝධිත්වයක් නොමැත්තේය. ප්‍රතිපක්ෂ මතය නම් එම ශ්‍රැතිය එසේ ලැබෙන නමුත් ඊට වර්ණයන් පෘථග් වශයෙන් දක්වීම අනපේක්ෂිතය යනු පමණකි. මේ මතය සාර්ථයයි

මෙහි කියනු නොලැබේ. නමුත් එහි අසාරත්වය දක්වනු පිණිස තර්කණය නම් අතිකක් වියයුතුයි. හැංගේ යනාදි තන්හි පෙනෙන්නාවූ අනුනාසිකයද, සා සී යනාදි තන්හි පෙනෙන්නාවූ දීර්ඝත්වයද භාෂාවෙහි ලැබෙනු සත්‍යනම් එම වර්ණමාත්‍රයන්හට ලේඛා ලක්ෂණ නොමැත්හොත් ඔවුන් දෘශ්‍යභාෂාවෙහි පෙන්වනු ලබන්නේ කෙසේද?-යනු ප්‍රශ්න මුඛයෙන් මෙහි යෙදෙන්නාවූ නිසි තර්කණය විය. දෘශ්‍යභාෂාවෙහි පෙන්වනු පිණිස ඔවුන්හට ලේඛා ලක්ෂණයෝ අපෙක්ෂිත වෙත්නම් එම ලේඛා ලක්ෂණයෝ අක්ෂරනොවෙත්ද? අක්ෂර නම් වර්ණමාලාවෙහි ඇතුළත් කළයුතු නොවෙත්ද?

නිසි තර්කණය මෙසේ හෙයින් සිදත් සඟරා කරුද ස්වකීය මතානුසාරයෙන්ම දූෂණීය බව පෙනේ. අඩිවර්ගාන්තය සිය බසෙහි ලැබෙන නමුත් ඒ ආචාර්යයෝතුමූ එය පෘථග් වර්ණයක් වශයෙන් ගිනියයුතු බවක් හෝ ඊට ලේඛා ලක්ෂණයක් වර්ණමාලා යෙහි ඇතුළත් කළයුතු බවක් හෝ නොදුක්වූහු.

තවද රඟ, බඟහර යනාදි තන්හි බින්දුවෙහි නොහොත් කවර්ගාන්තයෙහි ඌනමාත්‍ර වශයෙන් පමණක් වන්නාවූ සඤ්ඤක හෙවත් සංයොග ලාභය මොවුන් විසින් පෙන්වනලද නමුදු සාමාන්‍ය ඌන වර්ගාන්ත වශයෙන් එම සංයොගයෙහි ලැබීම සඳහන් නොකරන ලදි. කෙබඳු ලැබීමදයත් මේ දර්ශ්‍යමානවූ තන්හි මෙනි:— •

| | | | | |
|---|---|---|---|---|
| රඟ | , බඟහර | ... | කවර්ගාන්ත | ඌනමාත්‍රය. |
| එරඬු | , දඬු | ... | ටවර්ගාන්ත | එම. |
| සුවඳ | , කඳ | ... | තවර්ගාන්ත | එම. |
| බිඹු | , තරඹ | ... | පවර්ගාන්ත | එම. |

එසේම අවර්ණයෙහි මාත්‍රා වෘඩියයි ඔවුන් විසින් සලකන ලද ඇ- ඈ දෙදෙනෙක් සියබසෙහි ඇති නමුත් මොවුන් ස්වකීය මතයෙහි ප්‍රකාර අවර්ණයාගේ භෙදයන් හෙයින් එම අක්ෂර යුග්මය පෘථග් වශයෙන් වර්ණමාලායෙහි ඇතුළත් නොකරන ලදි. මෙසේ තැනින් තැන පෙනෙන්නාවූ මේ අසංවිධානය තෙම ස්වකීය මතයටම ප්‍රතිවිරුඬ වේ.

එයින් හෙළු වර්ණමාලා තොමෝ ශාස්ත්‍රීය ප්‍රකාරතම් සඤ්ඥකය, ඇ ඈ දෙදෙනය යන මොවුන්ද ඇතුළුව ලක්ෂණ වශයෙන් අක්ෂර තුන් තිසකින් යුක්තවේ. ඒ මෙසේය:—

| | | |
|---|---|---|
| පණකුරු | අආ, ඇඈ, ඉඊ, උඌ, එඒ, ඔඕ, | 12 |
| පස්වග | කග ං, ජ, ටඩණ, තදන, පබම. | 13 |
| අතුරුසිටි | හයරළලව. ... ... ... | 5 |
| උසුම් | ස. ... ... ... | 2 |
| සංයෝ | ර් ... ... ... | 1 |
| | | 33 |

සං. 1.—හකාරය මෙහි අතුරු සිටි වශයෙන් පමණක් දක්වතලද නමුදු එය උසුම් අකුරෙකිද ගැනේ.

සං. 2.—සංයෝ ලකුණ බයන්ත හා සම්බන්ධ කල්හි අර්ධ මකාරයෙන් සිටී. එය අමුතු ලකුණක් නොවන හෙයින් මෙහි පෘථග්වශයෙන් නොගනිතලද නමුදු එහි රූප සටහන පෙන්විය යුතුවේ. යට දැක්වූ බිඹු, නරඹ, යන නිදසුන් මගින් ශේ නිරූපිතය. සියලුම අර්ධවර්ගාන්තයන් එකම ධර්මයක ඇතුළත් කොට මෙහි සලකන ලදින් ඒ ධර්මයට අනුරූපසේ එකවර්ණයක් කොටද සැලකිය යුතුවේ. බි නුව මෙහි. 31 වෙනි පිටුවේ 14 වෙනි අඩකය බලනු

(2.) නවද වර්ණයක් තෙම සාරය, ලක්ෂණයයි විපක්ෂයකින් යුක්තවේ කර්ණගොචරව පවත්නේ හෙවත් කනට ඇසෙන්නේ වර්ණයක්හුගේ සාරයයි; චක්ෂුර්ගෝචරව පවත්නේ හෙවත් ඇසට පෙනෙන්නේ වර්ණයක්හුගේ ලක්ෂණයයි. වර්ණය, අක්ෂරය, යන නාමයෝ හෙළු වියරණෙහි අවිශෙෂාර්ථයෙන් ව්‍යවහාර කර තිබෙත්.

(3.) වර්ණමාලාවෙහි මූලාක්ෂරයවූ අයන්න ලක්ෂණයෙන් එකම වර්ණයක් නමුත් සාරයෙන් වර්ණ දෙකක් බව දත යුතුයි. විවෘත, සංවෘත, වශයෙනි. ගඟ යයි කී තන්හි අකාරයෝ දෙදෙනෙකි. එහෙත් එයින් පූර්ව අකාරයෙහිද පශ්චිම අකාරයෙහිද සාරය එකම නොවන බව මදක් ආලොචනයෙන් සුව්‍යක්ත වේ මැයි. මේ පූර්ව අකාරයෙහි සාරයට මෙහි විවෘත නොහොත් විවත්යයි කියනු ලැබේ; පශ්චිම අකාරයෙහි සාරයට සංවෘත නොහොත් සංවත්යයි කියනු ලැබේ.

අ. ආදිය ඇසුරු අකාරයතෙම විවත්වේ. මම යන්නෙහි පූර්ව අකාරය මෙනි.

අපවාදය 1. ව (වීමේ) යන ධාතුවෙහි අකාරය තෙම ආදිසථ වුවද සංවෘත් වේ. "සිරිමත් කෙලිම්හිත් වව" යයි කියූ තන්හි මෙනි.

අපවාදය 2. කර ධාතුවෙහි ආදිසථවූ අකාරයද සංවෘත් වේ.

ආ. අනාදි නමුදු හල් පූර්වවූ අකාරය විවෘත් වේ. ඇතුලත් යන තන්හි ලකාරසථවූ අයන්ත මෙනි.

ඉ. අකාරයෙන් පරහකාරසථවූ අයන්ත විවෘත් වේ. පහළ, දේලහ, යනාදි තන්හි මෙනි.

අකාරයෙන් පරයයි කියනලද්දේ කවර හෙයින්ද යත් සිගලු, ඉහ, යනාදි තන්හි සංවෘත් හෙයිනි.

ඊ. අනික් සියලුම තන්හි අකාරයතෙම සංවෘත්ය. නිතරම යන තන්හි සියලුම අකාරයෝ සංවෘත් වෙත්.

(4.) ප්‍රාණාක්ෂරයන්ට ස්වර යනුද නාමයක් බව දතයුතුයි.

(5.) අකාරයෙහි සාරවශයෙන් ස්වරයන් දෙදෙනකුන්ගේ විද්‍යමානත්වය මෙසේ පෙනෙන හෙයින් හෙළු වර්ණමල්හි ලකුණු වසයෙන් අකුරු තෙතිසෙක් නමුදු සරු (හෙවත් සාර) වසයෙන් වර්ණ සූතිසක්බව දත යුතුයි.

(6.) වර්ණමාලායෙහි ගාත්‍රාක්ෂරයන් දක්විමේදී උච්චාරණ සුඛය පිණිස අකාරාරූඪව දක්වනු ලැබෙත්. ක, ග, ජ, යනාදි සියල්ල අකාරයෙන් යුක්තයහ.

ශුද්ධ ගාත්‍රාක්ෂරයෙක් වූකලී හල් යනුවෙන් කියනු ලැබේ. ක්, ග්, ච්, ත්, යනාදීහු හල්වර්ණයෝ වෙත්. "හල්" යනු පාණිනීය ව්‍යාකරණයෙහි තබනලද නාමයකි. සියබසෙහි වනාහි හල්භාවයෙහි සඤ්ඤාව නම් අක්ෂරයෙන් ඔසවනලද කොඩියකට සමානවූ රේඛා ලක්ෂණයක් හෝ අක්ෂරය මතුයෙහි පිහිටුවන ලද ක්‍රිස් පලඳනාවකට සමානවූ රේඛා ලක්ෂණයක් හෝ වෙයි. මෙයින් පළමු කී ලක්ෂණය පිණිස කොඩි ගසට සමානවූ ඍජු රේඛාවක් අක්ෂරාන්තයෙහි සිට උඩට අඳිනුලැබේ. ඒ වනාහි

අක්ෂරාන්තය දක්ෂිණාවෘත්ත කල්හිය. අක්ෂරාන්තය වාමාවෘත්ත කල්හි දෙවැනිව කී ලක්ෂණය යොදනු ලැබේ. එයින් හල්ලක්ෂණයෝ මෙහි පෙනෙනසේය :—ක්, ට්.

**සංලක්ෂ්‍යය.— මේ හල් ලක්ෂණයන්ගේ උත්පත්තිස්ථානය නම් දක්ෂිණ ජම්බු ද්වීපයෙහි ද්‍රවිඩයන්ගේ ග්‍රන්ථ සෝඩිය වේ.**

(7.) ව්‍යඤ්ජන යනුද ගාත්‍රාක්ෂරයන්ට නමක්බව දතයුතු.

(8.) මෙසේ ගාත්‍රාක්ෂරයක් ප්‍රකෘති ලක්ෂණයෙන් අකාර ධාරි හෙයින් අකාරාරෝහණය දක්වනු පිණිස අන්කිසිවූ සලකුණක් ඕනෑ කරනු නොලැබේ. එසේවූ අකාරය හැර අනිකුත් සියලුම ස්වරයන් ගාත්‍රාක්ෂරයන් කෙරෙහි ආරූඪ කල්හි ඒ දක්වනු පිණිස විශෙෂ ක්‍රමයක් ඇත්. මේ ක්‍රමය නම් ගාත්‍රාක්ෂරය හා සම්බන්ධයෙන් ස්වරය ලිවීම නොවේ. ස්වරය වෙනුවෙන් එක් සඤ්ඥවක් ගාත්‍රාක්ෂරය කෙරෙහි යෙදීම වේ. ඒ මේ සඤ්ඥව නම් අර්ධ චන්ද්‍රාකාරවූ රේඛාවකි. මෙය ඒ ඒ ස්වරය වෙනුවෙන් ඊට නියමවූ තැන්හි යොදනු ලැබේ. පූර්වය අකුර දෙසට හරවා දකුණෙහි යෙදුවහොත් සඤ්ඥ තොමෝ ආයන්තයි; මුදුනෙහි යෙදුවහොත් ඉයන්තයි, වම්හි යෙදුවහොත් එයන්තයි, පතුලෙහි යෙදුවහොත් උයන්තයි; වම් දකුණු දෙපසෙහි යෙදුවහොත් ඔයන්තයි. ඉ, උ, දෙදෙනාගේ දීර්ඝත්වය පිණිස රේඛාව විගුණ කොට යොදනුලැබේ. තවද ඈයන්ත වෙනුවෙන් පූර්වය බාහිර දෙසට හරවා දකුණු පසෙහි යොදනු ලැබේ. දීර්ඝත්වය පිණිස නම් විගුණයෙති.

මෙසේ යොදනලද වංක රේඛාවට නොහොත් සඤ්ඥවට පිල්ලයයි කියනු ලැබේ. පිලියනු ප්‍රකෘතියි. දකුණු ඇළයෙහි යෙදුම් ලද්දේ ඇළපිල්ලය, මුදුනෙහි ඉස්පිල්ලය; පතුලෙහි පාපිල්ලය, වම් ඇළයෙහි එය නැමුණාවූ අඟකට සමානව ලියනු ලබන හෙයින් කොම්බුවයයි ද්‍රවිඩානු සාරයෙන් කියනු ලැබේ. විගුණවූ කල්හි පාපිල්ලෙහිදී පූර්වභාගයද ඉස්පිල්ලෙහිදී අපර භාගයද ලුහුඬු කොට යොදනුලැබේ. එකල ලුහුඬු භාගයට ඉස්පිල්ලෙහිදී ගැටේයයිද පාපිල්ලෙහිදී පෙකණියයයිද කියනු ලැබේ.

යම් අක්ෂරයක්හුගේ අන්තය පතුලෙහිවූ කල්හි පාපිලි තෙම එම අන්තයෙහි සිට දකුණට ලියනු ලැබේ. කු, තු, යනාදියෙහි මෙනි.

යම් අක්ෂරයක්හුගේ අන්තය මූදුනෙහි වීනම් ඒ අක්ෂරයෙහි පතුලෙහි සිට ඍජු රේඛාවක් යටට ඇද පාපිල්ල එම රේඛාවෙහි අන්තයෙහි සිට වමට ලියනු ලැබේ. පු, බු, යනාදි තන්හි මෙනි.

මෙහි යටට ඇඳි රේඛාව ලකුණෙහි කොටසක් නොව සම්බන්ධ මාත්‍රයකි. ඊට මෙහි සම්බන්ධ රේඛාවයයි කියනු ලැබේ.

**අපවාදය.**—තු යන්න හා වියවුල් නොවනු පිණිස ත්‍රු යන් තෙහි පාපිල්ලද, ගු යන්න හා වියවුල් නොවනු පිණිස හු යන් තෙහි පාපිල්ලද සම්බන්ධ රේඛාව මගින් යොදන ලදි.

**සංලක්ෂ්‍යය.** ළකාරාරූඪවූ පාපිල්ල පෙරකල ලියනලද්දේ අක්ෂරාන්තයෙහි සිට දකුණටය. ඒ මෙසේය :— ළු . කල්ඇමේදී අක්ෂරාන්තය ඉහල යෑමෙන් මේ ස්වරාරූඪවූ අක්ෂරය මෙසේ විය: ළු. ඉන්පසු මෙහි තත්ත්වය ප්‍රතිව්‍යජනා වී යෑම කරණකොටගෙන මෙහි පිල්ල දීර්ඝත්වයෙහි විශෙෂ ලකුණක් යයි සලකා දූත් උයන්න ආරූඪවූ ළකාරය එය විරහිතවද, ඌයන්න ආරූඪවූ ළ කාරය ඒ පිල්ලෙන් යුක්තවද ව්‍යවහාර කරනු ලැබේ.

එයින් දූත්—

ළ් + උ යනු ළු වේ.
ළ් + ඌ යනු ළූ වේ.

(9.) මේ පිළියෙදීමේ ක්‍රමය අශොක සෝඩිය හා සාධාරණ හෙයින් සිංහලාක්ෂරයන්ගේ දූර සම්භවය ඒ සෝඩිය වියයුතු බවද, සිංහලාක්ෂරයන් සටහන් වශයෙන් ද්‍රවිඩයන්ගේ ග්‍රන්ථ සෝඩිය හා සාධාරණ හෙයින් ඔවුන්ගේ අනන්තර සම්භවය එම ග්‍රන්ථ සෝඩිය වියයුතු බවද සපිර ප්‍රතීතියෙන් පෙනේ. එම ග්‍රන්ථ සෝඩිය හා සිංහල සෝඩියද යන දෙකම අශොක සෝඩියෙන් පැමිණියාහු නම් වර්ණයන්ගේ ලක්ෂණ සාම්‍යයද එයින්ම ඇතිවියහැකි නොවේද යනු මෙහි උපදින ප්‍රශ්නයකි. මෙබඳු ගාඪ්වූ සාම්‍යයක් එසේ ඇතිවිය නොහේ. ඇතිවීනම් එම එක සම්භව හෙතුවෙන්ම සිංහල අකුරු දඹදිව වෙනත් නා නා ජාතිකයන්ගේ වර්ණමාලාවන්හි අකුරු හා සමාකාරවිය යුතුයි.

එබඳු සම්බන්ධයක් නොමැත්තේය. ඒ ඇරත් සිංහල වර්ණමාලාවට නම පවා ලැබී තිබෙන්නේ ද්‍රවිඩයන්ගෙනි. සෝඩිය යනු ද්‍රවිඩ "ශුවඩි" යන්නෙන් වේ. *

යම් වස්තුවක නාමය වස්තුව සමගම පැමිණිය යුතු හෙයින් මේ සෝඩි යන නාමයතෙම එයින් උච්‍යමානවූ සිංහලයන්ගේ වර්ණමාලාව ද්‍රවිඩයන්ගෙන් ලැබුණු දායාදයක් බවට අඛණ්ඩ්‍යවූ සාක්‍ෂ්‍යයකි. තවද සිංහල ඊකාර ලක්‍ෂණය!නම් බිඳුදෙකකින් සරහනලද රයන්නකි. ද්‍රවිඩයන් අතරෙහි මිස පූර්ව දිග අන් කවර ජතියක් අතරෙහිවත් මේ වර්ණ සටහන නොමැත්තේය. එයම කාරණයෙහි විනිශ්චයට ප්‍රමාණ විය යුතුයි.

(10.) සිංහල භාෂාවෙහි ප්‍රවෘත්ති තොමෝ ශුද්ධ සිංහලය මිශ්‍ර සිංහලයයි ද්විප්‍රකාර වේ.

ශුද්ධ සිංහලට හෙළු යනු පුරාණ නාමයයි. පුරාණ කාව්‍යයන්හි පෙනෙන්නේ මේ භාෂාවයි. පෙරකල මේ හෙළුබස

---

* සිංහල වර්ණමාලාවට පාලියෙන් දීපිකාවක් ලියන්නාවූ එක්තරා භවතෙකු විසින් 'සෝඩි' යනු පාලි 'සු' යන උපසර්ගය පූර්ව 'ඩී' යන ධාතුවෙන් සිද්ධවූ 'සෝඩී' යන්නක් යයි තෝරා දී තිබේ. ස්වකීය ඥානය පාලියෙන් ඇත ගමන් නොකළ හෙයින් සිය දැනුමට වැටහෙන පමණින් මෙය කීසේ පෙනේ. 'ඩී' යන්නෙහි අර්ථය නම් 'වෙහාස ගමනෙ' යයි කියන ලදින් අහසෙහි ගමන හෙවත් පියාසර කිරීම වේ. සෝඩි තෙම වර්ණයන්ගෙන් හෙවත් ශ්‍රාවයන්ගෙන් යුක්තනේවි. ශ්‍රාවය නම් වාතයෙහි උපදවනලද එක්තරා කම්පනයකි. එහි ගමනය අහසෙහි වේ. එයින් සෝඩියයි පළමුකොට වර්ණයට කියා ඉන් පසුව ඒ අනුසාරයෙන් වර්ණමාලාවට කියනලද්දේ නම් එය ඇදහිය හැකිවූවක් විය යුතුයි. එහෙත් වර්ණයට එබඳු නාමයක් ඇතිබවක් නොපෙනේ. දෙවෙනුව 'සෝඩි' යනු වර්ණමාලාවට නාමයක් වශයෙන් පාලියෙන් සිද්ධනම් එය පළමුකොට පාලියෙහි පෙනිය යුතුයි. එහෙත් පාලියෙහි වර්ණමාලාවට එබඳු නාමයක් ඇතිබවද නොපෙනේ. තුන්වෙනුව අහසෙහි ගමන් ඇති අර්ථයෙන් සොඩී යයි කිවමනා නම් ප්‍රකෘතියෙන්ම එසේ කියයුතු වන්නේ පක්‍ෂියාහටය. එහෙත් පක්‍ෂීන්ට:පවා එබඳු නාමයක් ඇතිබවක් නොපෙනේ මැයි. කරුණු මෙසේ හෙයින් 'සෝඩි' යනු පාලියෙන් බිඳුණේය යන මතය නම් සිංහල පණ්ඩිතයන් අතුරෙහි ශාස්ත්‍ර සම්බන්ධයෙන් පවතින්නාවූ නොයෙක් මුලා මතයන්ගෙන් එකකි.

විශාල වාක්කොෂයකින් හා ඉතා විස්තර සහිතවූ ව්‍යාකරණ ශාස්ත්‍රයකින්ද යුක්තව පැවති බව පුරාණ ග්‍රන්ථයන්ගෙන් අශඩිතව ප්‍රතීත වේ. නමුත් දැනට පවතින්නාවූ හෙළබස නම් එහි ඉතා සුළුවූ ශෙෂයක් යයි කිය යුතුවේ. මෙහි කොෂය ඉතා සීමා සහිතය, දුර්වලය; පුරාණ පැවති බොහෝ ධාතු ප්‍රකෘතීන් හා ශබ්ද ප්‍රකෘතීන්ද අව්‍යවහාරයට ගොස් තිබේ. මීට හෙතුවූයේ සංස්කෘත මාගධී ද්‍රවිඩ ආදි භාෂාවන් හා සඹන්ධතා කරණ කොටගෙන එයින් පැමිණි භණිතීන්ගේ ව්‍යවහාරය විශාලලෙස ව්‍යාප්තවී යෑම වේ. මේ අභිනව භණිතීන් වන් තැන කිසිවෙක පුරාණ භණිතීහු මුලුවැදී අන්තර්හිත වෙත්. දැනට එව්රෝපිය භාෂාවන් ගෙන්ද වාක්ප්‍රාප්තිය හා ව්‍යාප්තිය බොහෝසේ වීගෙන යෙයි. අභිනව අදහස් සමග අභිනව භණිතයන්ගේද ප්‍රාප්තිය ලාභයකි. එහෙත් පුරාණ වාක්කොෂයද රක්ෂිත ගොපිත කර ගැනීම පමණක් නොව නැවතත් ප්‍රාණවත්කොට බොහෝසේ ශක්තිමත් කරගැන්ම යොග්‍යවේ. යම් මනුෂ්‍යවර්ගයක්හුගේ දිවුණුවට ප්‍රධාන සාක්ෂ්‍යය නම් ඔවුන්ගේ භාෂාවෙහි දිවුණුවයි. තමන්ගේ සියලුම අදහස් ස්වකීය භාෂාවෙන් ප්‍රකාශ කරගැන්ම හැකිවිය යුතුයි.

අන්‍ය භාෂාවන්ගෙන්ද පැමිණියාවූ භණිතයන් ආශ්‍රයකොට ගෙන ප්‍රචාරයට පමුණුවා ගන්නාලද සිංහල භාෂා තොමෝ මිශ්‍ර සිංහල නම් වේ. උම්මග්ගජාතකය ලියාතිබෙන්නේ මිශ්‍ර සිංහල යෙනි.

යම් ජනතාවක් විසින් ඔවුන්ගේ ශිෂ්ටව්‍යවහාර ප්‍රාප්තවූ භාෂාවට සියබසයයි කියනු ලැබේ. හින්දී භාෂාව ව්‍යවහාර කරන්නෝ ඊට සියබස යයි කියාගනිති. ඒ අයුරෙන්ම සිංහල යන්ගේ භාෂාවට සිංහලයෝ සියබස යයි කියති. සිදත් සඟරාවෙහි මෙයින් කියවෙන්නේ ශුද්ධ සිංහල නොහොත් හෙළු පව ණක් සියබස් ලකරෙහි පෙනෙතුද එසේමය. එය ලිවීමට ප්‍රමාණවූ සෝඩිය යට දක්වන ලදි.

මිශ්‍ර සිංහල ලිවීම පිණිස නම් හෙළසෝඩිය ප්‍රමාණ නොවේ. තවත් බොහෝ වර්ණයෝ අපෙක්ෂිත වෙති. සංස්කෘත භණිත යන්ද නිසි ප්‍රකාර ලිවීම උවමනා හෙයිනි. මෙයින් මිශ්‍ර සිංහල

ව්‍යවහාරයෙහි වනාහි මුළු සංස්කෘත වර්ණමාලාවම යොදාගනු ලැබේ. සංස්කෘත මාගධීන්ට අසාධාරණවූ ඇ ඈ යන වර්ණ යුග්මයක්ද, සඤ්ඤක නම් සඤ්ඤවක්ද සියබසෙහි ඇත්. එසේම ලෞකික සංස්කෘතය හා අසාධාරණවූ මාගධිය හා සාධාරණවූ ළකාරයෙක්ද ඇත්. එයින් මිශ්‍ර සිංහල හෝඩි තෙම වර්ණ සංඛ්‍යාවෙන් සංස්කෘත වර්ණමාලාවට මදක් වැඩිව පවතී.

(11.) ලෞකික සංස්කෘත වර්ණමාලාව නම් මෙසේය :—

| | ස්වර. | අන්තඃස්ථ. | ස්පර්ශවර්ණ. | ඌෂ්මවර්ණ |
|---|---|---|---|---|
| කණ්ඨජ ... | අ ආ | හ | කඛගඝඞ | (—)* |
| තාලුජ ... | ඉ ඊ | ය | චඡජඣඤ | ශ |
| මූර්ධන්‍ය ... | ඍ ඎ | ර | ටඨඩඪණ | ෂ |
| දන්තජ ... | ඏ (ඐ) | ල | තථදධන | ස |
| ඕෂ්ඨජ ... | උ ඌ | ව | පඵබභම | (—)† |
| කණ්ඨතාලුජ... | ඒ‡ ඓ | | | |
| කණ්ඨෝෂ්ඨජ... | ඕ‡ ඖ | | | |

ලකුණු :— ං මේ අනුස්වාරයයි.
ඃ මේ විසර්ගයයි.

ඍ, ඎ, ඏ, ඓ, ඖ, — යන මේ ස්වරයන් ව්‍යඤ්ජනාරූඪ කල්හි මෙසේ දක්වනු ලැබෙත් :—

| | | | | |
|---|---|---|---|---|
| ඍ = ෘ | . | නිදසුන් | ක් + ෘ | = කෘ |
| ඎ = ෲ | . | „ | ත් + ෲ | = තෲ |
| ඏ = ෟ | . | „ | ක් + ෟ ප් | = කෟප් |
| ඓ = ෛ | . | „ | ර් + ෛ | = රෛ |
| ඖ = ෙ – ෟ | . | „ | ව් + ෙ – ෟ | = වෞ |

(12.) ලෞකික සංස්කෘතයෙහි ව්‍යවහාරගත වර්ණයෝ සතලිස් අටෙකි. මීට ඇ, ඈ, ළ යන වර්ණයන් හා සඤ්ඤක ලක්ෂණයද එ ඔ යන හ්‍රස්ව ස්වර යුග්මයද එක්කොට ගත්කල්හි මිශ්‍ර සිංහල හෝඩියෙහි වර්ණයෝ සිව්පණසෙක් වෙති. ඒ මෙසේය :—

---

* මෙහි ලැබෙන්නාවූ වර්ණය නම් හයන්නට සමානවූ ඊට වඩා ඝනවූ රළුවූ වර්ණයකි. ජිහ්වාමූලීය යනු ඊට නම්. ලෞකික සංස්කෘතයෙහි නොමැත්තේය. වේදයෙහි පෙනේ.

† මෙහි ලැබෙන්නාවූ වර්ණය නම් ඉංග්‍රීසි f යන්නයි. මෙද ලෞකික සංස්කෘතයෙහි නොමැත්තේය. වේදයෙහි පෙනේ. උපධ්මානීය යනු ඊට නම්.

‡ මෙය පාලි සංස්කෘත භණිතයන් ලිවීමේදී දීඝ ලක්ෂණය නොමැතිව ලියනු ලැබේ. ක්‍රමයෙන් හැරදැමිය යුතුවූ අභ්‍යාසයකි.

මිශ්‍ර සිංහල ශෝධිය.

| | කණ්ඨ. | තාලු. | මූර්ධන්. | දන්ත. | ඕෂ්ඨ. |
|---|---|---|---|---|---|
| ස්වර ... | අ ආ | ඇ ඈ / ඉ ඊ | ඍ ඎ | ඏ | උ ඌ |
| අන්තඃස්ථ ... | හ | ය | ර ළ | ල | ව |
| ස්පර්ශවර්ණ ... | ක ඛ ග ඝ ඞ | ච ඡ ජ ඣ ඤ | ට ඨ ඩ ඪ ණ | ත ථ ද ධ න | ප ඵ බ භ ම |
| ඌෂ්මවර්ණ ... | ඃ | ශ | ෂ | ස | — |

මිශ්‍ර ස්වර. කණ්ඨතාලු ... එ ඒ ඓ
කණ්ඨෝෂ්ඨ ... ඔ ඕ ඖ

ලක්ෂණ : අනුස්වාරය : ං
සඤ්ඤක : ඁ

## සූත්‍ර පාඨය. 11. සඳ.

පෙරපර වණන් ගළපනු සඳනම්. සඳෙව්, මොහොර ඈගි.

11. ව්‍යාඛ්‍යා. පෙර පරවණන්, පූර්වාපර වර්ණයන්; ගළපනු, ඝටනය කිරීම; සඳ නම්, සන්ධි නම්. සඳෙව්, සඳ එව් යයි සිටිතන්හි සඳෙව් යනුය; මොහොර, මහ උරයයි සිටි තන්හි මොහොර යනුය; ඈගි, යන මේ ආදි ආකාර ඇත්තේයි,

## 11. විස්තරය. සන්ධි.

කථායෙහිදී නොයෙක්විට ශබ්ද සංක්ෂේපය ස්වභාවයෙන් වන්නේය. ශබ්ද සංක්ෂේපයට ඉවහල්වූ නොයෙක් ධර්මයෝ ඇත්. එයින් එක් ධර්මයෙක් නම් ආසන්නවූ වර්ණයන්ගේ හෝ ශබ්දයන්ගේ හෝ සම්මීලනය නොහොත් එකීභූත වීමයි. මෙහි ඝටනයයි කියන ලද්දේ ඒවය. සඳ-එව් යයි ශබ්ද දෙදෙනකුන් සිටිකල්හි ශීඝ්‍ර කථනයෙහිදී පූර්ව ශබ්දයාගේ අන්තස්වරය ලොප් වීමෙන් සඳ්-එව් යයි සිටී. එකල පූර්වවූ ද් යන්න හා අපරවූ එ යන්නද සම්මීලනය වීමෙන් සඳෙව් යයි සෑදේ. එසේම මහ-උර යයි සිටි තන්හි හ කාරස්ථවූ අ යන්න හා ඒට අපරවූ උ යන්නද සම්මීලිත වීමෙන් ඔ යන්නක් ලැබේ. එයින් මහඋර යනු මහොර යයි සිටී. මේ සන්ධිවූ තැනි. මහොර යනු පසුව සුඛෝච්චාරණයෙන් මොහොර වේ. සහෝදර යනු සිංහලට අහොයුරු යයි බිඳී පසුව සොහොයුරුවූ මෙනි. සඳ එව්යයි

කිතන්හි චන්ද්‍රයා වැනිවූ යනු අර්ථය වේ. එසේම මහඋරයයි කී තන්හි මහා ප්‍රාකාරය යනු අර්ථය වේ.

### 11. නිතිසාරය. සන්ධි.

මේ සූත්‍රයෙහි "ගලපනු" යයි පදයක් යොදන ලදින් සන්ධිය තෙම යමෙකුගේ ඉච්ඡාවෙන් කරනු ලබන්නක්සේ දක්වනලදී. ඒ ශාස්ත්‍රීය නොවේ. සන්ධියට හෙතුව නම් ශ්‍රැතියමැයි. තණ්හි ගොචරයකි. එහි ලක්ෂණයනම් ලිපියමැයි. චක්ෂුර්ගොචරයකි. මෙයින් උත්පත්ති මූලය ලක්ෂණයෙහි නොව හෙතුවෙහි බව ප්‍රත්‍යක්ෂය. එයින් ශාස්ත්‍රීය ප්‍රකාර නම් ගලපනුනොව ගැලපෙනු විය යුතුයි.

කිසිතැනෙක සන්ධිය තෙම අනියත වශයෙන් ලැබේ. එතැන්හිද සිඞිය කර්තෘහුගේ සෙවච්ඡාවෙන් නොව ශබ්ද ධර්ම යෙනි. එබඳු තන්හි සන්ධිය හෝ විසන්ධිය හෝ භජනය කිරීම පමණක් ඔහුගේ අභිමතය පරිදි 'වේ.

### සූත්‍ර පාඨය. 12. ලිඟු.

මේය මෝය යන වහරට කරුණුවූයේ ලිඟුනම්. දිය විදු ඈයි.

12. **ව්‍යාඛ්‍යා.** මේය, මේ (තැනැත්තේය); මෝය, මෝ (තැනැත්තිය); යන වහරට, යනමේ ව්‍යවහාරයට; කරුණුවූයේ, කාරණ වූයේ; ලිඟුනම්, ලිඞගය නමි. දිය, ජගත්තෙමේය; විදු, විද්‍යාතොමෝය; ඈයි, මේ ආකාර ඇත්තේයි.

### 12. විස්තරය. ලිඞග.

ප්‍රාණීන් සේ ශබ්දයන්ද මේ ව්‍යාකරණයෙහි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයකට බෙදා ඔවුන්ගේ විශෙෂය දක්විමේ සාමර්ථ්‍යයට ලිඞගයයි නම් යෙදෙනබව කීහ. යම් සම්පසර්වූ පුරුෂයකු ගැන කථාකරන කල්හි මේ තැනැත්තේ යන අර්ථයෙහි මේ යන්න පමණක්ද යෙදිය හැකිවේ. මේ තෙමේ යනුද එමයි. එසේම ස්ත්‍රියකු ගැන කථාකරන කල්හි මෝ යයි පමණක්ද කිය හැකිවේ. මෝ තොමෝ යනුද එමයි. මේ විශෙෂයට හෙතුව යටකී ලිඞග භෙදයයි. ප්‍රාණීන්ගේ ලිඞගභෙදය ප්‍රත්‍යක්ෂ හෙයින් එය මෙහි නිදසුන් නොකොට ශාස්ත්‍රානුසාරයෙන් පමණක් ලිඞගභෙදය ලැබෙන්නාවූ ශබ්දයුග්මයක් මෙහි දක්වූහු. එයින්

දිය යනු ජගත් යන අර්ථයෙහි ගත්කල්හි පුරුෂ ලිඞ්ගයෙහි වේ. ජගත් යනු ලොකයයි. විදූ යනු විද්‍යා යන අර්ථයෙහි ගත්කල්හි ස්ත්‍රී ලිඞ්ගයෙහි වේ විද්‍යා නම් ශාස්ත්‍රයයි.

## 12. නීතිසාරය. ලිඞ්ගභෙදය.

මේ සූත්‍රයෙන් ලිඞ්ගයෙහි ලක්‍ෂණ දෘෂ්ටාන්ත මුඛයෙන් දක්වූහු.

සංස්කෘතයෙහි වනාහි සමීපයෙහි සිටින්නාවූ පුරුෂයකු ගැන සර්වනාම වශයෙන් "අයම්" යයි කියනු ලැබේ මේ තැනැත්තේ යනු අර්ථයි. එසේම ස්ත්‍රියකු ගැන "ඉයම්" යයි කියනු ලැබේ. මේ තැනැත්තී යනු අර්ථයි. මේ භින්නවූ පද යුග්මයකින් දෙදෙනා දක්වීමේ හෙතුව නම් ලිඞ්ගභෙදය වේ.

එසේම සියබසෙහි "අයම්" යන අර්ථයෙහි "මේ" යයි කියනු ලැබේ. "ඉයම්" යන අර්ථයෙහි "මෝ" යයි කියනු ලැබේ. සර්වනාම වශයෙනි. හෙද ප්‍රථමා විභක්ති-එකවචනයෙහි වේ.

මේ උභය රූපයම එකම ප්‍රකෘතියකින් සිඬය. ඒ ප්‍රකෘතිය නම් "මේ" යනුයි. ඒ "මේ" ප්‍රකෘතිය වනාහි පුරුෂ ස්ත්‍රී උභය ලිඞ්ගයටම සාධාරණ වේ. කියනලද මැයි, සිදත්සඟරාවෙහි:—

තම එ මෙද රමණී—දිගු සව් තුරුණු මුදු ලොල්
ඇළි ඇලෑ ගුණ සදද—දෙලිඟුෂම වි දන්නේ.

මෙසේ මේ යනු විභක්ත්‍යන්තවූකල්හි පුංලිඞ්ගික වේ. ප්‍රකෘතියෙන් සිටි කල්හි පුං ස්ත්‍රීලිඞ්ගයන්හි සමවේ. "මේය මෝය" යනාදි සූත්‍රයෙහි පෙනෙන්නාවූ "මේ" යනු ප්‍රකෘති ශබ්දයද විභක්ත්‍යන්ත පදයද යනු අවිනිශ්චිත හෙයින් එහි ලිඞ්ගය අවිනිශ්චිතය. එහෙයින් ඡේ පුංලිඞ්ගයෙහි විශෙෂය දක්වීමට ප්‍රමාණ නොවේ.

"මෝ" යනු පූර්වොක්ත ප්‍රකාර ස්ත්‍රී ලිඞ්ගික නමුත් "මොහුට, මෝහට" යනාදි තන්හි පුං ලිඞ්ගයෙහි ලැබේ. සිදතෙහි:-

"සුගත්දෙව් මෝහට සෝගත්-උවසු."

(සුගත් දෙවතාවූයේ මෝහටනුයි සෝගත් නම්වේ. උපාසකයි.)

මෙසින් "මෝ" යනුද ස්ත්‍රී ලිඞ්ගයෙහි විශෙෂ දර්‍ශනය පිණිස ප්‍රමාණ නොවේ.

මෙසේ ලිඞ්ගභෙදයට මූලාශ්‍රයකොට පෙන්වනලද දෘෂ්ටාන්ත යුග්මයම කාර්‍ය්‍යානුරූප නොවෙත්.

එපමණක්ද නොවේ මෙකී පද යුග්මය ක්‍රමයෙන් පුං ස්ත්‍රී ලිඞ්ගික යයි මෙබඳු මුඛ්‍ය ස්ථානයෙක්හි කියාතිබෙන හෙයින් ඔව්හු මෙහි සීමාකරනලද එකම අවස්ථායෙහි පමණක් නොව සියලුමඅවස්ථාවන්හි එසේමයයි මහත්වූ මූලාවක් පවතී. ඒ අනුසාරයෙන් "ඒ" ශබ්දයෙන් සිඞවූ "ඒ, ඕ" යන රූපයන් ගැනද එම මූලාව පවතී. තවද "එ, මෙ" යන ශබ්දයෝ සමලිඞ්ගිකයයි කියන ලදින් මූලාව මහත් වියවුලෙන් ව්‍යාකූලිත වෙයි.

"තෙමේ තොමෝ යන වහරට කරුණුවූයේ ලිඟුනම්" යයි කියනලද්දේනම් මේසියලු මූලාහෙතූන්ගෙන් හා වියවුල්වලින් වියුක්තව ඉෂ්ටාර්‍ථය ලැබෙත්. සූත්‍රයද අතිශයින් ශාස්ත්‍රීය වෙති.

තවද දිය විදු ඇගි යයි කියූ තන්හි දිය ශබ්දය ජයාර්‍ථය, ජලාර්‍ථය, ජගදර්‍ථය, යන කොයි අර්‍ථයෙක්හි ගන්නාලද්දේ නමුත් මේ ව්‍යාකරණයෙහි පුංලිඞ්ගිකවේ. එහෙත් දුනුදිය යනඅර්‍ථයෙහි ගතහොත් ස්ත්‍රී ලිඞ්ගික වෙයි. එසේම විදු ශබ්දය විද්‍යාවිද්‍යුත්යන අර්‍ථයන්හි ස්ත්‍රී ලිඞ්ගික නමුත් පණ්ඩිතාර්‍ථයෙහි පුංලිඞ්ගික වේ. එහෙයින් මේ නිදසුන් දෙකම කාර්‍ය්‍ය පිණිස ප්‍රමාණ නොවෙත්. පුං ලිඞ්ගය පිණිස මිතුරු යනාදි ශබ්දයක්ද ස්ත්‍රී ලිඞ්ගය පිණිස සරසවිය යනාදි ශබ්දයක්ද යොදා ගන්නා ලද්දේනම් මේ ඉගැන්වීමේ ප්‍රකාර ඒ කාර්‍ය්‍යානුරූප වෙත්.

## සූත්‍රපාඨය. 13. විබත්.

නමින් පරව බෙදනු ලබනුයේ විබත්නම්. යෙහෙ, සෙබෙහි, ඇගි.

13 ව්‍යාඛ්‍යා. නමින් පරව, නාමය කෙරෙන් අපරව; බෙදනු ලබනුයේ, වෙන්කරනු ලබන්නේ; විබත්නම්, විභක්ති නම්. යෙහෙ, යහ යන්නෙන් සිදුවූ යෙහෙ යනුය; සෙබෙහි, සබ යන්නෙන් සිදුවූ සෙබෙහි යනුය; ඇගි, මේ ආදි ආකාර ඇත්තේයි.

## 18. විස්තරය. විභක්ති.

නාමයක්හුගේ ප්‍රවෘත්තිය නා නා සම්බන්ධයෙන් නා නා ප්‍රකාර වියහැකි. මිනිස් යනු නාමයකි. මෙය අර්ථසම්බන්ධය අනුව මිනිසා, මිනිසාට, මිනිසාගෙන් යනාදි වශයෙන් නා නා ප්‍රකාරව පවතී. ඒ සියලුම ප්‍රකාරයන් සමත්වයෙන් හා විෂමත්වයෙන්ද බලා සම සමයන් වෙන් වසයෙන් එක්කළ කල්හි සියල්ල නවවැදෑරුම්ව බෙදෙත්. මෙසේ වෙන් වසයෙන් බෙදීමට විභක්තියයි කියනු ලැබේ. විභාගය නොහොත් බෙදීම යනු එහි අර්ථයි. භජ් ධාතු වෙති.

එක් එක් විභක්තියට සඤ්ඤා වශයෙන් ලකුණක් තිබේ. හෙ නම් නාමයෙන් පරව යොදනු ලබන්නාවූ ප්‍රත්‍යයකි. මේ ප්‍රත්‍ය යටද විභක්ති යන නාමයම යෙදේ. විභක්තීන්හට පෙර, කම්, කතු ආදි වශයෙන් නම් යෙදෙත්. යහ යන නාමය එකවචන යෙන් පෙර විබත්හි ගනමනාතන්හි "එ" යනු ඊට යෙදෙන්නාවූ ප්‍රත්‍යය වේ. මෙහි යොගය වන්නේ නාමයෙන් පරවය. එයින් සිද්ධිය මෙසේ වේ. යහ + එ. මෙය සන්ධි ප්‍රාප්තියෙන් "යහෙ" යනු වේ. යහෙ යනු සුඛොච්චාරණයෙන් යෙහෙ වේ. යහපත යනු එහි අර්ථයයි. එසේම සබ යනු එකවචනයෙන් අදර විබත්හි ගනමනා තන්හි සබ + එහි යයි සිටී. මෙය සන්ධියෙන් සබෙහි වී සුඛොච්චාරණයෙන් "සෙබෙහි" වේ. සභාවෙහි යනු අර්ථයි.

මෙසේ යෙහෙ යයි කී තන්හි අන්තිම එ යන්න වනාහි යහ යන නමින් පරව බෙදීම ලබන්නාවූ නොහොත් වෙන්කොට දැක්විය හැකිවූ ප්‍රත්‍යයකි. එසේම සෙබෙහි යයි කී තන්හි අන්තිම "එහි"යනු සබ යන නාමයෙන් බෙදෙන්නාවූ ප්‍රත්‍යයකි. මෙසේ බෙදනු ලබන අර්ථයෙන් මේප්‍රත්‍යයන්හට විභක්ති නොහොත් විබත් යන නාමය යෙදෙන බැව් මේ ආචාර්යයෝ එහි ලක්ෂණ වශයෙන් කීහු.

## 18. නීතිසාරය. විභක්ති.

මෙහි කී ලක්ෂණය ප්‍රධානාර්ථය අත්හැර අප්‍රධානාර්ථය ලක්ෂ්‍ය කොට සිටි හෙයින් අශාස්ත්‍රීය වේ. විබත් යන්නෙහි ප්‍රධාන අප්‍රධාන වශයෙන් අර්ථ දෙකකි. ප්‍රධානාර්ථය නම් නාමයක්හුගේ

ප්‍රවෘත්ති සම්බන්ධයෙන් ලැබෙන්නාවූ කාරකාදි නවවිධ භෙද යකි. අප්‍රධානාර්ථය නම් මේ භෙදය දක්වීමට ඉවහල්වූ ප්‍රත්‍යය විශෙෂයකි. මේ ආචාර්යයන්ගේ ලක්ෂණ කථනය මේ අප්‍රධානාර්ථ යවූ ප්‍රත්‍යය සම්බන්ධයෙහි පමණක් විය. එහින් න්‍යූනය.

සාරස්වත ව්‍යාකරණයෙහි:—

කාරකාණි භවන්ති ෂට්.........................න්‍යාති විභක්ති රිත්‍යභිධීයතෙත.

(කාරකයෝ තුමූ සයෙක් වෙති. ඔව්හු විභක්තියයි කියනු ලැබෙත්.)

කාරකයෙන් බාහ්‍යවූ විභක්ති තුනද වෙනම දක්වූහු.

කරුණු මෙසේ හෙයින් "නමැසුරුව බෙදනු ලබනුයේ විබත් නම්" යයි කියන ලද්දේනම් ශාස්ත්‍රීය ලක්ෂණයක් වියයුතුයි.

(නමැසුරුව, නාමය ආශ්‍රිතව; බෙදනුලබනුයේ, වෙන්කොට දක්වනු ලබනුයේ; විබත් නම්, විභක්ති නම්.)

මෙයින් ධර්මයද ප්‍රත්‍යයද දෙකම ගැනෙත්. ධර්මය නම් පෙර, කම්, කතු ආදි වසයෙන් බෙදනු ලැබීමෙති; ප්‍රත්‍යය නම් ඒ, ඕ, හු, යනාදි වසයෙන් බෙදනු ලැබීමෙති.

### සූත්‍රපාඨය. 14. සමස්.

නේ සදන් සියොව එක සද අ.සුරක් වන සේ ගළපනු සමස් නම්. මීපල්, නිලුපුලැසී, ඇගි.

14. **ව්‍යාඛ්‍යා.** නේසදන්, අනෙක ශබ්දයන්; සියොව, සඹගනව; එකසද අසුරක් වනසේ, එක ශබ්දාකාරයක් වනසේ; ගළපනු, ඝටනය කිරීම; සමස් නම්, සමාස නම්. මීපල්, මී + පල් යන ශබ්ද යුග්මයෙන් මීපල් යනුය; නිලුපුලැසී, නිල් + උපුල් + ඇසී යන ශබ්දත්‍රයයෙන් නිලුපුලැසී යනුය; ඇගි, මේ ආදි ආකාර ඇත්තේයි. මීපල් නම් මහීපාලද්‍ හෙවත් රජය. නිලුපුලැසීනම් නීලොත්පලාක්ෂිය හෙවත් නීලොත්පලයන්ටබඳු වූ ඇස්ඇත්තීය.

### 14. විස්තරය. සමාස.

සද (ශබ්ද) යනු මේ ව්‍යාකරණයෙහි විශෙෂ වශයෙන් විභක්ත්‍යන්තව නොසිටියාවූ නාමයට යොදනු ලැබේ. ශබ්දයන්

කිහිපයක් එකම ශබ්දයක ආකාර ඇතිවනසේ ගැළපීම සමාස නම්. සන්ධියෙහි වනාහි ඝටනාව වර්ණයන් අතුරෙහි වේ. ශ්‍රවණ ගෝචර පමණකි. සමාසයෙහිද ආගන්තුක වශයෙන් සන්ධි ඇති වියහැකි. එහෙත් එහි විශෙෂයනම් වර්ණයන්ගේඝටනාව නොව අර්ථයන්ගේ ඝටනාව වේ. මී යන්නෙන් ධරණී යන අර්ථයද, පල් යන්නෙන් පාල යන අර්ථයද ගෙන දෙනු ලැබේ. මේ අර්ථ යුග්ම යෙහි ඝටනාව පිණිස මීපල්යයි කීකල්හි ධරණීපාල යන අර්ථය ගෙනදෙනු ලැබේ. තවද එයින් ඝටිතවූ මීපල් යනු ශබ්ද යුග්මයක නොව එකම ශබ්දයක ආකාරය දරා. එයින් විභක්තීන්හිදී මීපල්හු, මීපල්හුට, මීපල්හුගෙන් යනාදි වශයෙන් මේ ශබ්දාකාර යෙන් පරව ප්‍රත්‍යයෝ යෙදෙත්.

නිලුපුලැසී යයි කී තන්හිද න්‍යායය මෙසේමය.

## සූත්‍රපාඨය. 15. පියවි.

පියවි දෙවැදෑරුම්—ද පියවි සද පියවි වි
පදයොන් ද පියවි නම්—විබතෑනට ඇසුරැ සදපියවි නම්.

**15 ව්‍යාඛ්‍යා.** පියවි, ප්‍රකෘතිතොමෝ; දෙවැදෑරුම්, විප්‍රකාරවේ. දපියවි, ධාතුප්‍රකෘතිය; සද පියවි, ශබ්ද ප්‍රකෘතියයි; වි, කියායි. පදයොන්, පදයන්ට උත්පත්තිස්ථානවූයේ; දපියවි නම්, ධාතු ප්‍රකෘති නම්. විබතෑනට, විභක්ත්‍යාදීන්ට; ඇසුරැ, ආශ්‍රයවූයේ; සදපියවි නම්, ශබ්ද ප්‍රකෘති නම්.

## 15. විකාරය. ප්‍රකෘති.

මෙයින් ප්‍රකෘතිය සඤ්ඥාපිත කළහ. භාෂාවෙහි ප්‍රවර්තනය තෙම පදයන් කරණකොටගෙන වේ. "චතුර්විධං පදං ප්‍රොක්තම්" යී කියන ලදින් පදයෝ තුමූ සිව් වැදෑරුම් වෙත්. උපසර්ග නිපාත, නාමපද, ක්‍රියාපද යන මේ වශයෙනි මෙයින් නාම පදයන්ගේ හා ක්‍රියා පදයන්ගේ නිෂ්පත්තිය වන්නේ යම් කිසි මූලයකිනි. ඒ මූලයට ප්‍රකෘති යයි කියනු ලැබේ.

මේ ප්‍රකෘතීහු දෙවදෑරුම් වෙත්. ධාතු ප්‍රකෘති, ශබ්දප්‍රකෘති වශයෙනි. ශබ්ද ප්‍රකෘතිය නම් නාමයමැයි. උපසර්ග, නිපාතදෙකද ඇතැම් ආචාර්‍ය්‍යයෝ ශබ්දප්‍රකෘතියෙහිම ඇතුළත් කළහ. වෛයාකරණ සමයක් වශයෙනි.

ධාතු ප්‍රකෘතිය නම් පදයන්ගේ උත්පත්තිස්ථානයවූ මූලයයි. ශබ්ද ප්‍රකෘතිය නම් විභක්ත්‍යාදීන්ගේ ආශ්‍රයවූ හෙවත් ඔවුන්ගේ යෙදීමට ආස්පදවූ මූලයයි.

### 15. නිතිසාරය. ප්‍රකෘති.

මෙහි ධාතුප්‍රකෘතියද ශබ්ද ප්‍රකෘතියද දෙකක් බව පළමු කොට කියා පසුව සියලුම පදයන්ගේ උත්පත්තිස්ථානය හෙවත් ප්‍රකෘතිය ධාතුව බව කීහු. එකල නාමපදයන්ගේ ප්‍රකෘතියද ධාතුව වේ. ක්‍රියා පදයන්ගේ ප්‍රකෘතියද ධාතුව වේ. දෙකෙහි වෙනසක් නොමැත්තේය. "පියවි දෙවදූරුම්" යනු එයින් ව්‍යර්ථ වෙයි.

මෙසේ මේ සූත්‍රය සාවද්‍යබව පෙනේ. ඇතැම් ආචාර්යයෝ මෙහි "පද" යන්නෙන් අදහස් කරන ලද්දේ එහි සාමාන්‍යවූ අර්ථයනොව විශේෂාගත යුතුවූ ක්‍රියාපදය යන අර්ථයපමණකැයි සලකා එසේ උගන්වති. අදහස එසේයයි ගතහොත් දූෂණය බොහෝසේ අඩුවෙයි. එහෙත් දෙකක් කියවෙන තැන එකක් ගැනීමට රීතියක් නොපැනේ. එසේ ගත්තත් අර්ථ ව්‍යක්තියෙන් තොර හෙයින් එකල්හිදු සූත්‍රය සදෝස්බැව් කිය යුතුයි. "කිරිය මුල් දපියවි නම්" යනාදියක් කියන ලද්දේ නම් මේ විකල්පය යෙන් තොරව අර්ථය ලැබෙත්.

### සූත්‍ර පාඨය. 16-19. පියවි බේ.

16. වෙන වෙන දෙක නිපන්—නසම තබවයි එනෙබේ
කිසි අන් බසින් නුමුසු—හෙළදිව් පළ නිපන් නම්.

17. මගද සකු ඈ බණ—සමවූ බස තසම නම්
බිඳුණේ තබව නම්—විමසා දනු එහි පියෝ.

18. රුකුර, තරඹ, ඈ නිපන් දූ පියවි නම්.
යා, දූ, කර, ඈ තසම දූ පියවි නම්.
දත, නැඟි, සමර, තුලුර, ඈ තබව දූ පියවි නම්.

19. කොළඹ, කරළු, ඈ නිපන් සද පියවි නම්.
ගජ, කර, කිරණ, ඈ තසම සදපියවි නම්.

අත්, රුක්, සමන් බගදුරු, ඇදුරු, කන්, ඇඹුල් ඈ තබව සද පියවි නම්.

ව්‍යාඛ්‍යා. 16. එදෙක, ධාතුප්‍රකෘති ශබ්දප්‍රකෘති යන ඒ ඒකය තෙම; වෙන වෙන, වෙන් වෙන්ව; නිපන්, නිෂ්පන්නය; තසම, තත්සමය; තබවයි, තද්භවයයි (කියා); තෙබේ, ත්‍රිභෙදවේ. කිසි අන් බසින්, කිසිම අන්‍ය භාෂාවකින්; නුමුසු, අමිශ්‍රවූ; හෙළදිවිපල, සිංහලවීපයෙහි ප්‍රකටවූයේ හෙවත් ප්‍රාදුර්භූතවූයේ; නිපන් නම්, නිෂ්පන්න නම්.

17. මගද, මාගධිය; සකු, සංස්කෘතය; ඇබණ, යන මේ ආදි භණිතයක් හා; සමවූ බස; සමානවූ භාෂිතය තෙම; තසම නම්, තත්සම නම්. බිඳුණේ, භින්නවූයේ; තබව නම්, තද්භව නම්. එහි, එම ෂඩ්විධ ප්‍රකෘති සම්බන්ධයෙහි; පියෝ, ප්‍රයොග යත්; විමසා, විමර්ශනය කොට; දනු, ඥනය කරනු.

18. රුකුර, ක්‍රියාර්ථයෙහිවූ රුකුර යනුය; තරඹ, නිරීක්ෂණාර්ථයෙහිවූ තරඹ යනුය; ඈ, මේ ආදිය; නිපන් දපියවි නම් නිෂ්පන්න ධාතු ප්‍රකෘති නම්.

යා, ගමනාර්ථයෙහිවූ යා යනුය; ද, දහනාර්ථයෙහිවූ ද යනුය; කර, ක්‍රියාර්ථයෙහිවූ කර යනුය; ඈ, මේ ආදිය; තසම දපියවි නම්, තත්සම ධාතු ප්‍රකෘති නම්.

දන, ජයනාර්ථයෙහිවූ දන යනුය; නැඟි, ආරොහණාර්ථයෙහිවූ නැඟි යනුය; සමර, සමරණාර්ථයෙහිවූ සමර යනුය; තුලුර, ආලිඞ්ගනාර්ථයෙහිවූ තුලුර යනුය; ඈ, මේ ආදිය; තබව දපියවි නම්, තද්භව ධාතු ප්‍රකෘති නම්.

19. කොලඹ, නෞකාතීර්ථවාචිවූ කොලඹ යනුය; කරළු; නව වස්ත්‍රවාචිවූ කරළු යනුය; ඈ; මේ ආදිය; නිපන් සදපියවි නම්, නිෂ්පන්න ශබ්දප්‍රකෘති නම්.

ගජ, හස්තිවාචකවූ ගජ යනුය; කර, හස්ත වාචකවූ කර යනුය; කිරණ, රශ්මිවාචකවූ කිරණ යනුය; ඈ, මේ ආදිය; තසම සදපියවි නම්, තත්සම ශබ්ද ප්‍රකෘති නම්.

අත්, අත්‍යාදිවාචිවූ අත් යනුය; රුක්, වෘක්ෂවාචකවූ රුක් යනුය; සමන් බහදුරු, සමන්තභද්‍රවාචිවූ සමන් බහදුරු යනුය; ඇදුරු, ආචාර්‍ය්‍යාදිවාචිවූ ඇදුරු යනුය; කන්, කර්‍ණාදි නොත්‍රාදි වාචිවූ කන් යනුය; ඇඹුල්, විශ්‍රාමශාලාදි වාචිවූ ඇඹුල් යනුය; ඈ, මේ ආදිය; තබ්බව සදපියවි නම්, තද්භව ශබ්දප්‍රකෘති නම්.

## 16—19. විස්තරය. ප්‍රකෘති භෙද.

ධාතු-ශබ්ද-වශයෙන් ප්‍රකෘතිය විවිධබැව් පළමුකොට කියාදුන් ඒ එක් එක් භෙදය නිෂ්පන්න, තත්සම, තද්භව වශයෙන් ත්‍රිවිධබැව් මෙහි කියත්. නිෂ්පන්න යනුවෙන් මේ ලඞ්කාවීපයෙහිම ප්‍රාදුර්භූතවූ අන්‍යකිසි භාෂාවකින් මිශ්‍රනුවූ ධාතුප්‍රකෘතිහුද ශබ්ද ප්‍රකෘතිහුද කියනු ලැබෙත්. තත්සම යනුවෙන් සංස්කෘත මාගධී ආදි භාෂාවන් හා සාධාරණවූ ධාතු ප්‍රකෘතිහුද ශබ්ද ප්‍රකෘතිහුද කියනු ලැබෙත්. තද්භව යනුවෙන් සංස්කෘත මාගධී ආදි භාෂාවන්ගෙන් සිංහලට බිඳී ආවාවූ ධාතුප්‍රකෘතිහුද ශබ්ද ප්‍රකෘතිහුද කියනු ලැබෙත්.

මෙසේ ප්‍රකෘති තොමෝ ෂඩ්විධ වේ—

නිෂ්පන්න ධාතු ප්‍රකෘතිය, නිෂ්පන්න ශබ්ද ප්‍රකෘතිය,
තත්සම ධාතු ප්‍රකෘතිය, තත්සම ශබ්ද ප්‍රකෘතිය,
තද්භව ධාතු ප්‍රකෘතිය, තද්භව ශබ්ද ප්‍රකෘතිය—
යන මේ වසයෙනි.

මේ ප්‍රකෘතීන්ට මෙසේ උදාහරණ කීහු:—

(1.) නිෂ්පන්න ධාතු ප්‍රකෘතියට :—

රුකුර, කිරීමේ ධාතුවයි. "පරනට බියව රුකුළෝ" යන පාඨයෙහි පෙනෙන්නේ මේ ධාතුවෙහි යොගයයි.

නරඹ, බැලීමේ ධාතුවයි. "ඉටු සකිනේ තුටු සකිනේ නරඹමින"—

යන තන්හි පෙනෙන්නේ මේ ධාතුවෙහි යොගයයි. මේධාතු දෙකම මාගධී සංස්කෘත ආදි යම්කිසි භාෂාවක් හා සාධාරණ නොවෙත්. එබඳු යම් කිසි භාෂාවකින් භින්නවී ආ බවක් හෝ නොපැනේ. එයින් මොවුනු ලඞ්කාවෙහිම ප්‍රාදුර්භූතවූ ප්‍රකෘතීහු

යයි පිළිගතයුතු වේ. සූත්‍ර පාඨයෙහි ඈ යන්නෙන් තවත් මෙසේම වූ නිෂ්පන්න ධාතු ප්‍රකෘතීන් ඇති බැව් ප්‍රතීත කළහ.

(2.) නිෂ්පන්න ශබ්ද ප්‍රකෘතියට :—

කොළඹ, නෞකාතීර්ථය හෙවත් වරාය යනු අර්ථයි. මෙය කොළොම් ගසට නම්වූ කදම්බ යන්නෙන් බිඳුණේයයි ඇතම්හු සිතත්. එය කෂ්ට මතයක් බැව් කිය යුතුයි. බිඳුණේ නම් නිෂ්පන්නයක් විය නොහැකි හෙයිනි.

කරළ, නව වස්ත්‍රය යනු අර්ථයි.

මේ කොළඹ, කරළ යන ශබ්දද්වය මාගධී සංස්කෘතාදි භාෂාවන්හි නොපැනෙන හෙයින් ඔවුන්ගේ නිෂ්පන්න භාවය නිශ්චිතය.

(3.) තත්සම ධාතු ප්‍රකෘතියට :—

යා , ගමනාර්ථයෙහි ධාතුයි.
දා , දානාර්ථයෙහි ධාතුයි.
කර , ක්‍රියාර්ථයෙහි ධාතුයි.

මෙයින් යා, දා, යන ධාතු යුගමය සංස්කෘත මාගධී භාෂාවන් හා සාධාරණය. කර ධාතුව සංස්කෘතයෙහි පෙනෙන්නේ "කෘ" වශයෙනි. එහෙත් මාගධියෙහි කර යයි පෙනේ. එයින් ඒ වනාහි මාගධිය හා සාධාරණය. මෙසේ මොවුන් සංස්කෘත මාගධී භාෂාවන් හා සාධාරණ හෙයින් හෙවත් එම භාෂාවන්හි පෙනෙන්නාවූ ප්‍රකෘතීන් හා සම හෙයින් මොව්හු තුමූ තත්සම වෙත්. ඈ යන්නෙන් මෙබඳු අන්‍යයෝද ගැනෙත්.

(4.) තත්සම ශබ්ද ප්‍රකෘතියට :—

ගජ , හස්තිවාචකවූ ශබ්දයයි.
කර , හස්තවාචකවූ ශබ්දයයි.
කිරණ , රශ්මිවාචකවූ ශබ්දයයි.

මේ තුන සංස්කෘත මාගධී භාෂාවන්හිද මෙසේමය. එයින් තත්සම වෙත්. ඈ යන්නෙන් අන්‍යයන්ද ප්‍රතීත කළහ.

(5.) තද්භව ධාතු ප්‍රකෘතියට :—

දන , ජයනාර්ථයෙහි ධාතුයි. (ජයන යනු දිනීමයි.)
නැඟ , ආරෝහණාර්ථයෙහි ධාතුයි.
සමර , සමරණාර්ථයෙහි ධාතුයි.
තුලුර , ආලිඞ්ගනාර්ථයෙහි ධාතුයි.

මෙයින් දන යනු සංස්කෘත මාගධී 'ජිත' යන්නෙන් හිත්‍යාය. 'ජි' ජයෙ යනු එහි ධාතුවයි. නැඟ යනු සංස්කෘත මාගධී ලඞ්ඝ යන්නෙන් හිත්‍යාය. සමර යනු සංස්කෘත සමෘ යන්නෙන් හිනතයා. එයින් මොවුහු තද්භව ධාතුහු වෙත්.

තුලුර යනු කවර භාෂාවකින් හිනතදැයි තවම නොදන්නා ලදි.

(6.) තද්භව ශබ්ද ප්‍රකෘතියට :—

අත් , අන්තාදි වාචි ශබ්දයයි.
රුක් , වෘක්ෂවාචි ශබ්දයයි.
සමන් බහදුරු , සමන්ත භද්‍රවාචි ශබ්දයයි.
ඇදුරු , ආචාර්‍ය්‍යාදි වාචි ශබ්දයයි.
කන් , කර්ණාර්ථ නෙත්‍රාර්ථ වාචි ශබ්දයයි.
ඇඹුල් , අම්ලාදි වාචි ශබ්දයයි.

මේ ශබ්දයෝ වනාහි සිය බසට බිඳී ආවාහු වෙත්.

ඔවුන්ගේ භෙදය මෙසේය :—

| සංස්කෘත. | මාගධී. | ද්‍රවිඩ. | සිංහල. |
|---|---|---|---|
| අන්ත | අන්ත | ... | අත් |
| අර්ථ | අත්ථ | | |
| අස්ත | අත්ථ | | |
| හස්ත | හත්ථ | | |
| වෘක්ෂ | රුක්ඛ | ... | රුක් |
| සමන්තභද්‍ර | (සමන්තභද්ද) | .. | සමන්බහදුරු |
| අද්‍රි (පර්වතය) | (අද්දි) | ... | ඇදුරු |
| ආචාර්‍ය්‍ය | ආචරිය | | |
| කර්ණ (ශ්‍රවණය) | කණ්ණ | ... | කන් |
| ... | ... | කණ් (ඇස) | |

| සංස්කෘත. | මාගධී. | ද්‍රවිඩ. | සිංහල. |
|---|---|---|---|
| අමල | ... අම්බිල | ... | ඇඹුල් |
| ආමල | | | |
| සාම්බල | කාම්බල | ... | |
| ... | ... | අම්බලම් (විශ්‍රාමශාලා) | |

මෙසේ බිඳී ආ හෙයින් මේ ශබ්ද ප්‍රකෘතීහු තද්භවයහ.

## 16-19. නිතිසාරය. ප්‍රකෘතිභෙද.

(1.) මේ ව්‍යාකරණ කාණ්ඩයේ නිසි අවබොධය පිණිස සිංහල භාෂාවෙහි සම්භවය ස්වල්ප වශයෙන් හෝ දැනගැන්ම යොග්‍ය වේ. එය ඉතිහාස මාර්‍ගයෙන් කටයුතු හෙයින් ඉතිහාස යද මෙහි ඉවහල්යෑ. ලඞ්කා වේ ඉතිහාසය නිසි ලෙස පටන් ගන්නේ විජය රජුගේ ආගමනයෙනි. ඊට පූර්‍වකාලයන්හිද ලඞ්කාව ගැන යම් යම් සඳහන් යම් යම් තන්හි කථාංශමාත්‍රයෙන් දක්නට ලැබෙත්.

(2.) බොහෝ ඈත් කාලයෙහි මේ ලඞ්කාවේ ජනතාව අසුර සඞ්ඛ්‍යාවෙහි ගැනුණු බැව්ද එකල තාරක නම් අසුරරාජ යකු ඔවුන්ට අධිපතිව සිටි බැව්ද යම් කිසි පුරාණ ග්‍රන්ථයක පෙනේ. මේ අසුර රාජයාගේ කාලය නම් ආර්‍යයන් ජම්බුද්වීපයට පැමිණ එහි මුල් අල්ලමින් සිටින්නාවූ කාලය බව පෙනේ. මක්නීසාදයත් මොහු විසින් දෙව්ලොවට ගොස් දෙවියන් පරදවා වන්දීන් ගෙනා බවද ශක්‍රයා මොහුගේ අනුග්‍රහය පිණිස මොහුට විටින් විට පුදපඬුරු එවූ බවද කිසිතැනෙක කී හෙයිනි. මෙහි දිව්‍යලොක යන්නෙන් ආර්‍යයන් බිම් ගෙන සිටි තැන්ද ශක්‍රයාගෙන් ආර්‍යයන්ගේ බල මහිමය නොහොත් උපචාරයෙන් එම බලමහිමය උසුලන්නාවූ තැනැත්තාද කීසේ පෙනේ. එයින් ලඞ්කාධිපතිවූ අසුර රාජයා ජම්බුද්වීපයෙහි පවා ඇතම් ප්‍රදෙශයන්හි ප්‍රවෘත්තවූ ආඥාචක්‍රයකින් යුක්තව සිටි බවද ලඞ්කා ජනතාව බලසම්පන්නවූ ද්‍රවිඩ වර්‍ගයක්වූ බවද එසේම පෙනේ.

(3.) ඊළඟට ලඞ්කාව ගැන කථාංශයක් ලැබෙන්නේ රාමායණ කථායෙනි. එම කථාවෙහි පෙනෙන්නාවූ කාලයෙහි මේ ද්වීපයට අධිපතිව සිටියේ රාවණ නම් රජෙකි. එකල ලඞ්කා ජනතාව රාක්ෂස නමින් ජම්බුද්වීපයෙහි දන්නාලදී. රාක්ෂස යන නමින් අපේ සිතෙහි උපදින්නාවූ බුද්ධිය නම් භයානකවූ අමනුෂ්‍ය

වර්ගයෙක යනුයි. නුමුත් රාමායණයෙහි ප්‍රකාර ඔවුන් එබඳු වර්ගයක්වූබව නොපෙනේ. ඒ ග්‍රන්ථයෙහි ඔවුන් ගැන කර තිබෙන්නාවූ විස්තරයෙන් පෙනෙන්නේ නම් ඔවුන් වර්තමාන සිංහල වර්ගයාගෙන් වැඩි වෙනසක් නොමැතිව සිටියාවූ ජනතාවක් බවයි. වර්තමාන සිංහලයන් අතරෙහි සේම ඔවුන් අතරෙහිද අරූප ජනයෝ නොසිටියාහු නොවෙත්. නුමුත් සාමාන්‍ය වශයෙන් ඔව්හු රූපවත් ජනතාවක් වූහ. ඔවුන්ගෙන් ඇතම්හු බොහෝ දර්ශනීයවූ අය වූහ. ඔවුන්ගේ ඇතම් කුලාඞ්ගනාවෝ සුවර්ණ වර්ණ දෙහයෙන්ද චන්ද්‍රායමාණවූ වක්ත්‍රයෙන්ද යුක්තවූ මහත් රූප සම්පත්තියෙන් විරාජමානවූ කාන්තාවෝ වූහ. විද්‍යා ශිල්පයන්හි ඔවුන්ගේ නිපුණත්වය බොහෝවූ බව පෙනේ. කුල කාන්තාවන් විසින් තමන්ගේ විනෝදය පිණිස ගායනය කරන කල්හි එහි ශ්‍රවණ චිත්තාරාධනය අප්‍රමාණ විය.

(4.) රාවණ රාජයාද ජම්බුද්වීපයෙහි ඇතම් ප්‍රදේශයන්ට චක්‍රවර්තිව සිටි සේ පෙනේ. ඔහුට ශීර්ෂ දශයෙකැයි කියා තිබේ. එයින් පෙනෙන්නේ ඔහු ප්‍රදේශ දශයකට අධිපතිව ඊට ලකුණක් වශයෙන් දශචක්‍රයකින් යුත් කිරීටයක් පැළඳිබව යයි සිතේ.

(5.) මේ කාලයෙහි උත්තර ජම්බුද්වීපයෙහි සූර්යවංශය චන්ද්‍රවංශයයි ප්‍රකටවූ ද්‍රවිඩ රාජ පරම්පරා දෙකක් ආර්යයන්ගේ උපදෙස් ඇතිව ද්‍රවීල මනුෂ්‍ය ජාතීන්ට පහර දී ඔවුන් යටත් කර ගනිමින් බොහෝ බලසම්පන්න භාවයට පැමිණ සිටියාහුය. මෙයින් සූර්ය වංශයට රාමචන්ද්‍රනම් රජදරුවෙක් මෙකලට අධිපතිව සිටියේය. මොහුද ලඞ්කාධිපතිවූ රාවණරජුද අතරෙහි සට්ටනයක් අටගෙන යුද්ධාරම්භයක් විය. රාමචන්ද්‍ර තෙමේ මයිසෝර් දේශයේ උත්තර භාගයෙහි පිහිටි කිෂ්කින්ධ ප්‍රදේශයෙන්ද උපකාර ඇතිව මහත් සෙනඟක් පිරිවරා අවුත් ජම්බුද්වීපයද ලඞ්කාවද අතරෙහි මුහුද ඉතා පටු තැනෙක්හි මියරක් බැඳ ඒ පිටින් ලඞ්කාවට පැමිණ දෙලොස් හවුරුද්දක් යුදකොට රාවණ රජුගේ සොහොයුරුවූ විභීෂණහුගේ උපකාර ඇතිව රාවණ රජු පරාජිත කොට ජීවිතක්ෂයට පැමිණවිය. මේ දෙලොස් හැවිරිදි යුදයෙන් හා එහි අවසානය වූ පරාජයෙන්ද ලඞ්කාවෙහි බලය භග්න විය. ඉන්පසු ලඞ්කාව භාතිය දෙසටම ගමන්කළාය යයි සිතිය යුතු බව පෙනේ.

(6.) නැවත ලංකාව ගැන අපට අසන්ට ලැබෙන්නේ නම් ගෞතම බුද්ධරජාණන් වහන්සේගේ සම්බෝධි ප්‍රාප්තියෙන් පසුය. එකලට ලංකාවෙහි බිම්තැන්න පටන් නැගෙනහිර ප්‍රදේශයට, එනම් දැනට මඩකලපුව තිරිකුණාමලය යන නගරයන් ප්‍රධාන කොට ඇති ප්‍රදේශයට, සිටියාවූ ජනතාව 'යක්ෂ' යන නමින් ප්‍රකටවූ බවද, ලංකාවෙහි බටහිර ප්‍රදේශයෙහි එනම් කැලණිය පටන් යාපනය දක්වා ඇති ප්‍රදේශයෙහි සිටියාවූ ජනතාව 'නාග' යන නමින් ප්‍රකටවූ බවද පෙනේ.

(7.) බුදුන් පිරිනිවි හැට පස් වැනි වර්ෂයෙහිදී පමණ උත්තර කාලිංග දේශයේ සිංහපුර නම් නගරයෙන් නොපනත්කම් නිසා නෙරපා හරිනලද විජය නම් රාජ කුමාරයෙක් සත් සියයක් අනුචර පිරිසත් සමග අවුත් ලංකාවට ගොඩ බැස්සේය. ඔහු ගොඩ බැස්සේ ලංකාවේ යක්ෂ වාසයවූ ප්‍රදේශයට හෙයින් නැගෙනහිර දිසාවට විය යුතුයි. ඒ දිසාවෙහි තම්බලගාමම් නමින් ප්‍රදේශයක් තිරිකුණාමලය සමීපයෙහි තිබේ. තම්බල ගාමම් යයි දැන් කියනු ලබන්නේ දෙමළෙති. ඊට පෙර පැවති සිංහල නාමය තම්මන්නා වියයි සිතිය යුතු බවද විජය කුමරු ගොඩ බටුයේ ඒ තම්මන්නාවට මුත් පශ්චිම ලංකාවේ තම්මන්නා ප්‍රදේශයට නොවේ යයි පිළිගත යුතු බවද පෙනේ. විජය හා ඔහුගේ පිරිස සිංහ නම් ජනතාවකට අයත් ජනයෝ වූහ.

යක්ෂයන්ගේ කුමාරියක් යයි සැලකිය යුතුවූ කුවේණී නම් කාන්තාවක් මේ සිංහයන් සවකීය ආරක්ෂාවට ගෙන පසුව විජය කුමරුහට පත්නී විය. මේ පත්නියගේ උපකාරයෙන් විජය තෙමේ මංගලෝත්සවයකදී සවකීය කඨෝරයන් සමග යක්ෂාධිපතීන් කෙරෙහි ද්‍රෝහිත්වයෙන් පැන නැගී ඔවුන් ඝාතනය කොට එම ප්‍රදේශයෙහි ආධිපත්‍යය අල්ලාගත්තේය. ක්‍රමයෙන් අනික් ප්‍රදේශයන්ද යටත් කොට ගෙන හේ තෙමේ මුළු ලංකාවට අධිපති විය.

(8.) එසේ අධිපතිවූ විජයසිංහ විසින් මෙතෙක්කල් තමා හට පිළිසරණව සිටියාවූ කුවේණිය අත්හැරදමා ආසන්න රජදරුවන් අතරෙහිද තමා ශ්‍රෑයමාන වීමේ සම්බන්ධයක් ඇතිකරගනු

පිණිස දක්ෂිණ ජම්බුද්වීපයේ පාණ්ඩ්‍ය රජහු වෙත පුදපඬුරු යවා ඔහුගේ දුහිතෘ කුමාරියක් ගෙන්වා ඈ පරිග්‍රහ කරගන්නා ලදී. ඒ කුමරිය සමග ඔහුගේ පිරිසට භාර්‍යාවන් වනු පිණිස නා නා තරා තිරම්වල සත්සියයක් තරුණියෝද පැමිණියෝය. කුම රිය සමග ආවාවූ පිරිවර හා කම්කරු මෙහෙකරු ආදී පිරිස බොහෝ විය.

(9,) මෙසේ ලඞ්කා භූමිය ත්‍රිවර්ගිකවූ ජනතාවකින් යුක්ත විය. එක් වර්ගයක් නම් ස්වදේශිවූ යක්ෂ නාගයෝ වූහ. මොව්හු තාරක කාලයෙහි අසුර නමින්ද, රාවණ කාලයෙහි රාක්ෂස නමින්ද ජම්බුද්වීප වාසීන් විසින් දන්නාලද බලසම්පන්න ජනතා වෙත් පසු කල බලහීනත්වයට පැමිණ පැවත ආවාවූ ජනයෝ වූහයි පිළිගත යුතුබව පෙනේ. අසුර රාක්ෂස යක්ෂ නාග යන මේ සියලුම නම්වලින් කියවෙන්නේ ද්‍රවිඩයෝමය. යක්ෂ රාක්ෂස යෝ මුව දෙකෙලවරින් නික්මුණාවූ වක්වූ දළ යුවලකින්ද නාගයෝ හිසමතුයෙහි පැන නැග සිටියාවූ පෙණ මඩුල්ලකින්ද යුක්තව සිත්කම්හි ඔවුන්ගේ රූප සටහන්වල පෙනෙත්. මේ සටහන් වනාහි ඔව්හු අමනුෂ්‍යයෝ වූහයි යන බුද්ධිය අනුව පසු කල නිපදවා ගන්නාලද සටහන් වෙත්.

(10.) යථෝක්ත ත්‍රිවර්ගයෙන් තවත් එක් වර්ගයක් නම් සිංහ පුරයෙන් ආවාවූ සිංහයෝය. මහාවංශ කථායෙහි ප්‍රකාර සිංහ පුරය වඞ්ගදේශයටද මගධ දේශයටද ආසන්නවූ ලාළනම් ප්‍රදේශ යක නිපදවන ලද්දක් බව පෙනේ. ඒ විස්තරයට අනුවර්තීව පිහිටියාවූ තවමත් සිංහභූමි යන නමින් ප්‍රකටවූ ප්‍රදේශයක් වර්තමාන කලිඞ්ගයට වයඹ දිගින් පිහිටා තිබේ. රාංචි හෙවත් රාර ප්‍රදේශයෙහිය. එය කලක් චෝටා නාග්පූර් යන විශාල ප්‍රදේශයෙහි කොටසක් විය. කලක් වඞ්ග දේශයෙහි කොටසක් විය. දැනට ඔරිසා නම් ප්‍රදේශයෙහි කොටසක්ව පවතී. පෙර කල වඞ්ග දේශයට ඇතුලත්වූ සිංහපුරය පිහිටි ප්‍රදේශය නම් මේ සිංහ භූමියම යයි පිළිගැනීම න්‍යායානුකූල බව පෙනේ.

(11.) සිංහ භූමිය වනාහි අද දක්වා පිරිසිදු ද්‍රවිඩ ජනතාව කින් යුක්තවූ රටකි. සිංහ භූමි යනු සිංහ නම් ජනයන්ගේ භූමි යයි. විජය කුමරුගේ මුත්තණු තෙමේ මෙබඳු සිංහයෙක් විය,

ඔහුගේ පුත් තෙමේ සීහබාහු විය. ඔහුගේ දූ තොමෝ සීහ සීවලී විය. මොව්හු දෙදෙනා පාණිග්‍රහණයෙන් විසූහ. ආර්‍ය නීතියෙහි ප්‍රකාර නම් සහෝදර සහෝදරියන් අතරෙහි සඞ්ගමය තෙම මරණයෙන් දඬුවම් කටයුතුවූ අපරාධයකි. එහෙත් මොව්හු කිසි දඬුවමකට හෝ ලොක නිඳුවකට හෝ නො පැමිණ බොහෝ දරු සම්පතට පැමිණ යශඃ ශ්‍රීන් විසුවාහුය. හෙද ඔවුන් ආර්‍යයන් නොව ද්‍රවිඩයන්වූ බවට එකාන්තික සාක්‍ෂ්‍ය යකි. ද්‍රවිඩයන් අතරෙහිද ශිෂ්ටමාර්ගය දෙසට යම්තම් ගමන් ගත්තාවූ වර්‍ගයකැයි කියයුතු.

(12.) මෙසේ බලන කල සිංහ පුරය සිංහ භූමියෙහිම පිහිටි යේ යයි අශඞ්කිතව පිළිගත යුතු බවද, එසේ පිළිගත්තා හෝ නොපිළිගත්තා හෝ ඉන් ආවාවූ සිංහයෝ ද්‍රවිඩ වර්‍ගයක් වූහයි නිශ්චිත වශයෙන් පිළිගැනීම ආවශ්‍යක බවද පෙනේ.

(13.) තෘතීය වර්‍ගය නම් දක්‍ෂිණ ජම්බුද්වීපයෙන් ආවාවූ පාණ්ඩ්‍යයෝ වෙත්. පාණ්ඩ්‍ය දෙශය නම් දැනට මදුරා නමින් ප්‍රකටවූ ප්‍රදෙශය මූල්කොට පැවති රාජ්‍යයකි. එය ජන්ම භූමි කොට ඇත්තාවූ සකල ජනතා තොමෝ අද දක්වාම ද්‍රවිඩයෝ වෙත්. සිංහලට දෙමළ යයි බිඳුණේ මේ ද්‍රවිඩ නාමයයි.

(14.) මෙකී යක්‍ෂ, නාග, සිංහ, පාණ්ඩ්‍ය යන ජනතාවන් කල්යෑමෙහිදී එකීභූතවීමෙන් සිංහල වර්‍ගය තෙම සම්භව ප්‍රාප්ත විය. මේ වර්‍ගයට සිංහ පුරයෙන් ආවාවූ සිංහයන් ප්‍රධානහෙයින් ඒ සම්බන්ධයෙන් එම සිංහ නාමයට අපත්‍යාර්ථයෙහි "ල" ප්‍රත්‍යය යෙදී "සිංහල" යන නාමයද ඒ සමග ව්‍යවහාර ප්‍රාප්ත විය. එහෙත් මෙහි ප්‍රායොවෘත්තියෙන් ඇතුළත්වූ වර්‍ගය නම් රාක්‍ෂසයන්ගෙන් පැවති යක්‍ෂ නාග නම් ස්වදෙශීය වර්‍ගය වියයි පිළිගත යුතු බව පෙනේ. ඊළඟ විශාල වර්‍ගය නම් පාණ්ඩ්‍යයෙන් ආවාවූ දෙමළ සෙනගය. මෙසේ බලනකල සිංහලයෝ තුමූ සිංහ යක්‍ෂ නාග දෙමළ යනමොවුන්ගේ දරුවෝද නාග යක්‍ෂ පක්‍ෂයෙන් රාක්‍ෂස යන්ගේ මුනුබුරෝද වෙත්.

(15.) මේ සිංහල ජනතාවගේ සම්භවය සමග ඔවුන්ගේ භාෂාවද සම්භව ප්‍රාප්ත විය. භාෂාවක් නම් සිතෙහි උපදින්නාවූ අදහස් ප්‍රකාශ කිරීමේ මාර්ගය වේ. ප්‍රකාශය තෙම වාග් විෂය

කොට ඇත්තේය. මේ නම් භාෂාවෙහි ශ්‍රවණීය පක්ෂයයි. එහෙත් වාග් විෂයයට පැමිණවීමට පෙර අදහසෙහි ප්‍රකාශය සිතෙහිදීම එක් පිළිවෙළකට යොදා ගත යුතු වේ. මේ භාෂාවෙහි මනෝමය පක්ෂයයි. මෙසින් භාෂාතොමෝ මනෝ විෂය ශ්‍රොතෝ විෂය යයි උභය පක්ෂයකින් යුක්ත වේ. මනෝවිෂය පක්ෂය තෙම වාක්‍ය යොජනා ධර්මයන් සෙවනය කොට පවතී. ශ්‍රොතෝ විෂය පක්ෂය තෙම අර්ථවාහකවූ පදයන් සෙවනය කොට පවතී.

(16) අන්‍යොන්‍ය ප්‍රභෙද ඇති භාෂාවන් කථා කරන්නාවූ ජනතාවන් කිහිපයක් එකම ජන සමූහයක් වූකල්හි ඔවුන්ගේ භාෂාවන් අතරෙහිද සම්මිශ්‍රණයක් ඇතිවේ. මේ සම්මිශ්‍රණය සාමාන්‍ය වශයෙන් වන්නේ උත්සාහ කොට ශාස්ත්‍රානුකූලව ඉගෙන ගැනීමකින් නොව ඇසෙන්නාවූ පමණින් ඉගෙන අන්‍යොන්‍ය පක්ෂීය පදයන් ව්‍යවහාර කිරීමෙනි. පර රීතිය ඉතා පහසුවූ තැනෙහි මිස අනිකුත් සියලුම තන්හි වාක්‍ය යොජනාව කරන්නේ‍ තමන්ගේ බුඩියට පුරුදුවූ සේය, නොහොත් ස්වකීය භාෂාවෙහි වාග් ධර්මානුකූලවය. මෙසේ ජනතාවන් කිහිපයක් එක්වීමෙන් ඔවුන්ගේ භාෂාවන්ද මිශ්‍රණයට පැමිණීම කරණ කොටගෙන යම් අභිනව භාෂාවක් සෑදේද ඒ අභිනව භාෂාවෙහි වාක්‍ය යොජනා ධර්මයන්ගෙන් වැඩියක් ලැබෙන්නේ යටකී ජනතාවන් අතුරෙන් එක් පක්ෂයක් ඉතා විශාල නම් ඒ විශාල පක්ෂයෙන් බව ප්‍රත්‍යක්ෂමැයි. කොෂය හෙවත් වාක් සමූහය එම පක්ෂයෙන්ම හෝ ඉතා බලවත් පක්ෂයෙන් හෝ ව්‍යාප්තියට පැමිණිය හැකි නමුදු මහාජනයා කෙරෙහි ශාස්ත්‍රීය ඉගැන්වීමක් නොමැති තැන්හි මනෝ විෂයවූ පරකීය වාක්‍ය ධර්මයන්ගේ එබඳු ව්‍යාප්තියක් නොලැබේ. ස්වකීය කොෂය පහව ගිය නමුදු ලැබෙන්නේ නම් ස්වකීය සඳ පරිචිත වාක්‍ය ධර්මයන් ශෙෂත්ව යෙහි පිහිටා සිටීමයි. අනතිම ශෙෂත්වයෙහි වැඩිය නම් වැඩි දෙනාගෙන් ආවාවූ ව්‍යවහාරය බව ප්‍රත්‍යක්ෂය.

(17.) දුන් ඉතින් යක්ෂ නාගයන් ද්‍රවිඩ හෙයින් ඔවුන්ගේ භාෂාව ද්‍රවිඩ භාෂාවක් විය. හෝ වනාහි රාක්ෂසයන්ගේ භාණ්ඩිකය වියයි පිළිගතයුතු . පාණ්ඩ්‍යයන්ගේ භාෂාව දෙමළමැයි.

(18.) සිංහයන්ගේ භාෂාව කුමක් විදැයි අපි නිශ්චය වශයෙන් නොදනිමු. එතකුදු වුවත් එකල උත්තර ජම්බුද්වීපයෙහි ප්‍රාකෘත භාෂාවන් ප්‍රචලිතව පැවති හෙයින්ද, සිංහ පුරය උත්තර ජම්බුද්වීපයේ වඞ්ග මගධ දෙශයන්ට සමීපව පිහිටි නගරයක්වූ හෙයින්ද එහි භාෂාව ප්‍රාකෘතයක් වියයි සිතිය යුතු වේ. ඒ ප්‍රාකෘතයද මාගධී භෙදයක් වියයි එසේම සිතිය යුතු වේ. කවරහෙයින් දයත් පූර්වෝත්තර ජම්බුද්වීපය මුළුල්ලෙහි එකලට පැවති භාෂා තොමෝ මාගධී නමින් දන්නාලදි. සිංහයන් ලංකාවට අධිපතිවූ පසු ඔවුන්ගේ මේ භාෂාව ඉගෙනගැන්ම ඔවුන්ට බන්ධු වනු පිණිස ආවාවූ පාණ්ඩ්‍යයන්හටද ස්වදෙශිකවූ යක්ෂ නාගයන්හටද එක සේ අවශ්‍ය වූයේය යනු අශඞ්කිතයකි. නමුත් මේ දෙපක්ෂයටම පරිචිතවූ භාෂාව ද්‍රවිඩ වි . ද්‍රවිඩ භාෂාවන්හි මහාප්‍රාණාක්ෂරයෝ නොමැත්තාහ. එයින් මොවුන්හට මහාප්‍රාණ වර්ණයන්ගේ උච්චාරණය නොහැකි විය. මහාප්‍රාණ වර්ණයෝද ඔවුන්ගේ උච්චාරණයෙහිදී අල්පප්‍රාණයෝ වූහ. ඒ හෙතුකොට ගෙන සිංහලනම් වූ මේ අභිනව භාෂාව සම්භවයට පැමිණි කල්හි හෝ තොමෝ මහාප්‍රාණ වර්ණයන්ගෙන් විරහිත විය. පුරාණ ලිපිවල ඇතම් විට මහාප්‍රාණ වර්ණයෝ පෙණෙත් නම් ඒ වනාහි ආදි ව්‍යවහාරය බලා ඇතම් අය ඊට අනුකූලව ලියූ හෙයිනි.

(19.) මෙසේ වාක්‍ය නීති පදනීති යයි උභයනීති පක්ෂයක් ව්‍යාකරණයෙහි සැලකිය යුතු වේ. එයින් වාක්‍යනීතිහු භාෂාවෙහි ආධාරය වෙත්. පදයෝ වනාහි ඒ මතුයෙහි රඳ සිටින්නාවූ උපරි නිර්මාණීය වෙත්.

(20.) සිංහල භාෂාවෙහි ආධාරය හෙවත් වාක්‍ය නීතිය ගැන සිදත් සඟරා කරු විසින් යම් විභාගයක් නොකරන ලදි. නමුත් කොෂය හෙවත් වාක් සමූහය පියවි යන නාමයෙන් ගෙන විභාගකොට එය නිපන්, තසම, තබවයි ත්‍රිභෙදයකින් දක්වන ලදි. නිපන් පියවියෙන් කියන ලද්දේ මේ ද්වීපයෙහිම උත්පත්තිය ඇතිව එන්නාවූ වාක්සමූහයයි. එනම් නාරක රාවණාදීන්ගේ කාලයන්හි සිට එන්නාවූ ස්වදෙශිකවූ ප්‍රකෘතීහු වෙත්, නොහොත් පසුකල යක්ෂ නාගයයි දන්නාලද රාක්ෂසයන්ගේ භාෂාවෙන් ඇවිත් තිබෙන්නාවූ උරුමයයි.

(21.) තද්භව ප්‍රකෘතිය නම් සංස්කෘත මාගධී ආදි භාෂාවන්ගෙන් බිඳී ආවාවූ නොහොත් රූපය වෙනස්කොට ආවාවූ වාක් සමූහය වේ.

(22.) තමුත් තත්සම යන්නෙන් කියනු ලබන්නේ කුමක්ද? මේ ප්‍රකෘතිය නම් සංස්කෘත මාගධී ආදි භාෂාවන් හා සාධාරණවූ රූප ඇති වාක් සමූහ යයි කියා තිබේ. සාධාරණ යයි කී හෙයින් උභය පක්ෂයටම එක සේ අයිති බව මුත් ඒ භාෂාවන්ගෙන් ආ බවක් නොපෙනේ. ඒ භාෂාවන්ගෙන් නාවා නම් ලඞ්කාවෙහි උපන්නා විය යුතුයි. එහෙත් තිපත් නොවන හෙයින් ලඞ්කාවෙහි උපන්නාද නොවෙයි. මෙසේ යම් ප්‍රකෘතිරූපයක් ස්වදෙශික හෝ නොවේ නම් විදෙශික හෝ නොවේ නම් ලෝකයෙහි ප්‍රාදුර්භූත වූවක් විය නොහැකි. ඒ අසම්භාව්‍ය යෑ. එයින් තත්සම යනු අශාස්ත්‍රීය යෑ. තත්සම යයි කියනු ලබන්නාවූ සියලුම ප්‍රකෘතිරූපයෝ සංස්කෘත මාගධී ආදි භාෂාවන්ගෙන් නොවෙනස්ව ආවාහු වෙත්. එයින් ඒ බව නොවළහා පෙන්වමින් ඊට සඥාභූතව සිටිනු පිණිස තද්ගත යන අර්ථයෙන් "සම්ප්‍රාප්ත" යනාදි වශයෙන් යම් ලක්ෂණයක් යොදා ගැනීම සෑහේ. මෙහි කී තත්සම යන ලක්ෂණය නම් මේ ආචාර්‍යයන් විසින් ස්වමතයෙන්ම තබාගන්නා ලද්දක් නොව ජම්බුද්වීපයෙහි ප්‍රාකෘත වෛයාකරණයන්ගේ ව්‍යවහාරයෙන් ගෙන යොදා ගන්නා ලද්දක් බව මෙහි සඳහන්කළ යුතු වේ. එහෙත් එහි අශාස්ත්‍රීය භාවය එමයි.

(23.) සිංහලයන්ගේ භාෂායෙහි වනාහි යක්ෂ රාක්ෂසාදී ස්වකීය පෙර සිටියන්ගෙන් ආවාවූ ප්‍රකෘතිහු ඉතා ස්වල්ප සඞ්ඛ්‍යාවකි. එසේම පාණ්ඩ්‍ය පක්ෂයෙහි දෙමළ ඥාතීන්ගෙන් ආවාවූ ප්‍රකෘතීහුද සඞ්ඛ්‍යාවෙන් ස්වල්ප වෙති. ඉතා විපුල සඞ්ඛ්‍යාව නම් සංස්කෘත මාගධී භාෂාවන්ගෙන් බිඳී හෝ නොබිඳී හෝ ආවාවූ ප්‍රකෘතීහු වෙත්. මීට හේතු කිහිපයකි. ඒ මෙසේය:—

i. ලඞ්කාවට ශ්‍රේෂ්ඨවූ විජය කුමරු හා ඔහුගේ පිරිසද කථා කලේ මාගධියට සමානවූ ප්‍රාකෘතයකි. මේ සර්වසම්මත පිළිගැන්මයි.

ii. ලඞ්කාවෙහි බුද්ධාගම පිහිටි පසු මාගධිය බොහෝ විශාල ලෙස අධ්‍යයන පරිශීලනයට පැමිණ එහි ප්‍රකෘතීන්ගේ

ව්‍යාප්තියද "සම්ප්‍රාප්ත," තද්භව, වශයෙන් බොහෝ විශාල ලෙස ඇති විය.

iii. විජයිඳුගේ කාලයෙහි පටන් අද දක්වා ලඞකාවෙහි සංස්කෘත භාෂාවද උගතුන්ගේ ශාස්ත්‍රීය භාෂාව මෙන් පරිශීලනය අභ්‍යාසය කරනු ලැබේ. හෙද "සම්ප්‍රාප්ත" තද්භව ප්‍රකෘතීන්ගේ ව්‍යාප්තියට මහත් සේ හෙතු භූතවිය.

(24.) මේ හැර ජම්බුද්වීපයෙහි ඇතම් වර්තමාන ප්‍රාකෘතයන් ගෙන්ද ලොකයෙහි වෙනත් භාෂාවන්ගෙන්ද තවත් ප්‍රකෘතීහු පැමිණ තිබෙත්.

(25.) ප්‍රකෘතීන් හෙවත් වාක් සමූහය ගැන කරුණු මෙසේ නමුත් සිය බසෙහි ආධාරයවූ වාක්‍ය නීතීහු හෙවත් වාක්‍ය රචනාවෙහි යෙදෙන්නාවූ නීතීහු බොහෝ සෙයින් නිෂ්පන්නයහ; එයින් ද්‍රවිඩයහ. විදෙශිය වාක් ප්‍රකෘතීන්ගේ ආගමනයෙන් ස්වදෙශිය ප්‍රකෘතීන්ගේ අපගමනය ඇති වී නමුදු වාක්‍ය නීතීන් ගේ සුඛ ප්‍රවෘත්තියට එයින් කිසිම උපද්‍රවයක් නොමැති විය. එයින් ඔවුන්ගේ අනුපද්‍රැත ශෙෂත්වය විය.

(26.) මෙසේ බලන කල සිංහල භාෂා තොමෝ ආධාර යෙන් බොහෝ සේ ද්‍රවිඩ භාෂාවකි. කොෂයෙන් බොහෝ සේ ආර්‍ය භාෂාවකි. මේ ගැන සිදත් සඟරා කරුහට යම්කිසි සඞ්කල්පයක් තිබුණු බවක් හෝ සිංහල පඬිවරයන් අතරෙහි යම් කිසි විචාරයක් ඇතිව තිබුණු බවක් හෝ අද දක්වාද ඇති බවක් හෝ නොපැනේ. කොෂය ආර්‍ය හෙයින් මුළු භාෂාවම ආර්‍යය යනු ඔවුන්ගේ සිද්ධාන්තවූ ඇදහීමයි.

(27.) මෙහි නිෂ්පන්න ධාතුප්‍රකෘතියට පෙන්වා තිබෙන්නේ නිදසුන් දෙකකි. සියබසෙහි නිෂ්පන්න ධාතූන් බොහෝ විරල හෙයිනි. තවත් සමහරෙක්නම් මෙසේය:—

| ධාතු ප්‍රකෘති | අර්ථ | ප්‍රයොජ්‍ය |
|---|---|---|
| ල | ලීමේ | ලවමි |
| උල | ඉලීමේ | උලවමි |
| තෙල | තෙලීමේ | තෙලවමි |

| | | |
|---|---|---|
| බල | බැලීමේ | බලවම් |
| හඩ | හැඩීමේ | හඩවම් |
| තෙර | තෙරීමේ | තෙරවම් |
| (වට) | වැටීමේ | වටවම් |
| සාර | සැරීමේ | සාරවම් |
| පිර | පිරීමේ | පිරවම් |
| බද් | බැඳීමේ | බද්වම්=බද්දම් |
| පත් | පැනීමේ | පත්වම්=පත්තම් |
| වස් | වැසීමේ(ශාදනයයි) | වස්වම්=වස්සම් |
| හො | හීමේ | හොවම් |
| දෙඩ | දෙඩීමේ | දෙඩවම් |
| වෙව්ල | වෙව්ලීමේ | වෙව්ලවම් |

(28.) මේ හැර වැටහීමෙහිවූ වටහ ධාතුවය, බැබළීමෙහිවූ තෙව්න ධාතුවත්; අටවම්, පටවම්, ගොරවම්, ඉල්වම්, මොළවම්, එළවම්, යනාදි තන්හි ප්‍රයොජ්‍ය රූපයෙන් පෙනෙන්නාවූ ධාතුය — යන මොව්හුද නිෂ්පන්න ප්‍රකෘතීහු වෙත්.

(29.) යා, දා, කර, ඈ තසම දා පියව් නම්. දන, නැඟි සමර, කුලුර, ඈ තබව දා පියව් නම් — යී මෙහි කියා තිබේ.

සංස්කෘතයෙහි වනාහි යම් ධාතු ප්‍රකෘතියක් තොමෝ ත ප්‍රත්‍යය, ති ප්‍රත්‍යය, න ප්‍රත්‍යය, යන මේ යම් කිසි ප්‍රත්‍යයක ආශ්‍රයෙන් දක්නා ලැබේ. ඒ මෙසේය :—

| ශබ්දරූප. | ධාතුප්‍රකෘති. |
|---|---|
| කෘත<br>කෘති | කෘ , කිරීමේ. |
| යාත | යා , යෑමේ |
| දාති | දා , දීමේ |
| ජනන | ජන , ඉපදීමේ |

(30.) සිය බසෙහි වූ කලී ධාතු ප්‍රකෘති තොමෝ ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියාවෙහි ඉතා පැහැදිලි වශයෙන් දක්නා ලැබේ. ඒ මෙසේය :—

| ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා. | | ධාතු. |
|---|---|---|
| කරවා | ... | කර |
| බන්ද (බද්වා) | ... | බද් |
| පන්වා | ... | පන් |
| දක්වා | ... | දක් |

මෙයින් පෙනෙන්නේ නම් සිංහල ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා පදය ගෙන එහි ප්‍රත්‍යය වූ වා කාරය වෙන් කළ කල්හි ලැබෙන්නේ ධාතු ප්‍රකෘතිය බවයි. "දයින් පරව ව ජස රුසි" යනු සිඬාන්ත පාඨයි. එයින් —

යවා, දෙවා, දීනවා, නංගා හෝ නංවා (නග්වා) – යන පූර්ව ක්‍රියාවන් ගෙන බැලූ කල ඔවුන්ගේ ධාතූන් පෙනෙන්නේ මෙසේය :—

| | | | |
|---|---|---|---|
| යවා | ... | ය | , යෑමේ |
| දෙවා | ... | දෙ | , දීමේ |
| දීනවා | ... | දීන | , ජයගැනීමේ |
| නංගා – නංවා (නග්වා) | | නග් | , ආරෝහණයෙහි. |

මෙයින් යා, දා, දන, නැගි, යන රූපයන් මෙහි නොයෙදෙන බවද ඔවුන් එයින් අශාස්ත්‍රිය බවද ප්‍රත්‍යක්ෂය.

(31.) දන ධාතුව ජයනාර්ථයෙහි නොව ජනනාර්ථයෙහි (ඉපදීම් අර්ථයෙහි) ගතම්ගාත් හේ වනාහි සම්භාවනීය වූ තද්භව ප්‍රකෘති රූපයකි. එකල එය සංස්කෘත මාගධී "ජන" ජනනෙ යන්නෙන් බිඳුණේ වෙයි.

" දූනවි කදුළු පිනිබිඳු බලව විසිතුරු "

යයි කියූ තන්හි පෙනෙන්නේ මේ 'දන' ධාතුවයි. "පිනිබිඳු, තුෂාර බිඳූන් ; දූනවි, ජනනය කරවී "

(32 ) තවද මෙහි තද්භව ධාතු ප්‍රකෘතීන් අතරෙහි ආලිඞ්ගනාර්ථයෙහි තුලුර යන්නක් දක්නා ලැබේ. එබඳු ධාතුවක යොගයක් සිංහල භාෂාවෙහි කිසි තැනෙක කවරෙකු විසින්වත් දක්නා ලද බවක් නොපැනේ. තුරුලු යයි ශබ්ද ප්‍රකෘතියක් නම් භාෂාවෙහි ඇත්. එහි අර්ථයද ආලිඞ්ගිතයට ආසන්නයෑ. එයින් ඒ

වන්‍යාභි වණ පෙරළිියෙන් සිටියා වූ තුලුරු යයි ශඞකනීය වේ. මෙය යම් කිසි අන්‍ය භාෂාවකින් බිඳී ආවක් නම් නොපැනේ. එහෙයින් තුලුරු යනු තද්භව ධාතු ප්‍රකෘතියක් නොව නිෂ්පන්න ශබ්ද ප්‍රකෘතියක් බවද පුරාණ ලේඛක දෝෂයකින් තැන් මාරුවී වැටී තිබෙන බවද පිළිගත යුතුසේ පෙනේ.

(33.) නිෂ්පන්න ශබ්ද ප්‍රකෘතීහු වන්‍යාභි නිපන් දෘ පියවි සේ විරළ නොවෙත්. එයින් සමහරෙක් මෙසේය :—

විල්, කඳු, කැලෑ, ලඳු, සෙහෙන්, කුඹුරු, ළිඳ්, කොස්, පොල්, දෙල්, හෙරළි, ඉරිඟු, මෙනේරි, අඹු, තෙල්ලි, ගොරකා, කොළ, ගෙඩි, සරල්, අලි, වලස්, කොටි, ගෙරි, හරක්, කුරුළු, ළිහිණි, වළඳ්, හුළඟ්, තෙලඹු, පැළ, පැඳුරු, රෙදි, — ඈ.

(34.) දෙමළෙන් බිඳී ආවාවූ ඇතම් ධාතු ප්‍රකෘතීහු මෙසේය :—

| ධාතුප්‍රකෘති | | | නිදසුන්. | | |
|---|---|---|---|---|---|
| සිංහල. | | දෙමළ. | දෙමළ. | | සිංහල. |
| ඉර | ... | ඊර් | ඊරුවේන් | ... | ඉරන්නෙම් |
| කලඹ | ... | කිලප්පු | කිලප්පුකිරේන් | ... | කලඹම් |
| කැලඹෙ | ... | කිලම්බු | කිලම්බුම් | ... | කැලඹෙයි |
| තෝර | ... | තෙරි | තෙරිකිරේන් | ... | තෝරම් |
| තේරෙ | ... | තෙරි | තෙරියුම් " | ... | තේරෙයි |
| පෙරළ(විපර්‍යාසෙ) | | පිරළ් | පිරළ්කිරේන් | ... | පෙරළම් |
| පෙරල(වර්තනෙ) | | පුරලු | පුරලුකිරේන් | ... | පෙරලම් |
| වර(ආගමනෙ) | | වරු | වාරුංගල් | ... | වරෙව් |
| වක්කර | | වාර්(ක්කිර) | වාර්ක්කිරේන් | .. | වක්කරම්. |

(35.) දෙමළෙන් සිංහලට එන කල්හි නොබිඳී ආවාවූ ශබ්ද ප්‍රකෘතීහු අවිරළයහ. ප්‍රපඤ්චයෙන් සඳහන් කිරීමට මෙහි අනවකාශ හෙයින් සවල්පයක් දක්වනු ලැබේ :—

අම්මා, අප්පා, අයියා, අක්කා, මාමා, අප්පු, වට්ටි, පෙට්ටි, මුට්ටි, පෙට්ටගම්, කුරක්කන්, කොන්දගම්, පන්දල්, පදම්, පින්තල, වාඩි, නූල්, ජාඩි, ජෝඩු, මූඩි, සායි, පණම් (සං. පා. පණ),

තුච්චු, තහඩු, තයිලම් (සං. තෛල), ලේගියම් (සං ලෙහ්‍ය), සූතියම්, කණ්ණාඩි, අරුංගල්, කෝලම්, පොඩි, කෙතාලම්, මත්තලම් (සං. මද්දල), අඩි, මුන්තඩි, සායම්, පොදි, පොට්ටණි, පාරම් (සං. පා. භාර), ලාඩම්, සුරුට්ටු, තට්ටු, මොට්ටු, පහට්ටු, පිට්ටු, බම්බු, කොම්බු, විලංගු, පාඩගම්, නාඩගම් (සං. පා. නාටක), ආයිත්තම්, සුදු, සීනි, පාලම්, අම්බලම්, පාඩම් (සං. පා. පාඨ), මඩම්, මාත්තු, ආණම්, විලක්කු, මුළු, කොඩි, පොඩි, මුදලාලි, කුඩු, උඹලියම්, මාරු, පන්දු, ආණ්ඩු, තුණ්ඩු, කුණ්ඩු, වලිප්පු, කසිප්පු ("කෛප්පු"), ඔප්පු, ඊයම්, පාඩු.

(36.) දෙමළෙන් බිඳී ආවාවූ ශබ්ද ප්‍රකෘතීහුද අවිරල වෙත්. පාඨයෙහි දක්වන ලද නෙත්‍ර වාචිවූ කන් යනු දෙමළ කණ් යනු වෙන් වේ. එසේම විශ්‍රාමශාලා වාචිවූ ඇඹුල් යනු දෙමළ අම්බලම් යනුවෙන් වේ. කන් ශබ්දයෙහි වර්තමාන ව්‍යවහාරය නම් කණ්ඨයෙහි වේ. එසේම ඇඹුල් ශබ්දයෙහි වර්තමාන ව්‍යවහාරය නම් ආම්ල, කම්බලාර්ථයන්හි වේ. එකල එම ශබ්දයෝ සංස්කෘත මාගධියෙන් භින්නවූවෝ වෙත්. සිදත් පුරාණ සන්නයෙහි ප්‍රකාර මූල කී අර්ථයන්හි දෙමළෙන් ආබවද ප්‍රත්‍යක්ෂ හෙයින් ඒ ව්‍යවහාරයද පුරාණ පැවති බැව් පෙනේ. තවත් දෙමළෙන් බිඳී ආවාවූ ඇතැම් ශබ්ද ප්‍රකෘතීහු මෙසේය :—

| දෙමළ. | | සිංහල. |
|---|---|---|
| මනවාලන් | ... | මනමාලයා |
| මනවාලි | ... | මනමාලි |
| ශාවල් | ... | සැවුල් |
| කල් | ... | ගල් |
| උඤ්චල් | ... | උන්සිල්ලා |
| පල්ලාක්කු | ... | පල්ලැක්කි |
| ශුවඩි | ... | සෝඩි |
| වව්වාල්<br>වාවල් | ... | වවුල් |
| අලරි | ... | අරලිය |
| පූවාලෙයි | ... | පුවාලු |
| ආනෛයිවාලෛයි | ... | ආනමාලු |

| දෙමළ. | | සිංහල. |
|---|---|---|
| තංගෙයි | ... | තංගි |
| මච්චිනන් | ... | මස්සිනා |
| අගළි | ... | අගල |
| කත්ති | ... | කැති |
| ශිර් | ... | සිරු |
| ශට්ටි | ... | හට්ටි |
| ශේර්න්දු | ... | සේන්දු |
| ශාසින්දු | ... | හාන්සි |
| ආරාසින්දු | ... | ආරඤ්චි |
| ශේර්මාරු | ... | සේරුමාරු |
| පොරුන්දල් | ... | පොරොන්දු |
| ශන්ති | ... | සන්ති |
| ශරක්කු | ... | සරක්කු |
| කුරුම්බෙයි | ... | කුරුම්බා |
| අශමෝදගම් | ... | අසමොදගම් |
| ශාදික්කායි | ... | සාදික්කා |
| ශාදිලිංගම් | ... | සාදිලිංගම් |
| කුණ්ඩශට්ටි | ... | කුණ්ඩහට්ටි |
| ශෙරුප්පු | ... | සෙරෙප්පු |
| පරෙයන් | ... | (පරයා)—පර |
| තාලම් | ... | තාල |
| පණික්කන් | ... | පණික්කල |
| මූරුංගෙයි | ... | මූරුංගා |
| ශංගෙයිශුරි | ... | සංගසූරිය |
| කොච්චෙයිමල්ලි | ... | කොත්තමල්ලි |
| කුඩිකේඩු | ... | කුඩුකේඩු |
| කච්කාණ්ඩු | ... | ගල්කරඬු |
| ඔඩෙයි | ... | ඔඬේ-ඔඩ |
| කාඩෙයි | ... | කාඩේ-කඩ |
| මූලෙයි | ... | මොලේ-මොල |
| ශිලම්බු | ... | සලඹ |
| මණි (කිකිණි) | ... | මිණි |

| දෙමළ. | | සිංහල. |
|---|---|---|
| පින් (තැවත) | ... | පිනි |
| පනි (තුෂාර) | ... | පිනි |
| මෝර් (ක්ෂීර ජලය) | ... | මෝරු |
| ශෙයිද් | ... | සේදි |
| මූළුදු | ... | මූළුළු |
| පාවාඩෙයි | ... | පාවාඩ |
| ඉඩෙයි | ... | ඉඩ |
| කෝඩෙයි | ... | කෝඩෙ |
| පුදුමෙයි | ... | පුදුමය |
| අරුමෙයි | ... | අරුමය |
| පෙරුමෙයි | ... | පෙරුමය |
| කොණ්ඩෙයි | ... | කොන්ඩය |
| ශණ්ඩෙයි | ... | සන්ඩුව |
| කුඩෙයි | ... | කුඩ–කුඩේ |
| ශවරි | ... | හවරි |
| මූරෙයි | ... | මූරය |
| කූලි | ... | කූලි |
| ඔප්පම් | ... | ඔප |
| ඉන්ද | ... | ඉඳ |
| වාවා | ... | බාබා |

## සූත්‍රපාඨය. 20. පස.

**දසින් නමින් හොත කරනුයේ පස නම්.**

**තිළි, කරණී, තියරි,** ඇගි.

**ව්‍යාඛ්‍යා.** **දසින්,** ධාතුවෙන් **හෝ ; නමින්** හොත, නාම යෙන් හෝ (පරව) ; **කරනුයේ,** කරනු ලබනුයේ; පස නම්, ප්‍රත්‍යය නම්. **තිළි,** තුෂට වී යනාර්ථයෙහි තිළිය; කරණී, කතී ව්‍යාර්ථයෙහි කරණීය; **තියරි,** නාගරිකාර්ථයෙහි තියරිය; ඇ ගි, යන මේ ආදි ආකාර ඇත්තේයි.

## 20. විකාරය. ප්‍රත්‍යය.

ධාතුවකින් හෝ නාමයකින් හෝ පරව අර්ථාපෙක්ෂාවෙන් යම වර්ණයක් හෝ ඉත් වැඩියක් හෝ යොදනු ලැබේද ශේවතාහි

ප්‍රත්‍යයයයි. අර්ථාපෙක්ෂාවෙන් යයි කියන ලද්දේ අභිමතවූ අර්ථ සම්බන්ධය ද්‍යෝතනය කරනු පිණිස හෙයිනි.

(1.) තිලී යයි කියූතන්හි හේතෙමේ තොහොත් හෝ තොමෝ තුටුවී යනු අර්ථය වේ. මෙහි ද්‍යෝතනය පිණිස ඊ ප්‍රත්‍යය ඉවහල් විය. පුරාණ සන්නයෙහි කී න්‍යායයෙන් එහි යොගය මෙසේය :—

තුස යනු තුස්වීම් අර්ථයෙහිවූ ධාතුවයි. (සං. තුෂ; පා. තුස.) මෙය අතීත ක්‍රියා යෙහි 'තිස' යයි සිටීල.

ඉන්පසු අන්‍ය පුරුෂ එක වචනයෙහි ඊ ප්‍රත්‍යය යොදනු ලැබේ.

එයින් තිස+ඊ යයි සිටී.

තිස+ඊ යනු පූර්වස්වරලොපසන්ධියෙන් තිසී වේ. පුද ධාතුවෙන් පිදී යයි සිදුවූ සේය.

කරධාතුවෙහි ර කාරය මෙන් තුස ධාතුවෙහි ස කාරයද අතීත ක්‍රියා යෙහිදී ලබ්ධයට පැමිණේ.
එයින් —

තිසී යනු ව්‍යවහාරයෙහි තිලී වේ.

මේ ධාතුවෙන් පරව ප්‍රත්‍යය යොගය වූ තැනි.

(2.) කරණී යන තන්හි කර යනු කිරීම් අර්ථයෙහිවූ ධාතුවයි. ඉන් පරව කරනු ලැබිය යුතුවූ යන කර්මාර්ථයෙහි නී ප්‍රත්‍යය යොදනු ලැබේ. එකල කරනී යයි සිටී. කරනී යන්නෙහි නී යනු පූර්වස්ථ ර කාර හෙතුවෙන් ණී වේ යනු මෙහි සන්ධානයැ. එයින් කරණී යයි සෑදේ. කටයුතු දේ යනු අර්ථයි.

ධාතුවෙන් පරව ප්‍රත්‍යය යොගයවූ තැනි.

(3.) නියරි යන තන්හි සිද්ධිය මෙසේ දැක්වූහු :—

නගර යන ශබ්දයෙන් පරව එහිවූ යන අර්ථයෙහි ඉ ප්‍රත්‍යය යෙදූ කල්හි —

නගර+ඉ යයි සිටී.

මෙය පූර්ව ස්වරලොප සන්ධියෙන් නගරි වේ.

මෙය පුරාණ ව්‍යවහාරයෙහිදී ත කාරය දිරාගොස් යකාරා දේශ වීමෙන්ද ඒ හෙතුවෙන්ම පූර්වස්වූ නයන්න නියන්න වීමෙන්ද නියරි විය. නගරයෙහිවූ හෙවත් නගරය පිළිබඳවූ යනු අර්ථයයි.

මේ නමින් පරව ප්‍රත්‍යය යොගය වූ තැනි.

මෙසේ දයින් නමින් හොත කරනුයේ පසයයි කී තන්හි තිදීමටවූ ප්‍රත්‍යය නිදසුනෙන් සපුට කරන ලදි.

මෙහි නාමය සම්බන්ධවූ විභක්ති ප්‍රත්‍යයන් නිදසුන් පිණිස නොගත්තාහ.

## 20. නිඛිසාරය. ප්‍රත්‍යය.

මෙහි දැක්වූ නිදසුන් මගින් ප්‍රත්‍යය ගැන යම්කිසි බුඞි මාත්‍ර යක් ඇතිකර ගැනීම හැකිවන හෙයින් ඔවුහු ප්‍රයොජනවත් නමුදු දක්වනලද ප්‍රත්‍යය තුනෙන් දෙකක් සිංහල ප්‍රත්‍යයන් නොවන බව කිය යුතුයි.

(1.) කරණී යනු ණී ප්‍රත්‍යයක් යෙදීමෙන් සියබසෙහි සිඞවූ වක් නොවේ. එසේ සිඞවූවක් නම් එම නී ප්‍රත්‍යයයෙන්ම කිය යුතු තන්හි කියනී ය, බැලියයුතු තන්හි බලනී ය, තැබිය යුතු තන්හි තබනී ය යනාදි වශයෙන් ශබ්දයන් සාදගැනීම හැකිවිය යුතුයි. සිය බසෙහි එබඳු ශක්තියක් නොමැති හෙයින් එබඳු ප්‍රත්‍යයයක්ද නොමැත්තේය.

(2.) නියරි යයි කී තන්හි ඉ ප්‍රත්‍යය ගැනද කරුණු එසේ මය.

(3.) කරණී ශබ්දය වනාහි සං. මා. කරණීය ශබ්දයෙන් ආවාවූ තද්භවයකි. ඒ භාෂාවන්හි නීය ප්‍රත්‍යයයි. කිසි තැනෙක "ණීය" වේ. සිංහල රමණී යනුද මෙසේම වූ රමණීය ශබ්ද යෙන් භින්නය.

(4.) නගරි ශබ්දය වනාහි සං. මා. නගරීය ශබ්දයෙන් හා නාගරික ශබ්දයෙන්ද එකසේ භින්නාවී ආවාවූ ශබ්ද රූපයකි. නගරීය ශබ්දය ඊය ප්‍රත්‍යයෙන් හා නාගරික ශබ්දය ඉක ('ණික') ප්‍රත්‍යයෙන්ද සිඞය. සිංහල ගිහි ශබ්දයෙහිද නිෂ්පත්තිය මීට

ආසන්නය. සං. ගෘහ්‍ය ශබ්දයෙන්ද සං. ගෘහින් මා. ගිහි ශබ්ද යෙන්ද එකසේ හිත්තාව ආ හෙයිනි.

(5.) කරුණු මෙසේ නමුදු යටකී නී ප්‍රත්‍යයද ඉ ප්‍රත්‍යයද සිංහල භාෂාවෙහි නියත ප්‍රත්‍යයන් වශයෙන් දැන්වත් හොඳ ප්‍රචාරයට ගනු ලැබෙත් නම් ගේ භාෂාවෙහි වර්ධනයට බොහෝ ප්‍රයොජනවත් විය යුතුයි.

(6.) තවද මෙහි කී තිළී යන ක්‍රියාපදය සකාරයට ළකාරා දෙශ වීමෙන් සිද්ධවියයි පිළිගැනීමද දුෂ්කර බව පෙනේ. සකාර යට එබඳු ආදෙශයක් සිය බසෙහි දක්නා නොලැබෙන හෙයිනි.

සිංහල ක්‍රියා විධියෙහි වනාහි කිසිවිටෙක වර්තමානාර්ථයෙහි ක්‍රියා මූලයට ධාතුවද අතීතාර්ථයෙහි මූලයට අතීත නාම ක්‍රියාවද සිටි. සංස්කෘත දෘශ් ධාතුවෙන් සිංහලට දක් යන ධාතුව ලැබේ. දකිමි, දකිහි, දකි යනාදි රූපයෝ එයින් සිද්ධවෙත්. එහෙත් අතීතාර්ථයෙහි ක්‍රියාඞ්ගය නම් දෘෂ්ට (මා. දිඨ) යන්නෙන් හිත්තාවූ දිට් යනුවේ. මෙය ස්වරාන්තරූප කල්හි දිටු යයිද දුටු යයිද සිටී. මෙයින් අන්‍ය පුරුෂ එක වචනය පිණිස ඊ ප්‍රත්‍යය යොගයෙන් දිටී යයි ලැබේ.

එසේම සංස්කෘත තුෂ් ධාතුව සිංහලට තුස යයි පැමිණේ. මෙය පෙරකල වර්තමාන ක්‍රියා සිඞියෙහි ප්‍රචලිත වියයිද සිතිය හැකි. අතීතාර්ථයෙහි මීට යෙදෙන්නාවූ සංස්කෘත නාම ක්‍රියා රූපය නම් තුෂ්ට වේ. මෙය මාගධියට තුඨ යයි බිඳී එයින් සිං හලට තුට් යයි පැමිණේ. මෙය ස්වරාන්ත රූප කල්හි තුටු යයි සිටී.

මේ තුට් යන්නට ඊ ප්‍රත්‍යය යෙදූ කල්හි තුටී යයි සිටී. මෙය අපරාපෙක්ෂිවූ ස්වර විපර්‍ය්‍යාසයෙන් තිටී වේ. තිටී යනු ට කාර යට ළකාරාදෙශ වීමෙන් තිළී වේ. මේ ආදෙශය නොයෙක් තැන දක්නා ලැබේ. කිරිට – කිරුළු යනාදි වශයෙනි.

මෙහි ළකාරාදෙශය ශබ්ද ධර්මානුරූපව පෙනෙන හෙයින්ද අන්‍යයෙහි එසේ නොපෙනෙන හෙයින්ද තිළී යන්නෙහි ශාස්ත්‍රීය සිද්ධිය මෙසේ වියයි සැලකිය යුතු බව පෙනේ.

(7.) යවි, මෙහෙයුම්, පියාණ, යනාදි වශයෙන් නිදසුන් කිසිවක් දක්වන ලද්දේ නම් වියවුල් රහිතව සිංහල ප්‍රත්‍යයයන් ගේ බුද්ධියක් ගෙන දිය හැකිව තිබුණේය. වි, උම්, ආණ, යනාදි වශයෙනි.

## සූත්‍රපාඨය. 21. කිරිය.

නොදූවි නුගුණ දූවි නිසා සකරුතෙන් ද මූවවැ සිදු කිරිය නම්. දිනී, වැජඹෙයි, දෙන්නෙම්, ඇයි.

ව්‍යාඛ්‍යා. නොදූවි, ද්‍රව්‍ය නුවූ; නුගුණ, ගුණ නුවූ; දූවි නිසා, ද්‍රව්‍යාශ්‍රය කොට; සකරුතෙන්, ෂට්කාරකයෙන්; ද මූව වැ, ධාතුමයව; සිදු, සිඬවූයේ; කිරිය නම්, ක්‍රියා නම්. දිනී ජයග්‍රහණවාචි දින ධාතුවෙන් වූ දිනී යනුය (ජයගනී යනු අර්ථයි) ; වැජඹෙයි, ද්‍රලනාර්ථවාචි ජඹ ධාතුවෙන්වූ වැජඹෙයි යනුය (නෝ බැබලෙයි යනු අර්ථයි) ; දෙන්නෙම්, ජීවනාර්ථ වාචි දී ධාතුවෙන් වූ දෙන්නෙම් යනුය (ජීවත්වන්නෙම් යනු අර්ථයි) – ඇ යි, මේ ආදි ආකාර ඇත්තේයි.

## 21. විස්තරය. ක්‍රියා.

න්‍යාය ශාස්ත්‍රයෙහි වනාහි ලොකයෙහි මනොගොචරවූ සියලුම වස්තූන් ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා යයි තුන් වැදෑරුම් කොට බෙදූහ. සප්‍රාණ අප්‍රාණවූ සියලුම භූතයෝ ද්‍රව්‍ය වෙති. ගුණයෝ වනාහි ද්‍රව්‍යාශ්‍රිතව පවතිත්. මේ විභෙදයෙන් තොරවූ තවත් මනොගොචර වස්තුවෙක් නම් ක්‍රියාව මිස අන් කිසිවක් ලොක යෙහි නොමැත්තේය. ක්‍රියාවෙහි ප්‍රවෘත්තියද හැකිවන්නේ ද්‍රව්‍යවූ සප්‍රාණ හෝ අප්‍රාණ හෝ වස්තුවක්හුගේ ආශ්‍රයයෙනි. ක්‍රියාවක් කරනු පිණිස යමෙක් ඕනෑකෙරේ; කරනු ලබන පිණිස යමක් ඕනෑකෙරේ. මෙයින් හා මේ ආදි වශයෙනුත් කර්තෘය, කර්මය, කරණය, සම්ප්‍රදානය, අවධිය, ආධාරයයි නම්වූ ෂට්කාරකයෙක් ක්‍රියාවන්ගේ ප්‍රවෘත්තියට ඉවහල්ව පවතිත්. තවද ක්‍රියාවෙහි වාඬමයවූ නිදේශය නම් ධාතුවකින් නිපදවා ගන්නාලද පදයකි. එයින් මේ සියලුම භාවා භාව ලක්ෂණයන් ගකුළුවා ක්‍රියාව නම් ද්‍රව්‍යනුවූ, ගුණනුවූ, ද්‍රව්‍යාශ්‍රිතව ෂට් කාරකයෙන් ධාතුමයව සිදුවූ පදයයි සීමාකොට කීහ.

ඒට දිනී, වැජඹෙහි, දෙන්නෙම් යන මේ ක්‍රියා පදයන් සිද්ධ කලහ. මෙසින් —

(1.) දිනී යනු දින (ජය ගැනීමේ) යන ධාතුවෙන් සිඩය. මේ දින ධාතුතෙම මාගධී ජිනාමි (දිනමි) යනාදි තන්හි පෙනෙන් නාවූ ක්‍රියාඞගයෙන් සිංහලට බිදී ආවේය. මාගධියෙහි ධාතුව නම් ජි යනුයි. සංස්කෘතයෙහිද එසේමය.

දිනී යන පදරූපය තෙම අතීත කාල අන්‍ය පුරුෂ එක වචනයෙහිවූ ඊ ප්‍රත්‍යයෙන් සිඩය.

(2.) වැජඹෙහි යන තන්හි වැජඹ යනු ක්‍රියාඞගයයි. හේ වනාහි සංස්කෘත විජෘම්භ මාගදී විජම්භ යන්නෙන් භින්නය. එහි වියනු අර්ථද්‍යෝතනය පිණිසවූ උපසර්ගයයි. සං. ජෘම්භ, මා. ජම්භ ('ජභ' – 'ජභි') යනු ධාතුයි. මාගධී ජම්භ යන්නෙහි මූලාර්ථයනම් කරබෑම යයි කියා තිබේ. එහෙත් සං. ජෘම්භ යන්නෙහි එබදු අර්ථයක් ඇති බැව් නොපෙනේ. එහි මූලාර්ථය නම් ඇනවීම හෙවත් මුඛ විකාශයයි. දෙවැනි අර්ථය එයින් ඉක්ම ගොස් සියලු විකාශයන්හි වැටේ. විජෘම්භ යන්නෙහි ප්‍රායඃ වශයෙන් ලැබෙන්නාවූ අර්ථය නම් මේ විකාශීභාවය වේ. විකාශීභාවයෙන් බැබලීමද වේ. සිංහල වැජඹෙහි යයි කී තන්හි අභිප්‍රෙතවූ අර්ථය නම් මේ වෙයි. යුෂ්මතා බැබලෙහි නොහොත් බැබලෙහිවා යනු ආශයයි. වර්තමාන ක්‍රියායෙහි හෝ ආශීඃ ක්‍රියායෙහි හෝ රූප යකි. මධ්‍යම පුරුෂ එක වචනයෙහි 'හි' ප්‍රත්‍යය යොගයෙන් සිඩය. 'වැ' රූපයෙන් සිටි 'වි' උපසර්ග පූර්වවූ ජඹ ධාතුවෙනි. නිරුත්සාහික ක්‍රියාවෙක්හි හෙයින් 'හි' ප්‍රත්‍යය පූර්වයෙහි අකාර තෙමේ එකාර විය. එයින් සිඩිය මෙසේය :—

වැ + ජඹ + හි = වැ + ජඹෙ + හි = වැජඹෙහි.

(3.) දෙන්නෙම් යයි කී තන්හි "දී" යනු ජීවනාර්ථයෙහි ධාතුයි. සං. මා. ජීව යන්නෙන් භින්නය. ජීවත් වන්නෙම් යනු ක්‍රියාපදයෙහි අර්ථය වේ. අනාගත කාල එකවචනයෙහි උත්තම පුරුෂයි. මෙහි "එන්නෙම්" යනු ප්‍රත්‍යය යයිද උගන්වා තිබේ :–

දී + එන්නෙම් = දෙන්නෙම්.

පූර්වස්වර ලොප සන්ධියෙනි.

මේ සෑම තන්හිම ක්‍රියාව කරන්නේ දෙහයකින් යුක්‍ත භූත යෙකි. දෙහය නම් ද්‍රව්‍යමය වේ. එයින් ක්‍රියා ප්‍රවෘත්තිතොමෝ ද්‍රව්‍යාශ්‍රයෙන් වන්නීය.

## 21. නීතිසාරය. ක්‍රියා.

(1.) මෙහි ක්‍රියා ප්‍රවෘත්තිය ද්‍රව්‍යාශ්‍රයෙන් වනබැව් ක්‍රියාවෙහි එක් ලක්‍ෂණයක් වශයෙන් දක්වන ලදි. න්‍යාය ශාස්ත්‍රයෙහි "ක්‍රියා ශ්‍රයො ගුණාශ්‍රයොවා ද්‍රව්‍යම්"යී කියන ලදින් ද්‍රව්‍යය තෙම ක්‍රියාවට හෝ ගුණයට හෝ ආශ්‍රය වේ මැයි. මෙහි හෝ යන් නෙන් කියනලද 'වා' යනු විකල්පාර්ථයෙහි පමණක් නොව සමුච්චයාර්ථයෙහිද වැටේ. එයින් ද්‍රව්‍යයක් නම් ක්‍රියාවකට හෝ ගුණය කට හෝ ඒ දෙකටම හෝ එකයේ ආශ්‍රය විය හැකිවූ වස්තුවකි.

මෙයින් ද්‍රව්‍යයෙහි එක් ලක්‍ෂණයෙක් නම් ක්‍රියාශ්‍රයත්වය බවයයි කියනලද නමුත් ක්‍රියාවට ඇත්තාවූ එකම ආශ්‍රය නම් ද්‍රව්‍යයම යයි එයින් නොකියන ලදි. නවද න්‍යාය ශාස්ත්‍රයෙහි දෘෂ්ටියට පමණක් ගොචරවූ පෙරළා රස ගන්ධ ස්පර්ශාදි වශයෙන් උපලම්භනයකල හැකි අන්‍ය කිසිම පැවැත්මක් නොමැත්තාවූ රූපයතෙම ගුණයකි. කියනලද මැයි:- "චක්‍ෂුර්මාත්‍ර ග්‍රාහ්‍යො ගුණො රූපම්" (චක්‍ෂුසින් පමණක් ග්‍රහණය කටයුතුවූ ගුණය තෙම රූප නම්.) රූපය නම් ශුක්ල, නීල, පීතාදි වශයෙන් සප්තවිධ බැව් විස්තරයෙහි කියන ලදි. එයින් රූප යනු වර්ණයට නම්. වර්ණය නම් ගුණයකි.

"සුදපෙනේ" යන මේ වාක්‍යයෙහි සුද යනු ගුණයකි, ද්‍රව්‍ය යක් නොවේ. එහෙත් එය පෙනේ යන වෛයාකරණ ක්‍රියා පද යට ආශ්‍රය විය. එයින් ව්‍යාකරණයෙහිදී ක්‍රියායෙහි විශිෂ්ට ලක්‍ෂණ යක් වශයෙන් ද්‍රව්‍යය පමණක් ආශ්‍රයකොට දක්වීම අව්‍යාප්ති දෙෂයෙන් දූෂිතය.

(2.) ක්‍රියා ප්‍රවෘත්තියෙහි තවත් ලක්‍ෂණයෙක් නම් කාරක යන්ගේ සම්බන්ධය බව මෙහි කියන ලදි. ශිෂ්‍යයා විසින් තවම නොදන්නාලද ක්‍රියාව හඳුන්වාදීම පිණිස එසේම ඔහු විසින් තවූම නොදන්නාලද කාරකය ලකුණක් වශයෙන් කීම ඉෂ්ටාර්ථ සිද්ධියට උපකාරයක් නොවේ. ඒ අවිශෙෂ කාරණයකි. මෙහි

විශේෂයෙන් පිරික්සිය යුතු වන්නේ නම් කාරකයන්හුගේ සම්බන්ධය නොමැතිව ක්‍රියා ප්‍රවෘත්තියක් නොහැකිද යන බවයි. යටදක්වූ සුද පෙනේ යන උදාහරණයෙහි සුද යනු ප්‍රථමා විභක්ති එකවචනයෙහි සිටියාවූ නාම පදයකි. එහි කර්තෘ කර්මාදි වශයෙන් කිසිම කාරකයක් නොමැත්තේය. එහෙත් පෙනේ යන ක්‍රියා පදයට ආශ්‍රයවද එකප්‍රතිඥා භූතවද සිටී. එයින් කාරක සම්බන්ධයෙන් කී ලක්ෂණයද අව්‍යාප්තියෙන් දූෂිතයැ.

මේ "සකරුනෙන්" යනු සූත්‍රයට නොගන්නා ලද්දේ නම් ඉන් විය හැකිවූ කිසිම හානියක් නොපැනේ. ඒ සම්භව කොට ඇති දූෂණොපාදනයද වළකී.

(3.) තවද මෙහි දෙන්නෙම් යයි කී තන්හි ධාතුව තම දී යයි කියා තිබේ. සං. මා. විරං ජීව යනු සිංහලෙහි පෙනෙන්නේ සැරද කියාය. විධික්‍රියා (මධ්‍යම පුරුෂ) එකවචනයයි. ශුඛ ධාතුවෙන් සිටියේය. මෙහි විරං යනු සිය බසෙහි 'සැර' විය. එයින් සිංහලට බිඳුණාවූ ශුඛ ධාතුව නම් මේ 'ද' යනු වේ.

පැරකුම්බා සිරිතෙහි :—

සැරද පවර පැරකුම් බුජ රජ මුනිපුද පුරන්දරා.

මේ 'ද' ධාතුව නිරුත්සාහික ක්‍රියාව පිණිස සිටි කල්හිඅනීතයෙහි ඊට යෙදෙන්නාවූ 'එ' යන විකරණය ආරූඪව 'දෙ' යයි වේ. මේ ක්‍රියා රූපයක් නොව ක්‍රියාඛ්‍යය වශයෙනි. එයින් සැර යන්න හා සම්බන්ධයෙන් සැරදේ, සැර දෙනේ, යනාදි රූපයෝ ලැබෙත්. ඇතම් අය මේ බලා 'සැරද' යයි ශුඛ ධාතු රූපයෙන් හෝ 'සැරදෙව' යයි සිඬ ක්‍රියා පදයෙන් හෝ සිටිය යුතුවූ විධි ක්‍රියා එක වචනයෙහි වනාහි 'සැරදෙ' යන්නක් අව ලම්බනය කෙරෙති. ධාතුව ගැන ඔවුන්ගේ බුඩිය කුමක්දැයි නොපැනේ. එහෙත් යට දක්වූ කරුණුවලින් 'දෙන්නෙම්' යයි කී තන්හි ධාතුව නම 'දී' නොව 'ද' බව පෙනේ. 'දෙන්නෙම්' යනු නිරුත්සාහිකයෙහි උත්තම පුරුෂෛක වචන අනාගත ක්‍රියා රූපයයි.

## සූත්‍රපාඨය. 22. ලොප්.

වණන් අනුසුරුවීම් ලොප් නම්. තත්, වරද, මහසුප්, රඳූ, බා, පා, ඇගී.

ව්‍යාඛ්‍යා. වණන්, වර්ණයන්ගේ; අනුපූරුවීම්, අනූච්චාරණය වීම; ලොප් නම්, ලොප නම්. නත්, අනත්යයි කිවමනා තන්හි නත් යනුය; වරද, යුවරද යයි කිවමනා තන්හි වරද යනුය; මහසුප්, මහකසුප් යයි කිවමනා තන්හි මහසුප් යනුය; රදූ, රදදූයයි කිවමනා තන්හි රදූ යනුය; බා, බාහු යයි කිවමනා තන්හි බා යනුය; පා, පාදයයි කිවමනා තන්හි පා යනුය; ඈගි, මේ ආදී ආකාර ඇත්තේයි.

## 22. විකාරය. ලොප.

මෙයින් ලොපය දක්වූහු. ජනයන් විසින් සංකථනයෙහිදී තමන්ගේ දැනුමක් නොමැතිව නිතරම සුඛොච්චාරණය සොයනු ලැබේ. සුඛොච්චාරණයෙහි එක් මාර්ගයෙක් නම් ප්‍රයත්න සංක්ෂෙප යයි. ප්‍රයත්න සංක්ෂෙපය කාරණ කොටගෙන ඇතම් වර්ණයන්ගේ උච්චාරණය ඉතා ඌනත්වයෙන් කරනු ලැබේ. රදදූ යයි කිවමනා තන්හි රද්දූ යයි කියන්නාක් මෙනි. පසුව තවත් ක්ෂීණ වීමෙන් කිසිසේත් නොකියනු ලැබේ. එම රද්දූ යනු රදූ වූ මෙනි. මේ ශබ්ද ධර්මය කාරණකොට ගෙන සිංහලට අන්‍ය භාෂාවන්ගෙන් බිඳී එන්නාවූ ප්‍රකෘතීහු නොයෙක් විට වර්ණලොපය ලබත්. එපමණක්ද නොවේ. යථොක්ත ධර්මයෙහි ප්‍රවර්තිත හෙතුවෙන් සිංහල භාෂාභ්‍යන්තරයෙහිද වර්ණ ලොපය පවතී. වර්ණ ලොපය යම් ප්‍රකෘතියක ආදි මධ්‍ය අන්ත යන කොයිතැනක හෝ විය හැකි. එයින් මේ ප්‍රකෘතීන්ගේ ප්‍රවෘත්තිය මෙසේ දතයුතු :—

| | | සිංහල | |
|---|---|---|---|
| සංස්කෘත. | මාගධි. | අලුප්ත. | ලුප්ත. |
| අනන්ත | අනන්ත | අනත් | නත් |
| යුවරාජ | යුවරාජ | යුවරද | වරද |
| මහාකාශ්‍යප | මහාකස්සප | මහකසුප් | මහසුප් |
| රාජදුහිතෘ | රාජධීතා | රදදූ | රදූ |
| බාහු<br>භාග<br>භාග්‍ය | බාහු<br>භාග<br>භාග්‍ය } ... | — ... | බා |
| පාඨ<br>පාත්‍ර<br>පාද<br>පාදප<br>පාප<br>ප්‍රාසාද | පාඨ<br>පත්ත<br>පාද<br>පාදප<br>පාප<br>පාසාද } ... | — | පා |

## 22. නිත්සාරය. ලොප.

(1.) ආදි, මධ්‍ය, අන්ත, යන මේ වසයෙන් වූ ත්‍රිවිධ වර්ණ ලොපයට තවත් නිදසුන් මෙසේයි.

### (i) ආදිලොප.

| | | සිංහල. | |
|---|---|---|---|
| සංස්කෘත. | මාගධී. | ප්‍රකෘතිරූප. | ලුප්තරූප. |
| අඟණ | අඟණ | අඟුණු | ඟුණු |
| අලස | අලස | අලස | ලස |
| අසිපත්‍ර | අසිපත්ත | අසිපත | සිපත |
| ආභරණ | ආභරණ | අබරණ | බරණ |
| කරුණා | කරුණා | කුලුණු | ලුණු |
| සුරා | සුරා | සුරා | රා |
| — | — | සැහැලි | හැලි |

### (ii) මධ්‍යලොප.

| | | සිංහල. | |
|---|---|---|---|
| සංස්කෘත. | මාගධී. | ප්‍රකෘතිරූප. | ලුප්තරූප. |
| දිවාකාල | දිවාකාල | දවහල් | දවල් |
| නව කර්ම | නවකම්ම | නවහම් | නවම් |
| විසර්ජ්‍ය | විසජ්ජ | විහිද | විද |
| — | — | ඇටිකුකුළ | ඇටිකුළ |
| — | — | විල්කුකුළ | විලිකුළ |
| — | — | පස්යොදුන් | පස්දුන් |
| — | — | නවයොදුන් | නවදුන් |

### (iii) අන්තලොප.

| | | | |
|---|---|---|---|
| නාග<br>නාථ<br>නායක | නාග<br>නාථ<br>නායක | — | නා |
| නීති<br>නිප<br>නීර | නීති<br>නීප<br>නීර | — | නී |
| සූප<br>සූත්‍ර | සූප<br>(සුත්ත) | — | සූ |

| | | | | |
|---|---|---|---|---|
| ශ්වේත | සේත | } | — | සේ |
| ශ්වේත | සෙත | } | | |
| කෝප | කොප | } | — | කෝ |
| ක්‍රොධ | කොධ | } | | |

**සංලක්‍ෂ්‍යය. 1.** මේ අන්තවර්ණ ලෝපය බහුලව පෙනෙන්නේ තද්භව ප්‍රකෘතීන්හි බවද දීර්ඝ ස්වරයකින් පරව බවද සැලකිය යුතුයි.

**සංලක්‍ෂ්‍යය. 2.** බොහෝ තැන්හි වර්ණලෝපය වන්නේ ව්‍යඤ්ජන යක්හුගේ දිරායෑමෙන් ස්වරශේෂය හා දීර්ඝසන්ධියක්ද වී නැවත සන්ධියෙහි දීර්ඝත්වය හ්‍රස්ව වීමෙනි. නවම් යන්නෙහි සිද්ධිය ඊට නිදසුන්වේ: නවකර්ම - නවකම්ම - නවකම් - නවහම් - නවඅම් - නවාම් - නවම්.

**සංලක්‍ෂ්‍යය. 3.** අශොක යන්නෙන් ගිත්තවූ 'හෝ' යන්න ආද්‍යන්ත උභය ලෝපයෙන්ම සිඩවූ ප්‍රකෘති රූපයකට නිදසුනි.

(2.) වර්ණ ලෝපයට මූල හෙතුව නම් උච්චාරණ සඖකර්‍ෂ්‍යය බව යට කියනලදී. මේ උච්චාරණ සඖකර්‍ෂ්‍යය උඩරට සිංහල ව්‍යවහාරයෙහි බොහෝසේ පවතී. නිදසුන් :—

| | | |
|---|---|---|
| බස්නායකගෙදර | ... | බන්නැක්ගෙදර |
| වීරසිංහගෙදර | ... | වීසිංගෙදර |
| ගමරාළහාමි | ... | ගමරහාමි |
| සමරතුංග | ... | සමතුං |
| සේනාරත් | ... | හේරත්, හෙරත්. |

**සූත්‍රපාඨය. 23. අදෙස්.**

වණක්හු ලොපා වණක්හු කිරීම් අදෙස් නම්. සැරියුත්, අයුණු, වැහැප් ඈගි.

**ව්‍යාඛ්‍යා.** වණක්හු ලොපා, වර්ණයක්හු ලොප් කොට; වණක්හු කිරීම්, අන්‍ය වර්ණයක්හු එහි නිපදවීම; අදෙස් නම්, ආදෙශ නම්. සැරියුත්, සැරිපුත් යයි කිවමනා තන්හි සැරියුත්ය; අයුණු, අගුණයයි කිවමනා තන්හි අයුණුය; වැහැප්, වසබ් යයි කිවමනා තන්හි වැහැප්ය; ඈගි, මේ ආදි ආකාර ඇත්තේයි.

**23. විකාරය. ආදේශ.**

යම් ප්‍රකෘතියක විද්‍යමාන විය යුතුවූ වර්ණයක් වෙනුවට අන්‍ය වර්ණයක් ව්‍යවහාර කරනු ලැබේනම් ඊට ආදේශ යයි කියනු

ලැබේ. සැතැප්ම යයි කියයුතු තන්හි සාමාන්‍ය ව්‍යවහාරයෙහි හැතැක්ම යයි කියති. එහි ආදෙස දෙකක් පෙනෙත්.

පින්වත් මෙ මැනිඳ දිගාසිරි දෙමින් දෙය්යෝ රකිත්වා යෙහෙත්

යන මේ තන්හි දෙය්යෝ යනු දෙවියෝ යන්න වෙනුවටය. ආදෙශයෙකි.

මෙයින් ආදෙශයෙහි ස්වභාවය සපෂ්ටය. පාඨයෙහි නිදසුන් කල ආදෙශයන්ගේ ආවිර්භාවය මෙසේය :—

| | | සිංහල. | |
|---|---|---|---|
| සංස්කෘත. | මාගධි. | ප්‍රකෘතිරූප. | ආදෙශරූප. |
| ශාරිපුත්‍ර | සාරිපුත්ත | *සැරිපුත් ... | සැරියුත් |
| අගුණ | අගුණ | අගුණ ... | අයුණු |
| වෘෂභ | වසභ | *වසබ් .. | වැහැප් |

## 23. නීතිශාරය.

(1.) මේ සූත්‍රයෙන් එක් වර්ණයක් මකා දමා ඒ වෙනුවට අන්‍ය වර්ණයක් ලිවීම ආදෙශයයි ඉගැන්වූහ. ඒ වනාහි අතිශයින් අශාස්ත්‍රීයවූ, ආධුනිකයන්ගේ මහත් මූලාවට හෙතුවූ ලක්ෂණ කථනයකි. එයින් ආධුනිකයකුහට හැඟෙන්නේ නම් භාෂාවෙහි ව්‍යවහාරීමාණවූ ප්‍රකෘතීන් යම් යම් අයවලුන්ගේ කැමැත්තේ හැටියට වෙනස් කරගැනීමට යම් අවසරයක් ඇති බවයි. එසේ වෙනස් කරන්නේ කවර හෙයින්දැයි ඇසුව හොත් ඊට කියයුතු උත්තරයක් නම් නොමැත්තේය. එක් වර්ණයක් මකා දැමීමට අවසර තිබේ නම් ඒ වෙනුවට ලියයුතුවූ අනික් වර්ණය තෝරාගන්නේ කෙසේ දැයි ඇසුව හොත් ඊටද කියයුතු උත්තරයක් නොමැත්තේය.

(2.) මෙහි ඇත්ත නම් මෙසේය :— ජනයන්ගේ වාග්ව්‍යවහාරයෙහිදී තමන්ගේ දැනැත්මක් නොමැතිවම උච්චාරණ සුඛය අනුගමනය කරනු ලබන බැව් යට කියනලදි. එයින් නොයෙක්විට දෘඪවූ වර්ණයෝ ලිහිල් වෙති. නැතහොත් ශ්‍රාව්‍යයෙන් ආසන්නවූ වර්ණයකට පැමිණෙති. ලිහිල්වූ වර්ණයෝ තවත්

* මෙ රූපය ව්‍යවහාරයෙහි නොලැබේ.

ලිහිල්වීමෙන් ක්ෂය ප්‍රාප්තව ඔවුන් ආශ්‍රිතවූ ස්වරයෝ පමණක් ශේෂවෙති. මෙසේ එක් වර්ණයක් තවත් වර්ණයක් හුගේ භාවයට පැමිණීමට ආදෙශයයි කියනු ලැබේ. එය ශබ්ද ධර්මයෙන් ඉබේටම වන්නාවූ සිද්ධියක් මිස කිසිවකු විසින් කරන ලද්දක් හෝ කල හැක්කක් හෝ නොවේ.

(3.) මේ ධර්මය අනුව —

අ. කවර්ගයේ දෘඪ වර්ණයන්වූ ස්පර්ශ වර්ණයෝ නොයෙක්විට ලිහිල්වීමෙන් ස්වකීය අන්තඃස්ථවූ හකාර භාවයට පැමිණෙති. ඉන් පසු නොයෙක්විට හකාරයද තවත් ලිහිල්වීමෙන් ක්ෂය ප්‍රාප්තව තදාශ්‍රිතවූ ස්වරය පමණක් ශේෂවේ. නිදසුන් :—

සං. පා. දුකූල—සිං. දුහුල්, *දුඋල්—දූල්. (ඉතාතුනීපටසළු.)
සං. පා. සමාගම—සිං. සමහම්, *සමඅම්—සමාම්.

ආ. ට වර්ගයෙහි ස්පර්ශවර්ණයෝ ස්වකීය අන්තඃස්ථයක්වූ ළකාර භාවයට පැමිණෙති. නිදසුන් :—

සං. පා. කුක්කුට සිං. කුකුළු; සං. ආෂාඪ, පා. ආසාළ්හ සිං. ඇසළ.

ඉ. පවර්ගයෙහි ස්පර්ශ වර්ණයෝ ස්වකීය අන්තඃස්ථවූ වකාර භාවයට පැමිණෙති. නිදසුන් :—

සං. පා. තාපස, සිං. තවුස්; සං. අභිධර්ම, පා. අභිධම්ම සිං. විජම්.

(4.) මේ ධර්මානුසාරයෙන් බලන කල පොතෙහි නිදසුන් කල ආදෙශ රූපයන්ගේ ව්‍යුත්පත්තිය මෙසේ වේ :—

සැරිපුත් ... ප්‍රකෘති රූපය.
*සැරිවුත් ... පයන්තට වකාරාදෙශයෙන්. (ප—ව).
සැරිඋත්* ... වකාරයා දිරා යෑමෙන්. (වු—උ).

සං. ආර්යපුත්‍ර ප්‍රා. අජ්ජඋත්ත වූයේ මේ න්‍යායයෙනි.

සැරියුත් ... යකාරාගම සන්ධියෙන්.

අඟුණ ... ප්‍රකෘතිරූපය.
*අහුණු ... ග — හ. පිළිපෙරළීද.
*අඋණු ... හකාර ක්ෂයයෙන්.
අයුණු ... යකාරාගම සන්ධියෙන්.

සං. වෘෂභ පා. වසභ ප්‍රකෘතිරූප.

| | | | |
|---|---|---|---|
| සිං. | වසබ් | ... | භයන්ත අල්පප්‍රාණ වීමෙන්. |
| | *වහබ් | ... | සයන්තට හකාරාදෙශයෙන්. |
| | වැහැබ් | ... | පිළිපෙරළී. |
| | වැහැප් | ... | ගල් බයන්තට හල් පයන්ත ආදෙශ වීමෙන්. |

(5.) මෙහි හල් බයන්තට හල් පයන්ත ආදෙශ වීමේ හෙතුව කිමයත්: සිය බසෙහි වර්තමාන ව්‍යවහාරයෙහිවනාහි ඝොෂ ස්පර්ශවර්ණයකු විත්‍රයෙහි මිස අන් කිසි තැනක ස්වර වර්ජිතව නොසිටීම වේ. එබඳු වර්ණයක් පම් යෙයකින් හල්වී නම් අඝොෂ භාවයට පැමිණේ. අන්‍යය දිවට අපරිචිත හෙයිනි. ද්‍රාවිඩ භාෂාධර්මයකි. තවත් නිදසුන් :—

| | | | | |
|---|---|---|---|---|
| දිග | — | දිග් | = | දික්. |
| කද | — | කද් | = | කත් |
| ගැබ | — | ගැබ් | = | ගැප් |
| හෙබ | — | හෙබ් | = | හෙප් |
| කැසුබු | — | කැසුබ් | = | කැසුප් |
| බුදු | — | බුද් | = | බුත්. |

වදන් කව් පොතෙහි: "වඳිමුව ගණදෙව් සිරිපද පත්මෙ–" යයි කී තන්හි පද්ම යනු පත්ම වූයේ මේ ධර්මයෙනි.

විත්‍රයෙහි මිස යනු කිම්?

ලග්ගල, ලිග්ගල, පොහොසද්දන — යනාදි තන්හි අප වාදය යෙදෙන හෙයිනි.

(6.) අක්ෂරයන්ගේ ඝොෂා' ඝොෂ විශෙෂය වර්ණ විභාග යෙහිදී නොකියන ලදි. ප්‍රාසඞ්ගික හෙයින් දැන් දක්වනු ලැබේ.

සිය බසට අයත් වර්ණයෝ නම් තෙතිසෙකැයි යට කියන ලදි. එයින් ක ට ත ප ස යන පඤ්ච වර්ණය හැර අනිකුත් සියල්ල ඝොෂාක්ෂරයන් බව දත යුතුයි. ඉන් වර්ණක් හල්ව සිටි කල්හිදු මේ පසට වඩා උසස් හඬින් උච්චාරණය කළ හැකි හෙයිනි.

ස්පර්ශ වර්ණයෝ යට කියන ලද්දහ. 6 — 10, විස්තරය 10. ඔවුන් කෙරෙන් සියබසෙහි ලැබෙන්නාවූ මීට ඇතුළත් ඝොෂයෝ නම් ග, ජ, ඩ, ද, බ, යන මොව්හු වෙත්.

අපවාදය: (5)-(6).—වර්ගාන්ත ඝොෂයන් මේ ධර්මයෙහි ඇතුළත් නොවන බව සලකනු.

(7.) මෙහි දක්වූ පස්වණ පමණක් නොව ණ, ර, ළ, හ, යන වර්ණයන්ද වර්තමාන සිංහල ව්‍යවහාරයෙහි අස්වරව නොසිටින බැව් හල් ප්‍රසඞ්ගයෙන් මෙහි කියයුතු වේ.

අ. සකු ආදි බසකින් ණයන්නක් සියබසට බිඳී ඊමෙහිදී ස්වර රහිත වී නම් එය පැමිණෙන්නේ 'න්' වශයෙනි. නිදසුන්: සං. කර්ණ, මා. කණ්ණ, සිං. කන්.

මෙය පසුව ස්වරාරූඪ වූවද ණ භාවයට නොපැමිණේ. නිදසුන් :—

නොමද අමා ඔත මෙන් දෙන සනා සනාය
නි සි ද කියන ලිය ලිය ගී තැන තැන ය.—කොකිල.

ආ. ලයන්න හල් වීනම් ඒ හල් රූපයෙහිදී පමණක් දන්තජ වේ. නිදසුන්: ඇතුළ — ඇතුල්.

ද්විත්වයෙහිද දන්තජ වේ. නිදසුන්: මුළුළ — මුළුල්ල.

(7.) එසේ හෙයින් සිය බසෙහි පදයක්හුගේ අන්තයෙහි හල්ව සිටිය හැකිවූ වර්ණයෝ නම් එකළොසෙකි. ඒ මෙසේය :-
(i.) ස්පර්ශවර්ණ සතෙකි :— ක්, ං, ට්, ත්, න්, ප්, ම්.
(ii.) අන්තඃස්ථ තුනෙකි :— ය්, ල්, ව්.
(iii.) ඌෂ්මවර්ණ එකෙකි :— ස්.

සංලක්ෂ්‍යය. 1. මෙසින් 'ය්' යනු ව්‍යඤ්ජනයෙහි මුත් අන් සියලුම තන්හි 'සි' යයි ශ්‍රාව්‍යාවිශෙෂයෙන් යොදනු ලැබේ. නිදසුන්: නය් - නසි.

සංලක්ෂ්‍යය. 2. එසේම 'ව්' යන්නද 'වු' යන්න හා අවිශෙෂයෙන් යොදනු ලැබේ. නිදසුන්: සිවු — සිව්.

සිව් දිගිනෙත දෙව්රුපු සෙනග ලුහුබැද.—ගුත්තිල.

(8.) තවද මෙහි කිය යුත්තක් ඇති. සඤ්ඤක යයි දන්නාලද ඟ, ඬ, ඳ, ඹ, යන මේ වර්ණයෝ නම් අර්ධානුනාසික සංයොගය ඇති වර්ණයෝ වෙත්. මොවුන් යම් විටක ස්වර

වර්ජිත වුවහොත් ඔවුන්ගේ අර්ධානු නාසිකත්වය සම්පූර්ණ අනු නාසිකත්වයට පැමිණේ. අත්‍යර්ථයෙන් උච්චාරණය නොහැකි හෙයිනි. ඒ මෙසේ ය :—

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අඟ | — | අග් | = | අංග් | | |
| හඬ | — | හඬ් | = | හණ්ඩ් | = | හන්ඩ් |
| ළිඳ | — | ළිඳ් | = | ළින්ද් | | |
| වැඹ | — | වැඹ් | = | වැම්බ්. | | |

තවද සියබසෙහි හල්වර්ණ යුග්මයක්හුගේ සහප්‍රවෘත්තිය අසම්භව යැ. ප්‍රසඞ්ගය වූ තැන්හි අසුබොච්චාරණීය යයි වර්ණ යුග්මයෙන් එකෙක් නසී. එසින් යට දක්වූ රූපයෝ මෙසේ වෙත් :—

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අග් | = | අංග් | = | අං | | |
| හඬ් | = | හණ්ඩ් | = | හන්ඩ් | = | හන් |
| ළිඳ් | = | ළින්ද් | = | ළින් | | |
| වැඹ් | = | වැම්බ් | = | වැම්. | | |

(9.) තවද සියබසෙහි ඇත්තාවූ ද්‍රවිඩ ධර්ම හෙතුයෙන් හලන්තව බිඳී ආවාවූ ඇතම් ප්‍රකෘතීහු විකල්පයෙන් සවරාන්තව සිටිත්. නිදසුන් :—

සං. ආම්‍ර. මා. අම්බ. සිං. අඹ් — අඹ
සං. මා. ජම්බු, සිං. දඹ් — දඹ
සං. නෙත්‍ර. මා. නෙත්ත. සිං. නෙත් — නෙතු
සං. දුඃඛ. මා. දුක්ඛ. සිං. දුක් — දුකු.

දුඹු(ළ්)ල් — දුඹුළ, කුකු(ළ්)ල් — කුකුළ ආදියද මෙසේමය.

(10.) බිඳී නොආවාවූ ඇතම්හුද එසේම සිටිත්. නිදසුන් :-

නෙළුම් — නෙළුඹු.

(11.) පුඩලු — කුඩලු, මුඹ — නුඹ; (දෙමළ) මණවාලන්- (සිංහල) මණමාලයා, (දෙමළ) මණවාලි — (සිංහල) මණමාලි යන මේ තැන්හිද ආදෙශය සලකනු.

## සූත්‍රපාඨය. 24. අගම්.

වර්‍ණක්හු නිසා ඔහු නොලොපා වනුයේ අගම් නම්. නිරලඹ, රූවාරූ, ඇගි.

**ව්‍යාඛ්‍යා.** වර්‍ණක්හු නිසා, වර්‍ණයක්හු ආශ්‍රය කොට; ඔහු නොලොපා, ඔහු ලුප්ත නොකොට; වනුයේ, ආවිර්භූත වන්නේ නම්; අගම් නම්, ආගම නම්. නිරලඹ, නි + අලඹ යයි සිටි තන්හි නිරලඹය; රූවාරූ, රූ + අරූ යයි සිටි තන්හි රූවාරූය; ඇගි, මේ ආදි ආකාර ඇත්තේයි. නිරලඹ යනු ස්වාධීන භාව යෙහි වැටේ, ආලම්බනයක් හෙවත් අනුන්ගේ පිහිටක් නො මැත්තාවූ යන අර්‍ථයෙහි. රූවාරූ යනු රූපා රූප වේ. රූප + අරූප යනු සි. රූපනම් දර්‍ශනීය භාවයයි; අරූපනම් එහි අභා වයයි. මේ දෙක එක්කොට කීමෙහි රූපා රූප වේ.

### 24. විස්තරය. ආගම.

යම් වර්‍ණයක් ආශ්‍රය කරමින් එය තිබියදීම තවත් වර්‍ණයක් ඊට ආසන්නව ප්‍රාදුර්භූත වේද ඒ වනාහි ආගම නම්. සිය බසෙහි 'නි' යනු අභාවාර්‍ථයෙහි උපසර්‍ගයකි. අලඹ යනු එල්වීමට හෙවත් රඳා සිටීමට නම්. රඳුමක් නොහොත් පිහිටක් නොමැත් තාවූ යන අර්‍ථයෙහි නි + අලඹ යයි සිටී. එකල නි යන්න ආශ්‍රය කෙරෙමින් ඊට හානියක් නොකොට සන්‍ධි ස්ථානයෙහි ර කාර යක් ප්‍රාදුර්භූත වේ. එයින් නි + ර + අලඹ යයි සිටී. මෙය පරස්වර ලොප සන්‍ධියෙන් නිරලඹ වේ.

තවද රූප + අරූප යන අර්‍ථයෙහි රූ + අරූ යයි සිටි තන්හි පූර්‍වවූ රූ යන්න ආශ්‍රය කෙරෙමින් ඊට හානියක් නොකොට සන්‍ධිස්ථානයෙහි ව යන්නක් ප්‍රාදුර්භූත වේ. එකල පරස්වර ලොප සන්‍ධියෙන් රූවරූ යයි සෑදේ. පසුව මෙය සුබොච්චාරණ හෙතුවෙන් රූවාරූ වේ. සූ අසූ යන තන්හි සුවාසූ වූ මෙනි.

### 24. කිහිසාරය. ආගම.

(1.) මෙහි නිරලඹ යන තන්හි ර යන්න ආගමයක් යයි උගන්වා තිබේ. මෙය ආගමයක් නම් නිරොද, නිරතුරු, නිරවුල්, සිව් රැස්, සිව් රඟ, පුනරුත් — යනාදි තන්හිද ඒ ආගමයම පෙනේ. මේ ශබ්දරූපයන් මාගධී සංස්කෘත භාෂාවන්හි පෙනෙන්

නෝ මෙසේ ය :—

| | | මාගධී. | | සංස්කෘත. |
|---|---|---|---|---|
| නිරොද | ... | නිරොජ | ... | නිරොජස් |
| නිරතුරු | ... | නිරන්තර | ... | නිරන්තර |
| නිරවුල් | ... | නිරාකුල | ... | නිරාකුල |
| සිවිරැස් | ... | චතුරස්ස | ... | චතුරශ්‍ර |
| සිවිරඟ | ... | චතුරඞ්ග | ... | චතුරඞ්ග |
| පුනරුත් | ... | පුනරුත්ත | ... | පුනරුක්ත. |

එසේම නිරලඹ යනු මාගධී සංස්කෘතයන්හි නිරාලම්බ යයි පෙනේ.

මේ සියලුම තන්හි පෙනෙන්නාවූ රකාරය සියබසෙහිවූ ආගමයක් නොවන බවද නිරලඹ, පුනරත් යනාදි සියලු ශබ්ද රූපයන් සියබසෙහි සිඩවූවන් නොව මාගධී සංස්කෘත භාෂාවන් ගෙන් භින්නාවූවන් බවද ප්‍රත්‍යක්ෂය.

මේ මාගධී රූපයන්හිද ර කාරය ආගමයෙන් වියයි පාලි ව්‍යාකරණයෙහි උගන්වා තිබේ. මීට හෙතුව නම් මෙසේය. මාගධී වෛයාකරණයෝ ඔවුන්ගේ ඒ භාෂාව ලොකයෙහි පැවති මූල භාෂාව යයි ඇදහුවාහුය. එයින් කියන ලදි :—

සා මාගධී මූල භාසා — නරා යා යාදි කප්පිකා
බ්‍රහ්මාණො චස්සුතා ලාපා — සම්බුඩා චාපි භාසරෙ.

(ආදි කල්පිකවූ ජනයෝද, බ්‍රහ්මයෝද, නොඅසනලද තෙපුල් ඇත්තාවූ අයවල්ද, සම්මා සම්බුද්‍ධවරයෝද යම් භාෂාවකින් කථාකළාහුද ඒ මාගධී තොමෝ මූල භාෂායි.)

ඔවුන්ගේ ඇදහීම මෙසේ වූ හෙයින් මාගධී භාෂාවෙහි පෙනෙන්නාවූ කිසිම ප්‍රකෘති රූපයක් ඒ භාෂාවෙහිම ව්‍යුත්පන්නවූ බවමුත් අන් කිසි භාෂාවකින් භින්න වියයි ඔව්හු නොඇදහූහ. මේ භාෂාවෙහි වනාහි ගාත්‍රාක්ෂරයන්ගේ සංයොග ඇති නමුදු හලන්තවූ හෙවත් හල් වර්ණයකින් අන්තවූ කිසිවක් නොමැත්තේය. එහි ප්‍රකෘතිරූප හෝ ප්‍රකෘතීන්ගේ ව්‍යුත්පත්තියට ආධාරවූ උපසර්ග නිපාත ප්‍රත්‍යයාදි කිසිවක් හෝ හලන්තව නොසිටික්. එහෙයින් සංස්කෘතයෙහි යම් ප්‍රකෘතියක් හෝ

උපසර්ගාදියක් හෝ හලන්තව පෙනේද එය මාගධියෙහි පෙනෙන්නේ හල් වර්ණයෙන් වියුක්තවය. නිදසුන් මෙසේයි :—

| | | | |
|---|---|---|---|
| ශබ්දප්‍රකෘති : — | චතුර් | ... | චතු |
| | ෂෂ් (ෂට්, ෂඩ්) | ... | ඡ |
| උපසර්ග. :— | උද් | ... | උ |
| | නිර් | ... | නි |
| නිපාත : — | පුනර් | ... | පුන |

කරුණු මෙසේ හෙයින් මාගධී වෛයාකරණයන් විසින් මාගධියෙහි ලැබෙන්නාවූ චතුරඞ්ග, ඡළභිඤ්ඤ, උදිත, නිරාලම්බ පුනරුත්ත — යනාදි ශබ්ද රූපයන්ගේ ව්‍යුත්පත්තිය පෙන්වනු ලබන්නේ මෙසේය :—

| ශබ්දවයව. | | ආගම. | | සන්ධිරූප. |
|---|---|---|---|---|
| චතු + අඞ්ග | ... | ර | ... | චතුරඞ්ග |
| ඡ + අභිඤ්ඤ | ... | ළ | ... | ඡළභිඤ්ඤ |
| උ + ඉත | ... | ද | ... | උදිත |
| නි + ආලම්බ | ... | ර | ... | නිරාලම්බ |
| පුන + උත්ත | ... | ර | ... | පුනරුත්ත. |

මෙසේ යෝග්‍ය ස්ථානයට යෝග්‍යාක්ෂරයාගේ ආගමය වන බවට

•“යවමදන තරලා චා ගමා”

යයි සූත්‍රයක්ද කච්චායනයෙහි දී තිබේ. එහෙත් මේ සම්බන්ධවූ ආශ්චර්යය නම් මේ සියලුම ආගමයන් අතුරෙහි යෝග්‍ය ස්ථානයට යෝග්‍යවූ ආගමය නම් සංස්කෘත රූපයෙහි විද්‍යමාන වූම වර්ණය හෝ එය නිමිත්තකොට ඇති වර්ණයක් හෝ වේ මැයි. හැමතැන එයම මූලාලම්බනය වේ. ඉන් තොරව මේ වර්ණයන්ගේ පැවැත්මක් නම් නොමැත්තේය.

මෙයින් පෙනෙන්නේ මේ චතුරඞ්ගාදි රූපයන් මාගධියෙහිම අවයව සඞ්කලනයෙන් උත්පන්නවූවන් නොව සංස්කෘතයෙන් සම්ප්‍රාප්ත වශයෙන් හෝ තද්භව වශයෙන් හෝ ආවාවූ රූපයන් බවයි.

ඒ මෙසේ දත යුතු :—

| | | | | |
|---|---|---|---|---|
| චතුර් + අඞ්ග | = | චතුරඞ්ග | ... චතුරඞ්ග | ... සම්ප්‍රාප්ත |
| උද් + ඉත | = | උදිත | ... උදිත | ... එම |
| නිර් + ආලම්බ | = | නිරාලම්බ | ... නිරාලම්බ | ... එම |
| පුනර් + උක්ත | = | පුනරුක්ත | .. පුනරුත්ත | ... තද්භව |
| ෂඩ් + අභිඥ | = | ෂඩභිඥ | ... ඡළභිඤ්ඤ | ... එම |

මෙසේ හෙයින් මාගධි තොමෝ මූලභාෂාය යනු නිස්සාර කිමකි. මාගධියෙහි බොහෝ ප්‍රකෘතීන් ඇවිත් තිබෙන්නේ සංස්කෘතයෙනි. ඔවුන්ගේ ව්‍යුත්පත්තිය මාගධියෙන්ම පෙන්වා දීමට කරනලද උත්සාහය නිෂ්ඵලවූ ව්‍යාපාරයකි.

සිංහලෙහිද එසේමය. එහි බොහෝ ප්‍රකෘතීන් ඇවිත් තිබෙන්නේ මාගධී සංස්කෘත භාෂාවන්ගෙනි. එයින් ඔවුන්ගේ ව්‍යුත්පත්තිය එම භාෂාවන්හි පෙනෙන්නාවූ රූපයන් බලා නිශ්චය කරගත යුතුයි.

මෙසේ බලන කල නිරලඹ, සිව්රඟ, පුනරුත් - යනාදි රූපයන් මාගධි නිරාලම්බ, චතුරඞ්ග, පුනරුත්ත යනාදි රූපයන් ගෙන් භින්නව ආබව ප්‍රත්‍යක්ෂව පෙනෙන්නාසේම එම මාගධී රූපයන්ද සංස්කෘත නිර් + ආලම්බ, චතුර් + අඞ්ග, පුනර් + උක්ත යන මොවුන්ගෙන් භින්නව හෝ අභින්නව හෝ ආ බවද එයින් මෙහි සංස්කෘතයෙන් ආවාවූ රයන්ත මිස මාගධියෙහිද කිසිම තැනෙක රකාරාගමයක් නොමැති බවද නිශ්ශඞ්කිතාවයෙන් පෙනේ. සියබසෙහිද එසේමය.

(2.) රුවාරු යයි කියූ තන්හි පෙනෙන්නාවූ වකාරාගමය නම් සියබසෙහි බහු ප්‍රචාරයෙන් ලැබේ. එසේ ලැබෙන්නාවූ තවත් ආගමයක් නම් යකාරාගමයයි. නිදසුන් ;—

| | | | |
|---|---|---|---|
| යකාරාගම. | නි + අකුරු | ... | නියකුරු |
| | නි + ඇළි | ... | නියැළි |
| | වි + ඇට | ... | වියැට |
| | නො + එක් | ... | නොයෙක් |
| වකාරාගම. | තුනු + අඟ | ... | තුනුවඟ |
| | කටු + අල | ... | කටුවල |
| | ලො + ඇදුරු | ... | ලොවැදුරු. |

මේ සියලුම තන්හි පෙනෙන්නාවූ ආගමයෝ සන්ධිය පිණිස වෙත්. මේ සියලුම සන්ධිහුද බාහිර සන්ධි වෙත්. බාහිර සන්ධිහු නම් සමීපව සිටගත් ශබ්දයන් හෝ පදයන් හෝ අතරෙහි වන්නාවූ සන්ධියි. අන්‍යයෝ අභ්‍යන්තර සන්ධිහු වෙත්. ඔව්හු නම් එකම ශබ්දරූපයක හෝ පදරූපයක හෝ අභ්‍යන්තරයෙහිම වන්නාවූ සන්ධියි.

සංස්කෘත මාගධී භාෂාවන්හි බාහිර සන්ධිය පිණිස ආගමයෙක් නම් නොදන්නා ලදි. එයින් මෙහි දක්නාලද මේ ආගම ධර්මය සියබසෙහි විද්‍යමානවූයේ එම භාෂාවන් අනුව විය නොහැකි.

දෙමළෙහි වනාහි බාහිර සන්ධිය පිණිස මේ ආගම යුගමයෙහි ප්‍රචාරය ඉතා බොහෝයි. නිදසුන් :—

යකාරාගම.

| | | | |
|---|---|---|---|
| මණී + අරුමෙයි | = | මණීයරුමෙයි | (මිණීඅගය) |
| තී + එරියුම් | = | තීයෙරියුම් | (ගිනි දැල්වේ) |
| අවෙයි + එංගෙ | = | අවෙයියෙංගෙ | (ඒවා කොහිද?) |

වකාරාගම.

| | | | |
|---|---|---|---|
| අල්ල + එන්ඩාන් | = | අල්ලවෙන්ඩාන් | (නොමැයි කීය) |
| මගා + ආශෙයි | = | මගාවාශෙයි | (මහත් ආසාව) |
| ඔරු + ඉඩම් | = | ඔරුවිඩම් | (එක් තැනක්) |
| පූ + අලගු | = | පූවලගු | (කුසුම් සිරිය) |
| කෝ + ඉල් | = | කෝවිල් | (දේවාලය) |

මේ සන්ධියෙන්ම :—

| | | |
|---|---|---|
| මණ + ආලන් | = | මණවාලන් (මණමාලයා) |
| මණ + ආලි | = | මණවාලි (මණමාලි) |

ද්‍රවිඩ 'මණ' යනු පාණිග්‍රහණ මඞ්ගලයයි.

මෙසේ මේ ආගම යුගමය සියබසෙහි ශිෂ්ටවූ ධර්මයක් හෙයින්ද ස්වභාවයෙන් ද්‍රවිඩ හෙයින්ද සියබසෙහි මූලිකාවූ ද්‍රවිඩ සම්බන්ධයට හෙද බලවත් සාක්ෂ්‍යයකි.

## 25. පෙරරූ.

**සූත්‍රපාඨය.** පර වණීහට පෙර රූ කරනු පෙර රූ නම්. විස් සම් ඈයි.

**ව්‍යාඛ්‍යා.** පර වණීහට, පර වණීයාහට; පෙර රූ කරනු, පූර්‍ව රූප කරණය; පෙර රූ නම්, පූර්‍ව රූප නම්. විස්සම්, විස්කම් යයි සිටි තන්හි විස්සම් යනුය; ඈයි, මේ ආදි ආකාර ඇත්තේයි.

## 25. විස්තරය. පූර්‍වරූප.

මෙයින් පූර්‍වරූපය දක්වූහ. විස්කම් යනු දෙවියන්ගේ ශිල්පියාවන විශ්වකර්‍ම දිව්‍ය පුත්‍රයාහට නම්. සියලු කර්‍මාන්ත යෙහි දක්ෂ හෙයින් විශ්වකර්‍ම යනු වේ. මාගධියෙහි විස්සකම්ම වේ. විස්සකම්ම යනු සිය බස්හි විස්කම් වේ. මෙහි කයන්නට පූර්‍ව සර් සකාරයාගේ රූපය වීමෙන් විස්සම් වේ. මේ ව්‍යාකරණ හි එක්තරා ආදෙශයකි. ඊට විශෙෂ නාමයක් වශයෙන් මේ ග්‍රන්ථයෙහි මතු ප්‍රයොජනය සලකා පූර්‍ව රූප යයි කියනලදී.

## 25. නිතිසාරය. පෙර රූ.

මෙහි පළමුකොට ඇතම් වණී ධර්‍මයන් ගැන විවෙචනයක් ප්‍රාස්තාවිකය.

(1.) සංස්කෘතයෙහි ව්‍යාකරණ හි :—

ප්‍රති + අක්ෂ යනු ප්‍රත්‍යක්ෂයයි සන්ධි වේ. (ඉ + අ = ය.)

අනු + අර්ථ යනු අන්වර්ථ යයි සන්ධි වේ. (උ + අ = ව.)

මේ සන්ධින්ගෙන් ප්‍රතියමාන වූ වණීධර්‍මය නම් මෙසේය:-

ඉ, ය්, යන වණීයෝ සාරයෙන් සම වෙති.

උ, ව්, යන වණීයෝ සාරයෙන් සම වෙති.

මේ ධර්‍මය සාවධානව හිතෙහි ධාරණයකොට ගත යුතුවේ.

(2.) තවද අන්තඃස්ථ වණීයෝ ව්‍යාකරණ හි ප්‍රයත්නයෙන් එක් පක්ෂයක ස්වරයන්වද, අන්‍ය පක්ෂයෙන් ස්පර්‍ශ වණීයන් හා ඌෂ්ම වණීයන්වද අතරෙහි සිටි හෙයින් පූර්‍ව පක්ෂයට වඩා දැඩිවෙති, අපර පක්ෂයට වඩා ලිහිල් වෙති, එයින් අපර පක්ෂයට වඩා දුර්‍ව ලද වෙති.

(3.) මේ ලිහිල් හෙතුවෙන් යම් අන්තඃස්ථයෙක් දෘඪාක්ෂරයකු කෙරෙන් පරව සිටීද එකල සාමාන්‍ය උච්චාරණයෙහිදී හේතෙමේ දෘඪාක්ෂරයාගේ අනුනාදයෙන් වසාගනු ලැබේ. එසින් අන්තඃස්ථයං කෙරෙහි ආරූඪවූ ඒ අනුනාදය තෙම දෘඪාක්ෂරයාගේ විතීය රූපයක් වශයෙන් සිටගනී; අන්තඃස්ථය තෙම ඒ වැසියෑමෙන් නසී. මේතම් පූර්වරූප වීමයි. අන්තස්ථඃයා හටය.

නිදසුන් :—

සං. රම්‍ය ... මා. රම්ම් අ ... රම්ම
ය්

සං. ගොත්‍ර ... මා. ගොත්ත අ ... ගොත්ත
ර්

සං. ශුක්ල ... මා. සුක්ක් අ ... සුක්ක
ල්

සං. පක්ව ... මා. පක්ක් අ ... පක්ක.
ව්

(4.) මේ ධර්මය සිංහල භාෂාවෙහිද හ, ය, ව, යන මේ අන්තඃස්ථයන් සම්බන්ධයෙහි පවතී. නිදසුන්:—

කම් + හල = කම්මල
නැටි + අ = නැටිය = නැට්ට
රොඩු + අ = රොඩ්ව = රොඩ්ඩ.

(5.) සියබසෙහි අන්තඃස්ථයකු පූර්වවූ කල්හිද මේ ආදේශය වේ. නිදසුන් :—

ලැලි + අ = ලැල්ය = ලැල්ල
කුලු + අ = කුල්ව = කුල්ල.

(6.) තවද සං. කර්ම, මා. කම්ම යන්නෙන් භින්නවූ සිංහල කම් යනු නොයෙක් විට ප්‍රයත්න හානියෙන් හම් යයි සිටී. ප්‍රයත්නය නම් වර්ණෝච්චාරණයෙහිදී උගුරෙහි යොදනු ලබන්නාවූ ශක්ති ප්‍රමාණයයි. ඒ ශක්ති ප්‍රමාණය අඩුවූ කල වර්ණයෙහි දෘඪත්වයද අඩුවේ.

නිදසුන් : තව කර්ම — තව කම්ම — තවකම් — තවහම්. වෙණ්දහම් යනුද මෙසේමය.

සමාගම යනු සමහම් වීමෙහිද ධර්මය මෙමයි.

මේ ධර්මය අනුව බලන කල විස්කම් යයි සිටි තන්හි ක කාර තෙමේ ප්‍රයත්න හානියෙන් හකාර වේ. එයින් විස්හම් යයි සිටී. එකල හකාරයාහට පූර්වස්ථ සකාරයාගේ ආරූඪියෙන් විස්සම් වේ.

සිදත් කරු විසින් අත්තම්, වත්තම්, යනාදි තන්හි ක කාරයා හට පූර්වරූපවන බවක් සඳ අදියරෙහි කියා තිබේ. ඒ වර්ණයට පූර්වරූප වීමක් එහි නොමැත්තේය. පූර්ව රූපය වන්නේ නම් ක කාරයා ලිහිල්වීමෙන් වූ හ යන්නටයි. හෙද හකාරයා නිමග්න වීමෙනි.

(7.) මේ දක්වූ සේ මිස පූර්වරූප සිඬියක් සියබසෙහි නොමැති බව සලකනු.

(8.) තවද "පෙරරූ කරනු" යන්නක් සූත්‍රයෙහි කියාතිබේ. මෙහි වීමක් මිස කෙරීමක්නම් නොමැත්තේය. "කරනු" යනු අශාස්ත්‍රීය යෑ.

## 26. දෙරූ.

**සූත්‍රපාඨය.** වණහටද පදහටද දෙරූ දනවුම් දෙරූ නම්. තුටුකලේ එලොපල්ලා, කුළුණෙන් ලතෙත්තා, තෙදියට එක නෙත්තා, රණමැද දිය කොත්තා, දිදී, විඳවිඳ, පලපල. පාසා යෝහි සකිත් උසුරුවනුද රුසී. සක්වලක් පාසා මහමෙර. ඈගි.

**ව්‍යාඛ්‍යා.** වණහටද, වර්ණයකුහටද; පදහටද, පදයකුහටද; දෙරූදැනවුම්, විරූප ජනනයතෙම; දෙරූනම්, වෛරූප්‍ය නම්. එලොපල්ලා තුටු කලේ, ඒ ලොකපාල තෙමේ සන්තුෂ්ට කලේය යන අර්ථ ඇති මේ එලොපල්ලා යනුය; කුළුණෙන් ලතෙත්තා, කරුණාවෙන් හෘදය තෙත්වූයේ යන අර්ථ ඇති මේ ලතෙත්තා යනුය; තෙදියට එකනෙත්තා, ජගත්‍රයට එකම නෙත්‍රයක් වූයේ යන අර්ථ ඇති මේ එකනෙත්තා යනුය; රණමැද දිය කොත්තා, සංග්‍රාම මධ්‍යයෙහි ජයකෙතුවූයේ යන අර්ථ ඇති මේ දිය කොත්තා යනුය; දීදී, දනය කොට කොට යන අර්ථ ඇති මේ දිදී යනුය; විඳවිඳ, විඳිනය කොට කොට යන අර්ථ ඇති මේ විඳ විඳ යනුය; පලපල, තන්හි තන්හි යන අර්ථ ඇති මේ පල පල යනුය — (නිදසුන්, ඊට නිදර්ශනයි.) පාසා

යෝගි, පාසා යන්නහුගේ යොගය ඇති කල්හි; සකිත් උපුරා වනුද, එක්වරක් උච්චාරණය කිරීමද; රූසී, අභිමත වේ. සක් වළක් පාසා, චක්‍රවාලයක් පාසා; මහමෙර, මහාමෙරුවකී. ඈගි, මේ ආදි ආකාරයි.

## 26. විකාරය. විරූප.

වර්ණයක හෝ පදයක හෝ විතීය රූපයක් ඇති කරවීම දෙරූ නම් වේ. සවර වර්ණයක් විරූප වුව හොත් සන්ධියෙන් නැවතත් එක වර්ණයක් වන හෙයින් කෙවල සවර වර්ණය මෙයින් බාහිරය.

වෛරූප්‍යයට නිදසුන් මෙසේය :—

තුටු කළේ එලොපල්ලා යන තන්හි එලොපල්ලා යනු මින් පසු දක්වනු ලබන්නාවූ ප්‍රථමා විභක්ති එක වචනයෙහි සිටි නාම පදයකි. ලොපල් යනු එහි ප්‍රකෘති යයි. මෙය 'ආ' ප්‍රත්‍යය සමග මෙසේ සිටී :—

ලොපල් + ආ.

මෙය මේ ස්ථිතියෙහිම සන්ධි කළහොත් 'ලොපලා' වේ. නමුත් ලොකව්‍යවහාරය එසේ නොවේ. ලොකව්‍යවහාරය නම් මෙහි ලයන්න විරූප කොට ගැනීමයි. එයින් ලොපල්ලා යයි සෑදේ.

කුළුණෙන් ලනෙත්තා යන තන්හි වෛරූප්‍යය නම් නෙත් තා යන්නෙහිය. නෙත් යනු ප්‍රකෘතියයි. යට කී පරිද්දෙන්ම 'ආ' ප්‍රත්‍යය යොගයෙන් නෙත්තා වේ.

නෙදියට එක නෙත්තා යයි කියූ තන්හි නෙත්තා යන් නෙහිද සිඩිය එසේමය.

රණ මැද දිය කොත්තා යයි කියූ තන්හි කොත්තා යන් නෙහි සිඩියද එසේ මැයි.

දී යනු 'දානය කොට' යන අර්ථ ඇති පූර්ව ක්‍රියා පදයයි. අඛණ්ඩ ක්‍රියායෙහි පූර්ව ක්‍රියා පදය ද්විත්වයෙන් යොදනු ලැබේ. එයින් අඛණ්ඩ දානයෙහි නොහොත් 'දානය කෙරෙමින්' යන අර්ථයෙහි දී දී යයි යොදනු ලැබේ. මෙය තවත් නීතියකින් දි දී වේ. මෙහි ප්‍රස්තුතවන්නේ නම් එකම රූපයක් විරූපවූ බවයි.

විද යනු විද් (විදීමේ) යන ධාතුවෙන් සිඬවූ පූර්ව ක්‍රියා පද යයි. මෙද අඛණ්ඩ ක්‍රියාර්ථයෙහි විද විද යයි විරූප වේ.

'පල' යයි ස්ථානාර්ථවාචි ශබ්දයෙක් ඇත්. ගෙපල යනාදියෙහි ඒ පෙනේ. මෙය විප්සායෙන් ගත් කල්හි 'තන්හි තන්හි' යන අර්ථය ගෙන දේ.

දෙළ දෙළ හුරු මුළු පළ කළ පබළ ද ළ
ප ළ ප ළ පොරැත යත මුව මී ගවරර ළ.—හං.ස.

තවද බට පිපිරීමෙහිදී "පට පට" යයි ශබ්දයක් ඇසේ. එය දක්වනු පිණිස "පට පට" යයි කිවහොත් ශබ්දානුකරණයකි. ශබ්දයවූ ශබ්දයම අනුව කරනලද ශබ්දයක් හෙයිනි. ට කාරයට නොයෙක්විට ළකාරාදේශය වේ. එයින් පට පට යනු "පළ පළ" විය හැකි. ශබ්දානුකරණයකි. පාඨයෙහි නිර්දිෂ්ටවූ "පළ පළ" යනු අනුකරණ සූචක බැව් පුරාණ සන්නයෙහි කීහු.

උපසර්ගයක යොගය නම් ප්‍රකෘතියක ආදියෙහි වේ. එහෙත් ඇතම් විට යම් යම් විශෙෂාර්ථ පිණිස උපසර්ගයක් පදයකට පර වද යොදනු ලැබේ. නිපාතයක් සේමය. එසේ යෙදූ කල්හි ඊට කර්මප්‍රවචනීය යයි කියනු ලැබේ. එහි සම්බන්ධයද කර්මවිභක්ති යෙහි වූ පදයකි. තම එසේ හෙයිනැයි සිතිය යුතුවේ.

සංස්කෘතයෙන් "වෘක්ෂං වෘක්ෂංප්‍රති සිඤ්චති" යන්නෙන් කියවෙන්නේ "ගසක් ගසක් පාසා ඉසී" යනු වේ. දිය ඉසීමයි නොහොත් දිය වැගිරවීමයි. මේ වාක්‍යය "වෘක්ෂං ප්‍රති" යයි ලියනලද්දේද අනවද්‍යය; අර්ථයට කිසිම හානියක්ද ඉන් නොවන්නේය. එයින් සිංහලට "ගසක් ගසක් පාසා" යයි කී තන්හි "ගසක්" පාසා යයි කියන ලද්දේද අනවද්‍යය. මේ පාසා සම්බන්ධයෙහි විරූපය හෝ එක රූපය හෝ විකල්ප හෙයිනි. පාසා යනු සංස්කෘත ප්‍රති යන්නෙන් භින්නය. මේ යොගයෙහි කර්ම ප්‍රවචනීය යයි.

මේ න්‍යායයෙන් සක්වළක් සක්වළක් පාසා යයි කියන ලද්දේද සක්වළක් පාසා යයි කියන ලද්දේද විකල්ප හෙයින් අවිශෙෂය. සකිත් උපුරු වතුද රුසී යයි කී තන්හි "ද" යනු

සමුච්චයාර්ථයෙහි වේ. විරූපය ප්‍රාසංගික හෙයින් එක රූපයද විකල්පයෙන් එසේම අභිමත බැව් කිහ.

## 26. ද්විත්වාරය. විරූප.

මෙහි පළමුකොට එක්තරා වර්ණ ධර්මයක් විවෙචනය කට යුතු වේ. ඒ මෙසේය :—

ක්‍රමයෙන් ව්‍යඤ්ජනයක් හා ස්වරයක් පූර්වාපරව සිටි කල්හි—

(1.) ඔවුන්ගේ සන්ධිය හෝ වන්නේය. නිදසුන්:

උගත් + ආ = උගතා.

(2.) නැතහොත් ව්‍යඤ්ජනයාගේ අනුනාදය ස්වරයා කෙරෙහි පැමිණ ව්‍යඤ්ජනයෙහි ද්විතීය රූපයක්ව සිටී. නිදසුන්:

උගත් + ඕ = උගත්තෝ.

වර්ණයන්ගේ වෛරූප්‍යය නම් මේය. පූර්ව රූපයෙන් කියන ලද්දේ පෙර ව්‍යඤ්ජනයාගේ රූපය පසු ව්‍යඤ්ජනයා කෙරෙහි ආරූඪවීම වේ. මේ වෛරූප්‍යයෙහි විශෙෂය නම් පෙර ව්‍යඤ්ජනයාගේ ද්විතීය රූපයක් පසු ස්වරයා කෙරෙහි ප්‍රාප්තවීමයි.

(2.) මෙසේ වෛරූප්‍යය නම් යමෙකුගේ කෙරීමක් නොව ශබ්ද ධර්මයෙන් වන්නාවූ ස්වයං සිද්ධියකි. එහින් දෙරූ දැනවුම් යන්නෙන් කියනලද ලක්‍ෂණය ශාස්ත්‍රීය නොවේ.

(3.) තවද මේ වෛරූප්‍යය වනාහි අභ්‍යන්තර සන්ධියකි. මෙබඳු අභ්‍යන්තර සන්ධියක් මාගධී සංස්කෘත භාෂාවන්හි නොමැත්තේය. දෙමළෙහි වූකලී වෛරූප්‍යය අභ්‍යන්තර වශයෙන්ද බාහිර වශයෙන්ද එකසේ බහුල ප්‍රචාරයෙන් ලැබෙයි. නිදසුන් :-

(i) අභ්‍යන්තර.

ප්‍රකෘති : කණ්, ඇස.

කණ් + ආල් = කණ්ණාල්, ඇසින්.
කණ් + ඉල් = කණ්ණිල්, ඇසෙහි.

(ii) බාහිර.

තල් + ඌර් = තල්ලූර්, සුන්දරග්‍රාමය.
මූන් + අඩි = මූන්නඩි, පූර්වපදය (මූලික ස්ථානය.)

(4) සියබසෙහිද කිසිවිටෙක මේ වර්ණ වෛරූප්‍යය බාහිර සන්ධියෙහිද ලැබේ. බොහෝ ආරාවාර වශයෙනි. නිදසුන් :—

රන් + ආල = රත්තාල (සුවර්ණගෘහය)
රුක් + අත්තන = රුක්කත්තන
වක් + අත්ත = වක්කත්ත.

අතන සසිරිබර එනුවර ර ත් තා ල
තිබද රදන සුර දෙව්රද පු ත් තා ල.—කොවුල්.

මේ බාහිර සන්ධිය සංස්කෘතයෙහිද ඉතා ස්වල්ප වශයෙන් ලැබේ. තකාර සම්බන්ධයෙන් පමණකි.

හසත් + එති = 'හස තෙනති' (සිනාසෙමින් එයි) කීතන්හි මෙනි.

(5.) බොහෝ තන්හි මේ බාහිර සන්ධිය ලිපියෙහි දක්වනු නොලැබේ. නිදසුන් :—

ස ත් අ ත් සක් සක ත්
ව ත් අ ත් තිනෙත් බරනෙ ත්—කුසද.

(6.) මේ වෛරූප්‍යය පිණිස පූර්වස්ථවූ ව්‍යඤ්ජනය හ්‍රස්ව ස්වරයකු කෙරෙන් පරව සිටියක් විය යුතුයි. උගත්තෝ යන තන්හි හල් තකාරයට පූර්වවූ ස්වරයද, රත්තාල යන තන්හි හල් ත කාරයට පූර්වවූ ස්වරයද හ්‍රස්ව යැ. අනිකුත් තන්හිද එසේමය.

### 27—33. පෙරළි.

සූත්‍රපාඨය. 27. පිළි පෙරළි, වණ පෙරළි, පද පෙරළි, විබත් පෙරළි, කිරිය පෙරළි, වී පෙරළි පස් වැදෑරුම්.

„ 28. වසල්, රික්, කිසුම්, ඉපැත්, ඈ පිළි පෙරළි.

„ 29. කෙණෙර, හුරිර, යහන්, මහණ, ඈ වණ පෙරළි.

„ 30. රජ දත් ඈ පද පෙරළි.

„ 31. ගතු ගතුද දුදතෝ-සහ කට මැණ සපුත්මෙන් පිරි රුඹැ තිරිඳු මලද-පරතට බියම රුකුළෝ; ඈ විබත් පෙරළි.

„ 32. තමා වරදස නොදිස්නේ; මොණරිඳු එකල්හි-පුල් සලග නවාගනී —ඈ කිරිය පෙරළි.

„ 33. සද දහමින් සඳ හෙති හොත පස් පෙරළි ඈ කරනු.

ව්‍යාඛ්‍යා. 27. පිළි පෙරළි, පිළි විපර්‍ය්‍යාසය; වණ පෙරළි, වර්‍ණ විපර්‍ය්‍යාසය; පද පෙරළි, පද විපර්‍ය්‍යාසය; විබත් පෙරළි, විභක්ති විපර්‍ය්‍යාසය; කිරිය පෙරළි, ක්‍රියා විපර්‍ය්‍යාස යයි; වී, කියා; පෙරළි, විපර්‍ය්‍යාස තෙමේ; පස් වැදෑරුම්, පඤ්චවිධ වේ.

28. වසල්, විශාලාර්‍ථයෙහි වසල්‍ය; රික්, වෘක්‍ෂාර්‍ථයෙහි රික්ය; කිසුම්, කුසුමාර්‍ථයෙහි කිසුම්ය; ඉපැන්, උත්පන්නාර්‍ථයෙහි ඉපැන්ය; ඈ, මේ ආදිය; පිළි පෙරළි, පිළි විපර්‍ය්‍යාසයි.

29. කෙණෙර, කරේණු (හස්තිනී) අර්‍ථයෙහි කෙණෙරය; හුරිර, රුධිරාර්‍ථයෙහි හුරිරය; යහන්, ශයනාර්‍ථයෙහි යහන්ය; මහණ, ශ්‍රමණාර්‍ථයෙහි මහණය; ඈ, මේ ආදිය; වණ පෙරළි, වර්‍ණ විපර්‍ය්‍යාසයි.

30. රජදත්, දන්තරාජාර්‍ථයෙහි රජදත්ය; ඈ, මේ ආදිය; පද පෙරළි, පද විපර්‍ය්‍යාසයි.

31. දුදනෝ, දුර්ජනයෝ; ගත් උගතුද, ග්‍රහෝද්ග්‍රහණය කළාහුද; සහ කට මැණ, කණ්ඨමණි සහිතවූ; සපුන්මෙන්, සර්‍පයන් මෙන්; නිරිඳු මලද, නරේන්‍ද්‍ර නැමති මලයජ වෘක්‍ෂය; පිරිරැඹ, පරිරම්භණය් කොට; පරනට, අන්‍යයන්හට; බියම, භයම; රැකුලෝ, නිපදවූහු; ඈ, මේ ආදිය; විබත් පෙරළි, විභක්ති විපර්‍ය්‍යාසයි.

32. තමා වරද, ස්වකීය දෝෂය; අස, අංශුමාත්‍රයෙනුදු; නොදිස්නේ, දෘශ්‍යමාන නොවන්නේයි. මොණරිඳු, මයූරේන්‍ද්‍ර තෙමේ; එකල්හි, ඒ කාලයෙහි; පුල්සල් අග, ඵුල්ල ශාලාග්‍රයෙහි; තවා ගනී, නිවාස ග්‍රහණය් කෙරේ. ඈ, මේ ආදිය; කිරිය පෙරළි, ක්‍රියා විපර්‍ය්‍යාසයි.

33. සද දහමින්, ශබ්දධර්මයෙන් (හෝ) ; සඳහෙති හොත, ඡන්‍දෝ හෙතුවෙන් හෝ; පස් පෙරළි ඈ, පඤ්ච විපර්‍ය්‍යාසාදිය; කරනු, නිපදවනු.

## 27–33. විකාරය. විපර්යාස.

27. පෙරළි නොහොත් විපර්යාසය ව්‍යාකරණ විධි විස්සෙන් එකක් බව කලින් කියන ලදි. දැන් ඒ විපර්යාසය ජාති වසයෙන් එකක් නමුත් හෙද වසයෙන් පසක් බව කියා ඒ එක් එක් හෙදය නම් කොට නිදසුනෙන් හඳුන්වා දෙනුලැබේ. ඒ විපර්යාස පඤ්ච හෙදය මෙසේය :—

28. පිළි පෙරළි නොහොත් පිළි විපර්යාසය. පිල්ල නම් ව්‍යඤ්ජනාරූඪවූ ස්වරයක් පිණිස සිටි ලක්ෂණයයි. එයින් පිළි පෙරළි නම් ස්වරයාගේ විපර්යාසයකි. ඊට නිදසුන් මෙසේය :-

| සංස්කෘ. | මාගධි. | සිංහල. |
|---|---|---|
| විශාල | විසාල | විසල් — වසල් |
| වෘක්ෂ | රුක්ඛ | රුක් — රික් |
| කුසුම | කුසුම | කුසුම් — කිසුම් |
| උත්පන්න | උප්පන්න | උපන් — ඉපැන් |

මේ සිංහලට පෙනෙන්නාවූ උභය රූපයෙන් දෙවැන්නෙහි ස්වර විපර්යාසය ප්‍රත්‍යක්ෂය.

මෙහි සර පෙරළි යයි නොකියන ලද්දේ මී ළඟට පෙනෙන්නාවූ විපර්යාසයට වර්ණ පෙරළි යන ලුහුඬු නාමය යොදගනු පිණිසය. වර්ණ යන්නෙහි ස්වර ව්‍යඤ්ජන දෙකම ඇතුළත් නමුත් මෙහි පිළි යන්නෙන් ස්වරය කියන ලදින් වර්ණ යන්නට ඉතිරි වන්නේ ව්‍යඤ්ජනය පමණකි. මෙහි සර පෙරළි යයි කියන ලද්දේ නම්, අනිකට වියදුන් පෙරළි යයි කිය යුතු වේ. එකල වියදුන් යන්නද විස්තර කළ යුතුවේ. නැතහොත් ගතකුරු පෙරළි යයි කියයුතුවේ. ඒ දික්ය.

29. වර්ණ පෙරළි නොහොත් වර්ණ විපර්යාසය. මෙහි වර්ණ යන්නෙන් කියනු ලබන්නේ ගාත්‍රාක්ෂරයි. ජනයන්ගේ කථායෙහිදී කිසි විටෙක ගාත්‍රාක්ෂරයන්ගේ තැන් උවමාරු කොට කථාකරනු ලැබේ. "මෙකාලට" යයි කියයුතු තන්හි ක, ල, දෙදෙනාගේ තැන් උවමාරු කොට "මෙලාකට" යයි කියති. දැන් එය මෙලහකට යයි ව්‍යවහාර කරනු ලැබේ. මේ ධර්මය අනුගතවූ වර්ණ විපර්යාසයට මෙසේ නිදසුන් දක්වූහු :—

| සංස්කෘත. | මාගධී. | සිංහල. |
|---|---|---|
| කරේණු | (කණෙරු) | කෙණෙර |
| රුධිර | රුධිර | රුහිර — හුරිර |
| ශයන | සයන | යහන් |
| ශ්‍රමණ | සමණ | මහණ. |

30. පද පෙරළි නොහොත් පදවිපර්‍ය්‍යාසය. ජනව්‍යවහාර යෙහිදී ඇතම් විට මෙසේම පදයන්ගේ විපර්‍ය්‍යාසයද වේ. රජදත් යනු නිදසුනකි. උඩු ඇන්දෙහි ඉදිරියෙහි ඇත්තාවූ දත් පුවලට සංස්කෘතයෙන් රාජදන්ත යනු නම්. 'දන්ත රාජ'යයි කිය යුතු තැනි. අන්‍ය දන්තයන්ට වඩා ලොකුව ප්‍රමුඛව පෙනෙන හෙයින් දන්තරාජයි. මෙය සිංහලෙහි රජදත් වී. 'දත්රජ' විය යුතු තැනි. (සාමාන්‍යයෙන් රජදත් නම් රජුගේ දත්.)

31 විබත් පෙරළි නොහොත් විභක්ති විපර්‍ය්‍යාසය. මේ නම් එක් විභක්තියක් ඇතිවියයුතු තැන අන්‍ය විභක්තියක් යොදා ගැනීම වේ. සර්පයෝ කණ්ඨමණියෙන් යුක්තවූවෝ නමුදු අන්‍යයන්ට භයම දෙත්. එසේම දුර්ජනයෝ ශ්‍රෂ්ඨ උගත්තෝ නමුදු රාජයා නැමති සඳුන් තුර වෙළාගෙන (එනම් රාජයා සේවනය කරමින්) අන්‍යයන්ට භයම දෙත්. මෙය එකම වාක්‍ය යක් කොට පද්‍යයට නැගූ කල්හි මේ ආචාර්‍ය්‍ය මතයෙහි ප්‍රකාර මෙසේ සිටිය යුතුයි :—

ගතු ගතුද දුදනෝ—සහ කටමැණ සපුහු මෙන්
පිරි රැඹෑ තිරිඳු මලදා—පරනට බියම රැකුළෝ.

උපමෙය වාක්‍යයෙහි දුදනෝ යයි ප්‍රථමා විභක්තියෙහි සිටි හෙයින් උපමාන වාක්‍යයෙහිද සංස්කෘත මාගධින් ප්‍රකාර නම් සපුහු යයි එම විභක්තියෙහිම සිටිය යුතු හෙයිනි. එහෙත් මෙය ව්‍යවහාරානුකූල නොවේ. එයින් තිසි යොහය නම් පාඨයෙහි පෙනෙන සේය; එනම් —

ගතු ගතුද දුදනෝ-සහ කට මැණ සපුන් මෙන්
— යනාදි වශයෙනි.

32. කිරිය පෙරළි නොහොත් ක්‍රියා විපර්‍ය්‍යාසය. මේ වනාහි ව්‍යාකරණයෙහි ප්‍රකාර එක් ක්‍රියාවක් ඇති විය යුතු තැන අන්‍ය ක්‍රියාවක් යොදා ගැනීම වේ. කව්සිළුමිණෙහි පෙනෙන්නාවූ පාඨයෙක් නම් මෙසේ ය :—

තමා වරද'ස නොදිස්නේ—මෙරමා දෙස් දිස්නේ.

ව්‍යාකරණානුසාරයෙන් ගතහොත් මෙහි අර්ථය මෙසේය :—

තමාගේ දෝෂය අංශුමාත්‍රයෙන්වත් නොපෙනෙන්නේය (අනාගතයි), අනුන්ගේ දෙස් පෙනෙන්නේය (අනාගතයි).

එහෙත් මෙහි කියනලද්දේ අනාගතයෙහි නොව දැන් පවත්නාවූ සත්‍යයක් හෙයින් මෙහි අභිප්‍රෙතාර්ථය ප්‍රකාර නම් නොදිස්නේ යනු නොදිසේ කියාද, දිස්නේ යනු දිසේ කියාද වර්තමාන ක්‍රියාවෙහි විය යුතුයි. එසේනොව අනාගත රූප යෙන් යොදන ලදින් ක්‍රියා විපර්‍ය්‍යාසයි.

පුරාණ මයුර සන්දේශයෙහි පාඨයක් නම් මෙසේය :—

මොණරිඳු එකල්හී—පුල් සලග නවාගනී.

මෙසින් දූත ක්‍රියායෙහි යොදනලද මයූරරාජයා හට දිවසාව සානයෙහි ඵුල්ලශාලාග්‍රයෙක්හි රාත්‍රිය පිණිස නිවාස ග්‍රහණය නියමිත කළහ. නවා යනු නවාතැන් යන්නෙහි පෙනෙන්නාවූ ශබ්දයයි. රාත්‍රි නිවාසයට නම්. මෙහි කී නියමය "නවාගනු" යයි විධි ක්‍රියාවෙන් කටයුතුව තිබුණේය. එහෙත් "නවාගනී" යයි වර්තමාන ක්‍රියාවෙන් යොදනලදී. ක්‍රියා විපර්‍ය්‍යාසයයි.

33. මෙකී පඤ්ච විපර්‍ය්‍යාසාදිය ශබ්ද ධර්මයෙන් හෝ ඡන්දෝ හේතුයෙන් හෝ කටයුතුයි. මෙහි ආදි යන්නෙන් පෙර දක්වන ලද ලොප්, අදෙස්, අගම් ආදියද, මතු දක්වනු ලබන්නාවූ මත් වැඩි ආදියද සඞ්ගෘහිතය.

## 27–33. නීතිසාරය. විපර්‍ය්‍යාස.

(1.) වර්ණ යනු ව්‍යඤ්ජනයට පමණක් නොව ස්වරයටද නමකි. එහෙත් මෙහි වණ පෙරළි යන්නෙන් කියන ලද්දේ ව්‍යඤ්ජන විපර්‍ය්‍යාසය පමණකි. එයින් නාමය අති ව්‍යාප්තියෙන් දූෂිත හෙයින් අශාස්ත්‍රීය බව කියයුතුයි.

මේ වියරණෙහි කිසි තැනෙක ගාත්‍රාක්‍ෂරයට “ගත්” යයි ලුහුඬින් කියාතිබේ. එසේම ප්‍රාණාක්‍ෂරයට පණ යයි කිය හැකි. ප්‍රාණාක්‍ෂරයට සර යනුද නමි. ගාත්‍රාක්‍ෂරයට වියදුන් යනුද නමි. එහෙයින් මෙහි ‘පිළිපෙරළි’ යු තන්හි පණ පෙරළි හෝ සර පෙරළි හෝ කියා ‘වණපෙරළි’ යු තන්හි ගත් පෙරළි හෝ වියදුන් පෙරළි හෝ යයි කියන ලද්දේ නම් ශාස්ත්‍රීය වෙත්මැයි.

(2.) ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි වනාහි ශබ්ද යනු එක්තරා විශෙෂාර්ථයෙක්හි යොදනු ලැබේ. ප්‍රත්‍යය යොගයක් නොමැතිව ප්‍රකෘතියෙන් සිටි නාමය තෙම ශබ්දයයි. මිනිස්, ගස්, ගල්, යනු ශබ්දයෝ වෙත්.

එසේම පද යනුද විශෙෂාර්ථයෙක්හි යොදනු ලැබේ. ‘සුප් තිඬන්තං පදම්’ යී පාණිනිහු විසින් කියන ලදින් සුබන්තවූ හෝ තිඬන්තවූ හෝ රූපය පද නමි. සුබන්ත රූපය නම් ශබ්දප්‍රකෘතියකට ප්‍රත්‍යය යෙදීමෙන් සිදුවූ රූපයයි. තිඬන්ත රූපය නම් ධාතුවකට ප්‍රත්‍යය යෙදීමෙන් සිදුවූ රූපයයි. උපසර්ග නිපාත දෙකද පදයෙන් ගැනෙත්.

දරුවා වහා උගනී – යන මෙහි දරුවා යනු සුබන්ත පදයයි; වහා යනු නිපාත පදයයි; උගනී යනු තිඬන්ත පදයයි,—එහිදු උ යනු උපසර්ග පදයකි.

අවිශෙෂ වශයෙන් ශබ්ද යනුද පද යනුද කොයියම් භණිතියක් ගැන වුවත් සාමාන්‍ය ශාස්ත්‍රයෙහි ව්‍යවහාරකර තිබේ. ඒ ව්‍යවහාරය ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි නම් න්‍යාය විරොධ බව කිය යුතුයි. විශෙෂාර්ථයෙක්හි ස්ථිරව පිහිටුවා ගන්නාලද ලක්‍ෂණයක් හුගේ විලක්‍ෂණ ව්‍යවහාරය වෛකල්‍ය හෙතුවන හෙයිනි.

මෙසේ බලන කල මෙහි පද පෙරළි යයි යොදනලද නාම යද අයොග්‍ය බව කිය යුතුයි. දෙනලද නිදර්ශනයෙන් පෙනෙන්නේ පදයන්ගේ නොව ශබ්දයන්ගේ විපර්යාසයයි. එයින් ඊට සද පෙරළි යයි කියන ලද්දේ නම් ශාස්ත්‍රීය වෙත්.

(3.) තවද මේ සදපෙරළියට දෙනලද නිදර්ශනයද සිංහලයෙහිදී හෝ සිංහලට ඊමෙහිදී හෝ වූ පෙරළියක නිදර්ශනයක් නොවේ. රජදත් යනු සංස්කෘත රාජ දත්ත යන්නෙන් භින්නව

ආවකි. සංස්කෘතයෙහි එබඳු විපර්‍යාසයන්ට පරනිපාතයයි කියනු ලැබේ. 'භූතපූර්‍වඃ', 'අග්න්‍යාහිතඃ' යනුද නිදසුනි. පූර්‍වේ භූතඃ– පෙරවූයේ යන අර්‍ථයෙන්, 'පූර්‍වභූතඃ' යයි කියයුතු තන්හි පරනිපාතයෙන් 'භූතපූර්‍වඃ' වේ. මාගධියෙහි "භූත පුබ්බං භික්ඛවෙ දෙවාසුරසංගාමො සමුපබ්බූළ්හො අහොසි" — යන තන්හි 'භූත පුබ්බං' යී පෙනෙන්නේ මේ පරනිපාත රූපයයි. එසේම ගෙනෙනලද අග්නිය ආහිත + අග්නිඃ — ආහිතාග්නිඃ යයි කිය යුතු තැන්හි මේ පර නිපාතයෙන් අග්න්‍යාහිතඃ වේ.

සියබසෑ සාමාන්‍ය ව්‍යවහාරයෙහි ලැබෙන්නාවූ සඳ පෙරළි දෙකක් නම් මෙසේය :—

ගින්නට ගන්නාවූ දර ගිනිදර වේ. නමුත් මෙය ව්‍යවහාර යෙහි ලැබෙන්නේ දරගිනි කියාය.

එසේම දරෙන් මොළවනු ලබන්නාවූ ගිනි දරගිනි වේ. නමුත් මෙය ව්‍යවහාරයෙහි ලැබෙන්නේ ගිනි දර — ගින්දර කියාය.

(ɟ.) විබත් පෙරළියට දී තිබෙන්නාවූ නිදසුන නිසියේ අවබොධ කරගනු පිණිස සංස්කෘත මාගධී භාෂාවන්හි එක්තරා වාක්‍ය නීතියක් මෙතෙහි කළ යුතුවේ. සදෘශාර්‍ථ වාචකවූ සේ, මෙන්, වැනි, යන සිංහල නිපාතයන්ට සමව සංස්කෘතයෙහි ඇත් තාවූ ඇතම් නිපාතයෝ නම් යථා, ඉව, යන මොව්හු වෙත්; මාගධියෙහි යථා, ඉව, විය, මඤ්ඤෙ, යන මොව්හු වෙත්. මේ නිපාතයන්ගෙන් පදාර්‍ථයන්ගේ සමන්ධයක් ' පෙන්වනු මිස මොවුන්ගේ යම් කිසි විභක්ති සම්බන්ධයක් නොමැත්තේය. ඒ ඒ ස්ථානයෙහි අර්‍ථයෙන් අපෙක්‍ෂිතවූ විභක්තිය යෙදේ. නිදසුන් මෙසේයි :—

| සිංහල. | මාගධී. | සංස්කෘත. |
|---|---|---|
| මුඛය චන්‍ද්‍රයා මෙන් බබළා ... | මුඛං චන්‍දො'ව විරාජතෙ ... | මුඛං චන්‍ද්‍ර ඉව විරාජතෙ |
| | මුඛං චන්‍දෙවිය විරාජතෙ. | |
| | මුඛං චන්‍දෙ මඤ්ඤෙ විරාජතෙ. | |
| | මුඛං විරාජතෙ චන්‍දෙ යථා. ... | මුඛං විරාජතෙ චන්‍ද්‍රො යථා. |

මෙහි උපමිතවූ මුඛය ප්‍රථමා විභක්තියෙහි හෙයින් මාගධී සංස්කෘතයන්හි උපමානවූ චන්ද්‍රයාද අර්ථාපෙක්ෂාවෙන් එම විභක්තිය භජනය කෙරේ. එයින් පාඨයෙහි පෙනෙන්නාවූ ගතුගතුද යනාදි පද්‍යය සංස්කෘතයට නැගුවහොත් මෙසේ සිටී :-

අසාධවො යද්‍යපි ලබ්ධ විද්‍යාඃ
සකණ්ඨරත්නා ඉව කෘෂ්ණ සර්පාඃ
රවි වංදභාගං පරිරභ්‍ය නූනං
සදා පරෙෂාං භයමෙව චක්‍රුඃ.

මෙහි සපුන් මෙන් යන්නට සංස්කෘතය නම් "කෘෂ්ණ සර්පාඃ ඉව" යනුවේ. කෘෂ්ණ සර්පාඃ යනු ප්‍රථමා විභක්තියෙහි වෙයි. එයින් සිය බසෙහි රීතිය එම නම් මෙහි ඊට යෙදෙන්නාවූ වාක්‍යාංශය සපුහු මෙන් විය යුතුයි. ප්‍රථමා විභක්ති භජනයෙනි. එසේ නොව සපුන් යයි යොදන ලදින් හේ විබත් පෙරළි යයි මේ ආචාර්යයෝ කීහ.

පෙරළි නම් සර්වසම්මතවූ සාමාන්‍ය රීතියෙන් බැහැරයෑමේ ප්‍රවෘත්තියකි. සපුහු මෙන් යනු සම්මත රීතිය නම් "සපුන් මෙන්" යනු එබඳු පෙරළියක් වෙති. එහෙත් සිය බසෙහි සපුහු මෙන් යනාදි වශයෙන් ප්‍රථමා විභක්තිය හා 'මෙන්' නිපාතයෙහි සම්බන්ධයක් කිසි තැනෙක නොපැනේ. සර්වත්‍ර ව්‍යාප්තව පෙනෙන්නේ නම් සපුන් මෙන් යනාදි වශයෙන් ලැබෙන්නාවූ කර්ම විභක්තිසම්බන්ධයයි.

මෙසේ අඛණ්ඩව පවත්නාවූ ධර්මය භාෂාවෙහි නීතියය රීතිය යයි කීම සත්‍යය මූල් හෙයින් ශාස්ත්‍රීය ධර්මය වෙයි. නීතියටද රීතියටද අනුව වාක්‍ය යොජනය තෙම කිසිම අර්ථයකින් විපර්යාස යෙකැයි ශාස්ත්‍රීය වශයෙන් නම් කිව නොහේ. එයින් ඒ මූලාවක් බව ප්‍රත්‍යක්ෂය. මේ මූලාවට හෙතුව නම් සිදත් කරුහුගේ දෙෂය නොව සියබසෙහි සම්භවය ගැන නිසි සඞ්කල්පයක් සිංහල පණ්ඩිතයන් අතරෙහි නොපැවති බවයි. වාක් කොෂය බොහෝ සෙයින් සංස්කෘත මාගධී සම්භවකොට ඇති හෙයින් ඒ භාෂා යුග්මයට මාතෘ භාෂායයි ඔව්හු කීහ. අදත් කියති. උගන්වති. එයින් සියබසෙහි සියලු වාක්‍ය ධර්මයන්ද ඒ මාතෘ

භාෂාවන්ට අනුකූල විය යුතුය යනු ඔවුන්ගේ ඇදහීම වේ. සිදත් කරු විසින් මෙහි සපුන් යනු විබත් පෙරැළි යයි කියන ලද්දේ ඒ ඇදහීමේ හෙතුවෙනි.

කොෂ පක්ෂයෙන් සියබසෙහි සම්භවය බොහෝ සෙයින් සංස්කෘත මාගධීන්ගෙන් වී නමුදු වාක්‍යනීති පක්ෂයෙන් මාතෘ භාෂාව බොහෝ සෙයින් ද්‍රවිඩයයි සැලකිය යුතු බවට පෙනෙන්නාවූ ශාස්ත්‍ර යුක්තිහු පෙර දක්වන ලද්දාහ (අඞ්ක 16-19: වාක්‍ය 16; 25; 26.) මෙහි ප්‍රස්තුතවූ "මෙන්" නිපාතය සම්බන්ධයෙන් ලැබෙන්නාවූ ධර්මය නම් ද්‍රවිඩ ධර්මයකි. මේ නිපාතය දෙමළෙහි "මාන" යයි පෙනේ. එහි එය ස්වසම්බන්ධ පදයෙහි කිසිකල ප්‍රථමා විභක්තිය නොගනී. අර්ථයෙන් ප්‍රථමාව අපෙක්ෂ්‍යමාණවූ තන් හිදු ද්විතීයාවම භජනය කෙරේ. නිදසුන් :-

| සිංහල. | දෙමළ. |
|---|---|
| කුමරියගේ නෙත් නිලුපුල් මෙන් බබළත්. | කුමරියුඩය කණ්ගල් නීලෝත්පලංගලෙයි මාන ඉලංගුම්. |

මෙහි "නිලෝත්පලංගලෙයි" යනු ද්විතීයා විභක්තියෙහි වේ. "මාන" යන නිපාතය හා සම්බන්ධ හෙතුවෙනි.

(5.) "මෙන්" යනු යට දැක්වූ මාගධී "මඤ්ඤෙ" යන්නෙන් සිද්ධ වියයි සමහරු සලකති. "මඤ්ඤෙ" යනු ප්‍රථමා විභක්තිය අධිවාසනය කෙරේ. 'චන්දො මඤ්ඤෙ විරාජතෙ' යන තන්හි මෙනි. එහෙත් සිංහල මෙන් යනු ප්‍රථමාවිභක්තිය නො ඉවසයි. එයින් ඒ මතය නිස්සාරයැ. ධර්ම විරොධ හෙයිනි.

(6.) "සද දහමින් සඳහෙති හොත පස් පෙරැළි ඇ කරනු" යයි මේ ආචාර්යයෝ කීහ.

අ. ශබ්ද ධර්මයෙන් නම් විපර්යාසයන් වනු විනා කෙරීමක් නොමැත්තේය. ඩාදිය යනු දැඩිය වූයේ ස්වයංසිද්ධියෙන් මිස යමෙකුගේ පෙරළීමකින් නොවේ. යමෙක් පෙරළුවේ නම් අන්‍යයෝ ඔහු අනුව නොයති. 'දවකල්' (දිවාකාලය) දවහල් වී පසුව දහවල් වූයේත් එසේමැ. මේ ශබ්ද ධර්මයෙන් වන්නාවූ සිද්ධියි. මේවා බලා යම් යම් අය ඒ ශබ්ද ධර්මයෙන්ම තම තමන්ටත් අහි

මතවූ පෙරළීන් ස්වල්පා. ස්වල්ප වශයෙන් වත් කරන්ට ගියහොත් නොබෝ කලකින් මුළු භාෂාව සම්පූර්ණයෙන් අවුල්වී පෙරළී යනවා නියතය. එබන්දක් මේ ආචාර්යයන් විසින් අදහස් කරන ලද්දේයයි සිතිය නොහැකි. එසින් ශබ්ද ධර්මයෙන් මේ විපර්‍යාසයන් කළ යුතුයයි දෙනලද උපදෙශය අර්ථ රහිතය, අශාස්ත්‍රීයය.

ආ. නාමයන්ගේ ස්ත්‍රීලිඞ්ග දර්ශනය පිණිස ඇතම්විට පිළි පෙරළිය ඕනෑවේ. වස්සා — වැස්සී යයි යූ තැන්හි මෙනි. ක්‍රියා වරනැගිල්ලෙහිදී නොයෙක්විට විපර්‍යාසාදිය ඕනෑවෙති. කරමි — කෙළෙමි යනාදි තන්හි මෙනි. මේ විපර්‍යාසයෝ වෙතනා මුල්වම කටයුතු නොවෙත්දැයි යමකු විසින් මෙහි ඇසිය හැකි. ඊට උත්තරය නම් මෙසේය :—

මෙබඳු විපර්‍යාසයෝ නියත නීතීන් අනුව පවත්නාහු වෙත්. ඔවුන් නිසි තැනට නිසිසේ යොදගත යුතුය යන අර්ථයෙහි 'කරනු' යයි කිවද කිසිම දෙෂයක් නොමැත්තේය. නමුත් පඬුව විපර්‍යාසයට නිදසුන් කලේ ඔබඳු නීතීන් රීතීන් අනුව යන්නාවූ විපර්‍යාසයෝ නොවෙත්. අශාස්ත්‍රීය වන්නේ නම් කිසිම නීතියකට රීතියකට නොමැත්තාවූ සාමාන්‍ය වශයෙන් අව්‍යුත්පන්න ජනයන්ගේ ව්‍යවහාරයෙන් වන්නාවූ ඇතම් ස්වයංසිද්ධින් බලා ඔවුන්ගේ ධර්මයට අනුව එබඳුදේ කටයුතුයයි කීම වේ. මේ වනාහි ආධුනිකයන් මහත් මුළාවෙහි ගමනය කරවන්නාවූ උප දෙශයකි.

ඉ. ඡන්දෙ හෙතුවෙන්ද පස්පෙරළි ආදිය කළහැකි බැව් කියනලදී. මෙය අර්ථයට හෝ අර්ථ ප්‍රසාදයට හෝ අන්කිසි වාක්‍ය ගුණයකට හෝ කිසිම හානියක් බාධාවක් නොවනසේ පලදනා වක අණ්ඩලිම් එලලීම් වසයෙන් ඉතා සාවධානව කටයුතු බව ශිෂ්‍යයාට අවබොධ කරගත හැකිනම් මේ උපදෙශය මෙහිදී දක්වීම මහත් අනර්ථයට කරුණු නොවිය හැකි. එතකුදු වුවත් පොතේ අන්තිම හරියේදී දෙෂා දෙෂයන් සමග දක්වන ලද්දේ නම් වඩා මැනවියයි පෙනේ. ශිෂ්‍යයාගේ විවෙකඥනය ඒ ප්‍රමාණ යෙහිදී වඩා පැහැදිලිව පැවතිය යුතු හෙයිනි. මෙහි දීමෙන් ශිෂ්‍යයා නොමග ගිය හැකි.

ඊ. තවද මෙහි සද දහමින් යයි කීවේ කුමක්ගැනද? සද පියවි ද පියවි දෙක හඳුන්වා දීමේදී ශබ්ද යන්නට විශෙෂාර්ථයක් දී තිබේ. මෙහි අන්‍යයකි. මෙය ශාස්ත්‍ර ධර්මානුසාරිනොවේ. මෙහි සදදහම් යන්නෙන් කියවෙන්නේ වාග්ධර්මය නොහොත් ධර්මයන් බව ප්‍රත්‍යක්‍ෂය. එහින් වියවුල් නොවනසේ 'වාදහමින්' යයි කියනලද්දේ නම් ඒ ශාස්ත්‍රීය වෙත්.

උ. මෙසේ බලනකල මේ උපදෙශය දෙකට බෙදූ මෙ තැන්හි භාගය මෙසේ දිය යුතුව තිබුණේය: "වාදහමින් හොත පස් පෙරළි ඈ."

ග්‍රන්ථාවසානයට යොග්‍යවූ භාගය මෙසේ දියයුතුව තිබුණේය: "සඳහෙති හොත පස් පෙරළි ඈ."

හකුළුවා මෙතැන්හිම දියටි වීනම් මෙසේ දියයුතුව තිබුණේය. "වාදහමින් සඳහෙති හොත පස් පෙරළි ඈ."

## 34. වැඩි.

**සූත්‍රපාඨය.** වැඩි නම් මත් වැඩි. ඇස්, ඇල්, ඇප්, උවාරණ, නවාම්, මලවල සල් සිහිලේහි* ඈගි.

**ව්‍යාඛ්‍යා.** වැඩි නම්, වෘඩි නම්; මත්වැඩි, මාත්‍රාවෘඩියි. ඇස්, අස් විය යුතු තැන්හි ඇස්ය; ඇල්, අල් වියයුතු තැන්හි ඇල්ය; ඇප්, අප් වියයුතු තැන්හි ඇප්ය; උවාරණ, උවරණ වියයුතු තන්හි උවාරණය; නවාම්, නවම් වියයුතු තන්හි නවාම්ය; මලවල සල්සිහිලේහි; මලවල සල් සිහිලෙහි විය යුතු තන්හි මලවල සල්සිහිලේහිය; ඈගි, මේ ආදී ආකාරයි.

### විස්තරය. (මාත්‍රා) වෘඩි.

වර්ණයක්හුගේ උච්චාරණකාලමාත්‍ර වශයෙන් කරනලද යම් මිනිත භාවයක් ඇත්ද එය වැඩිකිරීම වෘඩි නමි. දක්වනලද නිදර්ශනයන්ගේ වෘඩිය මෙසේ දැනගත යුතු :—

---

* මලවල සල සිහිලේහි . — ශ්‍රී සුමඞ්ගල. 1884.
. — ලඞ්කාහිතව විශ්‍රැත. 1887,
. — ශ්‍රී ධර්මාරාම. 1902.
. — පුරාණසන්නය.

| සංස්කෘත. | මාගධී. | සිංහල. ප්‍රකෘතිරූප. | සිංහල. වෘද්ධිරූප. | අර්ථ. |
|---|---|---|---|---|
| අක්ෂි | අච්ඡි | අස් | ඇස් | නෙත්‍ර |
| ශාලි | සාලි | හල්-අල් | ඇල් | ඇල්වී |
| අප්-ආප | ආප | අප-අප් | ඇප් | ජලය |
| උපකරණ | උපකරණ | උවරණ | උවාරණ | වැඩට ඉවහල් දේ. |
| නවකර්ම | නවකම්ම | නවම් | නවාම් | අලුත්වැඩ. |
| — | — | මල්'වලසල් සිහිලේහි | මල්'වල සල්සිහි ලේහි | පුෂ්පාකුල වෘක්ෂ (වජ්‍රායා) ශිශිරයෙහි. |

## 34. නිහිසාරය. (මාත්‍රා) වෘද්ධි.

මෙහි මූලා මතයන් කිහිපයක් ඇතිබව පෙනේ. කාරණය මාත්‍රා වෘද්ධිය ගැන හෙයින් මාත්‍රා ගැන යම් විවේචනයක් පළමු වෙන් කටයුතු වේ.

(1) යම් වර්ණයක් උච්චාරණය කරනු පිණිස ස්වල්පවශයෙන් වුවද යම් කාලමාත්‍රයක් ඕනෑ කෙරේ. ඒ කාලමාත්‍රය පිහිටුවා බලන කල අයන්තට වඩා ආයන්න උච්චාරණයෙන් දීර්ඝබව ප්‍රත්‍යක්ෂය. මෙබඳු කාලමාත්‍ර හෙතුවෙන් සංස්කෘතයෙහි වර්ණයෝ ලඝු, ගුරු, ප්ලුත, අර්ධ මාත්‍රක යයි චතුර්භේද කොට සලකනු ලැබෙත්. කියනලද මැයි :—

> ඒකමාත්‍රො භවෙද්‍ධ්‍රස්වො — ද්විමාත්‍රො දීර්ඝ උච්‍යතෙ
> ත්‍රිමාත්‍රස්තු ප්ලුතො ඥෙයො — ව්‍යඤ්ජනඤ්චාර්ධ මාත්‍රකම්.

(ඒකමාත්‍රය තෙම හ්‍රස්ව වේ. ද්විමාත්‍රය තෙම දීර්ඝයයි කියනු ලැබේ. ත්‍රිමාත්‍රය තෙම ප්ලුතයයි දත යුත්තේයි. ව්‍යඤ්ජනය තෙම අර්ධමාත්‍රකයි.)

මෙයින්: හ්‍රස්වය තෙම ඒකමාත්‍රයකි.
දීර්ඝය තෙම ද්විමාත්‍රයකි.
ප්ලුතය තෙම ත්‍රිමාත්‍රයකි.
හල් වර්ණය තෙම අර්ධ මාත්‍රයකි.

සියබසෙහි : මෙණ යයි කී තන්හි හ්‍රස්වයෝ දෙදෙනෙකි, එසින් මාත්‍රා දෙකකි.
සීහ යයි කී තන්හි දීර්ඝයෙක්ද හ්‍රස්වයෙක්ද ඇති හෙයින් මාත්‍රා තුනකි.

තවද — "දෙමත් දිගු හා පසුගල්"යයි කියන ලදින් හල් පසුකොට ඇති හ්‍රස්වයද එම හල් සමග ගත් කල්හි විමාත්‍ර වේ. එසින් "සක්" යන තන්හි මාත්‍රා දෙකකි. මෙහි ස යන්න එක් මාත්‍රාවක් හෙයින් "ක්" යනු අන්‍ය මාත්‍රාව වියයුතු.

සංස්කෘතයෙහිද මෙසේමය. "දීර්ඝෝ යුක්ත පරශ්ච යඃ"යයි කියන ලදින් දීර්ඝයද, සංයෝගය පරකොට ඇති හෙවත් පරවූ හල් වර්ණයක් ඇති හ්‍රස්වයද එකසේ ගුරු වෙත්.

මෙයින් ව්‍යඤ්ජනය අර්ධමාත්‍රයයි කියනලද්දේ තනිව හෙවත් පූර්වාපර ස්වරයක් නොමැතිව සිටි කල්හි වියයුතුයි. ඛචිත් යන තන්හි කයන්න මෙනි. සියබසෙහි මෙබන්දක් නොමැත්තේය.

මෙසේ හල් වර්ණයද සිය බසෙහි මාත්‍රාවක් හෙයින් හිල්, හාල්, යනාදි තන්හි මාත්‍රා තුනක් පෙනෙනුයෙන් සියබසෙහිද ඇතම්විට ප්ලුතය ඇත්තේයයි එක් විධියකින් කිය හැකි වේ.

දැන් මෙසේ පහදා ගන්නාලද මීට ප්‍රස්තුතවූ කරුණු නම් මෙසේය :—

අ. හ්‍රස්වය තෙම තනිව සිටි කල්හි එක මාත්‍ර වේ.
ආ. හ්‍රස්වය තෙම හල්වර්ණයකු පරකොට සිටි කල්හි ඒ හා සමග විමාත්‍ර වේ.
ඉ. එයින් හල් වර්ණයද එකමාත්‍ර වේ.

(2) මේ නයින් බලන කල පාඨයෙහි දක්වනලද නිදසුන් වලින් සිහිලේහි යන්නෙහි 'ලේහි' යූ තන්හි මිස අන්කිසි තැනෙක මාත්‍රාවෘඩියක් ඇති බව නොපැනේ. අස් යයි කීවද ඇස් යයි කීවද කාලපරිමාණය එකමබව ප්‍රත්‍යක්ෂය. අස් යන්නෙහි මාත්‍රා දෙකකි. ඇස් යන්නෙහිද එමයි. නවර හ්‍රමයකින් මෙහි වෘඩියක් දුටුවාහු දැයි නොපැනේ. ඇල්, ඇප්, ගැනද එසේමය.

(3) උවරණ, තවාම්, යනු සිංහලට බිඳී ඊමේ ක්‍රමය මෙසේ දතයුතු :—

| සංස්කෘත. | මාගධී. | සිංහල. | |
|---|---|---|---|
| උපකරණ. | උපකරණ. | උපකරණ. | |
| | | * උපහරණ. | (කකාරය ලිහල්වී හකාරවීමෙන්.) |
| | | * උවහරණ. | (පයන්තද ලිහිල් වී වයනු වීමෙන්. |
| | | * උවඅරණ | (හයන්ත තවත්) ලිහිල්වී අයන්ත වීමෙන්.) |
| | | උවාරණ | (සන්ධියෙන්.) |
| නවකර්‍ම. | නවකම්ම. | නවකම්. | |
| | | නවහම් | (කයන්ත ලිහිල්වී හයනු වීමෙන්.) |
| | | * නවඅම් | (හයන්ත තවත් ලිහිල්වී අයනු වීමෙන්.) |
| | | නවාම් | (සන්ධියෙන්.) |

මේ ශාස්ත්‍රීය ක්‍රමයයි. මෙයින් මේ දෙතැන්හි කිසිම මාත්‍රා වෘද්ධියක් නොමැත්තේය. එහෙත් මේ ශබ්දයන්ගේ භෙද ක්‍රමය ගැන මේ ආචාර්‍ය්‍යයන්ගේ සිතෙහි පැවති සඞ්කල්පය මෙසේ වියයි පෙනේ :—

උපකරණ ... උවකරණ* (පයන්ත වයනු වීමෙනි.)
උවරණ (කකාර ලොපයෙනි.)
උවාරණ (මාත්‍රා වෘද්ධියෙනි.)

මෙහි අංශවයී දෙකක් පෙනෙති. එකක් නම් ශබ්දයෙහි තිබුණාවූ කයන්ත හදිසියෙන් ගිලිහී යෑමයි. අනික නම් කයන් තෙහි තිබුණාවූ අ කාරය නැවත එතැනටම පහළවී ඇළපිල්ලක් වීමයි. මෙහි ක්‍රමයක් නොමැති බවද මේ සඞ්කල්පය අශාස්ත්‍රීය බවද ප්‍රත්‍යක්‍ෂය.

නවම් ගැනද තර්කය එසේමය. උවරණ, නවම්, යනු උවාරණ, නවාම්, යනවුන්ගේ ප්‍රකෘතීන් නොව එයින් වූ විකෘතීන් බව දත යුතුයි. මාත්‍රා හානියෙනි. සාමාන්‍ය වශයෙන් වාග්

* මේ රූපය ව්‍යවාරයෙහි නොලැබේ. සම්භාව්‍ය රූපයයි,

ධර්මය නම් වර්ණයන්ගේ භාතියමැයි. වෘඞියක් පෙනෙන්නේ බොහෝ ආරාවාර වශයෙනි. ශතාවරී යන්නෙන් භින්නවූ භාතාවාරිය යනු නිදසුනකි.

(4.) මලවලසල් සිහිලේහි — යන තන්හි 'මලවල' යනු 'මල් + අවල' වේ. එහි සන්ධිය මිස මාත්‍රාවෘඞියක් නොමැත්තේය. ගත් කරු එසේ ඇති යයි ගතයුතු බවක් අදහස් කළේ යයිද නොසිතමු. 'මලවල' යනාදි පාඨය වසන්ත නම් වෘත්තයෙහි පද්‍ය පාදයක් වේ. එහි පද්‍යාර්ථය වාක්‍යයෙන් කෙසේ වෙතත් අර්ථයෙන් මෙබන්දක් වියයි සැලකිය හැකි :—

මල වල සල් සිහි ලේහි<br>
යව සකි ලොල් ඉහි ලේහි.

සඳසෙහි දැක්වූ —

රුදි අඳතින් දිගු නු ව නී<br>
සිතෙනි සසල තඹ ල ව නී<br>
රන් පතෙලෙන සල ස ව නී<br>
සොම් සිසි වත සොම් උ ව නී

යන මේ පද්‍යයෙහි මෙනි.

ගත් කරුහුගේ මේ නිදසුනෙහි ඡන්දොහෙතුවෙන් කරනලද මාත්‍රාවෘඞි දෙකකි. "සිහිලේහි" යයි යෙදූ හෙයිනි. මේ නිදසුන් පාඨයද පුරාණ මයූර සන්දේශයෙන්ම ගන්නාලද්දකැයි ශඞ්කා කළහැකි.

(5.) මෙසේ පද්‍යාන්තයෙහි වෘත්තය පිණිස ආවශ්‍යක තන්හි මාත්‍රාවෘඞිය හෝ භාතිය හෝ තිබයින් කරනු ලැබේ. පද්‍යාන්තයෙහි ගුරුලඝු විශෙෂය ඉතා සවල්ප හෙයිනි. තවද එයින් අර්ථයට හෝ කාව්‍ය සෞන්දර්යයට හෝ කිසිම බාධාවක්ද නොවන හෙයිනි.

අන් තැන්හි කටයුතු වන්නේ ඉතා සාවධාන වශයෙනි. වසවත් ඔසුවක් ගන්නාක් සේය.

පාදගම් රා නාද නූ කොට ගත් නැටුම් සුරඟන රුසේ—යයි කිසූ තන්හි නූ යනු නිදසුනි.

## 85. අඩු.

**සූත්‍රපාඨය.** අඩු නම් මත් අඩු. දඟ, සැඩ, කඳ, බඹු, සෙගු ණෙන්, නුවණ තිසයුරා, ඇගි.

**ව්‍යාඛ්‍යා.** අඩු නම්, හානිනම්; මත් අඩු, මාත්‍රාහානියි. දඟ, ජඞ්ඝාවාචිවූ දඟය; සැඩ, චණ්ඩාර්ථවාචිවූ සැඩය; කඳ, සකන්ධ වාචිවූ කඳය; බඹු, බ්‍රහමවාචිවූ බඹුය; සෙගුණෙන්, සේගුණෙන් යයි කිවමනා තන්හි සෙගුණෙන් යනුය; නුවණ තිසයුරා, නුවණ තී සයුරා යයි කිවමනා තන්හි නුවණ තිසයුරා යනුය; ඇගි, මේ ආදි ආකාරයි.

### විකාරය. (මාත්‍රා) හානි.

භණිතීන් සිය බසට බිඳී ඊමෙහිදී හෝ සියබසෙහිම හෝ මාත්‍රාවන්ගේ යම් ඌනත්‍වයක් ලබත්ද ඒ ඌනත්‍වයට මත් අඩු නොහොත් මාත්‍රා හානි යයි කියනු ලැබේ. නිදසුන් මෙසේයි :-

(i) සිය බසට බිඳී ඊමෙහිදී.

| සංස්කෘත. | මාගධී. | සිංහල. ප්‍රකෘතිරූප | සිංහල. හානිරූප. |
|---|---|---|---|
| ජඞ්ඝා | ජංඝා | — | දඟ |
| චණ්ඩ | චණ්ඩ | — | සැඩ |
| සකන්ධ | ඛන්ධ | — | කඳ |
| බ්‍රහමන් | බ්‍රහම | බම්බු | බඹු (මහාබ්‍රහමයා.) |

(ii) සිය බසෙහිදී.

| ප්‍රකෘතිරූප. | හානිරූප. | |
|---|---|---|
| සේ ගුණෙන් | ... සෙගුණෙන්. | ජේක ගුණයෙන් නොහොත් ව්‍යක්ත භාවයෙන්. |
| නුවණ තීසයුරා | ... නුවණ තිසයුරා. | ඥාන නැමති ජලයට සාගරයක්වූ තැනැත්තා. |

මේ විතීය නිදර්ශනය මුවදෙව්දා කවෙන් ගන්නා ලද්දකි. නිදසුන් දෙකෙන්ම පෙන්වන්නේ ඡන්දෝ හෙතුවෙන් කරනලද මාත්‍රා හානියයි.

### 86. නීතිසාරය. (මාත්‍රා) හානි.

(1.) මෙහි සියබසෙහිම වාග්වීයෙන් සිදුවූ එකම හානියක් වත් නිදසුන් වසයෙන් දක්වා නොමැත්. එයින් මෙහි එසේ සිදුවූ ඇතම් කිසිත් දක්වමු. ඒ මෙසේයි :—

| සංස්කෘත. | මාගධි. | සිංහල. ප්‍රකෘතිරූප. | හාතිරූප. |
|---|---|---|---|
| වණිජකර්. | වණිජකම්ම ... | වෙනඳගම් | |
| | | * වෙළඳඅම්=වෙළඳුම් ... | වෙළඳම් |
| නවකර්. | නවකම්ම ... | නවගම් | |
| | | * නවඅම්=නවාම් ... | නවම් |
| අමෘත | අමත | අමඅ =අමා ... | අම |

(2.) සිරද, සසිර, ලෝපල්, ගොපලු, ලොව්සුරු, බුව්සුරු, යනාදි සමාසයන්හිද එසේම වාඬම්යෙන්වූ මාත්‍රාහාතිය පෙනේ.

## 36. නිපා.

**සූත්‍ර පාඨය.** පියවි නිසා හොත නොනිසා හොත කෙළේ නිපා නම්. ගුරළුගෝමි, සඳගෝමි, රතැසිපා, ගොස්, ඈගි.

**ව්‍යාඛ්‍යා.** පියවි නිසා හොත, ප්‍රකෘතියක් ආශ්‍රයකොට හෝ; නොනිසා හොත, ආශ්‍රය නොකොට හෝ; කෙළේ, කරන ලද්දේ; නිපා නම්, නිපාතන නම්. ගුරුළුගෝමි, පූජ්‍යවූ ගරුඩාචාර්‍ය යන අර්ථයෙහි ගුරුළුගෝමිය; සඳගෝමි, පූජ්‍යවූ චන්ද්‍රාචාර්‍ය යන අර්ථයෙහි සඳගෝමිය; රතැසිපා, පූජ්‍යවූ රක්තාක්ෂිපාදයෝය යන අර්ථයෙහි රතැසිපාය; ගොස්, ගමනයකොට යන අර්ථයෙහි ගොස්ය; ඈගි, මේ ආදි ආකාර ඇත්තේයි.

## 36. විස්තරය. නිපාතන.

සංස්කෘතයෙහි 'ගො' යනු ගවයයි; ගොමින් යන්නෙන් බොහෝ ගවයන්ඇති තැනැත්තෙක් හෙවත් විශාල පොහොසතෙක් කියන ලදී. සිටුවරයකු මෙනි. ගොස්වාමි යනු එහි අර්ථයි. අනේපිඩු සිටුවර ආදි පොහොසතුන් බෞද්ධොපාසකවූ පසු ගොමි යනු උසස්වූ බෞද්ධොපාසක යන අර්ථයෙහිද වැටිණ. ධම්ප්‍රදීපිකාව කළ සිංහල ආචාර්‍ය තෙමේ නමින් ගුරුළු නම් විය. උසස්වූ බෞද්ධොපාසකවූ පඬිවරයෙක්ද විය. මේ සෑම අතින් පූජ්‍යවූ උපාසක කෙනෙකි. එසින් ඒ අර්ථයෙන් ගෝමි යනු ගුරුළු යන ප්‍රකෘතිය හා ආශ්‍රයයෙන් යොදා ගුරුළුගෝමි යයි ඔවුන්ට ජනයෝ ගෞරව පිණිස කීහ. මෙසේ පූජ්‍යාර්ථයෙහි

* මේ රූපය ව්‍යවහාරයෙහි නොලැබේ. සම්භාව්‍ය රූපයයි.

ගෝහිමි යන්නක් යෙදීම ව්‍යාකරණයෙහි කියන ලද යම් ශාස්ත්‍ර ක්‍රමයකින් සිදුවූවක් නොවේ. ජනසම්මතයෙන් නිපදවාගන්නා ලද්දකි. එසේ ද්‍යා ක්‍රමයෙන් සිදුවූවද ශිෂ්ට ව්‍යවහාරයෙහි පිළි ගන්නා ලද වාග් රූපයන්හට නිපාතනයෝයයි ව්‍යාකරණයෙහි කියනු ලැබේ.

නිපාතනය වනාහි යම් ප්‍රකෘතියක ආශ්‍රයයෙන් හෝ විය හැකි. ගුරුළුගෝමි යන තන්හි එසේය. ගුරුළු යන ශබ්ද ප්‍රකෘතියෙහි ආශ්‍රය ඇති හෙයිනි. සඳගෝමි යන තන්හිද එසේමය. සඳගෝමි නම් චන්ද්‍ර නමින් ප්‍රසිද්ධ බෞද්ධයන්ගේ සංස්කෘත ව්‍යාකරණයෙහි කතෘභූතවූ චන්ද්‍රාචාර්යයෝයි. මහත් බෞද්ධොපාසකයෙකැයි ගෝමි යන්න යොදන ලදී.

පාද යනු ශරීරයෙහි ඉතාම නීච ස්ථානය වේ. එහෙයින් එය යමෙකුගේ නාමය හා සම්බන්ධකොට යොදන ලදින් ශබ්දාර්ථානු සාරයෙන් බැලුවහොත් ඔහුට නින්දාව මිස ගෞරවය එළවන්නාවූ අර්ථයක් නොපැනේ. ඒ ශාස්ත්‍රීය වශයෙනි. එහෙත් පාද යනු ජනසම්මතයෙන් පූජ්‍යාර්ථයෙහිද යොදනු ලැබේ. ලුප්තියකිතැයි සිතිය යුතුබව පෙනේ. පූජ්‍යපාද යන අන්‍යාර්ථ සමාස රූපය පසු කල පාදයයි ශෙෂ වීමෙනි. ඒ එසේ වුවද පාදයයි පූජ්‍යාර්ථ යෙහි යෙදීම ශාස්ත්‍ර ක්‍රමයකට නොමැති හෙයින් නිපාතනයකි. රතැසිපා යන තන්හි පෙනෙන්නේ ඒ වේ. රත්නාක්ෂීන්වහන්සේ යනු අර්ථයි. රත්නාක්ෂි යනු සඤ්ඤා නාමයකි.

ගොස් යන්නෙන් ගමනාර්ථයෙහි පූර්ව ක්‍රියාව දක්වනු ලැබේ. සිය බසෙහි වනාහි ගමනාර්ථයෙහි ධාතුව නම් සිදත් මතයෙහි ප්‍රකාර 'යා' යනු වේ. මේ ධාතුවෙන් ගොස් යන්නක් සිදුවිය නොහැකි. ඊට ආධාරවිය හැකිවූ අන්කිසි ධාතුවක්ද සිය බසෙහි නොපැනේ. එයින් 'ගොස්' යනු ප්‍රකෘතියක ආශ්‍රයක් නොමැතිව සම්පාදිත වූවකි. එයින් නිපාතනය යනු මෙහි මතයයි.

### 86. නීතිසාරය. නිපාතන.

(1) සංස්කෘත මාගධීන්හි වනාහි ඇතම් ශබ්දයෝ අන්‍ය යන්ගෙන් පරව සමාසයෙහි යොදනුලැබූ කල්හි ඒ පූර්ව පදයන් හට උත්තමාර්ථය ගෙන දෙත්. එබඳු ශබ්දයෝ නම් චන්ද්‍ර, සිංහ, නාග, ශාර්දූල, වෘෂභ යනාදීහුයි. නරේන්ද්‍රචන්ද්‍ර, පුරුෂසිංහ, මන්ත්‍රි

නාග යනාදීහු ඔවුන්ගේ යොගයට නිදසුන් වෙත්. මේ අනුව සියබසෙහිද නිරිඳුසඳ, මැතිවරණ යනාදී යෝගයෝ ලැබෙත්. එක්තරා රීතියක් අනුව හෙයින් ඒට නිපාතනයයි නොකියත්.

ගුරුළුගෝමි, සඳගෝමි, රතැසිපා, යන තැන්හි පෙනෙන්නේත් එම රීතියම්ැයි. ගෝමි යනු පළමුකොට මහත් ගව සම්පත්තිය ඇති සිටුවරයකු කෙරෙහි වැටිණ. පසු උසස් බෞද්ධොපාසකයකු කෙරෙහිද වැටිණ. එයින් යමෙක් නමින් ගුරුළු වූයේ බෞද්ධොපාසකයෙක්ද වේනම් යථොක්ත සමාස ක්‍රමයෙන් හෙතෙම ගුරුළු ගෝමි ‍වේ. සඳගෝමි යනුද එසේමැයි.

තවද සංස්කෘත මාගධින්හි පාද යනු බහුවචනයෙන් ගෙන එසේම සමාසයෙන් යෙදූ කල්හි මහත් ගෞරවාර්ථයක් ගෙනදේ. එයින් රක්තාක්ෂිපාද යනු රීත්‍යනුසාරිවූ යොගයකි. මේ පාද යනු සියබසෙහි පා යයි සිටී. රතැසිපා යනු එයිනි.

මේසේ බලනකල ගුරුළුගෝමි, සඳගෝමි, රතැසිපා, යනමේ වාග්රූප තුනම ව්‍යාකරණ රීතින් අනුසාරිව සිදුවූ සමාස තුනකි. අක්‍රමයකින් සිදුවූවෝ නොවෙත්. එයින් ඉන් එකෙකුදු නිපාතනයෙක් නොවේ.

තවද සංස්කෘතයෙහි ගම් (ගමනෙ) යන ධාතුවෙන් සිදුවූ පූර්වක්‍රියාපදය නම් 'ගත්වා' වේ.

සියබසෙහි කිසිවිට තකාර සකාර දෙදෙනාගේ අන්‍යොන්‍ය ආදෙශය ඇත්. තුඹස—සුඹස ( හුඹහ ), සෙසු—තෙසු, යනාදියෙන් ඒ පෙනේ. කිසිවිටෙක අ කාරය ඔ කාර වේ. බහල යනු 'බොල්' වූ මෙනි. සියබසට බිඳී ඒමෙහිදී බොහෝවිට හණිත්න්ගේ අන්ත්‍යවර්ණය තෙම ලොප් වේ. පාත්‍ර—පා, බෝධි—බෝ, සූත්‍ර—හු යනාදීන්හි මෙනි.

මේ භෙද ක්‍රමයන්ගේ අනුසාරයෙන් බලනකල සිංහල 'ගොස්' යනු සංස්කෘත 'ගත්වා' යන්නෙන්ද, සිංහල 'ගොසින්' යනු මාගධී 'ගන්ත්වාන' යන්නෙන්ද බිඳුණාහු යයි පිළිගැනීම ශාස්ත්‍රීය වනු මිස මේ වාග්රූපයෝ යම් කෙනකුන් විසින් ඌනත්වයක් පිරිමසා ලීම පිණිස කෙණෙහි සිතුමනයෙන් ජපයා ගන්නා ලද්දාහුයයි සිතීම ශාස්ත්‍රීය නොවන බව ප්‍රත්‍යක්ෂය. ඒ

භාෂාවන්හි රීත්‍යනුසාරිව සිඩවූ මොවුන් සිංහලට බිදී ආකල සිංහලෙහිදී මොවුන් හට නිපාතන යසි කීම එසේම අශාස්ත්‍රීය බවද ප්‍රත්‍යක්‍ෂමැයි.

(2) මෙසේ ගත්කරු විසින් නිපාතනය පිණිස දක්වන ලද නිදසුන් සතරෙන් එකක්වත් නිපාතන නොවේ. නිපාතන නම් ව්‍යාකරණ විධියක් ඇත්තේද යනු ප්‍රශනයකි. නිපාතන යන්නෙන් කියවෙන්නේ කුමක්ද යනු කච්චායන නම් මාගධී ව්‍යාකරණයෙහි "යදනුපපන්නා නිපාතනා සිජ්ඣන්ති" යන සූත්‍ර යෙන් කීහ. උපපන්න නුවූ හෙවත් නිදීමට ක්‍රමයක් හා අනුවර්ති නුවූ යමක් ඇත්ද එබඳු සියල්ල නිපාතනයෙන් සිද්ධවෙත් යනු මෙහි අර්ථයයි. එහි අදහස මෙසේය :- ව්‍යාකරණ නීතීහු භූයො වෘත්තිය බලා සඞ්ගෘහීතකොට සාදන ලද්දාහු වෙත්. මේ සඞ්ග්‍රහ ණයෙහිදී සියල්ල ඇතුලත්කළ නොහේ. එයින් කොයි කොයි නීතියෙනුත් මගඇරී යන්නාවූ ඇතම් ලක්‍ෂ්‍යයන් ඇතිවිය හැකි. ඔව්හු නිපාතන වශයෙන් සිද්ධවෙත් යනුයි. එයින් නිපාතනනම් අක්‍රමයයි. ඊට නිදසුනක් නම් මෙසේය :- වර්ණයන් සම්බන්ධවූ ධර්මයක් නම් ව්‍යඤ්ජනයා ස්වරය ආරූඪකරගැන්මයි. මේ නීතිය වේ. එහෙත් බින්දුව මේ නීතියෙන් බාහිරය, සඤ්ඤක ලකුණුද බාහිරය, ඔවුන්ගේ ස්වරාරූඪකරගැන්මක් නොමැති හෙයිනි. එයින් මේ නීතියට ඔව්හු බාහිරයෝ හෙවත් නිපාතනයෝ වෙත්. ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි මූල පටන් අග දක්වා හැම ධර්මය වම නිපාතනයන් ඇතිවිය හැකි. මෙසේ නිපාතනයන් ඒ ඒ නීතියට බාහිරව ලැබෙනු විනා නිපාතන නම් විශෙෂවූ ව්‍යාක රණ විධියක් නොමැත්තේ මැයි.

(3) තවද මේ සූත්‍රය සන්න ටීකාදියකින් විනා ගතහැකිවූ අර්ථයකින් යුක්තවූවක් බවද නොපැනේ.

අ. ප්‍රකෘතියක ආශ්‍රයයෙන් හෝ කරනලද්දේ නිපාතනයයි මෙහි කීහ.

ආ. ප්‍රකෘතියක අනාශ්‍රයයෙන් හෝ කරනලද්දේ නිපාතන යයි කීහ.

මේ දෙකෙන් බාහිරව ලැබෙන්නාවූ කිසිම භණිතියක් භාෂාවෙහි ඇතිවිය නොහැකි. එයින් මේ සූත්‍රයෙහි වාච්‍යාර්ථ

ප්‍රකාර නම් මූළු භාෂාවම නිපාතන විය යුතුයි. ඒ අනර්ථ මැයි. එයින් සූත්‍රය මහත් අතිව්‍යාප්තියෙන් දූෂිතය.

(4) මෙසේ හෙයින් විශෙෂ වියරණ විදියක් වසයෙන් වේවා නිපාතනයෙහි ලක්‍ෂණය කී තන්හි මාගධී සුතුරටම අනුව කියනලද්දේ නම් ඉතා මැනවි බැවි මෙහි සඳහන් කළ යුතුවේ.

(5) තවද මේ සුතුරෙහි යොදනලද නිපා යන්න නිපාතන යට අතිශයින් අයොග්‍යවූ නාමයකි. නිපාතයයි අනිකක් ඇති හෙයින්ද නිපා යන්නෙන් එයත් කියවෙන හෙයින්ද දෙකකට එකම නම යෙදීමෙන් අර්ථ වෛකල්‍යය වන්නේයි. මේ සූත්‍රයෙහි කියන ලද්දේ නිපාතයද නිපාතනයද යනු තවමත් ඇතම් අය වලුත්හට ශඞ්කා සහිතවූ කාරණයකි.

(6) තවද නිපාත යනු නිපා යයි බිඳීඑනු මිස න කාරාන්තවූ නිපාතන යන්නත් එසේ බිඳී ඉය හැකි බවක්ද නොපැනේ. ස්වර සහිත නකාරයා ස්වර රහිත වනු විනා ලොප් වන බවක් බොහෝසේ දක්නා නොලැබේ. භාජන — බදුන්, සාසන — සසුන්, ආසන — අසුන්, විමාන — විමන්, ඉසිපතන — ඉසි පතන්, යනාදීහු සාධකයි. ඒ එසේ වේවා නොවේවා වෛකල්‍ය නිවාරණය පිණිස නිපාතන යනු සිංහලට 'නිපතන්' යයි ගැනීම යොග්‍යව තිබුණේමය.

(7) කරුණු මෙසේ හෙයින් සිංහල ව්‍යාකරණයෙහි නිපා තනයට කියයුතු ලක්‍ෂණය මෙබන්දක් විය යුතුයි :—

නිය මුත් සිදු නිපතන් නම්.

(නියමුත්, නීතියෙන් මුක්තව; සිදු සිඞවූයේ; නිපතන් නම්, නිපාතන නම්.)

සරසවති යන්නෙන් සිද්ධවූ 'සරසවිය' යන්නෙහි අන්ත යකාරය තෙම නිපාතන වසයෙන් පතිත යැ.

## 37. නියම් විදි.

**සූත්‍රපාඨය.** දමෝරා ඈ නියම් විදි.

**ව්‍යාඛ්‍යා.** දමෝරා ඈ, දමෝරා යනාදිය; නියම් විදි, නියම විධියයි.

## 37. විකාරය. නියත විධි.

රාජකුමාරයෙක්වූ කෘෂ්ණ නම් වීරයා ළදරුකාලයෙහි ගොපලු ගමකට ආරක්‍ෂාව පිණිස ගෙනයන ලදුව නන්ද නම් ගොපලු හා ඔහුගේ බිරින්දවූ යශොද විසින් වඩනා ලදි. මොහුට ඇත් පැටවකුට සේ වීසී තිබුණු හෙයින් යශොද විසින් ඔහුගේ උදරය අවට යදමක් බැඳ තිබුණේය. බැහැර යනවිට ඔහු යද මින් රඳවා තබා යෑම පිණිසය. මේ කුමර තෙමේ විෂ්ණුහුගේ අවතාරයක් විය. එහින් විෂ්ණුහටද, මේ දම සම්බන්ධයෙන් "දාමොදර" යයි කියනු ලැබේ. ඒ සංස්කෘතයෙහි. සංස්කෘතයෙහි වනාහි සමාසයෙහිදී සන්ධිය නිත්‍යය. එහින් දාම + උදර යනු නියම වසයෙන් "දාමොදර" විය යුතුයි. සිංහල භාෂාවෙහි වූ කලී සමාසයෙහි පවා සන්ධිය නිත්‍ය බවට නීතියක් නොමැත්තේය. එහින් සුර ඉසුරු යනාදි සමාස රූපයෝ විසන්ධියෙන්ම දක්නා ලැබෙත්. එහෙත් සංස්කෘතයෙහි දාමොදර යයි නිත්‍ය වශයෙන් පෙනෙන්නාවූ "දාම + උදර" යනු සමාසයක් වසයෙන් සිංහලෙහි කිසිම කාලෙක විසන්ධියෙන් නොසිටී. එහින් දමෝරා යනු නිත්‍ය රූපයකි. එසේම දමුදර, දමෝදර, දාමෝදර යනුද මේ නීතියෙන් නිත්‍යරූපයෝ වෙති. සන්ධි ලක්‍ෂණයෙහි.

**සංලක්‍ෂ්‍යය.** — මේ සම්බන්ධයෙන් පුරාණ සන්නය දූෂ්‍ය බව පෙනේ. එහි කියාතිබෙන්නේ නම් "දාමොදර" යනු සිය බසෙහි "දමෝරා" යන එකම රූපයෙන් පෙනෙනු මිස අන් කිසි රූපයක් නොමැති හෙයින් නියම් විදිය යනුයි. එය පසු කාලෙක අව්‍යුත්පන්නයන් විසින් ආරූඪ කරන ලද මූලාවක් යයි පිළිගත යුතු වේ.

## 37. නීතිසාරය. නියත විධි.

(1) මෙහි දමුදර යයි සිටි තන්හි උදර යන්නට "ඕර" යනු ආදෙශ වීමෙන් දමෝරා වියයි පුරාණ සන්නයෙහි කියා තිබේ. ඕර යනු ආදෙශයක් නොව උදර යන්නෙන් බිඳී ආවාවූ තද්භව ශබ්දයක් බව කිය යුතුයි. (අං. 79. 2. බලනු.) "දූත සිමැදුරෝ රේ — උවන් පියුම් වරගතන්" යනු මුවදෙව්ද පාඨයි. සිදතෙහි මත් "කඳේ කිමි තමහට කිස තබා අඹරෝරම නැගේ."

(2) අභිමත වශයෙන් හෝ ගෞරවාර්ථ වශයෙන් හෝ ඉදු ශබ්දය අන්‍ය ශබ්දයක්හුගේ අගට සමාසයෙන් යෙදූ කල්හි සන්ධි

තෙම නියත වේ. එයින් නිරිඳු, මැතිඳු යනාදි සන්‍ධි රූපයන් විනා නරඉඳු, මැතිඉඳු යනාදි විසන්‍ධි රූපයෝ නොලැබෙත්.

(3) අදින් පසු දිනයට සංස්කෘතයෙහි 'ශ්වස්'යයි කියනු ලැබේ. මාගධියෙහි 'සෙව'යයි කියනු ලැබේ. අව්‍යය වශයෙනි. එයින් සිහළට 'හේ' යයි පැමිණියා විය යුතුයි. එහෙත් මෙය ව්‍යවහාරයෙහි ලැබෙන්නේ ඒ අව්‍යය රූපයෙන් නොව ශබ්ද ප්‍රකෘතියක් වශයෙන් චතුර්ථ්‍යර්ථක වචනයෙහි 'ට' ප්‍රත්‍යය ගෙන 'හෙට' යන රූපයෙනි. නියම විධියි.

(4) නියම් විදිය බහු ප්‍රචාරයෙන් ලැබේ. මෙහෙසුරු, මෙහෙසි, යනාදි රූපයෝ තවත් ඊට නිදසුනි. මෙන් නිපාත සම්බන්‍ධයෙහි නාම් විභක්තියද එසේම නිදසුනකි. තවත් නිදසුන් ස්වල්පයක් නම් මෙසේය :—

අභිෂික්තා යන්නෙන් බිසව් මිස අබිසව් නොවේ.

නර+ඉඳු යන්නෙන් නිරිඳු මිස නරිඳු නොවේ.

සංස්කෘත ඍණ යනු මෙසේ බිඳේ :— මාගධී: ඉණ; සිංහලට: වර්ණවිපර්‍ය්‍යාසයෙන්, ණඉ. ඉ කාරය හල්යකාරයට සාරයෙන් සමය (25.1.) එයින් : නඉ = ණය්. මීට අකාරාගමයෙන් ණය.

රූවාරූ, සුවාසූ, අටෝරාසිය, ලොවුතුරා, යනාදීහුද එසේම නියත විධියි.

(5) සංලක්‍ෂ්‍යය — 'යන + ආදි' යයි සිටි තත්හි පූර්ව පදය වනාහි සිංහලය, අපරපදය නම් සංස්කෘතය, එයින් මොවුන් අතරෙහි වියහැකිවූ සන්‍ධියක් නොමැත්තේ යයි මේ උභය පදය විසන්‍ධියෙන් ලිවීම ඇතම් අය විසින් නියම විධියක් කරගෙන තිබේ. ඔවුන්ගේ ලියුම්වල නොයෙක් තැන දක්නට ලැබෙන්නාවූ "යන ආදි", "යන ආදි", "යන ආදි" යන්න පණඇදීම කට සමානයයි මේ ව්‍යවහාරයට විරුඬවූවෝ කියත්. මේ ව්‍යවහාරය කවර කෙනෙකුන් විසින් පහළ කරන ලද්දේදැයි නොදනිමු. එහෙත් නූගතුන් අතරෙහි ස්වල්ප වශයෙන් හා ඇතම් අභිනව උගතුන් අතරෙහි බහුල වශයෙන්ද එය පවත්නාබව පෙනේ. ව්‍යවහාරය නම් අශොභන බව හා අහෙතුක බවද කිය යුතුයි. ශුඬ සිංහල ශබ්දයක්ද පාළි සංස්කෘත ශබ්දයක්ද අතරෙහි සන්‍ධිවීමට හෝ සමාසවීමට හෝ කිසිම බාධාවක් සියබසෙහි නොපෑනේ. "සාරාසඬ්බ්‍යසජ්ලක්‍ෂණයක්මුළුල්ලෙහි" යනු බොහෝපුරාණයෙහි සිට පැවත එන්නාවූ අති සම්භාවිතවූ ශිෂ්ටව්‍යවහාරයකි. මෙහි 'සාරාසඬ්බ්‍ය'

(“සාර+අශ්වය”) යනු එබඳු මිශ්‍ර සන්ධියකි. “සාජ් ලක්‍ෂ” යනු එබඳු මිශ්‍ර සමාසයකි. “යත+ආදි” යන්නෙහි “ආදි” යනු සංස්කෘත යයි ගත් කල්හිදු “යතාදි” යයි සන්ධිකොට කීම ශිෂ්ට ව්‍යවහාරානුකූල බවට මේ ප්‍රමාණ වේ. එහෙත් මෙහි ආදි යනු සියබසට පරකීය යයි ගැනීමටද කිසිම කරුණක් නොමැත්තේය. ශුද්ධ සිංහල හෝඩියෙන් ලිය හැකිවූ සියලුම සංස්කෘත මාගධී ශබ්දයන් සවභාෂා රචනායෙහිදී ශුද්ධ සිංහලයයි සැලකීම ශිෂ්ට සම්මතයකි.

“වතරත්න මා හිමි වඳු සහ මහ සඟන”

යන මෙහි සංස්කෘත ‘රත්න’ යනු එසේ ශුද්ධ සිංහල වශයෙන් යොදු ගන්නා ලද්දකි.

“වන කල ගොදුරු මරකත මිණි මිවුරු ලෙස”

යන මෙහි පාලි සංස්කෘත ‘මරකත’ යනුද එසේමය.

මේ න්‍යායයෙන් බලන කල සංස්කෘත මාගධී “ආදි” යනුද සම්ප්‍රාප්ත හෙවත් සිදතෙහි ප්‍රකාර තත්සම වශයෙන් සියබසෙහි ලැබෙන්නාවූ ශබ්ද ප්‍රකෘතියකි. එහි ශුද්ධ සිංහල නම් “ඈ” යනු යයි යථොක්ත විසන්ධි කරුවෝ කියත්. එසේ නම් “රත්න” යන්නෙහි ශුද්ධ සිංහල නම් “රුවන්” යන්න බවද, “මරකත මිණි” යන්නෙහි ශුද්ධ සිංහල නම් “මරා මිණි” යන්න බවද අනික් පක්ෂයෙන් කිය හැකි.

මේ ගැන තර්කණයද උවමනා නොවේ. මිශ්‍ර සන්ධිය හා මිශ්‍ර සමාසයද සියබසෙහි ස්ථිරවූ ශිෂ්ට සම්මතයක් හෙයිනි. නිදසුන් :—

නො දූ ක රුපුන් යස සඳසේ ම ස ත් තේ
නො යෙ ක තමා යස රැස පෑ දි ස ත් තේ
නි සැ ක ඒකනායක මැති ම ස ත් තේ
ප සෙ ක සිරිසි පිපි රුකමෙන් ව ස ත් තේ

හං.ස.

පිවි බිම් බා සුරු රිවි කුල කමල’ ක ර
පි යුම ම් බා නිතරම රැඳි උර මැදු ර
මෙ න ර ම් බා හිමි රුසිරිනි මනහ ර
පැ ර කු ම් බා නරනිඳු සඳ දකු මිතු ර

සැලලිහිණි.

මේ ‘ආදි’ ශබ්දය සම්බන්ධවම —

පෙර එක් දැසක් නම ලත් බත් බෙදු දී
ලැබගෙන නොයෙක් සුරසිරි පිරිවරා දී
ක ර ව යි එ ස ක් දෙවිඳුගෙ සිත සමා දී
ල ද එ ක් පි ඩ ක් වත් වලදව බෙදු දී

ගුත්තිල.

මෙයින් යථොක්ත විසන්ධි කාරයන්ගේ මතය මොහ බව පමණක් නොව අද්භූතවූ මුලාවක් බවද පැහැදිලිව පෙනේ.

## 38. අනියම්විදි.

**සූත්‍රපාඨය.** කිසි සඳවිබත් ඈ අනියම් විදි.

**ව්‍යාඛ්‍යා.** කිසි සඳවිබත් ඈ, යම් කිසි සන්ධි විභක්ති ආදි යක්; අනියම් විදි, අනියම විධියි.

## 38. විස්තරය, අනියත විධි.

(1) නියම විධිය ඇට කියන ලදි. ස්ථිර නීතිය ඇති තැන නියම විධියයි. ඇතම් වාක් ප්‍රචාරයක් තෙම එබඳු එකම නීතිය කට නොබැඳී පවතියි. එසේවූ තන්හි ධර්මය අනියම විධි වේ. විකල්පාන්විතය යනු අර්ථයි. සහෝදර යනු 'සොහොඋරු' යයි බිඳේ. එතෙක් නියම විධියෙහි. ඉන්පසු යකාරාගම සන්ධියෙන් සොහොයුරු යයි හෝ වකාරාගම සන්ධියෙන් සොහොවුරු යයි හෝ වේ. අනියම විධියෙහි. ලෝ අඳුරු යනු විසන්ධියෙන් සවරූපයෙන්ම සිටී. සන්ධියෙන් ලොවැදුරු යයි හෝ සිටී. අනියම් විදියෙහි.

(2) විභක්ති යොගය ගැනද එසේමය. මිනිසා ගිය තැන යනු මිනිසු ගිය තැන, මිනිසහු ගිය තැන යයි නොසිටී. මිනිසා යනු මෙහි නියම විධි හෙයිනි. එහෙත් බමුණා දුන් බස්, බමුණු දුන් බස්, බමුණහු දුන් බස් යනු එකසේ යෙදෙත්. අනියම් විදි හෙයිනි.

(3) සූත්‍රයෙහි ඈ යන්නෙන් නිපාතාදීන්ගේ යොගයද සඞ්ගෘහීතය. විගසින් යව, විගසට යව, යනාදි වසයෙනි.

## 38. නීතිසාරය. අනියත විධි.

අනියම් විදියට තවත් නිදසුන් :—

සන්ධි : ලෝ ඉසුරු, ලොවිසුරු; අතුල, අත්ල, අල්ල; දියුණු, දිවුණු; මියුරු, මිවුරු; පියයුරු, පියවුරු.
විභක්ති : කල, කලැ, කල්හි; උගත්තෝ, උගත්තු.
ක්‍රියා : යමි, යෙමි; කරයි, කෙරේ; බබළමි, බැබළෙමි; දිත, දිනෙව; සැරදූ, සැරදෙව.
පූර්ව ක්‍රියා : ගොස්, ගොසින්; කර, කරැ, කොට, කොටින්; අවුත්, අවුදින්; රැගෙන, ඇරගෙන.

ක්‍රියා විශෙෂණ : සැණින්, සැණෙහි; විගසින්, විගසට; සතත, සතතින්; මෙලෙස, මෙලෙසින්, මේලෙසේ, මෙලෙසට.
ප්‍රකෘති : විදුලි, විදුලිය; සරසවි, සරසවිය; සඳලු, සැඳලි; මූදුන්, මූදුනු ; තොතැනි, තෝතැනි.

## සූත්‍රපාඨය. 39. අවිදුමන් විදි.

සියරු නොහළ සුද අත් පඬු ඇඹුල් ඈ, අවිබත් අවියසද ඈ අවිදුමන් විදි.

**ව්‍යාඛ්‍යා.** සියරු නොහළ, ස්වකීය-රූපය වර්ජිත නොකළා වූ; සුදඅත්, ශුද්ධාන්ත යන්නෙන් භින්නවූ සුද අත් යනුය; පඬු ඇඹුල්, පාණ්ඩු කම්බල යන්නෙන් භින්නවූ පඬු ඇඹුල් යනුය; ඈ, මේ ආදීහුද; අවිබත්, අවිභක්තික ශබ්දයෝද; අවියසද ඈ, අව්‍යය ශබ්ද යනාදීහුද; ද්‍යෙහෝ නොහොත් : අවිබත්, අවිභක්තිකවූ; අවියසද ඈ, අව්‍යය ශබ්ද යනාදීහුද; අවිදුමන් විදි, අවිද්‍යමාන විධිසි.

## 29. විස්තරය. අවිද්‍යමාන විධි.

රජකුගේ හෝ අන්‍යතර යම් උතුමකුගේ හෝ මාලිගායෙහි ස්ත්‍රීන්ගේ නිවාසය පිණිස වෙන්කර තබනලද ප්‍රදෙශයට අන්තඃපුරය නොහොත් ශුද්ධාන්ත යයි කියනු ලැබේ. මේ ශුද්ධාන්ත යනු විසන්ධිවූ කල ශුද්ධ + අන්ත යයි සිටී. සිංහලට බිඳී ඇවිත් තිබෙන්නේ මේ විසන්ධි රූපයෙහි එනම් සුද අත් කියාය. මේ සුදඅත් යනු කිසිකලෙක සුදත් කියා හෝ සුදහත් කියා හෝ නොසිටී

ශක්‍රයාගේ ශෛලාසනයෙහි පාණ්ඩු වර්ණවූ කම්බලයන් (නොහොත් පලස්) අතුරා තිබෙන හෙයින් ඊට අන්‍යාර්ථ සමාසයෙන් පාණ්ඩු කම්බල යයි කියනු ලැබේ. මේ පාණ්ඩු කම්බල යනු සිංහලට පඬු ඇඹුල් යයි බිඳේ. මෙය පූර්ව ස්වර ලොප සන්ධියෙන් පඬැඹුල් කියා හෝ පරස්වර ලොපසන්ධියෙන් පඬුඹුල් කියා හෝ සිටිය යුතුයි. එහෙත් මෙය පූර්වස්වර ලොප සන්ධියෙන් පඬැඹුල් යයි කිසිකල නොසිටී. අතික් අතට විසන්ධි රූපයෙන් පඬු ඇඹුල් යයි සිටී.

මෙසේ ස්වකීය රූපය නොහලාවූ නොහොත් වෙනස් නොකරන්නාවූ යම් වාක්ප්‍රචාරයක් ඇත්ද ඊට අවිද්‍යමාන විධි යයි කියනු ලැබේ.

ඇතම් ශබ්ද ප්‍රකෘතිහු විභක්ති නොගනිත්. එයින් අවිභක්තික වෙති.

අව්‍යය යන්නෙන් කියවෙන්නාවූ නිපාතොප සර්ගයෝද සෑම තැන්හි ස්වරූපයෙන්ම සිටිත්.

මෙබඳුවූ සියල්ල අවිද්‍යමාන විධියි. අවිපර්‍යය ඔවුන්ගේ සාධාරණ ධර්මය වේ.

## 39. නිතිසාරය. අවිද්‍යමාන විධි.

(1) සාමාන්‍ය වාග්ධර්මයක්වූ ඒ ඒ අර්ථය පිණිස වන රූප විපර්‍යය මේ ප්‍රචාරයෙහි අවිද්‍යමානනුයි මේ තෙම අවිද්‍යමාන විධි නම්. මෙහි ලක්ෂිතවූ අවිද්‍යමානත්වය සමස්ත වශයෙන් හෝ ඒකදෙශ වශයෙන් හෝ වියහැකි. ඒ නයින් විභෙද වේ.

(2) සමස්ත අවිද්‍යමානත්වයට 'සුදඅත්' යන පාඨයෙන් නිදසුන් කළහ. මේ වනාහි නියම් විදියෙහි පතිතවූ ශබ්දයෙකි. එහි විසන්ධිය නියත වේ. එයින් සන්ධියෙන් රූප විපර්‍යය නොහැකි වේ. රූප විපර්‍යය නොහැකි හෙයින් හේ සමස්තා' විද්‍යමාන යැ. තවත් නිදසුන්:— මහඉසි (මහර්ෂි) ; මහඋර (අනන්ත) . මොව්හු තුමූ මෙහෙසි, මොංගොර යනාදි වසයෙන් කිසිකල නොසිටිත්.

(3) අවිභක්තික ශබ්දයන්ද සමස්තා' විද්‍යමාන බැව් කියන ලදි. සියලුම නාම විශෙෂණ ශබ්දයෝ තුමූ ස්වකීය අධිකරණයෙහි නියුක්ත කල්හි නොවෙනස් රූපයෙන්ම සිටිත්. සිහිල් දිය යයි ලිඞ්ගාර්ථයෙහි සිටිකල්හි දෘශ්‍යමානවූ සිහිල් යන්න සියලු විභක්තීන්හිද එසේම සිටී. සුදු වස්සා යනු පුංලිඞ්ගික වේ; සුදු වැස්සී යනු ස්ත්‍රීලිඞ්ගික වේ. සුදු සලුව යනු නපුංසක ලිඟු වේ. ඒ තුන් තන්හිම සුදු යනු නොවෙනස්ව සිටී. එයින් නාම විශෙෂණයෝ තුමූ ස්වාධිකරණයෙහි සමස්තා' විද්‍යමාන වෙත්.

**සංලක්ෂ්‍යය.** — සංඝාත මාගධීත්සි නාම විශෙෂණයතෙම විශෙෂ්‍යයට අනුරූප වන සේ වර නැගෙන්නාවූ ශබ්ද ප්‍රකෘතියකි. දෙමළෙහි වනාහි නාම විශෙෂණය අව්‍යයයකි නොහොත් විශෙෂ්‍යය බලං නොපෙරළෙන්නාවූ වාග් විශෙෂයකි. එයින් සියබසෙහි ධර්මය නම් ද්‍රවිඩයෙන් වූ උරුමයකි.

(4.) ඇතැම් එකවර්ණී නාම (ශබ්ද) ප්‍රකෘතිහුද එසේම බොහෝ තන්හි ප්‍රකෘති රූපයෙන් සිටිත්.

නිදසුන් :—

| | | | | | |
|---|---|---|---|---|---|
| යා | ... | ගමන. | රෝ | ... | රෝග. |
| නා | ... | නාග. | මා | ... | චන්ද්‍ර. |
| නා | ... | නායක. | සී | .. | සිංහ. |
| නා | ... | නාථ. | භූ | ... | පෘථිවී. |
| රා | ... | රාග. | භූ | ... | යක්ෂාදීහු. |
| නී | ... | ගඟ. | ආ | ... | ආයු. |
| වේ | ... | විපී. | ඈ | ... | ආදී. |
| සේ | ... | ඡායා. | දී | ... | දධි. |
| සේ | ... | ඡේක | මී | ... | පෘථිවී. |

**සංලක්ෂ්‍යය.** — මේ නිත්‍ය ධර්මය සංස්කෘත මාගධීන්හි නොමැත්. ද්‍රවිඩයෙහි ඇත්. එහින් මේ වනාහි සියබසට ද්‍රවිඩ පක්ෂයෙන්වූ උරුමයකි.

(5) අව්‍යය ශබ්දයෝ නම් උපසර්ග නිපාතයෝයි (1. 15. විස්තරය.) බොහෝ නිපාතයෝ සමස්තා' විද්‍යමානයෝ වෙත්. නිදසුන් :— මුත්, මිස, වහා, විනා, නානා, ඇයි, ඔව්, අනේ, ඉතින්, ඉතිකින්, යළි, යල, හේ, හෝ,–ඈ.

(6) ඇතැම් උපසර්ගයෝද එසේමය. නිදසුන් :— පිරිවර, පිරිකර, පිරිසිදු, යනාදී තන්හි 'පිරි'; අදිපති, අදියර, යනාදී තන්හි 'අදි'; අනුදූන, අනුලොම්, යනාදී තන්හි 'අනු'; සුවඳ සුදසුන්, යනාදී තන්හි 'සු'; උවටැන්, උවසර, යනාදී තන්හි 'උව' (නොහොත් 'උප').

(7.) ඇතැම් ශබ්දයෝ අර්ථය පිණිස යම්තාක් නොවෙනස් වද යම්තාක් වෙනස්වද සිටිත්. ඔව්හු තුමූ එකදෙශ අවිද්‍යමානයෝ වෙත්. ඇතැම් ශබ්ද ප්‍රකෘතිහු මෙසේය. 'මැද' යනු නිදසුනකි. මෙය බහුවචනය නොගනී. හුදෙක් එකවචනයෙහි සිටී. එකවචනයෙහිද විබත් සයකම නොවෙනස් රූ බජයි. මිට ඇත්තේ රූප තුනක් පමණකි. ඒ මෙසේය :—

පෙර, අලප්, කම්, කතු, සබඳ, අදර විබත් ... මැද
සපදන් විබත් ... ... ... මැදට
කරණ අවදි විබත් ... ... ... මැදින්.

උඩ, යට, (බහිරර්ථයෙහි) පිට, (මන්දකාලාර්ථයෙහි) සැණ, යනාදීහු මේ එකදෙශත්වයට තවත් නිදසුනි.

(8) ක්‍රියා විශෙෂණාර්ථයෙහි පතිතවූ බොහෝ ශබ්දයෝද එම අධිකරණයෙහි මෙසේම එක දෙශ අවිද්‍යමානයෝ වෙත්. නිදසුන් :—

| ශබ්දය. | | ප්‍රචාරය. |
|---|---|---|
| කම (ක්‍රම) | ... | කෙමෙන් |
| සෙම් (ක්‍ෂෙම) | ... | සෙමෙන් ; සෙමෙහි |
| විගස | ... | විගසට ; විගසින් |
| සොඳ | ... | සොඳට ; සොඳින් |
| මැනවි | ... | මැනවින් |
| සැණෙක් | ... | සැණෙකින් |
| ඉක්මන් | ... | ඉක්මනට ; ඉක්මනින්. |

(9) ඇතම් උපසර්ගයෝද මේ සඛ්‍යාවෙහි පැනෙත්. තදභව වාග් රූපයන්හිය. නිදසුන් :—

| සංස්කෘත. | | | |
|---|---|---|---|
| උපසර්ග. | වාග්රූප. | මාගධී. | සිංහල. |
| ප්‍ර | ප්‍රමාණ | පමාණ | පමණ |
| | ප්‍රාපෙනාමි | පාපුණාමි | පැමිණෙමි |
| | ප්‍රණිපාත | පණිපාත | පිණිපා |
| | ප්‍රබුඩ | පබුඩ | පුබුදු |
| | ප්‍රභවාමි | පභවාමි | පොහොමි |

මෙසේ 'ප්‍ර' යන්නෙන් හිතනවූ මේ උපසර්ගය තෙම සිය බසෙහි ප, පැ, පි, පු, පො, යයි පස් ආකාරයකින් පෙනේ. අනියම් වසයෙනි. මෙසේ නිත්‍යරූප නොවන හෙයින්ද යම්තාක් අනිත්‍ය රූපයෙන් පෙනෙන හෙයින්ද මේ වනාහි එකදෙශ අවිද්‍යමානයි.

තවත් නිදසුන් :—

| සංස්කෘත. | මාගධී. | සිංහල. | වාග්රූප. |
|---|---|---|---|
| ප්‍රති | පටි | පිළි | පිළිසන් |
| ... | පති | පස් | පසක් |
| වි | වි | වි | විමල් |
| | | වෙ | වෙසෙස් |

| සංස්කෘ . | මාගධී. | සිංහල. | වාග්රූප. |
|---|---|---|---|
| අව | ඔ | ඔ | ඔවදන් |
| | අව | අව | අවමන් |
| පරා | පරා | පර | පරදිම් |
| | | පැර | පැරදෙම් |
| | | පලා | පලා යති (සං. පලායතෙත) |
| සම් | සං | ස | සතපම් |
| | | සැ | සැතපෙම් |
| උද් | උ | උ | උගන්වම් |
| | | ඉ | ඉගැන්විම් |
| නිර් | නි | නි | නිමල් |
| | | නිර් | නිරතුරු |
| ආ | ආ | අ | අමතයි |
| | | ඇ | ඇමති |

**සංලක්ෂ්‍යය.** — මෙහි දැක්වූ 'ප්‍රති' යනු කම් ප්‍රවචනියයෙකි යෙදෙන කල්හි සිඟ බසෙහි ඊට සමානවූ රූපය නම් 'පාසා' යනු වේ. වාක්‍ය. ප්‍රති, වෘක්‍ෂ සානති;—රුකක් පාසා සඳ සැන්.

(10) පඬු ඇඹුල් යනුද එකදෙශ අවිද්‍යමානත්‍වයට නිද සුනෙකි. කවර හෙයින්දයත් එය පූර්වස්වරලොප සන්ධියෙන් පඬැඹුල් නොවන නමුදු පරස්වර ලොප සන්ධියෙන් පඬුඹුල් වේ. මෙය පසුව පඬුපුල් යයි ලැබේ. නිදසුන් :—

සක් දෙව්දු උන් ස ද
සිහිල් පඬුපුල් සලස්නේ සො ද. ගුත්තිල.

(11) මේ අවිද්‍යමාන යන ශබ්දයාගේ මුඛ්‍යාර්ථයෙන් ලොක යෙහි නොමැත්තාවූ දෙයක් ප්‍රතීයමාන වන හෙයින් මෙය ව්‍යාකරණ ක්‍රමයක් දැක්වීම පිණිස අභාග්‍යවූ අභිධානයක් බව කියයුතුයි.

## 40. සත් කෙලවර.

**පාඨය.** ඉති විසිවැදැරුම් වියරණ විදි නිමි. සව් ප දන් සිදු සේ සලකනු.

**ව්‍යාඛ්‍යා.** ඉති, මෙසේ; විසි වැදැරුම්, විංශති ප්‍රකාරවූ; වියරණ විදි, ව්‍යාකරණ විධිහු; නිමි, සමාප්තයි. සව්, (ඒ)

සියල්ල; පදන් සිදුසේ, ප්‍රධාන (සූත්‍රයෙන්) සිද්ධවූ පරිද්දෙන්; සලකනු, සංලක්ෂණය කරනු.

## 49. විස්තරය. සඤ්ඤාවසානය.

(1) ව්‍යාකරණය විසි වැදෑරුම් බව නොහොත් ව්‍යාකරණ විධින් විස්සක් බව කලින් කියන ලදි. ඒ විදි විස්ස එකිනෙක ගෙන නම් වසයෙන් හා ලකුණු වසයෙන්ද මෙසේ හඳුන්වා දී සමාප්තය.

(2) ව්‍යාකරණයෙහි මූලය නම් භාෂාවෙහි ශිෂ්ට ව්‍යවහාරය වේ. එයින් සියලුම ව්‍යාකරණ විධීන් ජේක ප්‍රයොගානුරූප බව ප්‍රධාන සූත්‍රය කොට මුලදීම කියන ලදි. ඒ සූත්‍රයට අඞ්ග සූත්‍ර යයි කියනු ලැබේ. ඉන් පසු මේ ව්‍යාකරණයෙහි සියලුම සූත්‍රයෝ උපාඞ්ග සූත්‍රයෝ වෙත්. මේ උපාඞ්ග සූත්‍රයන්ගේ මාර්ගයෙන් යටකී විංශති ප්‍රකාරවූ ව්‍යාකරණ විධීන් සම්බන්ධව සිදු කරනු ලබන්නාවූ යමක් ඇත්ද ඒ සියල්ල ප්‍රධාන සූත්‍රයෙහි කී උපදෙශානුසාරයෙන් කටයුතු වේ. එනම් ජේක ප්‍රයොගයට අනුරූප වනු මිස අනනුරූප නොවන සේය.

## 40. නිතිසාරය. සඤ්ඤාවසානය.

ව්‍යාකරණ විධි විංශතියට තබනලද සඤ්ඤා හෙවත් නාමධෙය විංශතිය හඳුන්වා දී සමාප්ත හෙයින් සඤ්ඤාධිකාරය මෙහි නිමවිය යුතුයි. එහෙත් යට දක්වනලද ඇතම් සඤ්ඤාවන් සම්බන්ධයෙන් තවත් කියයුතු ඇතම් විස්තර තිබුණාහුය. ඒ ඒ තැනට ප්‍රපඤ්ච විය හැකි හෙයින් නොදක්වනලද නමුදු දැන් අවසර ඇති හෙයින් මේ අධිකාරයෙහිම කියනු ලැබෙත්.

## 41. සද.

**සූත්‍රපාඨය.** දා දැව් ගුණ කිරිය–සන් වී සදන් පස් බේ.
අනුරුත් අරුණු වෙසෙසින්–විමසා දෙබේ හා දන්.

**ව්‍යාඛ්‍යා.** දා, ජාතිය; දැව්, ද්‍රව්‍යය; ගුණ, ගුණය; කිරිය, ක්‍රියාය; සන්, සඤ්ඤායයි; වී, කියා; සදන්, ශබ්දයන්ගේ; පස්බේ, පඤ්චභෙදයද; අනුරුත් අරුණු වෙසෙසින්, අන්වර්ථ ආරූඪ යන විශෙෂයෙන්; දෙබේ හා, විභෙදයද; විමසා, විමර්ශනය කොට; දන්, ඥානය කරන්.

## 41. විස්තරය. ශබ්ද.

ශබ්දය තෙම ශබ්දප්‍රකෘති නාමයෙන් යට කියන ලදි. මේ ශබ්දය පස් වැදෑරුම් වේ. ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සඤ්ඥා, යන මේ වශයෙනි.

මේ එක් එක් භේදය නැවතත් දෙවැදෑරුම් වේ. අන්වර්ථ, ආරූඪ, යන මේ වශයෙනි. ආරූඪ යන්නට රූඪි යනුද නමි.

ශබ්දයට නාම යනුද පර්‍යාය බව යට කියන ලදි. මෙසේ භාෂාවෙහි විද්‍යමානවූ සියලුම ශබ්දයෝ හෙවත් නාමයෝ දස වැදෑරුම් වෙති. ඒ මෙසේය :–

| අන්වර්ථ ශබ්ද. | ආරූඪ ශබ්ද. |
|---|---|
| ජාති නාම | ජාති නාම |
| ද්‍රව්‍ය නාම | ද්‍රව්‍ය නාම |
| ගුණ නාම | ගුණ නාම |
| ක්‍රියා නාම | ක්‍රියා නාම |
| සඤ්ඥා නාම | සඤ්ඥා නාම |

මෙයින් ජාත්‍යාදි පඤ්චභේදය පළමුකොට ක්‍රමයෙන් විස්තර කරනු ලැබෙත්.

## 42. දෘ.

**සූත්‍රපාඨය.** බුන් අරුත්හි තියසද දෙදෙනා නොබිඳ පවත් වන්නී දෘ නම්. සුර, නර, ගොන්, ඈ.

**ව්‍යාඛ්‍යා.** බුන් අරුත්හි, භින්නාර්ථයෙහි; තිය සද දෙදෙනා, ඥාතය ශබ්දය යන දෙදෙනා; නොබිඳ පවත්වන්නී, අභින්නකොට ප්‍රවර්තනය කරවන්නී තොමෝ; දෘ නම්, ජාති නම්; සුර, දෙවියා; නර, මිනිස්ය; ගොන්, වැහැප්ය; ඈ, මේ ආදිසි.

## 42. විස්තරය. ජාති (ශබ්ද).

අදහස් ප්‍රකාශය පිණිස වාක් තොමෝ උපකරණ වෙයි. වාක් නම් අර්ථ සහිතවූ ධ්වනියකි. ඒ අර්ථයට මෙහි ඥාතයයි කියන ලදි.

"තුටු මිනිසා නටයි" යන තන්හි නටයි යන්නෙහි කනින් ශ්‍රූයමාණවූ ධ්වනියක්ද මනසින් බොධ්‍යමානවූ අර්ථයක්ද ඇත්. ඒ අර්ථය වනාහි ක්‍රියාර්ථයකි. නැටීමෙහි නොයෙක් ආකාර

ඇතත් නැටීම නම් එකම එක් ක්‍රියාවකි. නැටීමයයි ක්‍රියාවක් මිස ක්‍රියාවෝ නොමැත්. අන්‍ය ක්‍රියාවන් ගැනද එසේමය. ක්‍රියාවෙහි එකම අර්ථයක් මිස භින්නාර්ථ නොමැත්.

එසේම තුටු යනුවෙන් කියවෙන්නේ එකම ගුණයකි. අඩු වැඩි වසයෙන් තුෂ්ටියෙහි ප්‍රභෙද ඇතත් තුටු යනුවෙන් කියවෙන්නේ එකම එක ධර්මයකි.

එහෙත් මිනිසායයි කී කල්හි එහි අර්ථය තෙම එකම මිනිසකු කෙරෙහි නොව ලොකයෙහි කොයි මිනිසා කෙරෙහි වුවත් යෙදේ. මිනිස්හු එකෙකා වශයෙන් භින්නයෝ වෙත්. එයින් මිනිස් යනු භින්නාර්ථයෑ. එතකුදු වුවත් මිනිස් යන්න ගැන කිය යුත්තක් ඇත්තේය. "මිනිස්" යන වාක් තොමෝ ධ්වනියකින් යුක්තය. ඒ ධ්වනිය සමගම සිතට ආරූඪ වන්නාවූ එක්තරා අර්ථයක්ද එහි ඇත්තේය. ඒ අර්ථය එකම මිනිසකු හට විශෙෂ නොවේ. සියලු මිනිසුන් හට සාධාරණය. එසේ සාධාරණවූ මේ අර්ථයද ඊට වාහනවූ ධ්වනියද අභෙදත්වයෙන් එකම ධර්මයක් කෙරෙහි පවතිත්. ඒ ධර්මය නම් සියලු මනුෂ්‍යයන්ට සාධාරණවූ මනුෂ්‍ය ලක්ෂණ නැමති ධර්මයයි. මේ ධර්මයට "ජාති" යනු නමි. අන්‍ය සත්ත්ව ද්‍රව්‍යාදීන් සම්බන්ධයෙහිද එසේමය.

මෙසේ භින්නාර්ථ ඇති තැන්හි ඒ අර්ථ (ඥත) යද තත් ප්‍රකාශකවූ ධ්වනියද අභෙදයෙන් සාධාරණ ධර්මයෙහි පවත්වන්නී ජාති නමි. එයින් එබඳු ලක්ෂණ ඇති සුර, නර, ගොන්, ආදීහු ජාති නාමයෝ වෙත්.

### 42. නිහිසාරය. ජාති ශබ්ද.

(1) මේ සූත්‍රයෙහි කියන ලද ලක්ෂණානුසාරයෙන් බැලුව හොත් ගස්, ගල්, යනාදි ශබ්දයන්ද ජාති නාමයෙහි ගිනිය යුතුයි. ගස් ජාති, ගල් ජාති, යනාදි වසයෙනි. ඔව්හුද භින්නාර්ථයහ. එහෙත් වියරණෙහි වනාහි ඔව්හු ජාති නාමයෙහි නොගැනෙත්. ද්‍රව්‍ය නාමයෙහි ගැනෙත්. එයින් මේ සූත්‍රය අතිව්‍යාප්ති නම් දොෂයෙන් දූෂිත බව පෙනේ.

(2) තවද සූත්‍රයෙහි "නියසද දෙදෙනා" යයි කී තණ්හි 'සද'යනු යොදා තිබෙන්නේ මින් පෙර එක් තැනෙක සඤ්ඥපිත වූ නාම ප්‍රකෘත්‍යර්ථයෙහි (අං. 15) හෝ අනික් තැනෙකු කියන

ලද අව්‍යයාර්ථයෙහි (අං. 39) හෝ නොව ඉන් නෘතියවූ ධ්වනි නම් අර්ථයෙක්හිය. එක් තැනෙක එකම අර්ථයෙක්හි විශේෂයෙන් පිහිටුවා ගන්නා ලද සඤ්ඤාවක් එම ශාස්ත්‍රයෙහිම මෙසේ නානාර්ථයන්හි යෙදීම අතිශයින් අශාස්ත්‍රීයබව කිවමනා නොවේ.

(3) ව්‍යාකරණයෙහි අපෙක්ෂිත ජාතීන් නම් ප්‍රාණවත් සත්ත්ව විශේෂයන් පමණක් බව පෙනේ. එයින් සූත්‍රය බැඳිය යුතුව තිබුණේ ඊට අනුරූප වන සේය. "පැණී වෙසෙස් දූ නම්" යනාදියක් වසයෙනි.

(4) ප්‍රාණීන් හට විශේෂ සඤ්ඤාවක් වශයෙන් 'මේ ජාති' යන නාමය පිහිටුවන ලද නමුදු ප්‍රාණීන්ද ශරීර පක්ෂයෙන් ද්‍රව්‍ය සඞ්ඛ්‍යායෙහි වැටෙන බව දතයුතු. එයින් 'ජාති' යනු සමවාය යෙන් ද්‍රව්‍ය හා සම්බන්ධ වේ. (අං. 43, විස්තරය 2.)

## 43. දූව.

**සූත්‍රපාඨය.** ගුණ ඇනට අදර වූයේ දූව් නම්. ටැඹ, කුඹු, ඇ.

**ව්‍යාඛ්‍යා.** ගුණ ඇනට, ගුණාදීන්ට; අදරවූයේ, ආධාර වූයේ; දූව් නම්, ද්‍රව්‍ය නම්. ටැඹ, ස්තම්භය; කුඹු, කුම්භය; ඇ, යනාදියයි.

## 43. විස්තරය. ද්‍රව්‍ය (ශබ්ද).

ටැඹක් නම් උස් හෝ මිටි හෝ විය යුතුයි. ඒ උස් බව හෝ මිටි බව හෝ ගුණයකි. කුඩා හෝ මහත් හෝ විය යුතුයි. ඒ කුඩා බව හෝ මහත් බව හෝ ගුණයකි. මේ ගුණයන් හා රූපාකාරය, වර්ණය, යනාදි ගුණයන්ද ටැඹෙහි ඇතිවිය හැකි. එසේ ගුණයන් හට ආධාරවූ යම් වස්තුවක් ඇත්ද ඒ වස්තුවට ද්‍රව්‍යයයි කියනු ලැබේ. එයින් ටැඹය ද්‍රව්‍යයකි. කුම්භයද එසේම යම් යම් දෘශ්‍යාත්වාදි ගුණයන්ට ආධාර හෙයින් ද්‍රව්‍යයකි.

(2) සූත්‍රයෙහි 'ඇ' යනු කවරහෙයින්ද යත්: ද්‍රව්‍යය ආධාර වන්නේ ගුණයන්ට පමණක් නොවේ. ක්‍රියාවටද ආධාර වේ. කියන ලද මැයි :-

ද්‍රව්‍යලක්ෂණනතු ක්‍රියාගුණවත් සමවායි කාරණම්.

"ද්‍රව්‍ය ලක්ෂණය නම් ක්‍රියා, ගුණ, යන මොවුන්ගෙන් උපලක්ෂිතවූ සමවාය ඇති කාරණයයි."

සමවාය මෙසේ විස්තර කරන ලදි භාෂාපරිච්ඡේදයෙහි :-

සවාදීනාං කපාලාදෞ-ද්‍රව්‍යෙෂු ගුණකර්මණොඃ
තෙෂු ජාතෙශ්ච සම්බන්ධඃ-සමවායඃ ප්‍රකීර්තිතඃ.

"කපාලාදියෙහි විද්‍යමානවූ ඝටයන්ගේ සම්බන්ධයද, ද්‍රව්‍යයන් කෙරෙහි විද්‍යමානවූ ගුණ කර්ම දෙදෙනාගේ සම්බන්ධයද, එසේම ඔවුන් කෙරෙහි විද්‍යමානවූ ජාතියෙහි සම්බන්ධයද, සමවාය යයි කියන ලදි."

මෙයින් ගුණ, ක්‍රියා, පමණක් නොව ජාතියද ද්‍රව්‍යාශ්‍රිත වේ. ඈ යනු එහෙයිනි.

## 43. නිතිසාරය. ද්‍රව්‍ය (ශබ්ද).

(1) මෙයින් පූර්ව සූත්‍රයෙහි නිදසුන් කල සුර, නර, ගොන්, යන ශබ්දයෝද ප්‍රාණ්‍යර්ථ පක්ෂයෙන් ගත්කල ජාති නාමයෝ වෙති, ශාරීරාර්ථයෙන් ගත්කල ද්‍රව්‍ය නාමයෝ වෙති. මේ ද්‍රව්‍ය යන් කෙරෙහි ජාතින්ගේ සමවාය යයි.

(2) ද්‍රව්‍යයන් කෙරෙහි ක්‍රියා, ගුණ, යන මොවුන්ගේ සමවා යයට නිදසුන් මෙසේය (සුශ්‍රැතයෙන්) :-

පාකො නාස්ති විනා වීර්‍යාද්-වීර්‍යං නාස්ති විනා රසාත්
රසො නාස්ති විනා ද්‍රව්‍යාද්-ද්‍රව්‍යං ශ්‍රෙෂ්ඨ මතඃ සමෘතම්.

"වීර්‍යයෙන් තොරව පැසීම නොමැත්තේය; රසයෙන් තොරව වීර්‍යය නොමැත්තේය; ද්‍රව්‍යයෙන් තොරව රසය නොමැත්තේය. මෙයින් ද්‍රව්‍යය ශ්‍රෙෂ්ඨයයි දන්නාලදි."

මෙහි පැසීම නැමති ක්‍රියාවට හා වීර්‍ය, රස, නැමති ගුණයන්ටද ද්‍රව්‍යය ආධාර විය.

## 44. ගුණ.

**සූත්‍රපාඨය.** දූව් ඇසිරැ පෙරලෙන සුලු වි ගුණ නම්. කළු, හෙළ, තැබුළු, ඈ.

**ව්‍යාඛ්‍යා.** පෙරලෙන සුලුවි, විපර්‍යාසනවන සවභාවය ඇතිව; දූව් ඇසිරැ, ද්‍රව්‍යාශ්‍රිතවූයේ; ගුණ නම්, ගුණ නම්. කළු, කෘෂ්ණය; හෙළ, ධවලය; තැබුළු, විශාලය; ඈ, යනාදියයි.

## 44. විස්තරය. ගුණ (ශබ්ද).

ද්‍රව්‍යයක් නම් යම් යම් ගුණයන්හට ආධාරයක් බව යට කියන ලදි. ගුණයක් හෝ ගුණයන් හෝ නොමැත්තාවූ ද්‍රව්‍යයක් විද්‍යමාන විය නොහැකි. එසේම අනික් අතට ද්‍රව්‍යයක් හා සම්බන්ධයෙන් මිස ගුණයක්හුගේ පැවැත්මක් ඇතිවිය නොහැකි. එයින් ගුණයෝ තුමූ ද්‍රව්‍යයන් ආශ්‍රයකොට පවත්නාහු වෙත්.

ද්‍රව්‍යාශ්‍රය ගුණයක්හුගේ එක් ලක්‍ෂණයෙකි. මේ ආචාර්‍ය්‍යයන්ගේ මතයෙහි ප්‍රකාර තවත් ලක්‍ෂණයෙක්ද ඇත්. එනම් විපර්‍ය්‍යාසයට පැමිණියහැකි ස්වභාවයයි.

මේ ලකුණු ඇති හෙයින් කළු, හෙළ, නැබුළු, යනාදීහු ගුණයන්ට නිදසුන් කළහ.

## 44. නිතිසාරය. ගුණ (ශබ්ද).

(1) මෙහි ගුණය නම් පෙරළෙන සුලුව ද්‍රව්‍යාශ්‍රිතවූ ධර්මය කැයි කීහ. ද්‍රව්‍යාශ්‍රය නම් සුබොධය. එහෙත් පෙරළීමෙන් හෙවත් විපර්‍ය්‍යාසයෙන් අදහස්කරනලද්දේ කුමක්දැයි නොපෙනේ. කාලවර්ණවූ වස්තුවක් ක්‍රමයෙන් ධවලවර්ණ විය හැකි. ධවල වර්ණවූ වස්තුවක් ක්‍රමයෙන් අන්‍ය වර්ණ විය හැකි. එසේම පටුවූ වස්තුවක් ක්‍රමයෙන් නැබුළු වියහැකි.

මෙබඳු තන්හි පළමු තිබුණාවූ ගුණය ක්‍රමයෙන් විපර්‍ය්‍යස්ත විය යුතු මේ සූත්‍රයෙහි අභිප්‍රෙතවූ ආශය සේ පෙනේ. ඊට හෙතුව නම් දුර්ගාදාස විසින් මුග්ධබොධ ටීකායෙහි කරන ලද විස්තරයක් අවිවෙකයෙන් ග්‍රහණය කිරීම යයිද හැගේ. පාණිනි ව්‍යාකරණයට අනුවෘත්ති කියන්නාවූ කාත්‍යායන ඍෂිහු විසින් එක් තැනෙක මෙබඳු ශ්ලොකයක් යොදා තිබේ—

සත්වෙ නිවිශතෙ'පෛති–පෘථග් ජාතිෂු දෘශ්‍යතෙ
ආධෙයශ්චා ක්‍රියාජශ්ච–සො'සත්ත්ව ප්‍රකෘති ගුණඃ.

මෙය වොපදෙවයන් විසින් ස්වකීය ව්‍යාකරණයෙහිද ගෙන හැර දක්වන ලදි. එහි අර්ථය විස්තරකිරීමේදී දුර්ගාදාස විසින් කරන ලද කථායෙහි එක් වාක්‍යයක් නම් මෙසේය :–

"යම්සේ ශ්‍යාමතා තොමෝ පළමුකොට ආම්‍රාදි ඵලය ආශ්‍රය කෙරේද, පසුව විලිකුත් සමයෙහි එයින් පහවේද, වෙන් වෙන්

ජාතීන් කෙරෙහි එනම් භින්නවූ පදාර්ථයන් කෙරෙහි දක්නා ලැබේද- යම්සේ ආම්‍රාදි ඵලයෙහි දක්නා ලද ශ්‍යාමතා තොමෝ කදලි ඵලාදීන් කෙරෙහිද දක්නා ලැබේද, හේ වනාහි ගුණ වේ යනු අර්ථයි."

ගුණයන්ගේ පෙරළෙන සවභාවයක් මෙහි නම් නොපෙනේ. යම් ගුණයක් සවල්ප වශයෙන් හෝ බහු වශයෙන් හෝ සමස්ත වශයෙන් හෝ තදාශ්‍රයයෙන් පහව ගිය හැකි. ඒ පහවී යැමේදී අන්‍ය ගුණයක් එහි ප්‍රාදුර්භූත වියහැකි. එසේ ප්‍රාදුර්භූතවූ කල ඒ අන්‍ය ගුණය පළමු ගුණයෙහි විපර්‍යාසයක්යයි කීම යථාර්ථානුකූල නොවේ. යට දක්වූ ශ්ලෝකයෙහි කාත්‍යායනයන් විසින් ගුණයෙහි ලක්ෂණ ඉතා ශාස්ත්‍රීයලෙස කියා තිබේ. දුර්ගාදස විසින්ද එය මනාලෙස විස්තරකර තිබේ. ශ්ලෝකයෙහි ව්‍යාඛ්‍යානය මෙසේය :-

(යඃ, යමෙක් තෙම); සත්තෙව, විද්‍යමානවූව කෙරෙහි හෙවත් ද්‍රව්‍යය කෙරෙහි; නිවිශතෙ, ආශ්‍රිතව සිටීද; අපෛති, (එයින්) පහව යේද; පෘථක් ජාතිෂු, වෙන් වෙන් වසයෙන්වූ ජාතීන් කෙරෙහි; දෘශ්‍යතෙ, පෙනේද; ආධෙයශ්ච, ආධානය කරනු ලැබීමට යොග්‍යවේද; අක්‍රියාජඃච, ක්‍රියාව යොනිකොට නොමැත්තේ වේද; අසත්ත්ව ප්‍රකෘතිඃ, අද්‍රව්‍යය සවභාවකොට ඇති; සඃ, හෙතෙම; ගුණඃ, ගුණ වන්නේයි.

මෙයින් ගුණයෙහි භාවාභාව ලක්ෂණයෝ, මෙසේ වෙත් :— ගුණයතෙම —

1. ද්‍රව්‍යාශ්‍රිත වේ;
2. ද්‍රව්‍යමය නොවේ;
3. ක්‍රියාමය නොවේ;
4. ද්‍රව්‍යයෙන් පහවද යේ;
5. වෙන් වෙන් ජාතීන් කෙරෙහි එකසේ දක්නා ලැබේ;
6. යමක් (එනම් ද්‍රව්‍යයක්) ඊට ආධාරවිය යුතුයි.

න්‍යාය ශාස්ත්‍රයෙහි වනාහි දෘශ්‍යා' දෘශ්‍ය සකලාර්ථයන් ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, යයි ත්‍රිභෙදකොට බෙදූහ. මේ ශ්ලෝකයේහිද ගුණය නම් අද්‍රව්‍ය බවද, අක්‍රියා බවද කීහ. අද්‍රව්‍ය නම් අක්‍රියා

නම් අර්ථත්‍රයයෙන් ශෙෂවන්නේ ගුණය පමණකි. මෙහි විශෙෂය නම් තවත් ලකුණු සතරක් ඊට අනුකූලව දක්වීමයි.

(2) තවද න්‍යාය ශාස්ත්‍රයෙහි වනාහි ගුණයෙහි ලක්‍ෂණ මෙසේ කියන ලදි :— ද්‍රව්‍ය කර්ම භින්නත්වෙ සති සාමාන්‍යවාන් ගුණඃ.

(ද්‍රව්‍යයාගේද කර්මයාගේද භින්නත්වය ඇති කල්හිදු සාමාන්‍යය ඇත්තේ ගුණය වේ.)

මෙහි අර්ථය නම් මෙසේය :— "නොයෙක්විට ද්‍රව්‍යයක් තෙමේ සාමාන්‍ය ජාත්‍යර්ථයෙහිනොව භින්නාර්ථයෙහි සිටී. මහා මෙරු යයි කී තන්හි මෙහි. භින්නවූ හෙවත් සුවිශිෂ්ටවූ එකම වස්තුවක් එයින් කියවේ. කර්මය නොහොත් ක්‍රියාවද භින්නාර්ථයැ. නැටුම්, ගී, වැයුම්, යන තන්හි එක් එක් ක්‍රියාව එක් එක් සුවිශිෂ්ටාර්ථයක් භජනය කෙරේ. එසේම ද්‍රව්‍ය ක්‍රියා දෙකද අන්‍යොන්‍ය භින්නාර්ථයැ. ඒ සපෂ්ටමැයි. එහෙත් ගුණය කිසිකල භින්නාර්ථයෙහි නොසිටී; සැමකල් සාමාන්‍යය භජනය කෙරේ. එනම් ගුණය නානාවිධවූ ජාතියෙන් භින්නවූ නා නා වස්තුන් කෙරෙහි එකසේ පැවතිය හැකි. බොහෝ වෘක්ෂයන් කෙරෙහිද, ඇතම් සතුන් කෙරෙහිද, වෙනත් නොයෙක් වස්තුන් කෙරෙහිද පලාශ වර්ණය එකසේ පවතී. ඒ ගුණයකි. වස්ත්‍රයක් නම් ද්‍රව්‍යයකි, නෘත්‍යයක් නම් ක්‍රියාවකි. අන්‍යොන්‍ය භින්නයහ. එහෙත් සුදර්ශන භාවය නැමති ගුණය දෙකෙහිම සමානව පැවතිය හැකි. තවද ගායනය වාදනය යනු භින්නවූ ක්‍රියා දෙකකි. එහෙත් මධුරතා නැමති ගුණය දෙකෙහිම සමසේ පැවතිය හැකි.

මෙයින් ද්‍රව්‍යයාගේද කර්මයාගේද භින්නත්වය ඇති කල්හිදු සාමාන්‍යය ඇත්තේනම් ගුණය මැයි.

(3) මෙසේ හෙයින් ගුණයට ලකුණක් වසයෙන් සූත්‍රයෙහි කියනලද විපර්‍යාසශීලි භාවය අසම්භාව්‍ය ලක්‍ෂණයක්බව පෙනේ. ගැඹුරුවූ ශාස්ත්‍ර මාර්ගයන්හි නොගොස් "දව් වෙසෙසනුයේ ගුණ නම්" යනාදි වසයෙන් යමක් කියන ලද්දේ නම් වඩා මැනවි යයිද එසේම පෙනේ.

## 45—46. කිරිය(සද).

**සූත්‍රපාඨය. 45.** කිරිය ලකුණු වියතලද මැයි. එහි බේ මෙතැන්හි නොසැබැහැවිති බැවින් කිරිය අදියරැ පවස්තමෝ.

**ව්‍යාඛ්‍යා.** කිරිය ලකුණු, ක්‍රියාලක්‍ෂණය තෙම; වියතලද මැයි, කියතලද්දේමැයි. එහි බේ, එහි භෙදයන්; මෙතැන්හි **මේ ස්ථානයෙහි**; නොසැබැහැවිති බැවින්, අසම්භාවනීය හෙතු යෙන්; කිරිය අදියරැ, ක්‍රියාධිකාරයෙහි; පවස්තමෝ, මතු ප්‍රකාශ කරන්නමු.

### 45. විස්තරය. ක්‍රියා(ශබ්ද).

ක්‍රියා ශබ්දය හෙවත් ක්‍රියා නාමය හඳුන්වා දීම පිණිස දැන් ප්‍රස්තාව පැමිණිය. ඒ පිණිස පලමුකොට ක්‍රියා නම් කුමක් දැයි කිය යුතුවේ. එහෙත් එය කලින් එක් තැනෙක ලක්‍ෂණ වශ යෙන් කියන ලදින් දැන් මෙහි නැවතත් කීම උවමනා නොවේ. කලින් කියන ලද්දේ "නොදැව් නුගුණ" යනාදියෙහි. තවද ක්‍රියාවෙහි බොහෝ ප්‍රභෙද ඇත්. ඔවුන් ගැන යම් කථනයක් මෙහි සම්භාවනීය නොවේ, හෙවත් ස්ථානොචිත නොවේ. එයින් එම කථනය මින් පසු ක්‍රියාධිකාරයෙහි කරනු ලැබේ. දැන් මෙසේ මෙහි ප්‍රාස්තාවිකවූ ක්‍රියාලක්‍ෂණ කලින් කියා තිබෙන හෙයින් ඒ ප්‍රමාණ කොට ගෙන ක්‍රියා ශබ්දය හෙවත් ක්‍රියා නාමය විස්තර කරනු ලැබේ.

**සූත්‍රපාඨය. 46.** හව්කිරිය අරුත් කිරියැවි කිරිය සද දෙවැදැරුම්. නටනු, ගනු, වයනු, තැවුලි, පිරියෙස්ලි,* බොදුන්, නැමදුම්, ඈ හව් කිරිය සද නම්. දෙන්නේ, සේනුයේ, ඈ අරුත් කිරිය සද නම්.

**ව්‍යාඛ්‍යා.** හව් කිරය අරුත්කිරිය වී, භාවක්‍රියාය අර්ථ ක්‍රියා යයි කියා; කිරිය සද, ක්‍රියා ශබ්දය තෙම; දෙවැදැරුම්, ද්විප්‍රකාර වේ. නටනු, නැටීමය; ගනු, ගායනය; වයනු, වාදනය; තැවුලි, තාපනය; පිරියෙස්ලි, පයේෂණය හෙවත් සෙවීමය; බොදුන්, භොජනය (ආහාර අනුභවයයි) ; නැමදුම්, ප්‍රණාමය; ඈ, මේ ආදිය; හව් කිරිය සද නම්, භාව ක්‍රියා ශබ්ද නම්.

* පිරියස්ලි. — සම්ප්‍රදාය, පොත්.

දෙන්නේ, දූතය කරන තැනැත්තේ; සේනුයේ, සුවපත් වන තැනැත්තේ; ඈ, මේ ආදිය; අරුත් කිරිය සද නම්, අර්ථ ක්‍රියා ශබ්ද නම්.

46. විකාරය. ක්‍රියා (ශබ්ද).

ක්‍රියා ශබ්දය තෙම ද්විප්‍රකාර වේ. භාව ක්‍රියා, අර්ථ ක්‍රියා වසයෙනි.

භාව ක්‍රියා නම් කෙවලවූ ක්‍රියා මාත්‍රයයි. නැටීම, ගායනය යනාදි වසයෙනි.

මෙය ධාතුවෙන් පරව නු ප්‍රත්‍යය යොගයෙන් හෝ සෑදේ. නටනු, ගනු, වයනු, යනාදියෙහි මෙනි.

ධාතුවෙන් පරව ලි ප්‍රත්‍යය යොගයෙන් හෝ සෑදේ. නැවුලි, පිරියෙස්ලි, යනාදියෙහි මෙනි.

ධාතුවෙන් පරව උන් ප්‍රත්‍යය යොගයෙන් හෝ සෑදේ. බොදුන් යන්නෙහි මෙනි. උම් ප්‍රත්‍යයෙන් හෝ සෑදේ. නැමදුම්* යන්නෙහි මෙනි.

45 — 46. නීතිසාරය. ක්‍රියා(ශබ්ද).

(අ.) භාවක්‍රියා.

(1) මෙහි දක්වූ නිදසුන්වලින් භාවක්‍රියාවට ප්‍රත්‍යයයෝ සිව් දෙනෙක් ප්‍රකාශිත වූහ. එනම්: නු, ලි, උන්, උම්, යන මොව්හු වෙත්.

මෙහින් 'උන්' ප්‍රත්‍යය භ්‍රමයෙන් කියන ලද්දක්සේ පෙනේ.

මෙබඳු උන් ප්‍රත්‍යයක් ඇත්නම් හෙද භාෂා ව්‍යවහාරයෙහි අන්‍ය ප්‍රත්‍යයයන් සේම බහු ප්‍රචාරයෙන් ලැබෙන්නක් වියයුතුයි; අන්‍ය ප්‍රත්‍යයයන් සේම ඕනෑම ධාතුවකින් පරව යොදගත හැක්කක්ද විය යුතුයි. "නට" ධාතුවෙන් පරව පාඨයෙහි දක්වූ අනික් ප්‍රත්‍යය තෙදෙනා මෙසේ යෙදෙත් :—

නට + නු = නටනු.
නට + ලි = නැවිලි (ඇතම් පෙරළීන්ද ඇතිව.)
නට + උම් = නැටුම් (එසේම.)

---

* මෙහිද උන් ප්‍රත්‍යය, පුරාණ සන්නයෙහි. ලේඛක දෝෂයකින් 'උම්' යනු අත්හැරී යෑමකින් යයි හැඟේ.

උන් ප්‍රත්‍යයද මෙසේම යෙදුවහොත් 'නැවුන්' යයි සෑදේ. එබඳු ව්‍යවහාරයක් භාෂාවෙහි නොලැබේ.

එසින් බොදුන් යනු සිය බසෙහිවූ සිඩියකැයි පිළිගත නොහැකි. සංස්කෘත මාගධි භොජන යන්නෙන් භින්නවූවකැයි පිළිගත හැකි.

මෙසේ බලන කල සියබසෙහි භාව ක්‍රියා සිඩියට ඉවහල්වූ 'උන්' ප්‍රත්‍යයයක් නොපැනේ.

(2) පාඨයෙහි දක්වූනලද 'නු' ප්‍රත්‍යය නම් සංස්කෘත මාගධීන්හි බහු ප්‍රචාරයෙන් පෙනෙන්නාවූ 'න' ප්‍රත්‍යයට සමානව සිය බසෙහි ලැබෙන්නාවූ ප්‍රත්‍යය වේ. එය සම්බන්ධවූ රීතිය එම භාෂාවන්ගෙන් ආවේ යයිද, ඒ 'නු' ප්‍රත්‍යයමත් එම 'න' ප්‍රත්‍යයෙන් තද්භවවී ආවේ යයිද පිළිගැනීම ශාස්ත්‍රීය බව පෙනේ. එහෙත් එහි ප්‍රාප්තිය වූයේ මේ උකාරාන්තරූපයෙන් නොව ස්වර විවර්ජිත 'න්' යන රූපයෙන් යයි පිළිගැනීමට සැහෙන ශාස්ත්‍රීය කරුණු පැනෙත්. ඒ මෙසේය :—

(3) "**යන්** මන් නොසින් මහ තොරතුරු නියම දූත"— යන මේ තන්හි 'න්' ප්‍රත්‍යයයෙන් යුත් විධි ක්‍රියා රූපයක් යෙදිණ.

"වතින් ගුරුන් **අපියනු**"—යන මේ තන්හි 'නු' ප්‍රත්‍යයයෙන් යුත් එම ක්‍රියා රූපයක් ව්‍යවහෘතය.

එසින් විධි ක්‍රියා වශයෙන් 'කරන්' යන්නෙහිද 'කරනු' යන්නෙහිද විශෙෂයක් නොමැත්තේය.

තවද "**වඩිනු** මැනවි මහවෙල මැද වෙරළාන"—යන මෙතැන්හි පෙනෙන ප්‍රකාර නම් "වඩිනු" යනු විධි ක්‍රියාවක් නොව භාවක්‍රියා ශබ්දයකි. (වඩිනු, වැඩීම; මැනවි, යහපති.)

එසින් භාවක්‍රියා ශබ්දය මැනවි, සොඳේ, යෙදේ, යනාදි ශබ්දයක් සමග අනදර රහිතවූ විධි ක්‍රියාර්ථයෙහි යෙදෙන බව පෙනේ.

සිදතෙහිද (කම්කිරියැ) : විදි විසාහි 'කරනු' 'බොජනු' ඈවේ– යයි කියනලදින් මේ 'නු' ප්‍රත්‍යයාන්තරූපය කර්මාර්ථ විධි ක්‍රියායෙහි විධාන කරනලදී.

ක්‍රියාව කර්මාර්ථයෙහි හෙයින් 'තෝ කරනු' යනු ව්‍යාකරණ නොවේ. 'තොප කරනු' යනු වියයුතුයි. 'තොප කරනු සොදේ, තොප කරනු යෙදේ' යනාදියද පර්‍යායයි.

පරවිසන්‍දෙශයෙහි —

මූ නි ව ර නරවරන් නිවසෙහි නිබඳ වැ ස
පු ව ත ර බැව්න් තොප නොම බනු පසඟ ගො ස—

යන මේ තන්හිද යොගය එමයි. (තොප, පුරුෂමතා විසින්; නොම බනු, හීන නොවනු සොදේ.)

ප්‍රවෘත්තිය මෙසේ හෙයින් මේ විධි ක්‍රියා රූපය පලමුකොට ගූඪ ක්‍රියාවක් නොව 'මැනව්' යනාදියක් සමග සාදර විධ්‍යාර්ථයෙහි යොදනලද භාව ක්‍රියාවක් බවද, පසු කල සුවිඥත හෙතුයෙන් එහි 'මැනව්' යනාදියෙහි විකල්ප ලොපයක් ඇතිවූ බවද පෙනේ.

එයින් 'වතින් ගුරුන් අරියනු' යන තන්හි පෙනෙන්නේ නම් මේ ලුප්ත ව්‍යවහාරයෙන් විධ්‍යාර්ථයෙහි යොදන ලද 'නු' ප්‍රත්‍යයාන්තවූ මේ රූපයම බව ප්‍රත්‍යක්‍ෂය.

එයින්ම 'කරනු මැනව්', 'කරනු', 'කරන්', යන තුනම එකාර්ථ යැ. තුනෙහිම පෙනෙන්නේ මේ එකම භාව ක්‍රියාව බව ප්‍රත්‍යක්‍ෂයි.

තවද යම් වෘග් රූපයක් හලන්තව ආ කල්හි උච්චාරණ දීප්තිය පිණිස සියබසෙහි ඇතම් විට ස්වරාන්තවද සිටින බව යට කියන ලදී (23. නී. සා. 9.—10.) එයින් සංස්කෘත මාගධී 'ත' ප්‍රත්‍යය සිය බසට 'න්' යයි භින්නව් ආ කල ස්වරාන්තවද සිටීම වාග් ධර්මානුකූල වේ. එය සිය බසෙහි ප්‍රකෘති වශයෙන්ද නානා ස්වරයන් ගැනීමෙන්ද මේ මේ රූපයන්ගෙන් සිටී :—

න්, න, නා, නු, නෝ.

මෙයින් පූර්වයෙහි නිදසුන් කොට දක්වනලද 'නු' යන්න සුප්‍රකටයි. අන්‍යයන්ට නිදසුන් පසුව දක්වනු ලැබෙත්. 'න්' යන්නටද නිදසුන් යට දක්වනලදී. එම 'න්' යන්න මේ සියල්ලට මූලාශ්‍රය බව ප්‍රත්‍යක්‍ෂය. එහෙයින් මේ ප්‍රත්‍යයයෙහි සියබසට බිඳී

ආවාවූ ප්‍රකෘති රූපය නම් එම 'ත්' යන්න බවද එසේම ප්‍රත්‍යක්ෂය.

(4) තවද සංස්කෘත මාගධී භාෂාවන්හි 'ත' ප්‍රත්‍යයයෙන් සිද්ධ වන්නාවූ භාව ක්‍රියා ශබ්දය තෙම අන්‍ය ශබ්දප්‍රකෘතීන් සේම විභක්ති ප්‍රත්‍යයයන් ලබන්නකි. ඒ මෙසේ දතයුතු. කීමෙහි වැටෙන්නාවූ 'කථ්' ධාතුවෙන් පරව 'ත' ප්‍රත්‍යය යොගයෙන් 'කථ්ත'යයි ලැබේ. කිමයි. නපුංසක ලිඞ්ගිකයි. විභක්තීන්හි එහි ස්ථිතිය මෙසේය, (සංස්කෘතයෙහි) :—

| | | |
|---|---|---|
| ප්‍රථමා. } විතියා. } | ... | කථ්තම් |
| තෘතියා } කරණ } | ... | කථ්තෙන |
| චතුර්ථි | ... | කථ්තාය |
| පඤ්චමී | ... | කථ්තාත් |
| ෂෂ්ඨී | ... | කථ්තස්‍ය |
| සප්තමී | ... | කථ්තෙ |
| ආලපන | ... | (හෙ)කථ්ත |

මේ එකවචනයෙහි වේ. ද්විවචන බහු වචනයන්හිද එසේම ප්‍රත්‍යය ග්‍රහණය කෙරේ.

මේ 'කථ්ත' යන්නට සමව සිය බසෙහි සෑදෙන්නාවූ වාග් රූපය නම් "කියනු" යනු වේ. එහෙත් මෙය එකදෙශ අවිද්‍යමාන ධර්මයෙන් යුක්තය. එනම් උභය වචනයෙහි හෝ සියලු විභක්තීන්හි හෝ ප්‍රත්‍යයයන් නොගනී. එකවචනයෙහි ඇතම් විභක්තීන්හි පමණක් ප්‍රත්‍යයන් ගනී. ඒ මෙසේය :—

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රථමා | ... | කියනු. |
| | විතියා | ... | කියනු. |
| | තෘතීයා | ... | කියනුයෙන්, කියන්නෙන් |
| | කරණ | ... | කියනුයෙන්, කියන්නෙන් |
| | චතුර්ථි | ... | (කියනු + අට) = කියනුවට, කියන්නට |
| | පඤ්චමී | ... | කියනුයෙන්, කියන්නෙන් |
| | ෂෂ්ඨී | ... | (කියනු + එහි) = කියනුයෙහි, කියන්නෙහි |
| | සප්තමී | ... | කියනුයෙහි, කියන්නෙහි. |

(ii) ප්‍රථමා ... කියනු + ආ = කියනුවා, කියන්නා
ද්විතීයා ... කියනුවා, කියන්නා
තෘතීයා ... කියනුයෙන්, කියන්නෙන්
කරණ ... කියනුයෙන්, කියන්නෙන්
චතුර්ථී ... කියනුවට, කියන්නට
පඤ්චමී ... කියනුයෙන්, කියන්නෙන්
ෂෂ්ඨී ... කියනුයෙහි, කියන්නෙහි
සප්තමී ... කියනුයෙහි, කියන්නෙහි.

(iii) කියනු + ඒ = කියන්නේ.

(iv) කියනු + අ = කියන්න.

දැන් මේ නිදේශයන්ට ක්‍රමයෙන් නිදසුන් දක්වනු ලැබෙත්.

නිදේශ (i) — (ii) :—

පෙරවිබත් : i. වඩිනු මැනවි මහවෙළ මැද වෙරළාන.
ii. දෙනුවා නම් දන් පින් දෙනුවාමය.

කම්විබත් : i. අතින් පීනනු වැනි මුහුද බැස.
ii. මිණිසලබෙහි දිගැස - කොලහල අසා රණහස
පස්සේ යන විලස-උගන්නා මෙනි ගමන් එමලෙප.

කරණවිබත්: නිලුපුල් වෙනෙහි බැස—පැලඹෙන පැය
එකලෙ ස
එහි විල්ළිහිණි රැස—වෙනස නොදුනේ
හඩන්නෙන් මි ස.

සපදත් : ලෙව් දන මනැස කරවන සහතොස විපු ල
මෙ තිරිඳු රුවට පරදිනුවට පලමු ක ල
මෙහෙසුරු දළැස'ගින් කළ බව ගත වික ල
සිතෙනුය මදනහට එමයයි සෙනට මු ල.

අවදි : එ සි ඳු මෙයිඳු නො කියා බණ දෙසනු යෙ නි
මෙඉඳු මි හි ඳු මාහිමියන් පැමිණි වැ නි.

නිදේශය (iii) :—

පෙරවිබත්: සයට වේද රසමුසු බත් කන්නේ.

නිදේශය (iv) :—

ලුප්තවිභක්තියෙන් කියන කල්හි අයනු, ආයනු, යන්න විභක්ත්‍යන්තව කියන කල්හි අයන්න, ආයන්න, යයි කියනු ලැබේ. එයින් 'යනු' විභක්ති ප්‍රත්‍යයෙන් සිටි කල්හි 'යන්න' වේ. යනු + අ = යන්න.

(5) මේ භාව ක්‍රියා ශබ්දය තෙම යට කීසේ (135 වෙනි පිට)-

(i) 'න' ප්‍රත්‍යයෙන්ද සිටී. නිදසුන් :—

ක. කෙවින හඬින වැනි සෙමෙලන් වරල වන.

කා. දෙ සන ලෙස එවූ මෙහසුන් රස නුමූ තූ
අ සන මැනවි හිමි සිරි ලද මෙන් අමූ තූ.

(ii) 'නා' ප්‍රත්‍යයෙන්ද සිටී. නිදසුන් :—

වඩනා මැනවි මුනි රජ සිරිපා නැමද.

(iii) 'නේ' ප්‍රත්‍යයෙන්ද සිටී. නිදසුන් :—

වැලිතොට ඒය සිරි දුක වඩනේ මැනවි.

(6) නැවිලි, පිරියෙස්ලි යයි නිදසුන් දෙකක්ද පාඨයෙහි දක්වූහු. එහි පෙනෙන්නාවූ 'ලි' ප්‍රත්‍යය වර්තමාන ව්‍යවහාරයෙහි වැඩිකොටම පෙනෙන්නේ සුඛොච්චාරණය පිණිස පූර්වස්වූ 'ඉ' යන්නකින්ද යුක්තව 'ඉලි' ප්‍රත්‍යය වශයෙනි. නිදසුන් :—

නවනු – නැවිලි ; පහදනු – පැහැදිලි ; තවනු – තැවිලි.

කව්බසෙහි :—

ක. අදෙස් හැදගිලි වන-එසඳ ලකුණෙන් සඳ ලකුණුවන.

කා. සතොසින් පියාසර කර එම ඇඹිල්ලේ.

මෙහි ඇසිල්ලේ යනු ඇසිලි යන්නෙනි. (ඇසිලි + ඒ.)

(7) ඊම් ප්‍රත්‍යයෙන්ද පෙනේ.

නිදසුන් :—

නැටුම් – නැටීම් ; පැහැදුම් – පැහැදීම් ; තැවුම් - තැවීම් ; ගැරහුම් – ගැරහීම් ; පැසසුම් – පැසසීම්.

(8) ය, ක, ල, නා, යනාදි එක වර්ණවූ ධාතුන්ගෙන් යැම්, කැම්, ලැම්, නැම්, යනාදිය අනියමින් සෑදෙත්.

යැමෙහි යීම්, ලැමෙහි ලීම්, යයිද නියම විධියෙන් පෙනෙත්.

(9) තවද ලිය, කිය, විය, යනාදි ධාතූන්ගෙන් පරව 'මන' (සං. පා. මාන) ප්‍රත්‍යය වීමෙන්ද කර්මාර්ථයෙහි භාව ක්‍රියා ශබ්දය සැදේ. නිදසුන් :—

ලියමන, කියමන, වියමන.

(10) මෙතෙක් දක්වනලද භාව ක්‍රියා තොමෝ වර්තමානාර්ථයෙහි වේ. අතීතාර්ථයෙහිභාව ක්‍රියා ශබ්දයක්ද සියබසෙහි ඇත්. හෙතෙම අතීත ක්‍රියාඞ්ගයෙන් පරව ආ ප්‍රත්‍යය වීමෙන් සැදේ. නිදසුන් :—

1. උත්සාහක.

පෙරවිබත්. (i) දිනුවා නම් පරලොව දිනුවා මය.
(ii) සරිද මා නෑ සු වා
කියා කන්සට එකක් ගෑ සු වා.

කම්විබත් : (i) බමුවා ලෙසින් අටුවා ඇ දූ ර කු දෙව න
සිටුවා ය ස ස් තුටුවා පෙළරුත් දෙස න.

සංලක්ෂ්‍යය.—'ව' කාරය ආගම් සන්ධියෙනි.

2. නිරුත්සාහක.

කම්විබත් : (i) නොදනිත් දරුවන් ඇකයෙන් වැමුණා.
අවදි න. පිරුණෙන් එබරණෑ ස
නොවී අවසර පවා පවු රි ස.
(පිරුණෙන් = පිරුණා + ඉන්.)
කා. කෙළෙන් ආරාදනා සතොසින්.
(කෙළෙන් = කළා + ඉන්.)

සංලක්ෂ්‍යය.—මේ රීතිය සංස්කෘත මාගධීත්හි හෝ දෙමළෙහි හෝ නොපෙනේ. එහින් නිෂ්පන්න රීතියකි. රාක්ෂසයන්ගෙන් එන්නාවූ උරුමයක් විය යුතුයි,

(ආ.) අර්ථ ක්‍රියා.

(11) මේ 'නු' ප්‍රත්‍යයාන්තවූ භාව ක්‍රියා ශබ්දයට 'ඒ' ප්‍රත්‍යය යෝගයෙන් පුංලිඞ්ගයෙහි වර්තමානාර්ථ ක්‍රියා ශබ්දය තෙම සැදේ. නිදසුන් :—

(i) කියනු + ඒ = කියනුයේ, කියන්නේ.
(ii) කියනු + ආ = කියන්නා. (අං. 77.)

(12) ස්ත්‍රී ලිඞ්ගයෙහි ඊ ප්‍රත්‍යය යෝගයෙන් සිඬය. නිදසුන්:-

කියනු + ඊ = කියන්නී. (අං. 77.)

මේ රූපයෝ තුමූ වර්තමාන, අනාගත අර්ථයන්හි වෙත්.

(13) අර්ථ ක්‍රියා ශබ්දය තෙම අතීතාර්ථයෙහිද ලැබේ. හේ තෙමේ–

(i) පුං ලිඞ්ගය පිණිස අතීත ක්‍රියාඞ්ගයෙන් පරව 'ඒ' ප්‍රත්‍යය ගනී. නිදසුන් :–

අනුවණ කම් ක ළේ
ගුරුන් ගුණ සිහි නොක ළේ.

(ii) ස්ත්‍රී ලිඞ්ගය පිණිස උත්සාහක ක්‍රියාවෙහි 'ආ' ප්‍රත්‍යයද නිරුත්සාහක ක්‍රියායෙහි 'ඊ' ප්‍රත්‍යයද ගනී. නිදසුන් :–

(i) උත්සාහක ක්‍රියා :

මිහිපල් සවනත පුල්මල් කැත තී
සරහන ලෙස අඟනක් දල පෙමැ තී
කොමලති නැද සිපගෙන ගෙල රුවැ තී
සිඹිසා උවනත සොම්සඳ පැහැ තී.

(ii) නිරුත්සාහක ක්‍රියා :

නො ම ක ල ණී එපුවත් අසමින් සෙ ද ය
ගු ණ ක ල ණී අඟනක විත් කී ස ද ය
ර ජ දු ව ණී සීතා ළසොවින් ත ද ය
බි ම වැ මු ණී ඇඹුවා ඉකි බිද බි ද ය.

**සංලක්ෂ්‍යය.** — මෙහි 'සිඹියා' යනු ශුඹ ක්‍රියාවයයි ආධුනිකයන් සිතිය හැකි. එහෙත් ශුඹ ක්‍රියාව නම් ස්ත්‍රියකගේ කර්තෘත්ව සම්බන්ධයෙන් විනා සියබසෙහි අතීත ක්‍රියාව හා නොයෙදෙන්නාවූ මේ 'ආ' ප්‍රත්‍යයට කරුණු නොමැත්තේය. එයින් මේ වනායි ශුඹ ක්‍රියාවක් නොව ශුඹ ක්‍රියාර්ථයෙහි යොදන ලද අර්ථක්‍රියා රූපයබැව් දතයුතු. මේ ව්‍යවහාරය තෙම ද්‍රවිඩ වේ. දෙමළෙහි එය නිත්‍යය. සියබසෙහිද එසේමය.

## 47. සන්.

**සූත්‍රපාඨය.** කළ පනත සන්නම්. දෙව්දත්, බඹදත්, ඈ.

**ව්‍යාඛ්‍යා.** කළ පනත, කරන ලද ප්‍රඥප්ති තොමෝ; සන් නම්, සඤ්ඥා නම්. දෙව්දත්. දෙවදත්තය; බඹදත්, බ්‍රහ්මදත්තය; ඈ, මේ ආදියි.

## 47. විස්තරය. සඤ්ඥා (ශබ්ද).

යම් පුද්ගලයකු අන්‍ය පුද්ගලයන් අතුරෙන් වෙන්කොට තෝරාගනු පිණිස ඔහුට යම් නමක් තබනු ලැබේද ඒ නාමය තෙම

විශෙෂයෙන් කරන ලද ප්‍රඥප්තියකි. දෙවදත්ත යන්නෙහි අර්ථය නම් දෙවියන් විසින් දෙනලද්දේ යනුයි. බ්‍රහ්මදත්ත යන්නෙහි අර්ථයනම් බ්‍රහ්මයා විසින් දෙනලද්දේ යනුයි. එහෙත් මොවුන්ගේ අර්ථාපෙක්ෂාවක් නොමැතිව යම් පුද්ගලයකු හට දෙවදත්තයයි නම් තබන ලදි; අන්‍ය පුද්ගලයකු හට බ්‍රහ්මදත්තයයි නම් තබන ලදි. මෙසේ විශෙෂ වශයෙන් තබන ලද නාමය හෙවත් කරන ලද ප්‍රඥප්ති තොමෝ සඤ්ඤායි.

මෙයින් ආකාශය, චක්‍රවාලය, මහාමෙරු පර්වතය යනාදීහු සඤ්ඤා නාමයෝ නොවෙත්. වෙනත් එබඳු වස්තූන්ගෙන් තෝරා ගනු පිණිස තබන ලද නාමයන් නොවන හෙයිනි. සසර, නිවන් යනාදීහුද එසේම සඤ්ඤා නාමයෝ නොවෙත්.

## 47. නිතිසාරය. සඤ්ඤා (ශබ්ද).

ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි ලැබෙන්නාවූ සියලුම ධර්මයන් විභාග වශයෙන් බලා නම් තබා ඒ එක් එක් විභාගය නාමයෙන් හා ලක්ෂණයෙන්ද හඳුන්වා දෙන්නාවූ ප්‍රක්‍රියාවට ශාස්ත්‍රාරම්භයෙහි සඤ්ඤා යන නාමය තබන ලදි. දූන් මෙහි සඤ්ඤා යන්නෙන් ශබ්ද විශෙෂයක්ද කියන ලදි. ශාස්ත්‍රීය ප්‍රකරණයෙක්හි මේ අයොග්‍යය. එකම සඤ්ඤාවක් එකම ධර්මයක් කෙරෙහි පිහිටුවීම විෂය ප්‍රසාදයට හෙතු වේ; කිහිපයෙක්හි පිහිටුවීම වෛකල්‍ය හෙතුවකි.

## 48. පස් සද ශෝ.

**සූත්‍රපාඨය.** හැළි සිඟුවත් දූවන—ගොන් දෙව්දත් නම්වී.
මේ පස් සදන් එක—පදරුත්හි විකපන සේ.
ඉති පස් බේ.

**ව්‍යාඛ්‍යා.** හැළි, ධවලවූ; සිඟුවත්, ශෘඞ්ගවත්වූ; දූවන, ධාවනය කරන්නාවූ; ගොන්, වෘෂභ තෙම; දෙව්දත් නම් වී, දෙවදත් නම් විය.

මේ, මේ වනාහි; පස් සදන්, පඤ්ච ශබ්දයන්; එක පදරුත්හි, එක පදාර්ථයෙක්හි; විකපනසේ, විකල්පනය කරන්නාවූ ආකාර යයි.

ඉති, මෙසේ; පස් බේ (ශබ්දයාගේ) පඤ්ච භෙදයයි.

### විස්තරය. පඤ්ච ශබ්ද යෝගය.

ශබ්දය නම් ද්‍ර දුව්‍ය නාදි වශයෙන් පඤ්චවිධ බැව් කියා ඒ එක් එක් හෙදය නමින් හා ලක්ෂණයෙන්ද හඳුන්වා දී දැන් ඒ පඤ්චභෙදයම එකම වාක්‍යයෙක්හි සඞ්ග්‍රහකොට දක්වූහු. මෙහි හෙළ යනු ගුණ ශබ්දය, සිතු යනු ද්‍රව්‍ය ශබ්දය, දුවන යනු ක්‍රියා ශබ්දය, ගොන් යනු ජාති ශබ්දය, දෙව්දත් යනු සඤ්ඥා ශබ්දය. එසින් ශබ්ද පඤ්චකය එක් පදාර්ථයෙක්හි යෙදීමේ නිදසුන විය. මෙහි ජාති ශබ්දය ප්‍රධානකොට අන්‍යයන් ඊට විශෙෂණ කළහ. අන්‍ය ශබ්දයක් ප්‍රධාන කල්හිද යොගය මේ අනුසාර යෙනි.

මෙසේ ශබ්දයාගේ පඤ්ච විධවූ හෙදය දක්වා දැන් අන්වර්, ආරූඪ යයි විවිධවූ හෙදය විස්තර කරනු ලැබේ.

### 49. අනුරූත් සද.

**සූත්‍රපාඨය.** පැන්, කැසුබු, මියුලැසී, ඈ අරුත් ඇරබැ නිපන් බැවින් අනුරුත් සද නම්.

**ව්‍යාඛ්‍යා.** පැන්, පානීයාර්ථයෙහි පැන්ය; කැසුබු, කච්ඡපාර්ථයෙහි කැසුබුය; මියුලැසී, මෘගාඞ්ගනාක්ෂී යන අර්ථයෙහි මියුලැසීය; ඈ, මේ ආදිය; අරුත් ඇරබැ, අර්ථයක් ආරම්භකොට; නිපන් බැවින්, නිෂ්පන්නවූ හෙතුයෙන්; අනුරුත් සද නම්, අන්වර් ශබ්ද නම්.

### 49. විස්තරය. අන්වර්ථ ශබ්ද.

සංස්කෘත මාගධී 'පා' යන ධාතු තෙමේ පානාර්ථයෙහි හෙවත් පීමෙහි වැටේ. නිය ප්‍රත්‍යය තෙම ධාතුවෙන් පරව සිටි කල්හි කර්තව්‍යාර්ථය ගෙන දේ. එසින් පානීය යනු පිය යුතු දේ හෙවත් ජලය කියයි. මෙය තද්භවයෙන් 'පැන්' වී.

සං. මා. කච්ඡ යනු මුහුදු, ගං, විල්, ආදියෙහි ප්‍රාන්තවූ හෝ නුවූ හෝ ජල සහිත නිම්න භූමි කියා. වගුරු යනු සිංහල නම්. 'පා' යන ධාතු තෙමේ පාලනයෙහි වැටේ. එසින් කච්ඡයෙහි තමා පාලනය කරන්නේ හෙවත් රකෙන්නේ යන අර්ථයෙන් කච්ඡප වේ. මෙය තද්භවයෙන් කැසුබු වේ. සාමාන්‍ය ව්‍යවහාරයෙහි කැස්බා නම්.

මියුලු යනු මෘගාඞ්ගනාසි. ඇස් යනු නෙත්‍රයි මෘගාඞ්ගනාව කගේ නෙත්‍රයන්ට බඳුවූ ඇස් ඇත්තී මියුලු + ඇසි = මියුලැසී වෙයි.

මේ එක් එක් ශබ්දයාගේ නිෂ්පාදනාර්ථය අර්ථයක් අනුවිය. එයින් අන්වර්ථයි.

## 49. නීතිසාරය. අන්වර්ථ ශබ්ද.

මේ දූක්වූ තිදසුන් තුනෙන් කැසුබු යනු අන්වර්ථ ජාති ශබ්ද යකි. පැන්, මියුලැසී, යනු අන්වර්ථ ද්‍රව්‍ය ශබ්දයි.

අන්වර්ථවූ අනික් ශබ්දයන්ට නිදසුන් මෙසේය :–

"දිවි රන්වන් කැලුම් මනහර." මෙහි රන්වන් යනු අන්වර්ථ ගුණයි.

ලෙඩට පිළිසම්, වරදට දඬුවම් යනාදි තන්හි පිළියම්, දඬුවම් යනාදිය අන්වර්ථ ක්‍රියා ශබ්දයි.

සහසැස්, කුඹුයොන්, දසගිව් යනාදීහු අන්වර්ථ සඤ්ඥා ශබ්දයි.

## 50. අරූඪ සද.

**සූත්‍රපාඨය.** සෙලු, තෙල්බු, මඟුල්, ඈ අරූත් විලොම් බැවින් අරූඪ සදනම්. ඉති දෙබේ.

**50. ව්‍යාඛ්‍යා.** සෙලු, ශකුනාර්ථවාචි සෙලුය; තෙල්බු; කීටක විශෙෂ වාචි තෙල්බුය; මඟුල්, අඞ්ගාරක වාචි මඟුල්ය; ඈ, මේ ආදිය; අරූත් විලොම බැවින්, අර්ථ විලොම භාවයෙන්; අරූඪ සද නම්; ආරූඪ ශබ්ද නම්.

ඉති, මෙසේ; දෙබේ, ( ශබ්දයන්ගේ ) අන්වර්ථ ආරූඪ යන විභෙද යති.

## 50. විස්තරය. ආරූඪ ශබ්ද.

සෙල් යනු පර්වතයි. එයින් සෙලු යනුයෙන් පර්වත ඇත්තකු කියවිය යුතුයි. එහෙත් කියවෙන්නේ නම් ලිහිණියි. තෙල්බු යනු සංස්කෘතයෙහි තෛලපායි යයි පෙනේ. එයින් ඉන් තෙල් බොන්නකු කියවිය යුතුයි. එහෙත් කියවෙන්නේ නම් කැරපොතු යන කීට විශෙෂයයි. උන්ගේ තෙල් බීමක් නොමැත්තේය. මඟුල් යන්නෙන් ශුභවූ අයකු කියවිය යුතුයි. එහෙත් කියවෙන්නේ නම් අවමඞ්ගල සඞ්ඛ්‍යාවෙහි ගැනෙන්නාවූ අඟහරු නම් ග්‍රහයාය.

මෙසේ මේ ශබ්දයන්ගේ භවිතව්‍යවූ අර්ථය නම් එකෙකි. එය මෙහි අවිද්‍යමානය. විද්‍යමානවන්නේ නම් ඊට කිසිසේත් අනුකූල නුවූ එසින් ප්‍රතිකූලවූ අර්ථයකි. එය ශබ්දශක්තියෙන් අනුපපන්න හෙයින් ශබ්දය කෙරෙහි ආරූඪ කරන ලද්දකි. එසේ ආරූඪවූ අර්ථ ඇති හෙතුයෙන් මේ ශබ්දයෝ තුමූ ආරූඪ ශබ්දයෝ වෙත්.

## 50. නිතිසාරය. අන්වර්ථ ශබ්ද.

(1) ආරූඪ ශබ්දයන්ට රූඪී යනුද නම්. මෙහි දැක්වූ ශබ්දයන් රූඪිවීමට හෙතුව නම් අර්ථවිලොම භාවයයී පාඨයෙහි ප්‍රතීත කරවා තිබේ. ඒ නොමැනවි. ආධුනිකයන්ගේ විශාල මුළාවට හෙතුවකි. රූඪිවීම් පිණිස අර්ථ විලොමත්වය ආවශ්‍යක නම් භාෂාවෙහි රූඪි ශබ්දයන් අතිශයින් විරල විය යුතුයි. එහෙත් ඇති සෙය එසේ නොවේ. යම් පූර්වාර්ථයක්හුගේ ආශ්‍රයයෙන් අසම්භවවූ හෝ දැන් නොපවත්නාවූ හෝ යම් වාක් ප්‍රචාරයෙක් ඇත්ද ඒ සියල්ල ආරූඪාර්ථ ඇති හෙයින් රූඪී වෙති. දෙල්, කොස්, පොල්, අලි, වලස්, කැලෑ, විල්, ළින්, හුළං, යනාදීහු ආරූඪ ශබ්දයෝ වෙත්. ඔවුන්ගේ නිෂ්පත්තියෙහිදී ආශ්‍රිතවූ දන්නාලද පූර්වාර්ථයක් නොමැති හෙයිනි.

(2) සංස්කෘත මාගධී නිරුක්තිකාරයෝ කොයියම්ම ශබ්දයක් වුවත් අසවල් ධාතුවෙන් නිෂ්පන්න වියයි යම් ධාතුවක් හා සම්බන්ධ කරති. බොහෝ විට ධාත්වර්ථයද ශබ්දාර්ථයද අතරෙහි කරනු ලබන්නාවූ සම්බන්ධය නම් අතිශයින් දුර්ලවූ විකාරවූ සඞ්කල්පයකි. සිතෙන්ම උත්පාද කරගන්නා ලද්දක්මිස යම් ශාස්ත්‍ර ක්‍රමයකින් නිර්දිෂ්ටවූවක් නොවේ. මේ ඇදුරන්ගේ කල්පනාවෙහි ප්‍රකාර නම් භාෂාවේ බාලාවස්ථාවෙහිදී යම් කෙනකුන් විසින් පූර්ව ප්‍රවෘත්තවූ ධාතුකොෂයක් මනාසේ සිතෙහි ධාරණය කරගෙන ලොකයෙහි ඇතිනාක් වස්තූන්ට ඒ ඒ ධාතූන්ගෙන් තෝර තෝරා නම් තැබුවා විය යුතුයි. මෙය ශාස්ත්‍රීය වශයෙන් අසම්භාව්‍ය යැ. තවද ඇතම් විට සංස්කෘතයෙහි කියනලද නිරුක්තිය එකකි; මාගධියෙහි අනිකකි. "ලොක" යන්නෙහි නිරුක්තිය කියන්නාහු "ලුජ්ජතීති ලොකො; ලුජ විනාශෙ; ජස්ස කො" යයි මාගධිකයෝ කීහු.

මෙහි අර්ථය නම් මෙසේය :— "වනසනු ලැබේ නුයි ලොක නම්. විනාසයෙහි වැටෙන්නාවූ ලූජ යනු ධාතුයි. ජයන්නට ක යනු වේ."

මෙතෙකින් ලොක නොව "ලූක" යන්නක් සිද්ධවේ. ඒ කෙසේ වුවත් ඒ නෛරුක්තික යන්ටද නිශ්චයයක් නොමැති හෙයින් විකල්පවූ අන්‍ය සිද්ධියක්ද කිහු. ඒ මෙසේය :—

"ලූජ අදස්සනෙ ලුජ්ජතීතිලොකො. ගස්ස කො. ජස්සවා."

මෙහි අදහස මෙසේය :— "ලූජ යනු අදශීනයෙහි වැටේ. අදෘශ්‍ය වේ නුයි ලොක නම්. ග යන්නට ක යනු වේ. ජයන් නට හෝ."

මෙයින්ද සිඩිය "ලොක" නොව "ලූක" විය යුතුයි. සංස්කෘත යෙහි කී නිරුක්තිය මෙසේය :—

"ලොක්‍යතෙ අසෞ ලොකඃ," "මේ තෙමේ දකිනු ලැබේ නුයි ලොක නම්." එසේ නම් 'ලොකඃ' නොව "ලොක්‍යඃ" විය යුතුයි. ඒ කෙසේ හෝ වේවා —

මේ නිරුක්ති තුනම ඇත්ත විය නොහැකි. එක් පක්‍ෂයක ඇත්ත නම් අනික් පක්‍ෂය බොරු විය යුතුයි. පෙනෙන අර්ථ යෙන් ලොකය බව එක් පක්‍ෂයක කියති. ඊට ඉදුරුම ප්‍රති විරුඬව නොපෙනෙන අර්ථයෙන් ලොක යයි අනික් පක්‍ෂයෙහි කියති. මෙහි ඇත්ත යයි පෙනෙන්නේ නම් දෙපක්‍ෂයෙහිම ශ්‍රැතියෙන් යම් විධියකින් ආසන්නවූ යම් ධාතුවක් අල්ලාගෙන තම තමන්ගේ අදහස් පරිදිවූ අර්ථ සම්බන්ධයක්ද උපදවා ගෙන ශබ්දය ඒ ධාතුවට ඇඳ ගත් බවයි. මෙද නොයෙක්විට ඉන්ද්‍රජාල යෙන් මෙන් පහළවෙන්නාවූ ආදෙශයන්ගේ උපකාරයෙනි. මිට තවත් එකම සාධනයක් මෙහි සඳහන් කරනු ලැබේ. ඒ අනුසාර යෙන් මූළු පරිපාටියෙහි ප්‍රායො භාවය දතයුතු :—

සංස්කෘත නෛරුක්තිකයෝ මාතෘ ශබ්දයෙහි නිෂ්පත්තිය දක්වන්නාහු උනාදියෙහි (2. 94.) මෙසේ කියත් : මාන් පූජායාං; තෘච්; නලොපඃ.

මෙහි අර්ථය මෙසේය :—

"පූජායෙහි වැටෙන්නාවූ මාන් ධාතුවයි. ඉන් පරව තෘච් ප්‍රත්‍යයවේ. න කාරයාගේ ලොපයද වේ." එයින් සිඩිය මෙසේය:-

මාත් + තෘච් = මා + තෘච් (තකාරලොපයෙන්)
= මාතෘ ('ච්' යන්න සඤ්ඤමාත්‍රයක් හෙයින් අත්හැර ලීමෙන්.)

මේ ශබ්දයට මාගධිකයන්ගේ නිරුක්ති කථනය මෙසේය :- මාන පූජායං පුත්තං මානෙතීති මාතා. රාතු. පාතීති වා මාතා. පාතිස්සමො. පා පානෙ වා, තු, පාස්සමා, පායෙතීති මාතා.

මෙහි අර්ථ මෙසේ යයි සිතමු : මාන යන ධාතු තෙමේ පූජාර්ථයෙහි වැටේ. පුතු පුදනුයි මාතා යනු වේ. 'රාතු' ප්‍රත්‍යයයි. රකිනුයි හෝ මාතා නම්. පාති යන්නට මකාරාදෙසයෙනි. පා යනු පීමෙහි හෝ වැටේ. ඉන් පරව තු ප්‍රත්‍යය වේ. පායන් නට මායන්න වේ. එයින් පොවන්නී නුයි මාතා වේ.

මෙයින් මාතා යනු 'මා + තා' (පුදන්නී), 'පා + තා' (රකින්නී), 'පා + තා' (පොවන්නී*) යනමේ එකකින් සිදුවියයි කීහ. අසවල් එකෙන් යයි නිරුක්ති කරුභටම නිශ්චයයක් නොමැති විය. මෙහි ලාමක භාවය ප්‍රත්‍යක්ෂ මැයි.

මේ ශබ්දයට සංස්කෘත මාගධී උභය පක්ෂයෙහිම කරතිබෙන් නාවූ නිරුක්ති කථනය කණුන්ගේ ගල්ගැසීමකට සම යයි කිය යුතුය. මෙහි ඇත්ත නම් මෙසේ විය යුතු බව පැහැදිලිය :—

සංස්කෘත නිර්මාණ, මාගධී නිම්මාණ යන ශබ්ද යෙහි 'මා' යයි මැවීමෙහි වැටෙන්නාවූ ධාතුවක් පෙනේ. ඒ ධාතුවෙන් පරව සංස්කෘතයෙහි තෘච් ප්‍රත්‍යය යොගයෙන් මාතෘ යයි සෑදේ. දරුකොතපාදන වසයෙන් මව් තොමෝ මවන්නීය. එයින් මාතෘ වෙයි.

මෙසේ නිෂ්පත්තිය ප්‍රත්‍යක්ෂ තැන්හිදු. මේ නෛරුක්තික යන්ගේ නොයෙක් විකාර විගඩම් ඇති කල අන් තැන්හි කිය නුම කිම?

කාරුණ්‍ය මෙසේ හෙයින් ආධුනිකයන් විසින් මේ නෛරුක්තිකයන් කොපමණ පුරාණ වුවත් කොපමණ උසස් වුවත් කොපමණ ශ්‍රෙෂ්ඨ වුවත් මොවුන්ගේ සඞ්කල්පයන් පරීක්ෂාවෙන් බලා ග්‍රහණය කට යුතුයි.

---

* 'පොවන්නී' යන ප්‍රයොජ්‍යාර්ථයක්ද 'පාතා' යන්නට කිය නොහැකි. කිය හැක්කේ නම් 'බොන්නී' යන අර්ථයයි. එය ව්‍යාකරණ නයින් පැහැදිලිය.

(3) මේ නෛරුක්තිකයන්ට මග අරවා ගන්ට බැරිවූ එක් කාරණයක් ඇත්. එනම් ධාතූන් විෂයයෙහි වූකලී එම අර්ථාන්විතවූ ධාතු නැමති ප්‍රකෘතය ඊට පූර්වවූ යම් අර්ථාශ්‍රයකින් උපන් බවක් නොමැතිව ලොකයා විසින් ආරූඪ වශයෙන් යොදාගන්නා ලද්දක්යයි කියයුතු බවයි. ඔවුන්ගේ කල්පනාවෙහි ප්‍රකාර නම් ධාතූන් ආරූඪ වශයෙන් නිපදවා ගැනීමෙහි දොෂයක් නොමැතිවිය; එම ධාතූන්ගේ අවලම්බනයෙන් මිස එසේ නොමැතිව ආරූඪාර්ථයෙන් ශබ්දයන් නිපදවා ගැනීම පමණක් සාමාන්‍ය වශයෙන් න්‍යායවිරොධය යනු ඔවුන්ගේ ඇදහීම විය.

කෙසේ වුවත් ඔවුන්ගේ ඇදහීමෙහි ප්‍රකාර පවා ධාතූහු නම් ආරූඪ ප්‍රකෘතීහු වෙත්. එයින් භාෂාවෙහි මූල නම් රූඪියයි. රූඪිය පිණිස යම් අර්ථයක්හුගේ අනුලොම භාවයක් හෝ විලොම භාවයක් හෝ කිසිසේත් අපෙක්ෂිත නොවේ. ධාතූන්ගේ අර්ථ විලොම භාවයක් නොමැතියෙන් ඒ ප්‍රතීතය.

(4) කිසි විශෙෂ අර්ථවත් ශබ්දයක් තෙම සාමාන්‍ය ජනතාවගේ ව්‍යවහාරයෙහිදී අර්ථ සඞ්කෙතයක් නොමැතිවියෑම කරණකොටගෙන රූඪියෙහි පතිත වේ. පැන් යනු එබන්දකි. හේ වනාහි පානීය යන්නෙන් භින්නයෑ. පානීය නම් පිය යුතු දේය. එනම් බොන දියයි. එහෙත් දූන් වනාහි පැන් යනු රූඪියෙහි පතිතව එයින් කොයි දියත් කියනු ලැබේ. බොනදිය ගැන නම් බොනපැන් යයි කියනු ලැබේ. ගුත්තිලයෙහි —

දුන් අහනක් බොන පැන් පමණ දෙතිති.

එසේම සියබසෙහි 'තල' යයිද, සංස්කෘත මාගධීන්හි 'තිල' යයිද දන්නාලද ධාන්‍ය විශීෂයෙන් පහන් දැල්වීමාදිය පිණිස සිඳ ගන්නාලද දියවර ද්‍රව්‍යයට නොහොත් ස්නෙහයට සංස්කෘතයෙන් තෛලයයි කියනු ලැබේ. මෙය මාගධියෙහි තේල වේ. සිය බසෙහි තෙල් වේ. තල නම් ධාන්‍යයෙන් උපන් හෙයිනි. එහෙත් දූන් පොල්තෙල්, මීතෙල්, අබතෙල්, හරක්තෙල් ආදි වසයෙන් තෙල් යනුවෙන් කොයියම් ස්නෙහයක් වුවත් කියනු ලැබේ. තිලයෙන් උත්පන්නාවූ ස්නෙහය පිණිස නම් තල තෙල් යයි කියයුතු වේ. එයින් තෙල් යනු දූන් රූඪියෙහි පතිතයෑ.

ගවයන්ගේ ආවරණස්ථානය තෙම ගෝහල නම්. මෙය ඕ යන්න හ්‍රස්වවීමෙන් හා හකාරයාගේ ව්‍යඤ්ජනය දිරායෑමෙන් ගොඅල වී සන්ධියෙන් ගාල විය (අං. 76. 3.). එහෙත් දැන් ගාල යනු ගවයන් පමණක් නොව වෙනත් සිව්පාවන් ආවරණය කොට තැබීමේ ස්ථානයට කියනු ලැබේ. ඇත්ගාල, එළුගාල, බැටළුගාල, යනාදි වසයෙනි. ගවයන්ගේ ආවරණ ස්ථානය විශේෂකළ යුතුතැන්හි හරක්ගාල යයි කියනුලැබේ. ඉන් ගාල යනු රූඪියෙහි පතිතයැ.

කොළඹ යනු පූර්වයෙහි නැව්තොට යන ආරූඪාර්ථයකින් යුක්තවූ ශබ්දයකි. දැන් ඊපිට වෙතින් අර්ථයක් ආරූඪව නැව් තොට නොව ඒ ආශ්‍රයයෙන් උපාන්නවූ නගරයක් සුප්‍රකටාර්ථයෙන් කියනු ලැබේ. ඒ රූඪියි.

අර්ථ විපර්‍යාසයෙන්වූ රූඪියට තවත් නිදසුන් මෙසේයි :-

| සංස්කෘත. | මාගධී. | සිංහල. | අර්ථය. | වර්තමානාර්ථය. |
|---|---|---|---|---|
| මහාගේහිනී | මහාගේහිනී | මහගේ | ප්‍රධාන භාර්‍යා | ගැහැනි. |
| ස්වාමිනී | සාමිනී | හාමිනේ | ස්වාමිදූ | සාමාන්‍ය කුලස්ත්‍රී. |
| රාජක | රාජක | රදළ | උපරජ | උසස් මූලාදෘතියා. |
| | | රාළ | | සාමාන්‍ය කුල ජ්‍යෙෂ්ඨයා; ස්වාමිපුරුෂයා. |
| බොධි | බොධි | බෝ | අවබොධය | බෝගස. |
| ග්‍රන්ථ | ගන්ථ | ගත් | ගැටය | පොත. |
| පලාශ | පලාස | පලා | කොළපාට | ගෙඳ ආදිය. |
| විද්‍යා | විජ්ජා | විජ්ජ | දතයුතු දේ | ඉන්ද්‍රජාලය. |
| පර්ණශාලා | පණ්ණසාලා | පන්සල | කොළගේ | සඞ්ඝාවාසය. |
| ආරාම | ආරාම | අරම් | වත්ත | සඞ්ඝාවාසය. |
| | | අරඹ | | පුවක් ආදියෙහි වත්ත. |
| පාත්‍ර | පත්ත | පත් | භාජනය | සඞ්ඝයාගේ පිරිකරක්; කෑමපතද. |

| සංස්කෘත. | මාගධී. | සිංහල. | අන්වර්ථ. | වර්තමානාර්ථය. |
|---|---|---|---|---|
| වේෂ්ටන | වෙඨන | වොටුනු | හිස් වෙළුම නොහොත් තලප්පාව. | ඔටුන්න. |
| ගෘහද්වාර | ගහද්වාර | ගෙදර | ගෙයි දොරකඩ | නිවාසය. |
| මාෂක | මාසක | මසු | මෑ ඇටය; මෑ ඇටයක බර. රන්. | මසුරන් නොහොත් රන් මසු; මිල. |
| ශනෛඃ | සනිකං | හනික | (සෙමෙන්) | ඉක්මනින්. |
| ක්ෂේමේණ | (ඛෙමෙන) | සෙමෙන් හෙමින් | පහසුවෙන්; සන්සුන්ව. | නොඉක් මනින්. |
| කාණ | කාණ | කණ | (එකැස් අන්ධ) | අන්ධ |
| භණන | භණන | බණ | වචනය | ධර්මවචනය. |
| | | බැණුම් | කථනය | ආක්‍රොශ කථනය. |

මෙසේම දෙමළෙන් :-

වලෙසිවු: ආවරණය (අවට බැඳි පැලලි වැටයි); එයින් ආවරණ ඇති ස්ථානය; එයින් උතුමෙකුගේ ගෘහය—වලව්ව.

වාශල්: දොරටුව; එයින් රාජමන්දිරයෙහි දූරටුව; එයින් රාජ භවන—වාසල.

ශුවඩි : ලියූ පොත, තනි කොළේ ලියූ පොත—සෝඩිය.

ශවරි ('ශමරි' යන්නෙනි) : චමර නම් මෘගයාගේ වලිගය, චාමරය, කෙශකලාපය—හවරිය.

සංස්කෘත: භගවතී, ලක්ෂ්මී; දෙමළ: පගවදී, ලක්ෂ්මී, ලක්ෂ්මි යගේ රූපය ඇති මිලක්; සිංහල (ආකර්ෂණ සන්ධියෙන්, 76. 2.) : පගෝදි, මිලක නමක්; ඒ මිලෙහි බර.

සංස්: වරාහ, ශූකරයා; දෙමළ: වරාහන්, ශූකර රූපය ඇති මිලක්; සිං. වරාගම්.

සංස්: ලෛහ්‍ය, ලෙහෙසිය; දෙමළ: ලේගියම්; සිං. ලේගියම්.
සියබසෙහිමද: සුග, අල්පප්‍රමාණය; හුග, බහුප්‍රමාණය.
දෙස්: (පුරාණ) ශාසනී; (දූත්) ශාප.

නොහොත් ( නො + හොත් ) : 1. නැතහොත් (අන්‍යථාර්ථයෙන්); 2. යෙවත් (සමතාර්ථයෙන්.)

මිට නිදසුන් (ජනාධිකරණ සන්නයෙන්) :—

1. අන්‍යථාර්ථයෙහි :- බලිප්‍රතාපාපහ වික්‍රමෙණ. "බලි, බල වතුන්ගේ; ප්‍රතාපාපහ, ප්‍රතාප නසන්නාවූ; වික්‍රමෙණ, පරාක්‍රම ඇති; (නොහොත්) බලි, බලි නම් අසුරාගේ; ප්‍රතාපාපහ, ප්‍රතාප නසන්නාවූ; වික්‍රමෙණ, ත්‍රිපද වික්‍රම ඇති."

2. සමතාර්ථයෙහි :— සමතීව්‍ය දෘෂ්ටෙඃ පිතුරඛ යෂ්ටිඃ. "සමතීව්‍ය දෘෂ්ටෙඃ, ඇස් කැමැත්තාවූ ; (නොහොත්): සමතීව්‍ය, සිහි කටයුතුවූ; දෘෂ්ටෙඃ, ඇස් ඇති; පිතුඃ, පියාගේ.

(මෙහි දෙකෙන්ම කියවෙන්නේ එකම අර්ථයයි.)

(5) "කළ පණත සත් නම්" යි කියන ලදින් සියලුම සඤ්ඤ නාමයන් නීතිප්‍රකාර නම් රූඪි වියයුතුයි. රන්මැණිකා, මැණික් හාමි, ඇහැළමලී, කපුරුහාමි යනාදි නාමයෝ සඤ්ඤ වශයෙන් ආරූඪ ශබ්දයෝ වෙත්. අර්ථාපෙක්ෂාවක් නොමැතිව කරන ලද සඤ්ඤවන් හෙයිනි. අනපෙක්ෂිත වුවද ඔවුන් කෙරෙහි අන්වර්ථය විද්‍යමාන හෙයින් ඔවුන් හට අන්වර්ථ සඤ්ඤ ශබ්දයයි කියනුලැබේ. මහෞෂධ පණ්ඩිත යයි කී තන්හි නාමය තෙම සඤ්ඤ වශයෙන්ද අන්වර්ථය. එහෙත් එහි සඤ්ඤභාවය ආගන්තුක වශයෙනි. නීති ප්‍රකාර නම් එය ලක්ෂණ නාමයක් මිස සඤ්ඤවක් නොවේ.

එසේම කුඹුයොන්, සහසැස් ආදීහුද නිෂ්පත්තියෙන් සඤ්ඤ වෝ නොවෙත්. ලක්ෂණ සූචක අන්වර්ථ නාමයෝ වෙත්. පසුව අන්වර්ථයාගේ අපේක්ෂාවක් නොමැතිව රූඪිවූයෙන් සංඥ වූහ. සඤ්ඤ වුවද ඔවුන්ගේ අන්වර්ථ භාවය පූර්ව ප්‍රවෘත්ති සෙවයෙන් ලැබේ.

(6) "රිළවා ලනුකෙටියෙන් බැන්දේ රන්හාමියි" යන තන්හි රූඪි ශබ්ද පසටම නිදසුන් පිළිවෙළින් තිදීමටව පැනෙත්. ක්‍රියා ශබ්දය සර්ත්‍ර රූඪි බව සලකනු. (පිට 147. අං. 3.)

මෙසේ ශබ්දප්‍රකෘති සම්බන්ධයෙන් කිය යුතුව තිබුණාවූ පරිශෙෂය දක්වා දූන් වර්ණ විභාග සම්බන්ධයෙන්ද උපදෙශ්‍ය ශෙෂයක් ඇති හෙයින් හේ දක්වනු ලැබේ.

## 51. හකාර විතිය.

**සූත්‍රපාඨය.** අදෙස් අගම්විදි-පියවි සබඳ හකරන්
වෙසෙසා හැඳිනැ යොදනු-උගහා නොදැහැ ඇදුරන්.

**ව්‍යාඛ්‍යා.** අදෙස් අගම් විදි, ආදෙශ විධිය ආගම විධිය; පියවි, ප්‍රකෘතිය—යන මොවුන් හා; සබඳ, සම්බන්ධවූ; හකරන්, හකාරයන්; වෙසෙසා, විශිෂ්ටකොට; හැඳිනැ, සඤ්ඥනය කොට; ඇදුරන්, ආචාර්‍යයන්ගේ; උගහා, උද්ග්‍රාහය; නොදැහැ, වර්ජිත නොකොට; යොදනු, යොජිත කරනු.

## 51. විස්තරය. හකාර විනිශ්චය.

වාග් රූපයන්හි හකාරයාගේ සම්භවය කිසි විටෙක ආදෙශ වශයෙන් විය හැකි; කිසි විටෙක ආගම වශයෙන් විය හැකි; කිසි විටෙක ප්‍රකෘතියෙන්ම ලැබේ. මේවා විශෙෂණය කොට හෙවත් වෙන්කොට හැඳිනගෙන පූර්වාචාර්‍යයන්ගේ උපදෙශය හෙවත් ආදර්ශය අනුව තිසියේ ව්‍යවහාර කළ යුතුයි.

## 52. අදෙස් හකර.

**සූත්‍රපාඨය.** සුදු-හුදු, විසඳ-විහිඳ, සිඳි-හිඳි, සුදී-හුදී, සැමදූ-හැමදූ, සැඳිනැ-හැඳිනැ, සොබී-හොබී, සොබ-හොබ, සිඹැ-හිඹැ, පිරිසිඹු- පිරිහිඹු, සුණමින්-හුණමින්, ලසුනු- ලුහුනු, පසණ- පහණ, සල්-හල්, සුල්- හුල්, සැල්-හැල්, මුසල්- මොහොල්, සුසුල්- සුහුල්, සිඹුල්- හිඹුල්, සැදහිලි- හැදහිලි, සැලි-හැලි, සකර- හකර, සිඟුරැ- හිඟුරැ, සූරැ-හූරැ, සූ-හූ, සේ-හේ, සෝ-හෝ, සිමි-හිමි, සැමි-හැමි, සික්මුම්- හික්මුම්, සැම- හැම, සව්- හව්, සවා- හවා, සිවන්- හි න්, සිතු- හිතු, සුළු- හුළු, සගුළු- හගුළු, සිටි- හිටි, විසට- වුහුටු, සටහන්-හටහන්, පසන්-පහන්, සසුන්-හසුන්, සින්-හින්, සන්- හන්, සිස්නා- හිස්නා, සිස්- හිස්, සස්-හස්, සිකු- හිකු, සැකි- හැකි, සැති- හැති, සිගු- හිගු, සගු-හගු, ඈ සකරට අදෙස් හකරෙන් සිදු පා.

**ව්‍යාඛ්‍යා.** ඈ, මේ ආදිය; සකරට් අදෙස් හකරෙන්, සකාර යට ආදෙශවූ හකාරයෙන්; සිද්ධ, සිඬවූ; පා, පාඨයැ:-

| ප්‍රකෘති රූපය. | ආදෙශ රූපය. | විස්තර. |
|---|---|---|
| සුදු | හුදු | (ශුඩ) පිරිසිදු; ශ්වෙතවර්ණී. |
| විසද | විහිද | විහිදුවා. |
| සිඳි | හිඳි | ඡිනන. (ධා.ඡිද්.) |
| සුදී | හුදී | සුධී. (පණ්ඩිතයා.) |
| සැමද | හැමද | සම්මාර්ජ්‍ය. ඇමද. |
| සැදිනැ | හැදිනැ | 'සං' යන උපසර්ගය පූර්වවූ 'ජ්ඤ'යන ක්‍රියාඞ්ගයෙනි. ඥ යනු සංස්කෘත ධාතුයි. |
| සොබී | හොබී | සං. ශොභතෙ. |
| සොබ | හොබ | සං. ශොභා. |
| සිඹැ | හිඹැ | සං. මා. ධාතු: චුම්බ. |
| පිරිසිඹු | පිරිහිඹු | සං. පරිශ්‍රම. එයින් පිරිසිමු. පසුව : පිරිසිඹු. |
| සුණමින් | හුණමින් | අසමින්. සං. 'ශ්‍රැ' යන ධාතුවෙනි ශෘණො'යනු ක්‍රියා ඞ්ග . යි. එයින් 'ශෘණොමි' , අසමි. |
| ලසුනු | ලූහුනු | සං. ලශුන. සුදුලූනු. |
| පසණ | පහණ | සං. පාෂාණ, ගල්කැටය. |
| සල් | හල් | සං. ශාල, හල්ගස; ගස. ශාලා, සාලාව. |
| සුල් | හුල් | සං. ශූල, උල. |
| සැල් | හැල් | සං. ශාලා, සාලාව. ශාලි, ඇල්වී. |
| මුසල් | මොහොල් | සං. මුසල, මෝල. |
| සුසුල් | සුහුල් | සං. ශ්වශ්‍රෑ, නැන්ද |
| සිඹුල් | හිඹුල් | මා. සිම්බලී, ඉඹුල්. |
| සැදහිලි | හැදහිලි | සං. ධා. ශ්‍රද්ධා; මා. සද්ධා. සිං සදහ– හදහ=අදහ, ඇදහීමේ. |
| සැලි | හැලි | නිඣ්ඣරය, ජලධාරාව. |
| සකර | හකර | සං. ශර්කරා, හකුරැ. |

| ප්‍රකෘති රූපය. | ආදෙශ රූපය. | විස්තර. |
|---|---|---|
| සිඟුරු | හිඟුරු | සං. ශෘඞ්ගවෙර, ඉඟුරු. |
| සූරු | හූරු | සං. ශූකර, ඌරු. |
| සූ | හූ | සං. සූත්‍ර, නූල්. |
| සේ | හේ | සං. මා. සෙතු, ඒදණ්ඩ, පාලම.<br>මා. සෙතු, කාරණය. |
| සෝ | හෝ | සං. ස්‍රොතස්, හොය.<br>සං. අශොක, හෝපලු. |
| සිම් | හිම් | සං. මා. සීමා. ඉම. |
| සැමි | හැමි | සං. ස්වාමින්, මා. සාමි, හිමි. |
| සික්මුම් | හික්මුම් | සං. ධා. ශික්ෂ්. මා. සික්ඛ. |
| සැම | හැම | සව් (සර්ව) + ම (අවධාරණෙ) = සව්ම= සැව්ම = සැම (අං. **76. 1.** i.)= සැම=හැම. |
| සව් | හව් | සං. සර්ව. |
| සවා | හවා | ශාපකොට. සං. ධා. ශප්. |
| සිවන් | හිවන් | සං. සීවන, මැස්ම. |
| සිතු | හිතු | සං. මා. ධාතු: චින්ත, සිතීමේ. |
| සුලු | හුලු | සං. සික්ථ. බත් උල යන තැන් හි පෙනෙන්නාවූ උල. |
| සඟුළ | හඟුළ | සං. සඞ්ඝාටිකා, යුගමය· වහන්සගළ යන් තෙ හි මෙති. අඟුල යනුද එම අර්ථයෙති. |
| සිටි | හිටි | සං. සික්ථ. ඉටි. |
| විසට | විහුටු | සං. විසෘෂ්ට, විහිදුවනලද. |
| සටහන් | හටහන් | සං. සංස්ථාන; මා. සංඨාන. |
| පසන් | පහන් | සං. ප්‍රසන්න; මා. පසන්න. |
| සසුන් | හසුන් | සං. ශාසන; මා. සාසන. |
| සින් | හින් | සං. සන්න, උන්නාවූ. හුන්. |

| ප්‍රකෘති රූපය. | ආදෙශ රූපය. | විස්තර. |
|---|---|---|
| සත් | හත් | සං. මා. ජනන. (ඇදි). |
| සිස්තා | හිස්තා | සං. මා. සිඤ්චන, ඉසින් නාවූ. |
| සිස් | හිස් | සං. ශිර්ෂ්. මා. සීස, හිස. සං. මා. තුච්ඡ, හිස්වූ. |
| සස් | හස් | සං. ශස්‍ය, අස්වැන්න. |
| සිකු | හිකු | සං. ශුෂ්ක, මා. සුක්ඛ, වියලී ගිය. |
| සැකි | හැකි | සං. ශක්‍ය, පුළුවන්. |
| සැති | හැති | සං. ස්තවක, (මල්) පො කුර, රුක්මලෙහි මෙති. |
| සිගු | හිගු | සං. ශීඝ්‍ර, ඉක්මන්. |
| සගු | හගු | සං. ශෘඞ්ග, අං. |

## 53. අගම් හකර.

**සූත්‍රපාඨය.** සිදුහත්, ඇස් දහර, සැදැහැ, සදහම්, රජදහන්, දහන්, ඉදුහු, සටහන්, මැදහත්, අදහස්, බහස්ම, ඈ අගම් හකරෙන් සිදු පා.

**ව්‍යාඛ්‍යා.** ඈ, මේ ආදිය; අගම් හකරෙන්, ආගම හකාර යෙන්; සිදු, සිඬවූ; පා, පාඨයි :–

| සිංහල. | මාගධී. | සංස්කෘත. |
|---|---|---|
| සිදුහත් | සිඬත්ථ | සිද්ධාර්ථ. |
| ඇස්දහර | අස්සුධාරා | අශ්‍රුධාරා. |
| සැදැහැ | සඬා | ශ්‍රද්ධා. |
| සදහම් | සඬම්ම | සද්ධර්ම. |
| රජදහන් | රාජධානි | රාජධානි. |
| දහන් | ඣාන | ධ්‍යාන. |
| ඉදුහු | ඉඬි | ඍද්ධි. |
| සටහන් | සණ්ඨාන | සංස්ථාන. |
| මැදහත් | මජ්ඣත්ථ | මධ්‍යස්ථ. |
| අදහස් | අජ්ඣාසය | අධ්‍යාසය. |
| බහස්ම. (අළු) | භස්ම | භස්මන්. |

### 53. විකාරය. ආගම හකාරය.

මේ නිදසුන් අතුරෙන් ඇතම්හු හකාරය රහිතවද සිටිත්. එව්හු : සදම්; ඉදු; බස්ම. ඇතම්හු හකාරයෙන් ශේෂවූ ස්වරමාත්‍රය භජනය කෙරෙත්. එව්හු : ඇස්දුර; සැදූ.

### 53. නීතිසාරය. ආගම හකාරය.

(1) ආගම නම් බැහැරින් පැමිණියාවූ වර්ණයකි. එහෙත් මේ දක්වනලද කිසිම නිදසුනෙක බැහැරින් පැමිණියාවූ හකාරයක් නොපැනේ. සංස්කෘත සිද්ධාර්ථ යනු මාගධියෙහි සිද්ධත්ථයයි සිටී. මහාප්‍රාණාක්ෂරයෙක් නම් හකාරයෙන් යුක්තවූ අල්ප ප්‍රාණයෙකි. එහෙයින් සිද්ධත්ථ යනු සාර වශයෙන් මෙසේ වේ: සිද්හත්ත්හ. මෙය සිංහලට බිදී ඊමෙදී අන්ත්‍යවර්ණ ලොපයෙන් සිද්හත්වේ. (නී. සා 22. 1. iii; නී. සා. 23. 8. පිට 82.) මෙය සුඛොච්චාරණය පිණිස සිදුහත් වේ. (නී. සා. 23. 9.) එයින් හකාරය පූර්වයෙහි තිබුණාවූ වර්ණයක් මිස බැහැරින් ආවක් නොවේ. අන්‍ය ශබ්දයන් ගැනද න්‍යායය මෙසේමය. එයින් මේ සියලුම නිදසුන්හි හකාරය ආගමයක් නොව හෙදයට පෙර මහාප්‍රාණවර්ණයක්හු කෙරෙහි පැවති මහාප්‍රාණය ඉන් වෙන්ව සිටගත්තක් වේමැයි. මීට ඉවහල්වූයේ පූර්ව වර්ණයටද මහාප්‍රාණයටද අතරෙහි ස්වරයක්හුගේ ප්‍රාදුර්භාවය පමණකි. සිදුහත් යන තන්හි උ යන්නමෙනි.

(2) මෙහි කී ස්වරාගමයෙහි රීතිය නම් ද්‍රවිඩානුසාරයෙනි. සංස්කෘත පද්ම යනු දෙමළෙහි පදුමම් වේ. මාගධියෙහිද 'පදුම' වූයේත් එම ධර්මයෙනි. එසේම චන්ද්‍ර යනු දෙමළෙහි ශන්දිරන් වේ; ග්‍රාම යනු කිරාමම් වේ. අසවර්ණ සංයොගයන්හි මේ ධර්මය නිත්‍යයැ. ශිත්තිරෙයි, විත්තුවාන්, කල්ලියාණම් යනාදීහු තවත් නිදසුනී. (චිත්‍ර, විද්වාන්, කල්‍යාණම්.)

කිලිටු (ක්ලිෂ්ට), පරසිඳු (ප්‍රසිද්ධ), මිතුරු (මිත්‍ර) යනාදි තන්හිද ධර්මය මේමය.

(3) කාව්‍ය භාෂායෙහිදී කිසි විටෙක දීර්ඝ වර්ණයක්හුගේ මාත්‍රාවය විභින්නකොට ද්විතීයමාත්‍රාවට හකාරාරොහණය කරනු ලැබේ. ඉන් මෙබඳු විභාෂා වාග් රූපයෝ සැදෙත් :-

| ප්‍රකෘති රූප. | ආගම රූප. | සංස්කෘත. |
|---|---|---|
| දස් | දහස් | දස. |
| නාස් | නහස් | නාස. |

සංස්කෘත නිදීස යන්නෙන් සිතනවූ නිදස් යනු හැම කල් නිදහස්යයි සිටී. නියම විධියි. සාමාන්‍ය ව්‍යවහාරයෙහි 'පහත්' යනාදියද මෙසේමය. පා + අත් = පාත් = පහත්.

(4) අසන යන්නෙන් සිතනවූ අත් ශබ්දය හත්යයි සිටි තන් හිද හකාරාගමයක් පෙනේ. ආශ්‍රිතාර්ථයෙහි 'හසළ' යන්නෙහිද, අළුයයි කිව මනා තන්හි හළු යන්නෙහිද එසේමය.

## 54. පියවි හකර.

**සූත්‍රපාඨය.** හුරු, හොරු, හොළ, හළ, හමළ, හැගි, හඩ, හුණු, හිවි, ඈ පියවි පා.

**ව්‍යාඛ්‍යා.** ඈ, මේ ආදිය; පියවි පා, ප්‍රකෘති පාඨයි. (ප්‍රකෘති හකාරයෙන් යුත් පාඨයි යුසේසි) :-

| | | |
|---|---|---|
| හුරු | ; | ඇඞිම; නිසරු බව. |
| හොරු | , | ඔරුව. |
| හොළ | , | දූක. |
| හළ | , | හරනාලද. (අළ). |
| හමළ | , | හැමූවාවූ (හුළඟ ගැනයි). |
| හැගි | , | අදහස. (ඇගි). |
| හඩ | , | නාදය. (අඩ). |
| හුණු | , | පතිතවූ. ('හෙ' යන ධාතුවෙනි.) |
| හිවි | , | උස්. |

## 55. පණිකුරු පා.

ආදි හකාරයෙන් යුත් ඇතම් පාඨයන්ගේ එම ව්‍යඤ්ජනය දිරායෑම කරණකොටගෙන ඒ ආරූඪව සිටි ප්‍රාණාක්ෂරය ශෙෂ වේ. අඩ, ඇගි, අළ, යනාදියෙහි මෙනි. එහෙත් ආදි ප්‍රාණාක්ෂරය සියලුම තන්හි එසේ සිතනවූවක් නොවේ; නොයෙක් තැන ප්‍රකෘති වෙයි. එසින් ඒ ගැන විමතියක් නොමැති වනු පිණිස දූන් නිදසුන් සවල්පයක් දක්වමින් කාරණය විතනාභිමුඛ කරත්.

**සූත්‍රපාඨය.** අඳුන්, ඇඳෑ, එරැණු, අරැණු, අරා, අලු, අලුත්, අද, ඉදි, ඔද, එළු, උළු, ඔළු, ඇලි, අළු, ඇවිනි, අස්වස්, අල, එළඹි, අසි, ඉක්, ඇසිඳෑ, ඈ පණකුරැ පා.

**ව්‍යාඛ්‍යා.** ඈ, මේ ආදිය; පණකුරැ පා, ප්‍රාණාක්ෂර පාඨයි. (මොවුන්ගේ ආදි වර්ණය ප්‍රකෘති ප්‍රාණාක්ෂරයෙනැයි ප්‍රඥසේයි) :-

| සිංහල පාඨය. | සංස්කෘත. |
|---|---|
| අඳුන් ... | අඤ්ජන |
| ඇඳෑ (ප්‍රසාධනය කොට- සළු ආදියයි) ... | ආච්ඡාද්‍ය |
| එරැණු (බැස්සාවූ, පොකුණකට මෙති.) | අවරැහ් (බැසිමේ.) අවරොහණ, බැසීම. |
| අරැණු (මඳ රක්ත වර්ණය). | අරැණ. |
| අරා (නැඟී). | ආරැහ්‍ය. |
| අලු — | එළිය, ආලොක. දියඅලුව (දියාලුව), ආලු. |
| අලුත් (අභිනව). | — |
| අද (අභිමුඛ දිනය). | අද්‍ය. |
| ඉදි — | සෘජු. |
| ඔද — | ඔජස්. |
| එළු — | එඩක. |
| උළු (තාරකාව). | උඩු. |
| ඔළු (හිස්). | — |
| ඇලි (මියර ; ඇල). | ආලි. |
| අළු (වියන දණ්ඩ). | — |
| ඇවිණි (අවුණනලද). | ආවෘණෝමි, අවුණමි. |
| අස්වස් | ආශ්වාස. |
| අල (ඉන්නල, කුකුළල යනාදියෙහි.) | ආලුක. |
| එළඹි (උපගත). | — |
| අසි (කඩුව). | අසි. |
| ඉක් (ඉකුත් පසීංය). | අතික්‍රාන්ත. |
| ඇසිඳෑ (තෙලා). (දූන් 'ඇභිඳ' වෙතින් අපියෙක්හි.) | ආච්ඡිද්‍ය. |

**සංස්කෘත** මාගධී 'සං' යන උපසර්ග කිසි තැනෙක 'හ'කාර වශයෙන් සිංහලට බිඳී ඉන්පසු 'හ' යන්න දිරාගොස් ප්‍රාණාක්ෂර ශේෂත්වයෙන් 'අ' යන්න වේ. සංස්කෘත 'සංමාජී' යන්නෙන් 'හමද්'යනු එසේ බිඳී ආ ධාතුයි. මෙයින් 'හමදිමි,' 'අමදිමි' යනු ක්‍රියා රූපයි. 'ආ' උපසර්ගයද සිංහලට මෙසේම 'අ' යන්න වශයෙන් බිඳේ. එයින් මේ උපසර්ග දෙදෙනා පූර්වවූ පාඨ යුග්මයක් සියබසට බිඳී ඊමෙහිදී එකක් ආදි හකාරයෙන්ද එකක් ආදි අකාරයෙන්ද යුක්තව පැමිණි පසු හයන්න දිරායෑමෙන් දෙකම ආදි අකාරව හෝ පෙනිය හැකි. එබඳුවූ පාඨ ස්වල්පයක් දූන් දක්වනු ලැබේ.

## 56. සමපා.

**සූත්‍රපාඨය.** හැරබැ- ඇරබැ, හමු-අමු, හසර- අසර, හසළ- අසළ, හැකිළු- ඇකිළු, හැදූරුම්- ඇදූරුම්, ඇ සකරට අදෙස් හකරෙන්ද අ උපසගෙන්ද සමවැ සිදු පා.

**ව්‍යාඛ්‍යා.** ඇ, මේ ආදිය; සකරට අදෙස් හකරෙන්ද, සකාරයට ආදෙශවූ හකාරයෙන්ද; අ උපසගෙන්ද, 'අ' උපසර්ගයෙන්ද; සමවැ සිදු, සමානව සිඩවූ; පා, පාඨයි :-

| සිංහල පාඨය. | අර්ථය. | සංස්කෘත. |
|---|---|---|
| හැරබැ | කුපිතව | සංරභ්‍ය. |
| ඇරබැ | පටන්ගෙන | ආරභ්‍ය. |
| හමු | ඉදිරිපත් | සම්මුඛ. |
| අමු | එම | ආමුඛ. |
| හසර | හැසිරීම | සඤ්චාර. |
| අසර | මහා හැසිරීම | ආචාර. |
| හසළ | සරණ ගිය | සංශ්‍රිත. |
| අසළ | සෙවනයකළ | ආශ්‍රිත |
| හැකිළු | ඇකිළී | සංකුච්‍ය. |
| ඇකිළු | ඇකිළී | ආකුච්‍ය. |
| හැදූරුම් | ග්‍රහණධාරණය | සන්ධාරණ. |
| ඇදූරුම් | ධාරණය | ආධාරණ. |

## 56. විසතරය, සමගිතත පාඨ.

(1) සංස්කෘත මාගධීන්හි 'සං' යයි සිටි උපසර්ගය සිංහලට බිඳී ඊමෙහිදී අනුස්වාර ලොපයෙන් 'ස' යයි සිටී. 'සංමුඛ' යන්නෙන් 'සමු' යයි බිඳුණු තැන්හි මෙනි. මේ සමු යන්නෙහි ස යන්නට හ යන්න ආදෙශ වේ. එයින් 'සමු' යනු 'හමු' වේ. කිසි විටෙක මේ හකාරාදෙශය සිය බසෙහිදී නොව හෙද මාර්ගයෙහිදීම වේ. සඤ්චාර යන්නෙන් හසර යයි බිඳුණාක් මෙනි. මෙය සසර යයි කිසිකල නොබිඳේ.

(2) මෙහි යුගල යුගල වශයෙන් දක්වූ පාඨයන් උපසර්ගයෙන් අසමාන නමුදු සිඩියෙන් සමාන බැව් මේ ආචාර්යයෝ කිත. ඒ සමානත්වය නම් හකාරයාගේ ව්‍යඤ්ජන ජරාවෙන් පසු වන්නාවූ රූපසාම්‍යය බව දත්යුතුයි. එයින් හැරබෑ ඇරබෑ යනු සමාන රූප වෙත්, හමු අමු යනාදියද එසේම වෙත්.

## 56. නීතිසාරය. සමගිනන පාඨ.

(1) 'සං' උපසර්ගයට වන්නාවූ මෙහි කී හකාරාදෙශය සියලු තැන්හිම නිත්‍ය නොවන බව දතයුතුයි. 'සම්ප්‍රාපෙනාමි' යනු සිය බසෙහි 'සැපමිණෙමි' යයි සිටි. මෙහි සකාරය නොපෙරළේ. නියම් විදියි. සහරු, සතොස්, සබඳ යනාදි තන්හිද එසේමය.

(2) කිසි තැනෙක සිය බසට ස යන්නෙන් අවුත් විකල්පයෙන් ස යන්න හ යනු වේ. "සංලක්ෂණ" යන්නෙන් භිනනවූ සලකුණු– හලකුණු, යන තන්හි මෙනි. අනියම් විදියි.

(3) කිසි තැනෙක හකාරාදෙශයෙන්ම පැමිණේ. නියම් විදියි. සඤ්ජානාමි– හඳුනමි, සඞ්ඛාරයාමි- හදරමි, යනාදි තන්හි මෙනි. පසුව සියබසෙහිදී හකාර ජරායෙන් ස්වරශෙෂය හෝ වේ. අනියම් විදියෙනි. හඳුනමි– අඳුනමි, හැකිළෙමි– ඇකිළෙමි, යනාදි තන්හි මෙනි.

මෙසේ සකාරයා හට යම්කිසි ධර්මාර්ගයක් අනුව පවත්නාවූ හකාරාදෙශයද, හකාරය දිරායෑමෙන් වන්නාවූ ස්වරශෙෂයද පෙන්වා දුන් ව්‍යභිචාරයෙන් හෙවත් වෛධර්ම්‍යයෙන් සිදුවූ ඇතැම් රූපයන්ගේ දර්ශනයක්ද කරවනු ලැබේ.

## 57. ව්යබිසර හකාර.

**සූත්‍රපාඨය.** "රතත දිදී ඉහිල්-වසනතුරෙන් රසන්දම්
කියව සාර හළලා-පැහැබර දිගු නුවින්ලා;"
"කළ වන බිගු මහත්-වන වත හිරු හන් වත"—

මේ ඈ සේපාහි ව්යබිසර දස්නෙන් අනියම් විදිද සලකනු. ඉති හකාර විතිස.

සන් අදියර පළමුවනු.

**ව්‍යාඛ්‍යා.** රසන්දම්, රසනාදමයෙන් යුක්තවූ; ඉහිල්, ශිථිලවූ; වසන් අතුරෙන්, වසනාභ්‍යන්තරයෙන්; රත්අත, රක්ත වර්ණවූ හස්තය; දිදී, දෘතය කොට කොට; සාර, ග්‍රීවාව; හළලා, ආලොඩනයකොට; පැහැබර, ප්‍රභාභාරවූ; දිගු, දීර්ඝවූ; නුවන්, නෙත්‍රයන්; ලා, ප්‍රක්ෂෙප කොට හෙවත් යොමුකොට; කියව, කථනය කර.

හිරු, සූර්‍ය්‍යා; හන්වත, අස්තප්‍රාප්තවූ කල්හි; වත, වනාන්තරයෙහි; බිගු, භෘඞ්ගයන්ගේ; කළවන, කාලවර්ණය තෙම; මහත් වන, උදරමැයි. මෙහි අන්තිම ව්‍යාඛ්‍යාතවූ වන යනු අවධාරණාර්ථයෙහි නිපාත යයි.

මේ ඈ, මේ ආදිවූ; සේපාහි, ජේක පාඨයන්හි; ව්යබිසර දස්නෙන්, ව්‍යභිචාර දර්ශනයෙන් (ලැබෙන්නාවූ); අනියම් විදිද, අනියත විධින්ද; සලකනු, සංලක්ෂණය කරනු.

ඉති, මෙසේ; හකරවිතිස, හකාර විතිශවයයි. සන්අදියර, සඤ්ඥධිකාරය තෙම; පළමුවනු, (මෙසේ) ප්‍රාථම්‍යයෑ.

## 57. විස්තරය. ව්‍යභිචාර හකාරය.

සංස්කෘත ශිථිල යනු මාගධියෙහි සිථිලයයි සිටී. මෙය සිංහලට පළමුකොට සිහිල්, ඊළඟට හකාරාදෙශයෙන් හිහිල්, අන්තිමට හකාරයාගේ ඉරත්වයෙන් ඉහිල්යයි බිදී මේ අන්තිම රූපයෙන් දක්නා ලැබේ. තවද කැලඹීම් අර්ථයෙහි ලුඩ් යයි ධාතුවක් සංස්කෘතයෙහි ඇත්තේය. මෙය ආ උපසර්ගය පූර්වූ කල්හි ආලුඩ්යයි සිටී. මෙයින් ආලොඩයාමි යන ක්‍රියාව ලැබේ. මෙය සිංහලෙහි 'අළලම්' යයි සිටී. පූර්ව ක්‍රියායෙහි 'අළලා' විය යුතුයි. එහෙත්

ව්‍යභිචාරයෙන් මෙහි ආදි අකාරය සතාවයට යැමෙන් හළලා යයි සිටගත අසක්ද කවෙන් ගන්නාලද මේ පාඨයෙහි ඒ පෙනේ. තවද මෙහි රතත යනු රත්+අත යන්නක් සැඩිවූ තැනි. අත් යනු සංස්කෘත 'හස්ත' මාගධී 'හත්ථ' යන්නෙන් භින්නයි. එයින් එහි අකාරය තෙම හකාරයාගේ ස්වරශෙෂය වේ.

තවද සංස්කෘත අස්ත යනු පශ්චිම පර්වතයට නම්. මෙය සිය බසට බුන් කල්හි 'අත්' විය යුතුයි. එහෙත් 'කළවත බිඟු' යනාදි පුරාණ මයූරසන්දෙශ පද්‍යයෙහි එය 'හත්' යයි යොදා තිබේ. ව්‍යභිචාරයෙනි.

මෙසේ මේ නිදසුන්හි ආදි ප්‍රාණාක්ෂරවූ 'අත්' යනු 'හත්' යයි සිටී, 'අළලා' යනු 'හළලා' යයි සිටී. අනික් අතට හස්තාර්ථයෙහි 'හත්' යයි සිටිය මනා තන්හි 'අත්' යයිද, ශිථිලාර්ථයෙහි 'හිහිල්' යයි සිටිය මනා තන්හි 'ඉහිල්' යයිද සිටී.

ව්‍යභිචාරයෙන් වන්නාවූ මෙබඳු සිඩින් සැලකිය යුතුයි.

## 57. නිකිසාරය. ව්‍යභිචාර හකාරය.

(1) මෙහි "කළවත බිඟු" යනාදි පාඨය (පුරාණ) මයූර සන්දෙශයෙන් ගන්නාලද පද්‍යයක් යයි සිදත්සඟරා පුරාණ සන්නයෙහි කියා තිබේ. පද්‍යයක් හෙයින් යම් ඡන්දසක පිහිටිය යුතුයි. තවද වර්ණ වශයෙන් ඌනතා හෝ අතිරේක හෝ රහිත වියයුතුයි. එහෙත් එය මුද්‍රිත පොත්වල පෙනෙන්නේ මෙසේය නොහොත් මීට වැඩි වෙනසක් නොමැති සේය :—

කළ වත් බිඟු මහත් වන හිරු හත්වත.

මෙය පද්‍යයක් නොවන බව ප්‍රත්‍යක්ෂය. එයින් අප්‍රතිහත ප්‍රකෘති ලක්ෂණයෙන් නිර්මලයයි පෙනෙන්නාවූ පාඨය අපි දක්වීමු. උමතු ගී අඩියකි. මෙහි කවීහු විසින් 'අත්වත' යයි කිවමනා තන්හි 'හත්වත' යයි කියනලද්දේ පූර්වස්ථවූ 'මහත්වත' යන්න හා අනුප්‍රාසය පිණිස බව පෙනේ. එය 'හත්වත' යයි කිවහොත් අනුප්‍රාසය නැසේ. අර්ථයද නැසේ. සූර්යයා අස්තයට පැමිණෙනු මිස අස්ත වීමක් නම් නොමැත්තේය. මේ පද්‍යයෙහි 'වත' ශබ්දයාගේද කතිපය යොගය අනුප්‍රාසාර්ථයෙන්ම බව සලකනු.

(2) සිද්ධාන්තකෞමුදී, මුග්ධබෝධ, සාරස්වත, යන සංස්කෘත ව්‍යාකරණයන්හි ප්‍රථම පරිච්ඡේදය තෙම ශාස්ත්‍රලාඝව හෙතුයෙන් යොදගන්නාලද ඇතැම් සඤ්ඥාවන්ගේ දර්ශනය පිණිස ව්‍යාප්‍රෘතය. මේ සිදත්සඟරාවෙහිද ඒ අනුසාරයෙන් එබඳු සඤ්ඥාවන් කෙසේ වෙතත් ශාස්ත්‍ර ලක්‍ෂණයන් දක්වන්නාවූ මේ ප්‍රථම පරිච්ඡේදයට සඤ්ඥාධිකාරයයි නම් තබනලදි. සාරස්වත ව්‍යාකරණයෙහි සාරාංශ දර්ශනයෙන් කරනලද අති සඞ්ක්‍ෂිප්තවූ ප්‍රකරණයෙක් ඇත්. එහි නාමය සිද්ධාන්ත චන්ද්‍රිකා නම් වේ; මේ සිදත් සඟරාවද සාරාංශ දර්ශනයෙන් කරනලද ප්‍රකරණයකි. මෙහි නාමයද එම "සිද්ධාන්ත" යනු මූලාශ්‍රිතයැ. එසින් මේ සිදත්සඟරා යන නාමය යථොක්ත සිද්ධාන්ත චන්ද්‍රිකායෙහි නාමානුසාරයෙන් තබනලද්දේයයි සිතිය හැකි බව පෙනේ.

මෙසින් සඤ්ඥාධිකාරය නිමි.

---

# ද්විතීය පරිච්ඡේදය.

## සන්ධ්‍ය ධිකාරය.

**සූත්‍රපාඨය. 58.** පෙර පර වණන් තිසි-විදිනි ගළපනු සඳ නම්
වණ ලොප් අදෙස් ඈ එහි-ලැකියනු සරින්
දන්නේ.

**ව්‍යාඛ්‍යා.** පෙර පර වණන්, පූර්‍වාපර වර්‍ණයන්; තිසි විදිනි, යොග්‍යවූ පරිද්දෙන්; ගළපනු, සංඝනය කිරිම; සඳ නම්, සන්ධි නම්. එහි, ඒ සංවිධානයෙහි; වණලොප්, වර්‍ණලොපය; අදෙස්, ආදෙශය; ඈ, යනාමේ ආදිය; ලැකියනුසරින්, ලක්‍ෂ්‍යානු සාරයෙන්; දන්නේ, ඥනය කරන්නේයි.

**58. විස්තරය. සන්ධි විභාගය.**

ප්‍රථමා ධිකාරයෙහි ව්‍යාකරණ ලක්‍ෂණයන් හඳුන්වා දී ඉක්බිති ව්‍යාකරණ ශාස්ත්‍රයට බසින්නාහු එහි අධිගමය පිණිස සන්ධීන්ගේ තිසි අවබොධයක් ආවශ්‍යක හෙයින් දූන් සන්ධීන් කියත්.

සන්ධි නම් පූර්‍වාපර වර්‍ණයන් තිසියේ ගැළපිමයි. මේ ගැළ පීම පිණිස වර්‍ණයන්ගේ ලොපය, ආදෙශය, යනාමේ ආදිය ඉව හල් වෙති. ඔවුන්ගේ ස්ථානොචිතවූ සිඬිය ලක්‍ෂ්‍යානුසාරයෙන් දූනගත යුත්තේයි. මෙහි ලක්‍ෂ්‍ය යන්නෙන් අදහස් කරනලද්දේ දක්නට ලැබෙන්නාවූ ශිෂ්ට ව්‍යවහාරය මැයි. එයින් සන්ධිකර ණය ශිෂ්ට ව්‍යවහාරයට අවිරුඬයේ කටයුතුයි.

සන්ධි නවයක් මේ ආචාර්‍යයන් හට අභිමත වූහ. ඒ නවය නම් මෙසේයි :-

1. පෙර සර ලොප් සඳ, පූර්‍ව ස්වරලොප සන්ධිය.
2. පර සර ලොප් සඳ, පර ස්වරලොප සන්ධිය.
3. සර සඳ, ස්වර සන්ධිය.
4. සරදෙස් සඳ, ස්වරාදෙශ සන්ධිය.
5. ගතදෙස් සඳ, ගාත්‍රාක්‍ෂරාදෙශ සන්ධිය.
6. පෙර රූ සඳ, පූර්‍ව රූප සන්ධිය.
7. ගතකුරු ලොප් සඳ, ගාත්‍රාක්‍ෂර ලොපසන්ධිය.

8· අගම් සඳ, ආගම සන්ධිය.

9. දෙරූ සඳ, විරූප සන්ධිය.

**මේ සන්ධිහු දූන් ක්‍රමයෙන් දක්වනු ලැබෙත්.**

## 69. පෙර සර ලොප් සඳ.

**සූත්‍රපාඨය.** විදුරවියේ, දිගා, දිනිසුරු, කනිල්, බමරු දුල, නොමරුල්, සඳෙව්, යළේහි, පහරෙත, හඬෝනා, ඈ පෙර සර ලොපා පරසර ගත්ට පැමිණවූ බැවින් පෙර සර ලොප් සඳ නම්.

**ව්‍යාඛ්‍යා.** ඈ, මේ ආදිය; පෙර සර ලොපා, පූර්වස්වරය ලොප්කොට; පරසර, පරස්වරය; ගතට පැමිණවූ බැවින්, ගාත්‍රාක්ෂරයට ප්‍රාප්තකළ හෙයින්; පෙර සර ලොප් සඳ නම්, පූර්වස්වර ලොපසන්ධි නම් :-

| **පූර්වසම්තිය.** | **සන්ධි මුඛය.** | **සන්ධි රූපය.** | **අර්ථය.** |
|---|---|---|---|
| විදුරු + අවියේ | ... විදුර් + අවියේ | ... විදුරවියේ | වජ්‍ර–ආයුධයක් ඇත්තේ. එනම් ශක්‍රයා. |
| දිගු + ආ | ... දිග් + ආ | ... දිගා | දීර්ඝ–ආයුෂ. |
| දින + ඉසුරු | ... දින් + ඉසුරු | ... දිනිසුරු | දින–ඊශ්වර. එනම් සූර්යයා. |
| කනා + ඊල් | ... කන් + ඊල් | ... කනිල් | රන් උන්සිල්ලාව. |
| බමර + උදුල | ... බමර් + උදුල | ... බමරුදුල | භ්‍රමර–උජ්ජ්වල, පද්මාදිය. |
| නොමරු + ඌල් | ... නොමර් + ඌල් | නොමරූල් | වැලි නැති උල් පත. |
| සඳු + එව් | ... සඳ් + එව් | ... සඳෙව් | චන්ද්‍රයා වැනි. |
| යළ + ඒහි | ... යළ් + ඒහි | ... යළේහි | නැවත හේයෙහි. |
| පහර + ඔත | ... පහර් + ඔත | ... පහරොත | පහර වැටුණු කල්හි හෙවත් වැදුණු කල්හි. |
| හඬ + ඕනා | ... හඬ් + ඕනා | ... හඬෝනා | හඬ වැටෙන් නාවූ හෙවත් එන්නාවූ. |

විස්තරය.

සපෂටමැයි.

### 59. නිතිසාරය. පූර්ව ස්වරලොප සන්ධිය.

මෙහි පූර්‍ව සවරය ලොප්කළ බවකුත් අපර ස්වරය ගාත්‍රාක්‍ෂර යට පැමිණවූ බවකුත් කියා තිබේ. ඒ ශාස්ත්‍රිය නොවේ. යමකු විසින් කරනලද අත්තමක් සේ එයින් හැඟියන හෙයිනි. පූර්ව සවරය ලොප්වීමෙන් අපර සවරය ගාත්‍රාක්‍ෂරය හා ගැළපුණේ යයි කියන ලද්දේ නම් ශාස්ත්‍රියයැ.

### 60. පර සර ලොප් සඳ.

**සූත්‍රපාඨය.** උඹ ලේසුම්, සුස්මෙත්, තියුණු, වැටුසිපත, ඈ
පර සර ලොප් සඳ නම්.

**ව්‍යාඛ්‍යා.** ඈ, මේ ආදිය; පර සර ලොප් සඳ නම්, පරස්වර ලොප සන්ධි නම් :–

| පූර්වස්ථිතිය. | සන්ධි මුඛය. | සන්ධි රූපය. | අර්ථය. |
|---|---|---|---|
| උඹලේ + උසුම් | උඹලේ + සුම් | උඹලේසුම් | උල්පතෙහි උණුහුම. |
| සු + උස්මෙත් | සු + ස්මෙත් | සුස්මෙත් | අතිශය උෂ්ණයෙන්. |
| ති + අයුණු | ති + යුණු | තියුණු | තුන් අගුණ. |
| වැටු + අසිපත | වැටු + සිපත | වැටුසිපත | හෙළු කඩුව. |

විස්තරය.

පසෂටමැයි.

### 60. නිතිසාරය. පරස්වරලොප සන්ධිය.

(1) මෙහි දක්වූ සු + උස්මෙත් යනු සුස්මෙත් වූයේ පූර්වස්වර ලොපයෙන්ද පරස්වර ලොපයෙන්ද යනු අවිනිශ්චිත හෙයින් මේ වනාහි කාරණයට යැපෙන්නාවූ නිදසුනක් නොවේ.

(2) සං. මා. අගුණ යන්නෙන් සිද්ධවූ අයුණු ශබ්දය ආදි වර්ණ ලොපයෙන් යුණු යයිද භාෂාවෙහි සිටී. අනත් යනු නත් යයිද සිටින්නාක් මෙනි. රුවන්මලෙහි–

දූසිරි ද දෙස් වරද–අයුණු යුණු සම වනුයේ.

එසේම සංස්කෘත 'අසිපත්‍ර,' මාගධී 'අසිපත්ත' යන්නෙන් බිනනවූ අසිපත් ශබ්දයද ආදිවර්ණ ලොපයෙන් සිපත් යයි සිටී. නිදසුන් :-

පැහැනි සිපත් මිස් පවහල කුඹු පෙළද. කොවුල්.

මෙසේ හෙයින් නි + යුණු යන්නෙන් කිසි සන්ධියක් නොමැතිව නියුණු සැදේ; වැටු + සිපත යන්නෙන් කිසි සන්ධියක් නොමැතිව වැටුසිපත සැදේ. එහෙයින් මේ ශබ්ද යුගමයද කාරණයට යැපෙන්නාවූ නිදසුන් නොවෙත්.

(3) පූර්වස්වර ලොප සන්ධිය භාෂාවෙහි බොහෝ ව්‍යාප්තව පෙනෙන නමුත් පරස්වර ලොප සන්ධිය බහුලව නොපැනේ. පෙනෙන්නේනම් ආරාවාරයෙනි. ඇතම් නිදසුන් මෙසේය :-

පිළි + උතුරු ... පිළිතුරු
පඩු + ඇඹුල් ... *පඩුඹුල්-පඩුපුල්
රිය + ඇදුරු ... රියදුරු. (පූර්වස්වර ලොප සන්ධියෙන් රියැදුරු-ද.)

මැතිතුමා, මිණිබරණ යනාදි තන්හි සන්ධිය ඇති නැති බව නියුණු යනාදි තන්හි මෙන්ම අවිනිශ්චිතයි.

(4) අර්ථ වශයෙන් නම් පරස්වර ලොප සන්ධි යන්නක් ඇති බවද අවිනිශ්චිතය. පරස්වරයාගේ ලොපය මිස ඉන්පසු කිසිම සන්ධියක් නොවන හෙයිනි. එහෙත් එම ලොපයට හෙතුවනම් ස්වරයන් දෙදෙනකුන්ගේ සම්මුඛී භාවයෙන් වූ සන්ධිකාර්යයක් හෙයින් ඒ නිමිත්තෙන් ඊට සන්ධි නාමය යෙදේ. අර්ථාසන්න වශයෙනි.

## 61. සර සඳ.

**සූත්‍රපාඨය.** පසැස් ඇ සරලොප් නැතද සර ගතට පැමිණවූ බැවින් සර සඳ නම්.

**ව්‍යාඛ්‍යා.** පසැස් ඇ, පසැස් යනාදිය; සරලොප් නැතද, ස්වරලොප රහිත නමුදු; සර ගත● පැමිණවූ බැවින්, ස්වරය ගාත්‍රාක්ෂරය කෙරෙහි ප්‍රාප්තකළ හෙයින්; සර සඳ නම්, ස්වර සන්ධි නම්.

* මේ රූපය ව්‍යවහාරයෙහි නොපැනේ.

### විස්තරය. ස්වර සන්ධිය.

පස් + ඇස් යයි සිටි තන්හි වර්ණ ලොප, ආදෙශාදි කිසිවක් නොමැතිවම පූර්වස්ථවූ හල් සකාරයා කෙරෙහි අපරස්ථවූ ඇ යන්න පැමිණවීමෙන් පසැස් යයි සෑදේ. මිට මේ ආචාර්යයෝ ස්වර සන්ධියයි කිහ. පසැස් යන්නෙන් බුදුහු කියවෙත්. නෙත් පසක් ඇත්තේ යනු අර්ථයි.

### 61. නිහිසාරය. ස්වර සන්ධිය.

ස්වර සන්ධි යන්නෙන් සිතට අභිමුඛවන්නේ නම් ස්වරයන් දෙදෙනකුන් සම්මුඛ වීමෙන් වන්නාවූ සන්ධියකි. සංස්කෘත ව්‍යාකරණයෙහි එහි අර්ථය ඒ වේ. මහා සිද්ධාන්තකෞමුදියෙහි "අච් සන්ධි ප්‍රකරණම්" යන කාණ්ඩයෙහි එබඳු සන්ධින්ගේ සිද්ධිය උගන්වන ලදි. "අච්" යනු ස්වරයි. මුග්ධබොධයෙහිද 'අච් සන්ධි පාදඃ" යන කාණ්ඩයෙහි එසේමය. සාරස්වතයෙහිද එසේම "ස්වර සන්ධි ප්‍රක්‍රියා" යන කාණ්ඩයෙහි උගන්වන ලද්දේත් ස්වර යන් දෙදෙනකුන්ගේ සඞ්ඝට්ටනයෙන්වූ සන්ධිය මැයි. පාලි ව්‍යාකරණයේහිද එසේමය. මහාරූපසිද්ධියෙහි ස්වරයෙන් ස්වරය පර කල්හි වන්නාවූ සන්ධි ක්‍රමයට බස්නාහු "අථ සර සන්ධි වුච්චතෙ" යයි කීහු. මේ කසයින් වියරණයි. පදසාධනයෙහි එබඳු සන්ධින්ගේ සිද්ධිය උගන්වා "සර සන්ධි" යන්නෙන් කාණ්ඩය නිර්දිෂ්ට කළහ. මේ මුගලන් වියරණයි.

මෙසේ අන්වර්ථයෙන් බැලුවද, ආචාර්ය සම්ප්‍රදායයෙන් බැලුවද කාර්ය්‍ය එකසේමය: ස්වරයන් දෙදෙනකු අතරෙහි මිස ව්‍යඤ්ජනයක්ද ස්වරයක්ද අතරෙහි වන්නාවූ පැහැසීමට ස්වර සන්ධි යයි කීම අතිශයින් අභාග්‍යවූ නාම කථනයකි.

තත්ත්වාර්ථයෙන් කටයුතුවූ ශාස්ත්‍රීය නාම කථනය නම් ව්‍යඤ්ජන ස්වර සන්ධි යනුයි, නැතහොත් ස්වරාරූඪ සන්ධි යනුයි.

### 62. සරදෙස් සඳ.

**සූත්‍රපාඨය.** මෙහෙසුරු, මොහොර, ලඹෝර, ඈ අ ඉ උන් ලොපං එ ඔ ඕ අදෙස් කළ බැවින් සර දෙස් සඳ නම්.

**ව්‍යාඛ්‍යා.** මෙහෙසුරු, මහෙශ්වරාර්ථයෙහි මෙහෙසුරුය; මොහොර, මහා ප්‍රාකාරාර්ථයෙහි මොහොරය; ලඹෝර, ලම්බොද

රූපයෙහි ලම්බෝරාය; ඈ, මේ ආදිය; අ ඉ උන් ලොපා, අකාර ඉකාර උකාරයන් ලොප්කොට; එ ඔ ඕ අදෙස් කළ බැවින්, එකාර, ඔකාර, ඕකාරයන් ආදෙශ කළ හෙතුයෙන්; සරදෙස් සඳ නම්, සවරාදෙශ සන්ධි නම්.

## 62. විස්තරය. ස්වරාදේශ සන්ධිය.

මහ + ඉසුරු යන තන්හි හ කාරසථවූ අයන්නද ඉන් පරවූ ඉ යන්නද සඞ්ඝට්ටනයෙන් සිටින්. මේ අකුරු දෙකම මකාදමා ඒ වෙනුවට එයන්නක් ලියූ කල 'මහෙසුරු' යන්නක් ලැබේ. මෙය සුබොච්චාරණයෙන් මෙහෙසුරු වේ. මහෙශ්වර යනු අර්‍ථයි. ශිව දෙවියාට නම්.

එසේම මහ + උර යන තන්හි අයන්නක්ද උයන්නක්ද සඞ්ඝට්ටනයෙන් සිටිත්. මේ දෙක මකා දමා ඒ වෙනුවට ඔ යන් නක් බහාලූ කල 'මහොර' යන්නක් ලැබේ. මෙය සුබොච්චාරණ යෙන් මොහොර වේ.

එසේම ලම්බ + උදරා යසි සිටි තන්හි සඞ්ඝට්ටනයෙන් සිටි අ උ දෙදෙනා මකාදමා ඒ වෙනුවට ඕ කාරයෙක් ලිවීමෙන් ලම්බෝදරා යයි ලැබේ. මෙය ද කාරයාගේ ලොපයෙන් ලම්බෝරා වේ.

මේ පුරාණ සන්නයෙහි කියා දී තිබෙන්නාවූ ක්‍රමයයි.

## 62. නිතිසාරය. ස්වරාදේශ සන්ධිය.

(1) පුරාණ සන්නයෙහි දක්වූ විස්තරය සූත්‍රයට අනුරූපව කරනලදී. එම විස්තරයද සූත්‍රයද එකාන් අශාස්ත්‍රීය බව කිය යුතුයි. අකුරු දෙකක් මකාදමා ඒ වෙනුවට අන්අකුරක් ලියන්ට යයි කීම කිසිසේත් ශාස්ත්‍රීය නොවේ. එයින් ශිෂ්‍යයාටම ප්‍රත්‍යක්‍ෂව පෙනෙන්නාවූ විපර්‍යයක් පෙන්වා දෙනු මිස එහි න්‍යායය සම්බන්ධවූ කිසිම හසරක් ඔහුගේ බුද්ධියට ඉදිරිකර නොමැති හෙයිනි.

තවද මෙහි යමෙකු විසින් මකාලීමක් හෝ ආදෙශ කිරීමක් හෝ නොමැත්තේය. අදහස් පූර්‍වකව එසේ කිරීමක් සූත්‍රයෙන් අඟවනු ලබන හෙයින් ඒ ලක්‍ෂණයෙන්ද සූත්‍රය අශාස්ත්‍රීය වේ.

සන්ධීහු තුමූ වාග්ධර්මයෙන් ස්වයං සිඩවෙත්; යමකු විසින් සිදු කරනු නොලබත්. ඔවුන්ගේ ශාස්ත්‍රීය නිර්දේශය නම් ඒ සිදුවූ ක්‍රමය න්‍යායානුසාරයෙන් පෙන්වාදීම මිස අත්තමක් ගෙත්ත මක් සේ නොත්‍රාසිමූඛ කිරීම නොවේ. මෙහි දක්වූ සන්ධින්ගේ සිඩිය මෙසේය :—

(2) අකාරය තෙම කණ්ඨජවූ ස්වරයයි. ඉකාරය තෙම තාලුජවූ ස්වරයයි. මොවුන් පැහැසුණු කල්හි කණ්ඨතාලුජවූ එ කාරය සෑදේ. 'අ—ඉ' යන දෙදෙනා සඞ්කලනයෙන් 'එ' යන්න වූයේ ඒ ධර්මයෙනි.

එසේම කණ්ඨජවූ අ යන්නෙහිද ඔෂ්ඨජවූ උ යන්නෙහිද සඞ්කලනයෙන් කණ්ඨෝෂ්ඨජවූ ඔ යන්න සෑදේ.

මේ න්‍යායයෙන් මහ + ඉසුරු යනු අ ඉ දෙදෙනාගේ සඞ්කල නයෙන් 'මහෙසුරු' වේ. මෙය සුඛොච්චාරණයෙන් මෙහෙසුරු වේ.

එසේම මහ + උර යනු අ උ දෙදෙනාගේ සඞ්කලනයෙන් 'මහොර' වේ. මෙය සුඛොච්චාරණයෙන් මොහොර වේ.

(3) "ලම්බෝරා" යන්නෙහි සිඩිය මේ සන්ධියෙන් නොවේ. උදරාර්ථවූ ඕර ශබ්දයක් සිය බසෙහි ඇති බැව් පූර්වයෙහි කියන ලදී. ( නීතිසාර **37**. 1.) ගණ දෙවියා හට එල්ලෙන්නාවූ හෙවත් නෙරා සිටියාවූ උදරයක් ඇති හෙයින් හේ තෙමේ ඒ අර්ථයෙන් "ලම්බ + ඕරා" වේ. මෙය පූර්වස්වර ලොප සන්ධියෙන් 'ලම්බෝරා' වෙයි.

**සංලක්ෂ්‍යය.** — මෙහි කී ඕර ශබ්දයාගේ සිඩිය මෙසේය : සංස්කෘත මාගධී උදර යනු ප්‍රාකෘතයෙහි උඅර වේ. මෙය සිය බසට පැමිණි මෙහිදී, ද්‍රවිඩ රීතියක් අනුව යෑමෙන් උ අ දෙදෙනා ඕකාරභාවයට පැමිණිය. එයින් උ අ ර යනු 'ඕර' වී. (නීතිසාර 74. 2. බලනු.)

## 63. ගතදෙස් සඳ.

**සූත්‍රපාඨය.** අත්වරු, සිත්වරු, මහණුවම්, දඹුවම්, ගිනියම්, ඈ පර කී තරතට ව යන් හා, කප්පිල්, කැසුප් පොතු, ලප්තාරග, හෙප්තොට, සුත්බත්, බුත්සරණ, ඈ බදන් සර ලොපා පතන් හා අදෙස් කළ බැවින් ගතදෙස් සඳ නම්.

ව්‍යාඛ්‍යා. අත්වරු, අත්කරු යයි සිටි තන්හි අත්වරුය; සිත්වරු, සිත්කරු යයි සිටි තන්හි සිත්වරුය; මහණුවම්, මහණකම් යයි සිටි තන්හි මහණුවම්ය; දඬුවම්, දඬුකම් යයි සිටි තන්හි දඬුවම්ය; ගිතියම්, ගිතිකම් යයි සිටි තන්හි ගතියම්ය; ඈ, යන මේ ආදිය; පර ක කාරනට, පර කකාරයන්ට; ව යන් හා, ව කාර ය කාරයන් (ආදෙශ කළ බැවින්) හා;-

කප්පිල්, කබපිල් යයි සිටි තන්හි කප්පිල්ය; කැසුප්පොතු, කැසුබුපොතු යයි සිටි තන්හි කැසුප්පොතුය; ලප්නාරඟ, ලබු නාරඟ යයි සිටි තන්හි ලප් නාරඟය; හෙප්තොට, හෙබතොට යයි සිටි තන්හි හෙප්තොටය; සුත් බත්, සුදු බත් යයි සිටි තන්හි සුත් බත්ය; බුත්සරණ, බුදුසරණ යයි සිටි තන්හි බුත්සරණය; ඈ, යනමේ ආදිය; බ දන් සර ලොපා, බ කාර ද කාරයන්ගේ ස්වරයන් ලොප්කොට; ප තන් අදෙස් කළ බැවින් හා, ප කාර ත කාරයන් ආදෙශ කළ බැවින්ද; ගතදෙස් සඳ නම්, ගාත්‍රාදෙශ සන්ධි නම්.

* කබපිල් යන්නෙන් මොනර පිල්ද, හෙබ යන්නෙන් ඔයක්ද කියනු ලැබේ.

### වි චා ර ය.

ස්පෂ්ටයි.

### 63. නීතිසාරය. ගාත්‍රාදෙශ සන්ධිය.

(1) මෙහිද "ලොපා අදෙස් කළ බැවින්" යයි කරනලද කථනය අභිප්‍රෙත ව්‍යාපාර සූචක හෙයින් ආශාසත්‍රීය බැව් කියයුතුයි.

(2) අත්වරු, සිත්වරු යන දෙතන්හි සන්ධියක්ද ඇති බැව් සැලකීම බොහෝ දුෂ්කරය. ප්‍රත්‍යක්ෂව පෙනෙන්නේ නම් සමාස ගතවූ කරු ශබ්දයෙහි කකාරයාහට වකාරයක් ආදෙශවූ බව පමණකි.

මේ ආදෙශයද බොහෝ ශඞ්කා සහිත බැව් මෙහි ප්‍රස්තාවට බාහිර වසයෙන් වුවද කියයුතු වේ.

පුරාණ පොත්වල අත්වරු, සිත්වරු, මල්වරු යනාදි රූපයන් පෙනෙන බව සැබවකි. රජක යන්නෙන් භින්නවූ රදව් යන්නෙන්ද, ලොක යන්නෙන් භින්නවූ ලෙව් යන්නෙන්ද ප්‍රකාශ යන්නෙන් භින්නවූ පවස් යන්නෙන්ද කිසිවිටෙක කයන්නට

වකාරාදේශයක් ඇති බවද පෙනේ. එහෙත් ඒ මාතෘ භාෂාවකින් සියබසට ඊමෙහිදී පමණකි. සියබසෙහිදීම එබඳු ආදේශයක් වන බව මේ "වරු" යන්නෙන් බැහැර කිසි තැනෙක නොපැනේ. තවද මේ අත්වරු, සිත්වරු, මල්වරු යන ශබ්දයන් අත්තරු, සිත්තරු, මල්ලරු යන රූපයන්ගෙන්ද සිටිය හැකි. මෙසේ නිපදීමෙනි :-

අත්කරු—අත්හරු—අත්තරු (පෙර රූ සඳින්). සිත්තරු, මල්ලරු, සොම්මරු යනාදි තන්හිද එසේමය. (නි. සා. 25. 4.) සිත්තරු, සොම්මරු යනු ග්‍රන්‍ථාරූඪව ඇති බවද පෙණෙත්.

මේ අත්තරු යනාදි ශබ්ද රූපයන්ට මෙසේ ශාස්ත්‍ර රීතියක් ඇත්. එහෙත් 'ව' යන්නෙන් යුක්තවූ අත්වරු සිත්වරු යනාදියට එබන්දක් නොපෙනේ. එසින් මේ අත්වරු, සිත්වරු යනාදි රූපයෝ යම් විමතියක් අනුව කරගන්නා ලද්දැහු ද්‍යෙහෝසි සැක කිරිමට ඉඩ තිබේ. සිය බසෙහි "වරු" යයි බහු වචන ප්‍රත්‍යයයක් පෙනේ. "රජවරු" යනාදි තන්හි මෙනි. "සිත්තරු" යනු මේ ප්‍රත්‍යය හා සම්බන්ධකර ගැනීමකින් "සිත්වරු" විය යුතු බවක් සිතනලද්දේයයි පිළිගතහොත් යථොක්ත විමතිය පෙනේ.

(3) මහණුවම්, දඬුවම්, ගිනියම්, යන තෙතන්හිද ආදේශ සන්ධියක් නොපැනේ. පෙනෙන්නේ නම් ආගම සන්ධියකි. ඒ මෙසේය :-

මහණකම් = මහණුකම් (ස්වර විපර්‍යාසයෙන්.)
= මහණුහම් (කකාරයා ලිහිල්වීමෙන්.)
= *මහණුඅම් (හකාරයා දිරායෑමෙන්.)
= මහණුවම් (වකාරාගම සන්ධියෙන්.)

දඬුකම් = දඬුහම්
= *දඬුඅම්
= දඬුවම් (වකාරාගම සන්ධියෙන්.)

ගිනිකම් = ගිනිහම්
= *ගිනිඅම්
= ගිනියම් (යකාරාගම සන්ධියෙන්.)

(4) කප්පිල් යනාදි තන්හි සිද්ධිය මෙසේය :-

| | | | | |
|---|---|---|---|---|
| කබපිල් | — | කබ්පිල් | — | කප්පිල්. |
| කැසුබු පොතු | — | කැසුබ් පොතු | — | කැසුප් පොතු. |
| ලබුතාරඟ | — | ලබ්තාරඟ | — | ලප්තාරඟ. |
| හෙබතොට | — | හෙබ්තොට | — | හෙප්තොට. |
| සුදුබත් | — | සුද්බත් | — | සුත්බත්. |
| බුදුසරණ | — | බුද්සරණ | — | බුත්සරණ. |

නි. සා. 23. 5 බලනු. 80 වෙනි පිට.

## 64. පෙරරූ සඳ.

**සූත්‍රපාඨය.** අත්තම්, වත්තම්, ගෙත්තම්, පන්නම්, විස්සම්, ඈ පර ක කරනට පෙරරූ ලද්දෙන් පෙරරූ සඳ නම්.

**ව්‍යාඛ්‍යා.** අත්තම්, අත්කම් යන තන්හි අත්තම්ය; වත් තම්, වත්කම් යන තන්හි වත්තම්ය; ගෙත්තම්, ගෙත්කම් යන තන්හි ගෙත්තම්ය; පන්නම්, පන්කම් යන තන්හි පන්නම්ය; විස්සම්, විස්කම් යන තන්හි විස්සම්ය; ඈ, යන මේ ආදිය; පර ක කරනට, පර ක කාරයන්ට; පෙරරූ ලද්දෙන්, පූර්වරූප ලත් හෙයින්; පෙරරූ සඳ නම්, පූර්වරූප සන්ධි නම්.

වාක්‍යාර්ථ : අත්තම්, හස්ත කර්මාන්ත; වත්තම්, පොහොසත් කම; ගෙත්තම්, ගෙතුම් වැඩ; පන්නම්, පර්ණකර්ම හෙවත් කොළ වැඩ; විස්සම්, විශ්වකර්ම.

## 64. විස්තරය. පූර්වරූප සන්ධිය.

අත් + කම් යයි සිටි තන්හි, පරවූ ක් කාරයාද පූර්වවූ ත කාර යාගේ රූපයම ගනී. එයින් අත්තම් ලැබේ. මෙසේ පූර්ව වර්ණ යාගේ රූපය අපරෙහිද පිහිටීමෙන් සන්ධිය වූ හෙයින් පූර්වරූප සන්ධි නම්. සෙසු පාඨයන්හිද සන්ධියෙහි සිද්ධිය එසේමය.

## 64. නිතිසාරය. පූර්වරූප සන්ධිය.

(1) කම් යනු සමාසයෙහි පරව සිටි කල්හි නොයෙක්විට විකල්පයෙන් තම් වේ. ක කාරය ලිහිල්වී හකාර භාවයට පැමිණී මෙති. ඊට පූර්ව සිටියේ හල් වර්ණයෙක් නම් ඒ හල් වර්ණයෙහි ප්‍රතිධ්වනිය මේ හ කාරයා කෙරෙහි ආරූඪවීමෙන් හ කාරයා

නිමග්න වේ. එහින් පූර්ව වර්ණය විත්වරූපයෙන් සිටගනී. මේ සියලුම නිදසුන්හි සන්ධියට හේතුව මේ විධි. මෙහි ආදේශය මිස සන්ධියක් නම් නොපැනේ. එහෙත් ආදේශයට හේතුවූයේ පූර්වා පරව සිටි වර්ණ දෙදෙනකුන්ගේ සංසර්ගය හෙයින් සන්ධි යන නාමය යෙදේ.

නිදසුන් කළ පාඨයන්ගේ සිද්ධිය මෙසේය :—

| සං. | මා. | සිංහල. | | |
|---|---|---|---|---|
| | | ආදිරූප. | සන්ධිමුඛය. | සන්ධිරූප. |
| හස්තකර්ම | හත්ථකම්ම | අත්කම් ... | අත්හම් ... | අත්තම් |
| ව්‍යක්තකර්ම | ව්‍යත්තකම්ම | වත්කම් ... | වත්හම් ... | වත්තම් |
| ග්‍රන්ථකර්ම | ගන්ථකම්ම | ගෙත්කම් ... | ගෙත්හම් ... | ගෙත්තම් |
| පර්ණකර්ම | පණ්ණකම්ම | පන්කම් ... | පන්හම් ... | පන්නම් |
| විශ්වකර්ම | විස්සකම්ම | විස්කම් ... | විස්හම් ... | විස්සම් |

(නි. සා. 25. 4.)

මේ සියලුම නිදසුන්හි පරව සිටි ශබ්දය එකම කම් යන්න බව සලකනු.

(2) සොම්මරු යන්නෙහි සිද්ධියද මෙසේමය. සම්කරු — සම්හරු — සම්මරු — සොම්මරු (ආදිස්වර විපර්යාසයෙනි.)

(3) දක්වා — දක්කා, පරද්වා — පරද්ද, පන්වා — පන්නා, ලිස්වා — ලිස්සා, යනාදි රූපයන්ගේ සිද්ධියද මේ න්‍යායයෙනි.

(4) පූර්වරූප නිමිත්ත තෙම සංයොගයෙන් සිටි කල්හි කිසි තැනෙක ලොප් වේ. නිදසුන් :—

නග්වා = නංග්වා = නංග්ගා = නංගා.
බද්වා = බන්ද්වා = බන්ද්ද = බන්ද.

නි. සා. 23. 8. පිට 82.

(5) මෙහි සියලුම තන්හි කාර්ය සිද්ධිය වන්නේ අන්තඃස්ථයා හල් වර්ණයකු කෙරෙන් පර කල්හි බවද සලකනු. කම් යන්න හෝ කරු යන්න හෝ පර කල්හි එහි කයන්න මූලදී අන්තඃස්ථ නොවන නමුත් පසුකල ලිහිල්වීමෙන් අන්තඃස්ථ වේ. හකාර භාවයට පැමිණීමෙනි.

### සූත්‍රපාඨය 65. ගතකුරු ලොප්සඳ.

ගංරන්, වංමුතු, මුංබියලි, හොලුම්මල්, අම්මල්, ඈ ගබන් ලොපා මත්වැඩූ බැවින් ගතකුරු ලොප් සඳ නම්.

**ව්‍යාඛ්‍යා.** ගංරන්, ගඟරන් යන තන්හි ගංරන්ය, වංමුතු, වඟමුතු යන තන්හි වංමුතුය; මුංබියලි, මුඟුබියලි යන තන්හි මුංබියලිය; නෙලුම්මල්, නෙලුඹු මල් යන තන්හි නෙලුම් මල්ය; අම්මල්, අඹමල් යන තන්හි අම් මල්ය; ඈ, යන මේ ආදිය; ගබන් ලොපා, ග කාරං බ කාරයන් ලොප් කොට; මත් වැඩූ බැවින්, මාත්‍රාවෘඞිය කළ හෙතුයෙන්; ගතකුරු ලොප් සඳ නම්, ගාත්‍රාක්ෂර ලොප සන්ධි නමි.

### 65. විස්තරය. ගාත්‍රාක්ෂර ලොප සන්ධිය.

ගඟරන් යන තන්හි ගඟ යනු ගයන්තකින්ද අඞ්වර්ගාන්තත සහිතවූ තවත් ගයන්තකින්ද යුක්ත වේ. ඒ අඞ්වර්ගාන්තය නම් බින්දුවෙහි අඩියයි. මෙයින් දෙවැනි ගයන්ත ලොප් කළ කල්හි පළමු ගයන්ත හා අඞ් වර්ගාන්තයද ශේෂ වෙත්. මේ අඞ් වර්ගාන්තයට මාත්‍රාවෘඞි කළ කල්හි සම්පූර්ණ බින්දුව වේ. එයින් පෙර තිබුණාවූ ගඟ යනු ගං වේ. එයින්ම ගඟරන් යනු ගංරන් වේ. ගඟෙහි උපන්නාවූ සවර්ණයයි. මේ ග කාරය ලොප් කළ තැනි.

නෙලුඹු යන්නෙහි අන්ත වර්ණය අඞ් වර්ගාන්තයෙන් යුක්තවූ බුයන්තකි. මේ බුයන්ත ලොප් කොට ඒ අඞ්වර්ගාන්තයට මාත්‍රා වෘඞි කල කල්හි නෙලුම් යයි සම්පූර්ණ වර්ගාන්තයෙන් සිටී. මේ බකාරය ලොප් කළ තැනි.

සූත්‍රයෙහි නිදසුන් කළ අනික් පාඨයන්ගේ සිඞියද මේ න්‍යායයෙනි.

### 65. නීතිසාරය. ගාත්‍රාක්ෂර ලොපසන්ධිය.

(1) මේ සූත්‍රය කාරණ දෙකකින්ම අශාස්ත්‍රීය බව කිය යුතුයි. පළමු කොට "ගබන් ලොපා මත් වැඩූ බැවින්" යනු අභිප්‍රෙත ව්‍යාපාර සූචක හෙයින් ශාස්ත්‍රීය නොවේ. දෙවෙනුව ගතකුරු ලොප් සඳ යයි නම් තැබීමට හෙතු දෙකක් දක්වා

තිබේ. ගබන් ලොපය එකකි, මත් වැඩීම එකකි. මේ විතිය හෙතුව නාම ශිඩියට කිසිසේත් අදහළ නොවේ. එසේ දක්වීම ව්‍යර්ථහෙයින් තර්ක දූෂණයකි; එයින් අශාස්ත්‍රීය යැ.

(2) මේ සන්ධියට අදහළවූ වර්ණයෝ නම් අඩිවර්ගාන්තයෙන් යුත් ඝොෂකුරු පස පමණක් යයි පෙනේ. එනම්: ඟ, ඦ, ඬ, ඳ, ඹ, යන මොහුයි. මෙයින්ද නිදසුන් සුලබව පවත්නේ ඟ' ඳ, ඹ, යන තිදෙනා සම්බන්ධවය. ළිත්කඳ ('ළිද්කඳ') යන තන්හි පෙනෙන්නේ ඳ යන්හ සම්බන්ධවූ නිදසුනෙකි. අන්‍යයන් සම්බන්ධවූ නිදසුන් පාඨයෙහි නිර්දිෂ්ටය.

(3) එහෙත් මෙබඳු සන්ධියක් ඇත්තේද යනු අතිශයින් සංශය සහිත බව කියයුතුයි. දක්වනලද නිදසුන් සියල්ල සමාසයෙන් සිදුවූ වාග් රූපයෝ වෙත්. සමාසයෙහි වනාහි පූර්වාවයවවූ ශබ්දය හැම කල් ප්‍රකෘතියෙන් සිටිය යුතු වේ.

තවද අප්‍රාණී වාචකවූ ශබ්දයන්ගේ ප්‍රථමා විභක්ති බහු වචන රූපය 'වල්' ප්‍රත්‍යය නොගන්නා සෑම තැන්හිම ප්‍රකෘතිය හා සම වේ. 'ගස' යන්නෙහි ප්‍රථමා විභක්ති බහු වචනය නම් 'ගස්' වේ. ප්‍රකෘතියද එමයි. ප්‍රථමා එක වචන රූපය නම් මේ ප්‍රකෘතියට 'අ' ප්‍රත්‍යය වීමෙනි.

'හුළඟ' යනු අප්‍රාණී වාචකවූ ශබ්දයකි. ප්‍රථමා විභක්ති එක වචනයි. මෙහි 'අ' ප්‍රත්‍යය වියුක්ත කළ කල්හි බහු වචන රූපය 'හුළඟ්' යයි ලැබේ. ප්‍රකෘතියද මේ වේ. මෙය පූර්වයෙහි දක්වනලද එක්තරා වාග් ධර්මයකින් (**23. නි. සා.** 8.) 'හුළං' වේ. එයින් මේ 'හුළං' ශබ්දය ගෙන යම් කිසි සමාසයක් කොට 'හුළං ගැසීම' යනාදියක් කී කල්හි එහි යම්කිසි සන්ධියක් හෝ සන්ධියක් පිණිස කරනලද ලොපයක් හෝ නොමැත්තේය.

මේ න්‍යායයෙන් බලන කල ගංරන්, වංමුතු, යනාදි සමාස පාඨයන්හිද යම් කිසි සන්ධියක් හෝ සන්ධියක් පිණිස කරනලද වර්ණලොපයක් හෝ නොමැත්මැයි.

එයින් ගතදෙස් සඳ මෙන්ම මේ ගතකුරු ලොප් සඳද මූලාවකැයි කිය යුතු බව පෙනේ.

(4) 'අඹ' යන්නෙහි ප්‍රකෘති රූපයද 'අඹ' ම යයි යමකු කිව හැකි. ඒ සත්‍යයකි. එහෙත් එහි අන්තස්වරය උච්චාරණ සුඛය පිණිස යයි පිළිගත හැකි වේ. තෙලුඹු යන්නෙහි අන්ත ස්වරය මෙති.

## 66. අගම් සඳ.

**සූත්‍රපාඨය.** පිරියත්, මියුගුණු, සිපියෙව්, දුවඟ, රූවාරූ, තුනුවඟ, පුනරුත්, නිරොද, ඈ පෙරසර නොලොපා යවරන් අගම් කෙලෙන් අගම් සඳ නම්.

**ව්‍යාඛ්‍යා.** පිරියත්, පිරි අත් යන තන්හි පිරියත්ය; මියු ගුණු, මි අගුණු යන තන්හි මියුගුණුය; සිපියෙව්, සිපි එව් යන තන්හි සිපි යෙව්ය; දුවඟ, දු අඟ යන තන්හි දුවඟය; රූවාරූ, රූ අරූ යන තන්හි රූවාරූය; තුනුවඟ, තුනු අඟ යන තන්හි තුනුවඟය; පුනරුත්, පුන උත් යන තන්හි පුනරුත්ය; නිරොද, නි ඔද යන තන්හි නිරොදය; ඈ, යන මේ ආදිය; පෙර සර නොලොපා, පූර්වස්වරය ලොප් නොකොට; යවරන් අගම් කෙලෙන්, යකාර වකාර රකාරයන් ආගම කළ හෙතුයෙන්; අගම් සඳ නම්, ආගම සන්ධි නම්.

**වාක්‍යාර්ථ :** පිරියත්, පර්‍යාප්තය හෙවත් හාත්පස; මියු ගුණු, මහ්‍යඞ්ගණය; සිපියෙව්, ශිල්පියකුමෙන්; දුවඟ, ධ්‍රුතාඞ්ග; රූවාරූ, රූපාරූප; තුනුවඟ, කෘශාඞ්ගී; පුනරුත්, පුනඃ කපි තය; නිරොද, ඔජො රහිත (භාවය නොහොත් දෙය.)

### විස්තරය. ආගම සන්ධිය.

#### සපඤටය.

### 66. නීතිසාරය. ආගම සන්ධිය.

මෙහි යකාර වකාරාගම සන්ධි නිර්දේශයෙන් දක්වනලද නිද සුන් ශාස්ත්‍රීය වෙත්. (නීතිසාරය. 24. 2. බලනු.) එහෙත් රකාරාගමය පිණිස දක්වන ලද නිදසුන්හි එයින් වූ කිසිම සන්ධි යක් නොපැනේ. එබන්දක් භාෂාවෙහි ඇති බවද සංශය සහි තය (නීතිසාර. 24. 1. බලනු.)

## 67. දෙරූ සඳ.

**සූත්‍රපාඨය.** වැල්ලවුරු, හෙළිල්ලඹු, තඹපල්ලෙන්, කුල් ලෙව්, ඈ පෙරසර ලොපා ගතට දෙරූ දූනවූ බැවින් දෙරූ සඳ නම්.

ව්‍යාඛ්‍යා. වැල්ලවුරු, වැලි අවුරු යන තන්හි වැල්ලවු රුය; හෙළිල්ලඹු, හෙළිලි අඹු යන තන්හි හෙළිල්ලඹුය; තඹ පල්ලෙන්, තඹ පලු එන් යන තන්හි තඹ පල්ලෙන්ය; කුල්ලෙව්, කුලු එව් යන තන්හි කුල්ලෙව්ය; ඈ, යන මේ ආදිය; පෙර සර ලොපා, පූර්ව ස්වරය ලොප් කොට; ගතට, ගාත්‍රාක්ෂරයට; දෙරු දූනවූ බැවින්, විරූප ජනනය කරවූ බැවින්; දෙරු සඳ නම්, විරූප සන්ධි නම්.

වාක්‍යාර්ථ : වැල්ලවුරු, වැල්ලෙන් කළ ආවරණය; හෙළිල් ලඹු, හෙළලු ස්ත්‍රී; තඹ පල්ලෙන්, තඹ වන් දලුයෙන්; කුල්ලෙව්, කුල්ලක් මෙන්.

## 67. විස්තරය. විරූප සන්ධිය.

වැලි + අවුරු යයි සිටි තන්හි සංහිතායෙහි පූර්වස්වරයවූ ඉයන්න ලොප් කරනු ලැබේ. එකල වැල් + අවුරු යයි සිටී. මෙහි 'ල්' යන්නට විතීය රූපයක් උපද වනු ලැබේ. එයින්: 'වැල් + ල් + අවුරු' වේ. ඉන්පසු විතීය ලකාරයාගේ අකාරු රොහණයෙන් 'වැල්ලවුරු' වේ. අනිකුත් නිදසුන් සම්බන්ධ සිඩියද එම න්‍යායයෙනි.

## 67. නීතිසාරය. විරූප සන්ධිය.

1. මෙහිද "පෙර සර ලොපා ගතට දෙරු දූනවූ බැවින්" යනු අභිප්‍රෙත ක්‍රියා සූචක හෙයින් අශාසත්‍රිය බව කිය යුතුයි.

2. මේ සන්ධිය අත්තමක් සේ සිදු කරන පිළිවෙළ මෙහි කියා දුන්නා මිස සන්ධියෙහි න්‍යායය ගැන ශිෂ්‍යයාහට කිසිම උපදෙශයක් නොදෙන ලදී.

3. මෙහි පූර්ව ස්වර ලොපයක් නම් නොමැත්තේය. නිද සුන් කළ පාඨයන්ගේ සිඩිය මෙසේ දත යුතු :—

වැලි + අවුරු = වැල් + ඉඅ + වුරු = වැල් + ය + වුරු=
වැල් + ල + වුරු = වැල්ලවුරු.
තඹපලු + එන් = තඹපල් + උඑ + න්=තඹපල් + වෙන්=
තඹ පල්ලෙන්.

මෙහි ධර්මය පිණිස නී. සා. 25. 1 – 5 බලනු.

68. පාඨය : සඳ අදියර දෙවනු.

ව්‍යාඛ්‍යා. සඳ අදියර, සන්ධ්‍යධිකාරයතෙම; දෙවනු, (මෙසේ) විනියයි.

### 68. නිෂ්සාරය. සන්ධි ප්‍රසඞ්ගය.

මෙසේ ග්‍රන්ථකාරවූ ආචාර්‍ය්‍යයන් විසින් කරනලද මේ සන්ධි විභාගය විද්‍යාර්‍ථීන්ගේ ශාස්ත්‍රීය අවබොධයට ප්‍රමාණ නොවන බව ප්‍රත්‍යක්‍ෂය. එපමණක්ද නොවේ. එහි වැඩි හරිය ශිෂ්‍යයාහට කිසිසේත් ප්‍රයොජන වත්ද නොවේ; අශාස්ත්‍රීය හෙයින් ඔහුගේ මූළාවටම හෙතු වෙයි. ශාස්ත්‍රීය වශයෙන් භාෂායෙහි පෙනෙන්නාවූ ඇතැම් සන්ධීහු නොකියන ලද්දහ; සන්ධිනුවූ ඇතැම් වාග්ධර්‍මයෝ සන්ධියයි පිළිගෙන එසේ දක්වන ලද්දහ. තවද ඇතම් සන්ධීන් කෙරෙහි පිහිටුවනලද නාමධෙයයෝ කිසිසේත් නොමැනවි. සත්‍යයටද ශාස්ත්‍රයටද ප්‍රතිවිරුඬ හෙයිනි.

මෙසේ නොයෙක් කරුණින් මේ සන්ධි විභාගය දූෂ්‍ය හෙයින් එහි පෙනෙන අශාස්ත්‍රීය ලක්‍ෂණයන්ගෙන් මුක්තවූ ශාස්ත්‍රානුකූලවූ සන්ධි නිර්දේශයක්හුගේ විද්‍යමානත්වය ආධුනිකයන්ගේ සඞ්ග්‍රහ පිණිස අවශ්‍යමැයි. තවද චිරාගතවූ ශික්‍ෂා මාර්‍ගයකට දෙස් කියන්නවුන් විසින් ඊට වඩා නිර්මලවූ මනොඥවූ මාර්‍ගයක් පහද දීම්ද යොග්‍ය වේ මැයි. න්‍යායය මෙසේ හෙයින් දැන් ආධුනිකානුග්‍රහ වශයෙන් සවභාෂාගත ශිෂ්ට ව්‍යවහාරයෙහි පෙනෙන්නාවූ සන්ධීන් අවලොකනය කොට පඞ්ක්තීන් වශයෙන් බෙදා ඔවුන්ගේ ශාස්ත්‍රීය නිර්දේශයක් මෙහි කරනු ලැබේ. හෙද සම්පූර්‍ණයයි කිය නොහේ. එහෙත් ශාස්ත්‍රීය පක්‍ෂයෙහි ආරම්භයක් හෙයින් මොහාපහරණයෙහිද ප්‍රබොධ කරණයෙහිද හෙතුවිය යුතුයි.

# 69. සන්ධි නිද්දේශය.

**නවීනානාං ප්‍රබෝධාය**
**ප්‍රවීණානාං මුදේ තථා**
**ක්‍රියතෙ සන්ධි නිද්දේශඃ**
**ස්වභාෂායාං යථා නයම්.**

1. තිසා ඉසිරුම් සුව — වණනුප සෙලෙස් සඳ නම්
අබතුරු බැහැර වෙසෙසින් — එ දෙබෙ වහර අනු සිදු.

2. එක පියවි අබතුරු — යළ හෝ තුරු එක පද
සිදු අබතුරු සඳ නම් — පියවි පසතුරු ඒ නිත්.

3. දෙබිණුම් දෙපද හෝ — අතුරේ සිදු බැහැර නම්
සමසෙහි බුහුසු වනුයේ — වනු ඉසි අනුදු කිසි තැන.

4. සර සඳ සරුරු සඳ — වියදුන් සඳිනුනුන් බේ
මෙතුන් බේ සඳ මහ මං — ඇත් මෙහි යළි අතුරු මං.

5. කිම එසඳ තුන්බේ — එක් එක් ලබා අනුබේ
එහි තතු බලා වෙසෙසා — සැකෙවින් ගෙන පවස්මෝ.

1. උච්චාරණ සුඛය පිණිස වන්නාවූ වර්ණයන්ගේ උපශ්ලේෂය තෙම සන්ධි නම්. හේ වනාහි අභ්‍යන්තර සන්ධිය බාහිර සන්ධිය යන විශේෂණයෙන් විභේද වේ. එහි සිද්ධි තොමෝ ව්‍යවහාරානුකූල වන්නීය.

2. එකම ප්‍රකෘතියක අභ්‍යන්තරයෙහි හෝ එකම පදයක් හුගේ අභ්‍යන්තරයෙහි හෝ සිද්ධවූයේ අභ්‍යන්තර සන්ධි නම්. හේ වනාහි ප්‍රකෘති ප්‍රත්‍යය යන දෙදෙනා අතරෙහි නිත්‍යමැයි.

3. භණිතීන් නොහොත් පදයන් දෙදෙනකුන් අතරෙහි සිද්ධවූයේ බාහිර සන්ධි යයි. හේ වනාහි බොහෝ සෙයින් සමාසයෙහි වන්නේයි. කිසි තැනෙක වකත්‍රිපසා අනුවද වන්නේයි.

4. යථොක්ත සන්ධීන්ගේ වනාහි ස්වර සන්ධිය, ස්වරාරූඪ සන්ධිය, ව්‍යඤ්ජන සන්ධිය යයි උනුන් භෙද ඇත්තාහ. මෙකී භෙදත්‍රය සන්ධියෙහි මහාමාර්ගයෝ වෙත්. තවද මෙහි අන්තර මාර්ගයෝ ඇත්තාහ.

5. කවර හෙයින්දයත් ඒ සන්ධි ත්‍රිභෙදයෙහි එක් එක් භෙදය අනුභෙදයන් ලබා. එහි තත්ත්වය විශිෂ්ටකොට බලා සඞෙක්ෂපයෙන් ග්‍රහණය කොට හෙවත් සඞ්ග්‍රහකොට ප්‍රකාශ කරම්හ.

## 70. සරසඳ. ස්වර සන්ධිය.

පෙර පරව සිටියන්–දෙසරන් සසඟ සරසඳ
පෙර ලොප් අපර ලොප් දිගු–සමහර වියදුන’ ගමින්
ඇහැඳුම් දෙරූ හෙයිනුදු–එහි වනු සත් වැදෑරුම්.

පූර්වාපරව සිටියාවූ ස්වරයන් දෙදෙනකුන්ගේ සංසර්ගය තෙම ස්වර සන්ධි නම්. පූර්ව ස්වරලොප සන්ධිය, අපර ස්වරලොප සන්ධිය, දීර්ඝ සන්ධිය, සමාහාර සන්ධිය, ව්‍යඤ්ජනාගම සන්ධිය, යන මොවුන් ගෙන් හා, ආකර්ෂණ සන්ධිය, විරූප හෙතු සන්ධිය, යන මොවුන් ගෙන්ද ඒ ස්වරසන්ධියෙහි වනාහි සප්තානු ප්‍රකාරයක් ඇත්තේ වෙයි.

## 71. පෙරසර ලොප්සඳ. පූර්වස්වර ලොප සන්ධිය.

පෙර සර අදස්නෙන්–එ තැසි තැනට පර සර
පැමිණෙන එයින් වනු–පෙරසර ලොප් සඳ නම්.

ස්වරයන් දෙදෙනකුන්ගේ අනන්තර සම්හිතය ඇති කල්හි පූර්ව ස්වරයාගේ අදර්ශන ප්‍රාප්තියෙන් එය නෂ්ටවූ ස්ථානයට පර ස්වරයා පැමිණේද එකල එයින් සිදුවන්නේ නම් පූර්වස්වරලොප සන්ධියයි. ඊට නිදසුන් මෙසේයි :–

(i) අභ්‍යන්තර.

| | |
|---|---|
| පෙළ + ඉන් = පෙළින් | රිටි + එන් = රිටෙන් |
| පුර + එහි = පුරෙහි | සතුරු + ආ = සතුරා |
| මිණි + අ = මිණ | ලකුණු + එන් = ලකුණෙන් |
| මෙ + ඉන් = මින්. | මො + උන් = මුන්. |

| සංස්කෘත. | | මාගධී. | | සිංහල |
|---|---|---|---|---|
| ක්ෂුධා | ... | (ඛුධා) | ... | සුදු = *සුආ = සා |
| නදී | ... | නදී (ප්‍රා. නඊ) | | *නඊ = නී. |

**සංලක්ෂ්‍යය.**—එ + ඉන් = ඉන්; ඔ + උන්=උන්, යන මේ දෙතැන්හිද සන්ධිය මේ වේ. අදර්ශන ප්‍රාප්තවූ පූර්ව ස්වරයාගේ ආශ්‍රයස්ථානයට අපරස්වරයා පැමිණීමෙනි. මෙ + ඉන් = මින්, මො + උන් = මුන් යන මේ දෙතැන්හි මෙහි

( ii ) බාහිර.

ගණ + ඉසුරු = ගණිසුරු. | තරු + ඉදු = තරිඳු.

නොහි = *නොඊ = නි.

යා නි සිටින ගෙමුවා. කව්සේ.

නොවූ = *නොඌ = නූ.

පටු නූ ගුණැති මම්තුර යන්න නුබ අරු. කොවුල්.

(ආකර්ෂණ සන්ධියද බලනු. 76. 4.)

**සංලක්ෂ්‍යය 1.** —මේ වනාහි බහුප්‍රචාරයෙන් ලැබෙන්නාවූ සන්ධියකි. එහි සිඬිය බොහෝ සේ වන්නේ 'ඉ' වර්‍ණය පරවූ තැන්හි බව සලකනු.

**සංලක්ෂ්‍යය 2.** — ගිරි + ඉඳු=ගිරිඳු, මැති + ඉඳු = මැතිඳු, මිහි + ඉසුරු= මිහිසුරු යනාදි තන්හි සන්ධිය පූර්‍වස්වර ලොපද අපරස්වර·ලොපද යනු අවිනිශ්චිතය.

**සංලක්ෂ්‍යය 3.** — දෙ + අැ වරක් = 'දැ වරක්' යන තන්හි සන්ධිය මේ වේ. එහෙත් දෙ + අත = 'දැත' යන තන්හි සන්ධිය මෙය නොව සමාහාර සන්ධියයි. (74. 3. ii.) සන්ධියට ආධාරවූ ස්වරය නම් අපරස්ථානයෙහි සිටි අ කාරය නොව උභය ස්වරයාගේ සඞකලනයක් යෙයිනි.

## 72. පරසර ලොප්සඳ. පර ස්වරලොප සන්ධිය.

පෙර සර නො සැහැමෙන්-පරසර අදිස්වී යෙත
ගතැරුම් පසඟ නැතියෙන්-කෙණෙහි පරසර ලොප් සඳ.

ස්වරයන් දෙදෙනෙකුන්ගේ සම්මුඛී භාවය ඇති කල්හි පූර්‍ව ස්වරයාගේ අසහනය කරණකොටගෙන අපර ස්වරයා අදෘශ්‍ය මානව යනහොත් එකල ව්‍යඤ්ජනයාගේ ස්වරාරෝහණ ප්‍රසඞ්ග යක් නොමැති හෙයින් ඒ ලොපලක්‍ෂණයෙන් පර ස්වරලොප සන්ධිය වන්නේයි. ඊට නිදසුන් මෙසේයි :-

( i ) අභ්‍යන්තර.

'දිගුනුවනී' යන්නට කර්මවිභක්ති එක වචනයෙහි 'අ' ප්‍රත්‍යය කළ කල්හි-

1. වියදුන් අගම් සඳින් : දි ගු නු ව නි ය.
2. පරසර ලොප් සඳින් : දි ගු නු ව නී.

නිදසුන් තුනෙක් :-

කහත වතළ දිගුනුවනි-මඳහස ලෙළ රතලවනි
මදුර මල් සැ දි ස ව නි-ළද සිදුඹුව දි වි ගු ව නී.
කාව්සේ.

**සංලක්ෂ්‍යය.** —බැතී+ඉන් = බැතින්, ගුරු+උන් = ගුරුන් යනාදි තන්හි සන්ධිය පෙරසර ලොප්ද පරසර ලොප්ද යනු අවිනිශ්චිතය.

( ii ) බාහිර.

පිළි+උතුරු = පිළිතුරු
පඹු+ඇඹුල් = පඹුඹුල් = පඹුපුල්
කිහිරලි+උපුල් = කිහිරලිපුල්
රිය+ඇදුරු = රියදුරු (පරසරලොප්)
රියැදුරු (පෙරසරලොප්)
දින+ඇසේ = දිනසේ (පරසරලොප්)
දිනැසේ (පෙරසරලොප්)

ගොනා ලඟින් **දිනෑස්** කවද යාද.

වෘෂභ රාශිය කෙරෙන් සූර්‍ය සඞ්ක්‍රාන්තිය කවද වන්නීදැයි ඇසූ යේයි.

**සංලක්ෂ්‍යය 1.**—ති සුණු, වැටු සිපත, මැති තුමා, යනාදි තන්හි සන්ධිය අවිනිශ්චිතය. ශුණු, සිපත්, තුම්, යනාදීන් ප්‍රකෘතියෙන්ද ලැබෙන හෙයිනි.

**සංලක්ෂ්‍යය 2.** —මේ සන්ධියෙහි ප්‍රචාරය අතිශයින් විරල බැව් දත යුතුයි,

**සංලක්ෂ්‍යය 3.** —ප්‍රත්‍යයාන්ත පදයක් හලන්තව සිටි කල්හි මිස ස්වරාන්තවූ කල්හි පසු පදයක් හා සන්ධිවනු බොහෝසේ විරලය. එයින්-

'නරනිඳුහු ඉං ගෙන්-සෙමෙනද නැසී පැහැහී'

යන තන්හි නරන්+ඉඳුහු = 'නරනිඳුහු' යයිද සෙමෙන්+අද = 'සෙමෙනද' යයිද ස්වරරූඪ සන්ධි දෙකක් පෙනෙන නමුදු-

වෙ ත එවෙහෙර සුපිහිටි අඹ **තුරේ තුරේ**
සැ ත පෙව යෙහෙන් මුළු රෑ මම් තු රේ තු රේ *.
(කොකිල.)

---

* එවෙහෙර වෙත, ඒ විහාරය සමීපයෙහි; සුපිහිටි, මනාසේ ප්‍රතිෂ්ඨිතවූ; අඹතුරේ, ආම්‍ර වෘක්ෂයාගේ; තුරේ, අන්තරයෙහි; මිතුරේ, මාගේ මිත්‍රය! තුරේ, සන්තොෂයෙන් (යුක්තව)-කාරණාර්ථයෙහි සප්තමියි; මුළු රෑ, සමස්ත රාත්‍රියෙහි; යෙහෙන්, යහපතින්; සැත පෙව, සන්තර්පිත වෙව.

යන මෙතැන්හි පරසවර්ණලොප සන්ධියයි ගිනිය නොහේ. 'අතුරු' ශබ්දය ආදි වර්ණලොපයෙන් 'තුරු' යන ප්‍රකෘති රූපයෙන්ද සිටිනා හෙයිනි. 'මා එන තුරු' යනාදි තන්හි ඒ පෙනේ. 'මා එනතුරු, අසම්තා ප්‍රත්‍යාගමනය කරන් නාවූ අන්තරයෙහි.'

## 73. දිඝු සඳ.

ලුහු ස වණ යුවලෙක්–පැහැයි සගුරු බැව් යෙත
දිඝු සඳැයි ඒ දන්නේ–බුහුසු එ සිදු අබතුරු.

ලඝුවූ සවර්ණ යුගමයෙක් ප්‍රකෂීණය ලැබ හෙවත් එකී භූතව සවර්ණය ගුරු භාවයට පැමිණෙත් හොත් ඒ වනාහි දීර්ඝ සන්ධියයි දන්නේයි. එහි සිද්ධිය බොහෝ සෙයින් ඔන්නේ අභ්‍යන්තරයෙහිය. ඊට නිදසුන් මෙසේයි :–

(i) අභ්‍යන්තර.

| සංස්කෘත. | මාගධි. | ප්‍රාකෘත. | සිංහල. |
|---|---|---|---|
| අමෘත | අමත | අමඅ ... | අමා |
| කතක | කතක | (කණඅ) | *කතහ–*කතඅ–කතා. |
| දධි | දධි | දහි (හින්දි : දහී) | දිහි–*දිඉ–දී. |
| මධී | මඨී | මහී | මිහි–*මිඉ–මී. |
| මධු | මධු | — | *මිහි–*මිඉ–මී. |
| දුකූල | දුකූල | (දුඋංල) | දුහුල්–*දුඋල්–දූල්. |
| ශූකර | සූකර | (සූඅර. හින්දි.) | සුහුරු–*හුහුරු *හුඋරු–හූරු. |
| භෛෂජ්‍ය | භෙසජ්ජ | — | බෙහෙද්–බෙහෙත්– *බෙඑත්–බේත්. |
| ලෝභ | ලොභ | (ලෝභා–හින්දි.) | ලොහො– *ලොඔ–ලෝ. |
| ශ්මසාන | සුසාන | (මසාන) | සොහොන්– *සොඔන්–සෝන්. |
| මහා (සමාසයෙහි) | මහා | ... | මහ=*මඅ=මා. |
| චතුර් | (චතු) | (චාර. හින්දි) | සතර–*සඅර–සාර. |
| සුහෘද් | සුහද | (සුහඅ) | *යහල්–යහළු– *යඅළු–යාළු. |
| ලොහිත | ලොහිත | (ලෝහු–හින්දි.) | ලෙහෙ–*ලෙඑ–ලේ. |

| | | |
|---|---|---|
| සමුද්‍ර | සමුද්ද (සමුන්දර්. හින්දි) | *සුමුදු-*මුසුදු-මුහුදු-මුඋදු-මූදු. |
| ලශුන | ලසුණ — | ලුහුණු-*ලුඋණු-ලූණු. |
| මුඛ | මුඛ (මුණ්හ. හින්දුස්.) | මුහුණු-මුඋණු-මූණු. |
| ව්‍රීහි | වීහි — | *විහි-විඉ-වී. |
| බහු | බහු — | බොහො=*බොඔ-බෝ. † |
| මහාතීර්ථ | මහාතිත්ථ — | මහතොට-*මඅතොට-මාතොට. *මහතොර-*මඅතොර-*මඅතර-මාතර. |

මොවුන්ගේ සිඞියද එම න්‍යායයෙනි :-

| | |
|---|---|
| පහද-*පඅද-පාද | බැලුහු-*බැලුඋ-බැලූ |
| සිටිහි-*සිටිඉ-සිටී | පැහැසී-*පැඇසී-පෑසී |
| සිටියි-*සිටිඉ-සිටී | බැහැර-*බැඇර- බෑර |

( ii ) බාහිර.

| සංස්කෘත. | මාගධී. | සිංහල. |
|---|---|---|
| දිවා + කාල | දිවාකාල | *දවකල්=දවහල්=*දවඅල්=දවාල්. |
| සම් + ආගම | සමාගම | *සමගම්=සමහම්=*සමඅම්=සමාම්. |
| උප + කරණ | උපකරණ | *උවහරණ=*උවඅරණ=උවාරණ. |
| නව + කර්ම | නවකම්ම | නවකම්=නවහම්=*නවඅම්=නවාම්. |
| වණිජ + කර්ම | වණිජකම්ම | වෙණදකම්=වෙණදහම්= *වෙළඳහම්=*වෙළඳඅම්=වෙළඳාම්. |

එසේම සිංහල : { දිය + අලුව=දියාලුව. / වන + අත=වනාත.

මාගධී : මන + අප=මනාප.

**සංලක්ෂ්‍යය.** — මේ සන්ධියෙහි සිඞිය වැඩිකොටම වන්නේ පරව්‍යඤ්ජනයකු කණ්ඨජවූ තන්හි දිරගොස් සවර ශෙෂභාවයට පැමිණීමෙනි. නිදසුන් විමසනු.

## 74. සමහර සඳ. සමාහාර සන්ධිය.

පෙර සර අපර හා-දෙතැන් දුනු සර හෝ වත්
සමහර සඳැයි ඒ දත්-අනුලොම් විලොම් හෝ සිදු.

---

† අං. 74. 1 ද බලනු.

පූර්ව ස්වරය අපර ස්වරය හා සංකලනයව පැමිණීමෙන් උභය ස්ථානයෙහි ජනිතවූ ස්වරය හෝ අන්‍යයක් හෝ වන්නේද හේ වනාහි සමාහාර සන්ධියයි ඥාතය කරනු. එහි සිද්ධිය අනුලෝම වශයෙන් හෝ විලෝම වශයෙන් හෝ වේ.

සංලක්ෂ්‍යය. — උභය ස්ථාන ජනිතවූ වර්ණයෝ නම් දෙදෙනෙකි. 'එ' වර්ණ, 'ඔ' වර්ණ වශයෙනි. වර්ණ යනුවෙන් මෙහි හ්‍රස්වයද දීර්ඝයද එකසේ ගැනේ.

තවද උභය ස්ථාන වර්ණයන්හුගේ ජනනය පිණිස පූර්ව ස්වරය අවර්ණය විය යුතුයි. අපර ස්වරය 'ඉ' වර්ණය හෝ 'උ' වර්ණය හෝ විය යුතුයි. එයින් මේ සන්ධිය අනුලෝම වශයෙන් වන්නේ පෙර සර අවර්ණවද පරසර ඉ වර්ණව හෝ උ වර්ණව හෝද සිටි තන්හිය. විලෝම වශයෙන් වන්නේ ඊට ප්‍රතිපවූ ක්‍රමයෙන් හෙවත් ක්‍රම විපර්‍යාසයෙන් සිටි තන්හිය.

## 1. අනුලෝම සමාහාරය.

### (i) අභ්‍යන්තර.

**සිද්ධයෙහි :-**

| | |
|---|---|
| කොම + ඉන් = කොමෙන් | ඊය + ඉන් = ඊයෙන් |
| සෙම + ඉන් = සෙමෙන් | ඒය + ඉන් = ඒයෙන් |
| බල + ඉන් = බලෙන්; බෙලෙන්. | කඩුව + ඉන් = කඩුවෙන් |

එදිසා + හි = එදිහාහි = එහාහි = *එහාඉ = එහේ

මෙදිසා + හි = මෙදිහාහි = මෙහාහි = *මෙහාඉ = මෙහේ

ගස + හි = ගහ + හි = *ගහඉ = ගහේ

කොළ + හි = *කොළ + ඉ = කොළේ

මල + හි = *මලඉ = මලේ.

**වාග්භේදයෙහි :-**

| සංස්කෘත. | මාගධි. | සිංහල. |
|---|---|---|
| බහු | බහු | *බඋ = බෝ |
| මාතෘ | මාතු | *මඋ = මෝ |
| ප්‍රභූත ශක්ති | පහූත සත්ති | *පහුසත්=*පඋසත්=පෝසත්. |

සංලක්ෂ්‍යය. — සංස්කෘතයෙහි සිට වාග් රූපයන් මාගධියට බිඳී ඊමෙහිදී මේ සන්ධියෙහි සිද්ධිය බහුල ප්‍රචාරයෙන් පෙනේ. බොහෝවිට ඒ රූප යන්ගේ සිංහලට බිඳී ඊමද ඒ සන්ධියෙන් යුක්තවය. නිදසුන් :-

සං. භෛෂජ්‍ය=(විසන්ධියෙන්) භාඉෂජ්‍ය=*භඉෂජ්‍ය,
මා. භෙසජ්ජ, සිං. බෙහෙද්=බෙහෙත්.

සං. ඖෂධ=(විසන්ධියෙන්) ආඋෂධ=*අඋසධ; මා. ඔසධ,
සිං. ඔසු.

එසේම :-

| සංස්කෘත. | සිංහල. | සංස්කෘත. | සිංහල. |
|---|---|---|---|
| මෛත්‍රී | . මෙත් | කෞස්තුභ | . කොතබු |
| වෛර | . වෙර | ගෞතම | . ගොයුම් |
| තෛල | . තෙල් | යෞවන | . යොවුන්. |

(ii) බාහිර.

මහ + උර = *මහොර = මොහොර
අව + උරුසිය = අවෝරුසිය.

**සංලක්‍ෂ්‍යය 1.** මේ සන්ධිය සංස්කෘතයෙහි නිත්‍ය නමුදු සිය බසෙහි බොහෝ විරල බව කිය යුතුයි.

**සංලක්‍ෂ්‍යය 2.** මෙහෙසුරු යනු සිය බසෙහි මහ + ඉසුරු යයි සිට සන්ධියෙන් සිද්ධවීද නැතහොත් සංස්කෘත මහෙශ්වර යන්නෙන් බිඳුණේද යනු අවිනිශ්චිතය.

## 2. ප්‍රතිලෝම සමාහාරය.

☞ ඉ + අ = ඒ ; උ + අ = ඕ.

### (i) අභ්‍යන්තර.

ක. වාග්භෙදයෙහි :-

| සංස්කෘත. | මාගධි. | ප්‍රාකෘත. | සිංහල. |
|---|---|---|---|
| උදර | උදර | උඅර | ඕර. |
| සිංහල | සීහළ | ... | සිහළ-*සිඅළ-*සේළ-*සෙළ-හෙළ-හෙළු-එළු. |
| සකල | සකල | සඅල | *සිඅල=*සේල=*සේර=සේරම (අවධාරණාර්ථයෙහි 'ම්' යන්න සමග.) |
| මුඛ | මුඛ | | *මුඅ=මෝ. (නදීමුඛය.) |
| මකර | මකර | | *මුඅර=මෝර |
| මුසල | මුසල | | *මුහල=*මුඅල්=මෝල්=මොහොල් |

(නී. සා. 53. 4.)

මෙසේම සිංහල : දු + අණියෝ = { දුවණියෝ. / දේණියෝ. }

කා. සුබොධොච්චාරණයෙහිදී ඉඅ, ඉය යනු අවිශෙෂ වෙත්; එසේම උඅ, උව යනු අවිශෙෂ වෙත්. එයින් කිසි විටෙක 'ඉය' යනු මේ සන්ධියෙන් 'ඒ' වේ (ඉය=ඉඅ=ඒ); 'උව' යනු 'ඕ' වේ (උව=උඅ=ඕ.) නිදසුන් :—

සිංහල : වියලී ගිය=වේලී ගිය
පුවරු=පෝරු

දෙමළ : ශුවඩි=*ශෝඩි=සෝඩි
උවර්මණි=*ඕර්මණි=ඕර්මන්
තුවරෙයි=*තුඅර=තෝර

සංලක්ෂ්‍යය. — මේ ප්‍රතිලොම සන්ධිය බාහිර වශයෙන් දක්නා නොලැබේ. මෙය සංස්කෘතයෙහි හෝ මාගධියෙහි හෝ ලැබෙන්නාවූ සන්ධියක් නොවේ. දෙමළෙහිද ශිෂ්ට භාෂාවෙහි නොලැබේ; සාමාන්‍ය ව්‍යවහාරයෙහි බහු ප්‍රචාරයෙන් ලැබේ; එහෙත් ග්‍රාම්‍ය නොවේ. මෙය සිංහලට ද්‍රවිඩ පක්ෂයෙන් සහජව ආවාවූ උරුමයකි. එයින් මිස 'දුවණියෝ' යනු 'දේණියෝ' වූයේ කෙසේ දැයි ශාස්ත්‍රීය වශයෙන් කිය නොහේ.

### 3. ව්‍යභිචාර සමාහාරය.

සමාහාර සන්ධියෙහි ව්‍යභිචාරයක්ද ඇත්තේය. අවර්ණ ඉවර්ණ දෙදෙනාගේ අනියම සඞ්කලනයෙහි. මේ සඞ්කලනයෙහි ඵලය කිසි තැනෙක 'ඇ' වේ. නිදසුන් :—

(*i*) අභ්‍යන්තර. අනුලොම. වාග්භෙදයෙහි.

| සංස්කෘත. | මාගධී. | ප්‍රාකෘත. | සන්ධිමුඛය. | සිංහල. |
|---|---|---|---|---|
| ආදි | ආදි | ආඉ | ආඉ | ඇ |
| ජාති | ජාති | ... | *දාඉ | දෑ |
| ඥාති | ඤාති | ... | *නාඉ | නෑ |
| භ්‍රාතෘ | (භාතු) | භාඊ | *බාඊ | බෑ |
| මාතෘ | (මාතු) මාති (කා) | ... | *මාඉ | මෑ |
| රාත්‍රි | (රත්ති) | ... | *රාඉ | රෑ |

(*ii*) බාහිර. ප්‍රතිලොම. සියබසෙහි.

ඒ + අත = (අ + ඉ) + අත ... (නි. සා. 62. 2.)
= අ + (ඉ + අ) + ත
= අ + (ඇ) + ත
= ඇත. (පෙර සර ලොප්.)

එසේම: —

| | |
|---|---|
| මෙ + අත = මෑත | ඒ + අත = ඈත |
| දෙ + අත = දූත | මේ + අත = මෑත. |

## 75. වියදුන් අගම් සඳ. ව්‍යඤ්ජනාගම සන්ධිය.

පෙර පර සර අතුරු — නොතසා උසුරුවනු වස්
මැදයත් වණෙක් පැමිණෙත — අගම් සඳ ඒ වියදුන්.

පූර්ව පර ස්වරයන් දෙදෙනාගේ අන්තරය නෂ්ට නොකොට වර්ණයන් උච්චාරණය කරනු හැකි වනු පිණිස එම අන්තරයට මධ්‍යස්ථ වර්ණයකු හෙවත් අන්තඃස්ථයකු පැමිණෙත් හොත් හේ වනාහි ව්‍යඤ්ජනාගම සන්ධියයි.

සංලක්ෂ්‍යය. — අන්තඃස්ථයෝ නම් හයරළලව යන මේ වර්ණයෝයි. (නි. සා. 6–10. 12.) එහෙත් ඔවුනතුරෙන් මේ සන්ධිය පිණිස ප්‍රාසනාවිකා වූවෝ නම් ය, ව, යන මෙ දෙදෙනා වෙත්.

මොවුන්ගේ ආගමය හෙවත් සම්ප්‍රාප්තිය සාමාන්‍ය වශයෙන් වන්නේ පූර්වාපෙක්ෂී වශයෙනි. එනම් පූර්වස්වරය තාලුජ නම් එකල ආගමයද තාලුජ අන්තඃස්ථය හෙවත් 'ය' යන්න වේ. පූර්ව ස්වරය ඕෂ්ඨජ නම් ආගමය තෙම ඕෂ්ඨජ අන්තඃස්ථය හෙවත් 'ව' යන්න වේ. අපරාපෙක්ෂී කල්හි යකාරාගමය හෝ වකාරාගමය හෝ අපරස්වරයා බලා ඊට අනුරූප සේ වන්නේයි. එයින් සාමාන්‍ය ධර්මය නම් මේ වේ: සංවෘත ස්වරාපෙක්ෂී යකාරාගමයි; විවෘත ස්වරාපෙක්ෂී වකාරාගමයි.

නිදසුන් මෙසේයි :—

### (i) අභ්‍යන්තර.

ක. සංවෘත පූර්වාපෙක්ෂී :

| | |
|---|---|
| ගැට + ආ = ගැටයා | දිවි + ආ = දිවියා |
| නෑ + ආ = නෑයා | සිටි + ඕ = සිටියෝ |
| පිරි + අත් = පිරියත් | නි + ඇළි = නියැළි |

සං. ප්‍රති + කර්ම, මා. පටිකම්ම, සිං. පිළිකම් = පිළිහම්
= *පිළි අම් = පිළියම්.

කා. සංවෘත අපරාපෙක්ෂි :

සා + අ = සාය. (දුර්භික්ෂ කාලය.)

හු + ඉන් = හුයින්

හෝ + අ + ඉන් = හොයෙන්

වනු + ඒ = වනුයේ. (උදාහරණ : වණක්හු නිසා ඔහු
තොලොපා වනුයේ අගම් නම්.)

හුණු + එන් = හුණුයෙන්. (උද : තලපතරන් කෙහෙල්ලේ-
පහන් පැහැකිදු හුණුයෙන්.)

ආ + ඒ = ආයේ. (උද: සොඳුරු දීගෙක මෙමා ආයේ.)

සංලක්ෂ්‍යය :- මෙහි ව්‍යභිචාරයද ඇතිබව සලකනු.

කි. විවෘත පූර්වාපෙක්ෂි :

අඹු + අ = අඹුව | පොළෝ + අ = පොළොව
දුටු + එම් = දුටුවෙම් | සෝ + ඉන් = සොවින්

සබා + අට = සබාවට. (නිහාකළ ඒ දම් සබාවට. ගුත්තිල.)

කී. විවෘත අපරාපෙක්ෂි :

කෑ + උම් = කෑවුම් | වතු = *සිඋ = සිවු
පෙ + උම් = පෙවුම් | මෙබලා = *මෙඋල් = මෙවුල්

සංලක්ෂ්‍යය. — ලිය, කිය, සොය, යනාදි ධාතූන්ගෙන් පරව 'උම්' ප්‍රත්‍යය වූ කල්හි ධාත්වන්ත 'ය' කාරයා ලොප් වී මේ සන්ධිය සිදු වේ. එයිත් —

ලියුම් = ලිවුම් | වියුම් = විවුම්
කියුම් = කිවුම් | *සෙයුම = සෙවුම්.

(ii) බාහිර.

කු. සංවෘත පූර්වාපෙක්ෂි :

දඩ + කම් = *දඩහම් = *දඩ අම් = දඩයම්

කිඹි + කරු = *කිඹිහරු = *කිඹිඅරු = කිඹියරු

ගිනි + කම් = *ගිනිහම් = *ගිනිඅම් = ගිනියම්

කූ. සංවෘත අපරාපෙක්ෂි :

මා + ඉම් = මායිම්. | තො + එක් = තොයෙක්.

කෘ. විවෘත පූර්වාපෙක්ෂි :

බු + ඉසුරු = *බුඉසුරු = බුවිසුරු

ලෝ + ඇදුරු = *ලොඇදුරු = ලොවැදුරු

සා + එක් = සාවෙක්.

කාෘ. විවෘත අපරාපෙක්‍ෂි.

ගෙ + උයන්=ගෙවුයන්. | දෙ + උර=දෙවුර.

**සංලක්‍ෂ්‍යය 1.** — කිසිතැනෙක විකල්පිත උභයා පෙක්‍ෂාවෙන් උභයාගමම ලැබේ. නිදසුන් :—

| සංස්කෘත. | මාගධී. | සන්ධිමුඛය. | සිංහල. |
| --- | --- | --- | --- |
| තීක්‍ෂණ | තිඛිණ | *තිහුණු=*තිඋණු = | තියුණු. තිවුණු. |
| සූක්‍ෂම | සුඛුම | *සිහුම්=*සිඋම් = | සියුම්. සිවුම්. |
| මධුර | මධුර | *මිහුරු=*මිඋරු = | මියුරු. මිවුරු. |
| ද්විගුණ | දිගුණ | *දිහුණු=දිඋණු = | දියුණු. දිවුණු. |
| පයොධර | පයොධර | *පියහුරු=පියඋරු | පියයුරු. පියවුරු. |

**සංලක්‍ෂ්‍යය 2.** — සං. මා. 'කොකිල' යනු පළමුකොට 'කොවිල්' (='කොඋල්') යයි බිඳී පසුව 'කොවුල්' වූ තන්හි 'ව' කාරාගමය පූර්වාපෙක්‍ෂිද අපරාපෙක්‍ෂිද යනු අවිනිශ්චිතය'. කොවිල්' යනු ප්‍රකෘතියෙන්මත් 'කොවුල්' යයි සිටියහැකි (**නි. සා. 23.** පිටිය 7. සං. 2 ). එහින් මෙහි 'ව' කාරාගම යක් ඇත්තේය යනුද අවිනිශ්චිතය. 'ප්‍රාකාර' යනු 'පවුර' වූ තන්හිද එසේමය.

**සංලක්‍ෂ්‍යය 3.** — සං. මා. 'සහොදර' යනු සිංහලට මෙසේ බිඳේ:—

සහෝදර=*සොහොදුරු=*සොහොඋරු = සොහොයුරු. / සොහොවුරු.

මෙහි 'සොහො උරු' යයි සිටි තන්හි පූර්වාපර සවර යුග්මය විවෘතයහ. ඔවුන් අතරෙහි පහළ හෙයින් 'ය' කාරාගමය තෙම ව්‍යභිචාරි වේ; 'ව' කාරාගමය පූර්වාපෙක්‍ෂිද අපරා පෙක්‍ෂිද යනු අවිනිශ්චිතය.

**සංලක්‍ෂ්‍යය 4.** — සායක් (සාගතයක්), පායක් (ප්‍රාසාදයක්), හුයක් (හුලක්), හොයක් (ඇළක්), මෝයක් (නදී මුඛයක්) යනාදි තන්හි ප්‍රකෘතියෙන් පරව පෙනෙන්නාවූ 'ය' කාරාගමයද ව්‍යභිචාරය. විවෘතාන්තවූ මේ ප්‍රකෘතීන් සම්බන්ධයෙහි නිත්‍ය හෙයිනි.

**සංලක්‍ෂ්‍යය 5.** — ඉත්තෑවා, කොල්ලෑව, හොරණෑව, දෝලෑව යනාදි තන්හිද නෑවෙමි, ගෑවෙමි, කෑවෙමි, පෑවෙමි, යනාදි තන්හිද පෙනෙන්නාවූ 'ව' කාරාගමය ව්‍යභිචාරිය. මෙබඳු ඇතම් පද සිඹින්හි අගිමත හා නිත්‍යද හෙයිනි.

**සංලක්ෂ්‍යය 6.** — 'දිවියෙක්' යනාදි තන්හි 'ය' කාරාගමය උභයාපෙක්ෂි නොවේ. 'දිවියා' යන තන්හිද නිත්‍ය හෙයිනි. 'සාවා' යනාදි තන්හි පෙනෙන්නාවූ 'ව' කාරාගමයද උභයාපෙක්ෂි නොවේ. 'සාවෙක්' කීවද පූර්වාපෙක්ෂිව නිත්‍යව පෙනෙන හෙයිනි.

**සංලක්ෂ්‍යය 7.** — 'කටුවල' යන තන්හි 'ව' කාරාගමයද උභයාපෙක්ෂි නොවේ. සන්ධියෙන් පසු පරස්වරය සංවෘතව සිටින හෙයිනි. පරස්වරයා අනවස්ථිත කල්හි ආගමයක්හුගේ භාවනිශ්චය පිණිස ඒ ප්‍රමාණ නොවේ.

## 76. ඇහැසුම් සඳ. ආකර්ෂණ සන්ධිය.

පෙර පර සරක් හෝ — සර සම පර වණක් හෝ
ඇහැසී නැසෙන අනතුරු — ඇහැසුම් සදේ ගුරු නිත්.

පූර්වාපර ස්වරයක් හෝ ස්වරයට සමාන අපර වර්ණයක් හෝ ආකර්ෂණය ලැබ අන්‍යයා කෙරෙහි නිලීන වත්හොත් හේ වනාහි ආකර්ෂණ සන්ධියයි. ගුරු භාවය එහි නිත්‍ය වේ.

ස්වරයන්ට සමානවූ වර්ණයෝ නම් මෙසේය :—

යි = ය් = ඉ.
වු = ව් = උ. } නී. සා. **23.** විතිය 7. සං. 1 – 2; **25. 1.**

සන්ධියට නිදසුන් මෙසේයි :—

1. (*i*) අභ්‍යන්තර.

අයි.
අය්. } =ආ. ළමයි=ළමය්=ළමා. ('ළමාබස්' යනාදියෙහි.)
විෂය=විසය=*විසය්=විසා.

**විසා** දලනිඳු පසුරා. මුවදෙව්.
විදි **විසා**ස. සිදත්.

ඉන්ද්‍රනීලමය=*ඉඳුනිල්මය්=ඉඳුනිල්මා.

නා නා සුරිඳු පුළු ලුර සිරි සඳ ඇ ල් මා
නූ නා කොළෙන සල තල වැනි **ඉඳු** **නි ල් මා.**—සැළ.

සදයි=සදා.

යො දා ඉවත රූප' දුරු නෙද රසිනි ස දා
ස දා දියත නුබමිණි මෙන් මෙහිමි ස දා.—මයුර.

පුදයි=පුදා.

එතුනුරුවත් තියවත් පුදා.—සිදත්.

ඉයි.
ඉය්. } =ඊ. සිවියි=සිවි. (73 1 ද බලනු. ඉයි-ඉය්=ඉඉ=ඊ.)

අගල පිළිම්ණී උ ර
සිවි හා සුර දෙපුර හිමි සා ර

කුස.

එයි.
එය්. } =ඒ. වෙසෙයි=වෙසේ.

ල පස් මුනිඳු සාසන රකිනා නිබ ද
වෙසේ සිරින් කිසිරැලි පුල් සුරිඳු ස ද

කොවුල්.

දෙනෙයි=දෙනේ.

ඔබ අරිය සඟ තොටුවන් දෙනේ.—සිදත්.

එහි=එඉ=ඊ. ගුවනෙහි=*ගුවනෙඉ=ගුවනී.

ලද සිදමුව දිටි ගුවනී. කව්සේ.

ඔයි.
ඔය්. } =ඕ. බොයි=බෝ.

මුළු ලෙව් ඔබ දහමොද බෝ.

සිදත්.

අව්=ආ. පාප=පව්=පා.

මාතෘ=මාතු=මඋ=මව්=මා. ‍ෙ5. 1.

සපයව්=සපයා.

පියව්=පියා.

(වි) විසිවැදුරුම් — වියරණ විදි සපයා. සිදත්.

මා නවතන්හට — පියෝ පියා අැමැත්තෙති.

මුවදෙව්.

ඇව්=ඈ. (සව්ම=) සැව්ම=සෑම.

වැව්කන්ද=වෑ කන්ද.

ඉව්=ඊ. චතුරස්‍ර=සිව්රැස්ස=සී රැස්ස.

එව්=ඒ. දෙව්දුනු=දේදුනු.

දෙව් අදියර=දෙව්දියර=දේදියර.

දෙව්තා=දේතා. (ජේතවන-

දේවන—දෙව්න—දෙව්නා.)

ඔව්=ඕ: හොව්නා=හෝනා

දෞව්නා=දෞනා

ලොව්නා=ලෝනා.

(*ii*) බාහිර.

ඇවි, ඇවු } = ඈ. වැවි + කන්ද = වෑකන්ද.

ඉවි, ඉවු } = ඊ. සිවි + මැදුරු = සිවුමැදුරු = සීමැදුරු.
සිව්රු + අළු = සිවුරළු = සිවු–රළු = සීරළු.

එවි, එවු } = ඒ. දෙවි + දුනු = දේදුනු.
දෙවි + අදියර = දේඅදියර = දේදියර.

මතු බුදුබව ලබන–ලෙස දේ දියර අගමැති. කොවුල්.

**සංලක්ෂ්‍යය.**– මෙබඳු තන්හි සන්ධිය පූර්වාපර භණිති යුග්මයක්හුගේ ඝටනය ඇතිකල්හි පමණක් සිදුවන හෙයින් බාහිර සන්ධියක් බවද එනමුදු උවත් සන්ධියෙහි සිඬිය වන්නේ එක් භණිතයක් හුගේ (එනම් පූර්ව භණිතයාගේ) අභ්‍යන්තරයෙහි පමණක් හෙයින් අභ්‍යන්තර සන්ධ්‍යයෙහිත් ගැනෙන බව්ද සලකනු. 192 වෙනි පිට බලනු.

2.

කිසි විටෙක මේ ආකර්ෂණ ධර්මයෙන් හා සමාහාර සන්ධියෙන්ද ‘අය’ යනු ‘ඒ’ වේ. (අය=අය්=අඉ=ඒ); ‘අව’ යනු ‘ඕ’ වේ. (අව=අව්=අඋ=ඕ.)

**සංලක්ෂ්‍යය.** — මෙහි ප්‍රථමකොට වන්නාවූ අන්තස්වරලොපය ආකර්ෂණ හෙතුවෙනි. එයින් හල් වන්නාවූ අන්තඃස්ථයා සවර්ණීය ස්වර භාවයට පැමිණීම **නි. සා. 25.** 1හි පෙනෙන්නාවූ වර්ණ ධර්මයෙහි. ඉන්පසු වන්නාවූ ස්වර සන්ධිය සමාහාරයෙහි.

සන්ධියට නිදසුන් මෙසේයි: –

(i) අභ්‍යන්තර.

| | | |
|---|---|---|
| අය=ඒ. | කළය=කළේ | නිලය=නිලේ |
| | විනාසය=විනාසේ | ඇටය=ඇටේ |
| | විජයසිංහ=විජේසිංහ. | |
| අව=ඕ. | ඇටවරු=ඇටෝරු | කිරළව=කිරළෝ |
| | රනවරු=රනෝරු | පොළව=පොළෝ |

**සංලක්ෂ්‍යය. 1.** — මේ සන්ධිය මාගධියෙහි අතිශයින් බහුලය. සංස්කෘතයෙන් වාග්භෙදය වීමෙහිදී සාමාන්‍ය සිඬිය මෙසේයි: ශයනාසන– සේනාසන; කථයති– කථෙති; අවකාශ– ඕකාස; අවතරති– ඔතරති යනාදී වසයෙනි. සංස්කෘතයෙහිද කිසි විටෙක ඇත්. ‘මඝවතා’ යයි කියයුතු තන්හි ‘මඝොනා’ වූයේ එයිනි.

**සංලක්ෂ්‍යය. 2.** මේ සන්ධිය බාහිරව නොපෙනේ.

3.

මෙතෙක් තැන් සන්ධිය පූර්වස්ථාකර්ෂණයෙනි. අපරස්ථාකර්ෂණයෙන්ද ලැබේ. නිදසුන් :-

( i ) අභ්‍යන්තර.

| සංස්කෘත. | මාගධී. | සිංහල. |
|---|---|---|
| සුහෘද් | සුහද | සුඅද=සාද |
| ස්වප්න | සුපින | *සුවින=*සුඉන=සීන |
| විප | *දීප | දිව්=*දිඋ=දූ |

**සංලක්ෂ්‍යය.** — *සුවින-*සුඉන යනු සුඛොච්චාරණයෙහිදී අවිශෙෂයහ. *සුඉන යයි සිටියේද සුඛොච්චාරණයෙන් *සුවින වන හෙයිනි. ආකර්ෂණයට හෙතුව ඒ විය.

( ii ) බාහිර.

සිවු + විසි=සිව් විසි=*සිඋවිසි=සූවිසි
එහි + ළඟ=*එඉළඟ=ඊළඟ.
මෙහි + ළඟ=*මෙඉළඟ=මීළඟ
ගෝ + හල=ගො + හල=*ගොඅල=ගාල.
දෙ + ඇළේ=දෑළේ
නො + හැර=නොඇර=නැර
නො + අඩන්=නාඩන්.

**සංලක්ෂ්‍යය.** — ප්‍රතිෂෙධාර්ථයෙහි 'නො' යන්න නොයෙක්විට මේ සන්ධියෙහි නිලීන වන බව යට දැක්වූ නිදසුන්වලින් ප්‍රතීත වේ, තවත් නිදසුන් මෙසේයි : -

වෙන වෙණැදුරකු බල-නැසිද තෝ මූසිල. ගුත්තිල.

නැ ර ලො ල ය වඩවයි දුටු දනන් හ ට
සැ ර ග ල ය සිරි බල මේ ලෙසින් සි ට
හංස.
නා සා අත් පියඹ යුරු රුසිරු කොමල යේ
නා සා කෙලෙස පසුවෙමි බොළඳ බස් නි ගේ.
වියත් කව්.

4.

**කිසි විටෙක දීර්ඝඞය ප්‍රකෘතියෙන් තිබුණේ වෙයි. නිදසුන් : -**

මාතෘකා=මාතිකා=*මාති=*මාඉ=මෑ. }
භ්‍රාතෘ=භාතු=භාර් (ප්‍රාකෘත) =බෑ. } (74. 3 ද බලනු.)

තොච්=තොළුඥ=නු. }
තොගී=*තොර්=නී. } (71. ii ද බලනු.)

### 77. දෙරූගේ සද. විරූප හෙතු සන්ධිය.

පෙරසර අපර හා—පැහැසී වෙමින් අතගත්
ලබත පෙර ගත් පිළිරූ—සිදු ඉන් දෙරූ හේ සඳ.

පූර්ව ස්වරය අපර ස්වරය හා එකීභූතව අන්තඃස්ථයකු වී පූර්ව ව්‍යඤ්ජනයෙහි ප්‍රතිරූපය ලබත් හොත් එයින් සිඩවූයේ නම් විරූප හෙතු සන්ධියයි. නිදසුන් මෙසේයි :-

ඇමති + ඕ=ඇමත් + ඉ + ඕ=ඇමත්යෝ. **25.** 1.

මෙතෙකින් විරූප හෙතු සන්ධිය වේ. මින් පසු ව්‍යඤ්ජනය කින් පරව සිටි 'ය' කාරය තෙම දුර්වල හෙයින් එම ව්‍යඤ්ජනයා ගේ පිළිරුව් ආධාමකොට ඇති ප්‍රතිරූපය ආරොහණ වශයෙන් ලබා (**නි. සා. 25.** 3.) එයින් 'ඇමත්යෝ' යනු 'ඇමත්තෝ' වේ (**නි. සා. 25.** 4-5.) මෙය සුබොධවාරණයෙන් 'ඇමැත්තෝ' වේ. මේ විරූපයට හෙතුවූයේ අන්තඃස්ථයකු පහළකොට ලූ යථොක්ත සන්ධිය හෙයින් හේ වනාහි විරූප හෙතු සන්ධියයි. කුරුලු + ඕ=කුරුල්ලෝ යන තන්හිද ධර්මය එමය.

තවත් නිදසුන්: -

(i) අභ්‍යන්තර.

නැටි + අ=*නැට්ය=නැට්ට.

ගෙඹි + ආ=*ගෙඹ්යා= ගෙම්බ්යා=*ගෙම්බ්බා=ගෙම්බා.

(**නි. සා. 23.** 8. පිට 82.)

පොලු + අ=පොල්ව=පොල්ල.

කියනු + ආ=*කියන්වා=කියන්නා.

මහලු + ආ=*මහල්වා=මහල්ලා.

මුළුළු + ඒ=*මුළුල්වේ=මුළුල්ලේ. (**නි. සා. 23.** 7. ආ. පිට 81.)

(ii) බාහිර.

වැලි + අවුරු=*වැල්යවුරු=වැල්ලවුරු.

හෙලිලි + අඹු=*හෙලිල්යඹු=හෙලිල්ලඹු.

කුලු + එව්=*කුල්වෙව්=කුල්ලෙව්.

### සරරු සඳ. ස්වරාරූඪ සන්ධිය.

**78.** වියදුන් තුමා පර-සරරුම් සරරු සඳ නම්
අනතුරු දෙරූ වෙසෙසින්-දෙ යනු බේ එහි දන්නේ.

ව්‍යඤ්ජනයා තමාගෙන් පරව සිටි ස්වරයා කෙරෙහි වන්නාවූ ආරෝහණය තෙම ස්වරාරූඪ සන්ධි නමි. අනන්තර සන්ධිය, විරූප සන්ධිය යන විශෙෂයෙන්වූ එහි විභෙදය ඥතය කරන්නේයි.

### 79. අනතුරු සඳ. අනන්තර සන්ධිය.

වියදුන 'බි මුව පත්-ෂර සර ලගිත් නිකෙලෙස්
කිසි තුරු නොමැති හේතෙන්-අනතුරු සරරු සඳ නම්.

ව්‍යඤ්ජනයකු ස්වාභිමුඛ ප්‍රාප්තවූ පර ස්වරයා කෙරෙහි නිෂ්කෙලශයෙන් ලග්න වත් හොත් කිසිවිත් අන්තරයක් නොමැත්තාවූ හෙතුයෙන් හේ වනාහි අනන්තර ස්වරාරූඪ සන්ධි නමි. නිදසුන් මෙසේයි: -

| (i) අභ්‍යන්තර. | (ii) බාහිර. |
|---|---|
| ගස් + එහි=ගසෙහි | තදුන් + උයන්=තදුනුයන් |
| කැලුම් + එන්=කැලුමෙන් | තිල් + උපුල් + ඇසී=තිලුපුලැසී. |

**ශුඩියක්.– 37 නිතිසාරය (1) හා සම්බන්ධයි.**

(අං. 79. 2. බලනු) යයි කියූ තන්හි ඒ වෙනුවට "අං. **74, 2.** බලනු"යයි යොදාගත යුතුයි. ඒ කීවේ ප්‍රතිලොම සමාහාර සන්ධිය ගැනයි.

### 80. දෙරූ සඳ. විරූප සන්ධිය.

දෙසරන් මැද හලෙකු-මත් රැක උපුරු වනු වස්
නිපදත් තමා පිළි රූ-හේ වේ දෙරූ සඳ නම්.

ස්වරයන් දෙදෙනකු හට මැදිවූ හල් වර්ණයෙක් විතීය ස්වරයාගේ ආරෝහණයට නොගොස් මාත්‍රාසංරක්‍ෂණයෙන් උච්චාරණය කරනු පිණිස තමාගේ ප්‍රතිරූපයක් නිපදවාද හේ සන්ධි තෙම විරූප සන්ධි නම් වේ. නිදසුන් මෙසේයි: –

(i) අභ්‍යන්තර.

මදුතුන් බ ලැ ත් තෝ-රුපු සයුර මෙර — **ම න් තෝ**
අවිසිජ් **උ ග න් තෝ**–අවට සිටියෝය සාඩු — **ග න් තෝ**
ගුත්තිල.

මත් + ඕ=මත් (ත්) ඕ=මත්තෝ;

උගත් + ඕ=උගත් (ත්) ඕ=උගත්තෝ;

ගත් + ඕ=ගත් (ත්) ඕ=ගත්තෝ.

( ii ) බාහිර.

| | |
|---|---|
| වල් + අම්බලම=වල්ලම්බලම | වක් + අත්ත=වක්කත්ත |
| රුක් + අත්තන=රුක්ඝත්තන | පැන් + ආසා=පැන්නාසා. |

**සංලක්ෂ්‍යය 1.**—මේ බාහිර සන්ධි තෙමේ ජන ප්‍රචාරයෙහි බොහෝසේ ලැබේ; ග්‍රන්ථාරූඪව බොහෝසේ දක්වනු නොලැබේ. තවත් නිදසුන්:-

| | |
|---|---|
| පොල් + උල=පොල්ලුල | තල් + අරඹ=තල්ලරඹ |
| දික් + ඔය=දික්කොය | වෙල් + එළිය=වෙල්ලෙළිය. |

**සංලක්ෂ්‍යය 2.**— මේ සන්ධිය සංස්කෘතයෙහි ඉතා ස්වල්ප වශයෙන් පෙනේ; හ්‍රස්ව ස්වරයකු කෙරෙන් පරවූ හල් 'න' කාරයා අන්‍ය ස්වරයකු පෙර වූව සිටි කල්හි පමණකි. භවන් + එති=භවන්නෙති යනු නිදසුනි. සිනාසෙමින් එයි යනු අපිසි. මාගධියෙහි කිසිසේත් නොපෙනේ. ඵලනන වාග් රූපයන් එහි නොමැති හෙයිනි. ද්‍රවිඩයෙහිවූ නාලී විශාල ප්‍රචාරයෙන් ලැබේ. නිදසුන්:-

| | |
|---|---|
| නල් + ඌර්=නල්ලූර් | (හොඳ ගම) |
| කණ් + ආඩි=කණ්ණාඩි | (නෙත් පළිඟුව) |
| පොන් + අවරෙයි=පොන්නවරෙයි | (රන් + අවරා=රනවරා) |
| මන් + ආරු=මන්නාරු | (වැලි හොය) |
| මූන් + අඩි=මූන්නඩි | (මූන්නඩිය, ප්‍රමුඛ ස්ථානය.) |

කොකිල සන්දේශය කරන්නාවූ ප්‍රවර පණ්ඩිතාචාර්යයන් විසින් මේ බාහිර සන්ධිය කාව්‍ය බන්ධනයෙහි රම්‍ය සේ ආශ්‍රය කර තිබේ. ඒ මහාහී සන්දේශයෙන් පද්‍යයක් මෙසේය:-

කුරිරු දරුණු තෙද රුස් ගොස් — ව ක් නා ල
සොඳුරු තරුණු සුර සර වත් — ම න් නා ල
අනත සසිරි රුඳි එනුවර — ර න් නා ල
නිබඳ රඳන සුර දෙව් රද — පු ත් නා ල.

රුඳි, රඤ්ජිතවූ; අනත සසිරි, අනන්ත ශ්‍රී සහිතවූ; එනුවර, ඒ නගර නමැති; **රන් ආල**, කනක විමානයෙහි;- අහෝ නොහොත්, ශ්ලේෂාර්ථයෙන්; එ නුවර, ඒ නගරය නැමති; අනත සසිරි, අනන්ත සංශ්‍රයයෙහි (මෙහි අනන්ත සංශ්‍රයයෙන් ආකාශය ප්‍රතීත කළහ); රුඳි, රඤ්ජිතවූ; රන් ආල, කනක විමානයෙහි;

නිබද, නිරන්තරයෙන්; රඳන, වාස්තව්‍යවූ, සුර, සුර තෙමේ නම් (සුර යන්නෙන් සුධීදිව්‍යරජයා කියනු ලැබේ. ඔහුගේ නිවාසය කනක විමානයෙක්හිය); පුන්නාල දෙව්රජ, පුන්නාල නම් දිව්‍ය රජයාසි; (කෙබන්දේදයත්): (රෞද්‍ර පක්ෂයෙහි) කුරිරු, ක්‍රෑරවූ; දරුණු, දරුණුවූ; තෙද රැස්, තෙජෝ රශ්මීන්; ගොස්, ගමනය කොට; **වන්,** ප්‍රවිෂ්ටවූ; **ආල,** ආස්පදයකට බඳුවූ; (සෞම්‍ය පක්ෂයෙහි);- වන්, (තමා පිළිබඳව ප්‍රවිෂ්ටවූ); **මන් ආල,** චිත්තානුරාගයෙන් යුත්; සොඳුරු, සුන්දරවූ; තරුණු, තාරුණ්‍යවූ; සුර සර, දිව්‍යාඞ්ගනාවන් ඇති (පුන්නාල නම් දිව්‍ය රජයාසි.)

**සංලක්ෂ්‍යය 3.**— ලිපියෙහි දක්වන ලද්දේ හෝ නොදක්වන ලද්දේ හෝ අනන්තර ස්වරරූඪ සන්ධිය ශක්‍ය නමුදු එය නොසිද්ධ තන්හි මෙය නිත්‍ය බව සලකනු. ද්‍රවිඩ ධර්මයි.

## 81. වියදුන් සඳ. ව්‍යඤ්ජන සන්ධිය.

1 පෙර පර දෙ වියදුන්-සසඟින් ලබන සම බැව්
ලබත් හෝ තුරු වගලක්-වියදුන් සඳේ දන්නේ.

2. ඉති පෙර රුවින් හෝ-කිසි තැන පර රුවින් හෝ
කිසි තැන ගොත සර'ගමින්-වනුයේ එසඳ තුන් බේ.

පූර්වාපර උභය ව්‍යඤ්ජනයන් අන්‍යොන්‍ය සංසර්ගයෙන් සමාන භාවය ලබතොත් හෝ උච්චාරණ සුඛය පිණිස තමන් අතුරෙහි උපකාර වර්ණයක් ලබතොත් හෝ සේ වනාහි ව්‍යඤ්ජන සන්ධියයි දන්නේයි.

මෙසේ පූර්ව රූපයෙන් හෝ කිසි තැනෙක පර රූපයෙන් හෝ යළිදු කිසි තැනෙක ස්වරාගමයෙන් හෝ සිදුවනුයේ ඒ ව්‍යඤ්ජන සන්ධි තෙම ත්‍රිභෙද වන්නේයි.

## 82. පෙර රූ සඳ. පූර්වරූප සන්ධිය.

පෙර පර දෙවියදුන්-සිලිටින් උසුරුවනු වස්
පර වණ ගනුතු පෙර රූ-වියදුන් සඳේ පෙර රූ.

පූර්වාපර ව්‍යඤ්ජනයන් දෙදෙනා ශ්ලිෂ්ටතායෙන් උච්චාරණය කරනු පිණිස අපර වර්ණය පූර්ව වර්ණයාගේ රූපය ගනුත්හොත් සේ වනාහි පූර්වරූප නම් ව්‍යඤ්ජන සන්ධියයි. නිදසුන් මෙසේයි:-

(i) අභ්‍යන්තර.

සත් + නු=සත්තු. | සං. බාල්‍ය, සිං. බාල්ල.

බාල්ලේ පුරුදු කිවි නැව සියල්ලේ. මයූර.

සං. මා. තුල්‍ය, සිං. තුල්ල.

මන සිසි තුල්ල දිගුනෙත නිලුපුල පුල්ල. කොවුල්.

පන්වම්=පන්නම්.

කවුරු අඟනන් පියති පන්නා. කව්සේ.

වද් + වා=වන්ද්වා (නි. සා. 23. 8.)

=*වන්ද්දු (නි. සා. 25. 3-5.)

=වන්දු (නි. සා. 23. 8. පිට. 82.)

බඹ සුර නරන් වන්දු. ගුත්තිල.

(ii) බාහිර.

කම් + හල=කම්මල

ගෙත් + කම්=ගෙත්හම්=ගෙත්තම්

අග් + කම්=අංග් + කම්=අංග්හම්=*අංග්ඝම්=අංගම්.

කොස් + චින්න=කොස්සින්න. (කොස්කැලේ.)

**සංලක්‍ෂ්‍යය 1.**— බාහිර වශයෙන් මේ සන්ධිය බොහෝසේ වන්නේ 'හ' කාරයා ප්‍රකෘතියෙන් හෝ ආදේශයෙන් හෝ පරව සිටි කල්හිය.

**සංලක්‍ෂ්‍යය 2.**—බාහිර වශයෙන් හෝ අභ්‍යන්තර වශයෙන් හෝ මේ සන්ධිය පිණිස පර වර්ණය හැම කල්ම හ, ය, ව, යන මේ අන්තඃස්ථයන් තිදෙනාගෙන් එකකු වියයුතු බවද සලකනු.

(නි. සා. 25. 1-5.)

## 83. පර රූ සඳ. පර රූප සන්ධිය.

පෙර පර දෙව්යදුන්-සිතිඳු ඉසිරුම් සඳහා
ගනුතු පෙර වණ පර රූ-සඳ නම් එ වේ පර රූ.

පූර්වාපර උභය ව්‍යඤ්ජනයන්ගේ සතිඞෝච්චාරණය වනු පිණිස පූර්ව වර්ණය අපරයාගේ රූපය ගනුත් හොත් හේ වනාහි පර රූප නම් සන්ධිය වන්නේයි. නිදසුන් මෙසේයි:–

(i) අභ්‍යන්තර.

| | |
|---|---|
| පින් + ම=පිම්ම | පත් + ල=පල්ල |
| ඇද් + ම=ඇම්ම | බැඳ් + ම=බැන්ද්ම=බැම්ම |
| අත් + ල=අල්ල | රොද් + න=රොත්න. |

(ii) බාහිර.

| | |
|---|---|
| ලිප් + ගල=ලිග්ගල | මත් + ගොන=මග්ගොන |
| ලක් + ගල=ලග්ගල | යත් + දී=යද්දී |
| හික් + ගස්=හිග්ගස් | ගොබ් + කොළ=ගොක්කොළ. |

පෙමිත් පිළිබද්දේ-රුදවූ එකාකු මැද්දේ
උත්ලිය නොසිද්දේ–අසා අනිකෙක් කෙසේ බද්දේ

කව්සේ.

(සිත් + දේ=සිද්දේ; බත් + දේ=බද්දේ)

## 8[illegible]. වහල් වණ. උපකාර වර්ණ.

සමරාගම සන්ධියට බසිනු පෙර එහි නිසි අවබෝධය පිණිස වහල් වණන් හෙවත් උපකාර වර්ණයන් සම්බන්ධවූ සමාලොචනයක් දූත් මෙහි ප්‍රාසඞ්ගිකයැ.

පද අත් පිරුම් වස්-පදරුත් දිලුම් වස් හෝ
යළ හෝ සුවිසිරුම් වස්–පැමිණෙන වණකු එවහල්.

සිය බසෙහි වනාහි ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි කියනලද අනුබන්ධ, විකරණ ප්‍රත්‍යය, යනාදි වසයෙන් පදසිද්ධිය පිණිස යෙදෙන යම් කිසි සඞ්ඛ්‍යාවෙක්හි ඇතුළත් නොවන්නාවූ ඇතම් වර්ණයෝ වාගාශ්‍රිතව දක්නා ලැබෙත්. එයින් සමහරු–

(1) කාව්‍ය භාෂායෙහිදී පද්‍යයාගේ යම්කිසි මාත්‍රා ඌනතාවක් පූරණය පිණිස හෝ එළිසමය පිණිස හෝ උපකාරිව යෙදෙත්.

(2) සමහරු යම් කිසි අර්ථ ද්‍යෝතනයක් පිණිස ලක්ෂණ වශයෙන් යෙදෙත්.

(3) සමහරු උච්චාරණ සුඛය පිණිස යෙදෙත්.

මොව්හු වනාහි වහල් වර්ණයෝ වෙති. ඔවුන්ගේ සාමාන්‍ය දර්ශනයක් නම් මෙසේය :–

**වහල්වණ.**

**ඇ.**

මේ වර්ණය තෙම පදන්තයෙහි යොදනලද්දේ කිසි තැනෙක අනියමාර්ථ සූචක වෙයි. නිදසුන් :—

යන්ට බරණැස් ස මු—දෙව නෑත ඔහු තො පැ ස් ස මු
කරව අප ඇස් ස මු—අපිද වෙණ නද අසනා රි ස් ස මු.

ගුත්තිල.

2. කිසි තැනෙක අනියමාර්ථවාචි අසම්භාව්‍ය ක්‍රියාව හා රචනා දීප්තිය පිණිසද යොදනු ලැබේ. නිදසුන්: –

නොහබා **වනනා** හොත් අනනද නරඹාය. මයූර.

(මෙහි රචනා දීප්තිය නම් වනන, අනන, යන මොවුන්ගෙන් වන්නාවූ අනුප්‍රාසයයි.)

තවද—

බියෙන් බිසරුවන් වේ මග බැස **සර** **නා**
වසන් පියෙන් රසින'ලු කල රුවන් කො න
ලමින් එදූක අදසි කර නුඹේ ග න
පහන් වෙති උන් නොපහන් නොකර **ය** **නා**. මයූර.

මෙහි **සරනා** යයි කියූ තන්හි අකාරය තෙම අනියමාර්ථයෙහි වේ; අන්තිම පාදයෙහි **යනා** යයි කියූ තන්හි අනියමාර්ථයෙහිද සාලාර්ථයෙහිද යනු අවිනිශ්චිතයැ.*

**සංලක්ෂ්‍යය.**— "නෙකල නෙසද රූ—නොවෙත්ව **හොනා** අනියම්" යන මෙහිද තවත් එබඳු තැන්හිද පෙනෙන්නාවූ අ කාරය තෙම ප්‍රසතුත ප්‍රත්‍යය 'න' යන්නයයි සිදත්කරුගේ පැවති කල්පනාව අනුව යොදන ලද්දකි.

---

* බිසරුවන්, අභිසාරිකාවන්; වේ මග බැස, වීථිමාර්ගාවතීර්ණව; බියෙන් සරනා, භීතියෙන් සඤ්චාරය කරත්හොත්; රසින්, රශ්මියෙන්; අලුකල, ආලෝකය කළාවූ; රුවන් කොන, රත්නශෘඞ්ගය; පියෙන්, නුඹගේ පක්ෂයෙන් (උභය පක්ෂයම මෙයින් ගැනේ); වසන්, ඡාදනය කරන්; ඒ දූක, ඒ දශිතය කොට; නුඹේ ගන, නුඹගේ ශරීරයෙහි; කර, කාන්තිය; අදසි ලමින්, චිත්තයෙහි ප්‍රක්ෂෙපකරමින්-සමාලොචනය කරමින් යනු භාවයි- ; පහන් වෙති, (දූත්) ප්‍රභාත වන්නේයයි; උන්, ඒ අඞ්ගනාවන්; යනා, ප්‍රයාණය කරන් හොත් නොහොත් ප්‍රයාණය කරත්ම; නොපහන් නොකර, (ඔවුන්) අප්‍රසන්න නොමකරනු.

අඹතලද පිය ඇති නුඹගේ ශරීරය යථොක්ත රත්න කාන්තියෙන් ප්‍රභාසව රව පෙනෙන කල්හි මේ මොහරෙක් තෙම පක්ෂාන්ත් අඹයි, අරුණාලෝකයද මොහු කෙරෙහි බබලා; උදව එන්නාවූ සූර්‍ය්‍යා භව මොහුගේ නෘත්‍යාරම්භය වේදැයි සිතා යථොක්ත අඞ්ගනාවන්ගේ ප්‍රයාණය වියහැකි. ඒ දූක පිය හකු එවිගැන්මෙන් හැවන රත්න කාන්තිය විහිදුවා ඔවුන්ගේ අප්‍රසාදය ප්‍රකාශ මින් නොම කරන්- යනු මෙහි තාත්පර්ය යයි.

3. අසම්භාව්‍ය ක්‍රියාව හා යොදනලද්දේ බොහෝවිට එහි කාලාර්ථය ද්‍යෝතනය කෙරෙයි. නිදසුන් :—

**කියනා** උන් මෙතෙපල-ආයෙය ඇදුරු ගුත්තිල. එම.

**සංලක්‍ෂ්‍යය.**— සිදතෙහි වනාහි අසබහව් කිරියෙහි '**නා**' පස රුසී යයි කියන ලදින් මෙහි බැහැරින් ආවාවූ අ යන්නක් නොමැති සේ පෙනේ. එහෙත් ශිෂ්ටව්‍යවහාරවූ 'කියත් නොත්' යනාදියෙන් එය එසේ නොවන බව පැහැදිලිය. මේ 'අ' යන්න නපුංසක ලිඞ්ගාශ්‍රිත සප්තමී විභක්ති එක වචනයෙහි ප්‍රත්‍යය සී පිළිගත යුතු වේ. **අසල** යනාදි තත්හි මෙහි.

4. මෙහි යොගය කාලාර්ථය පිණිස පමණක් නොවේ. සාමාන්‍ය භාවාර්ථයෙහිද ලැබේ. නිදසුන්: –

**වනනා** බැරි අසත සිරි පිරි නික පිටිය. සොවුල්.

(වනන, වණීනයෙහි; බැරි, භාරයි.)

අතික් තැනෙක්හි—

**යන්** මැනවිය දුක දිසි උදයග මිතුර. කොවුල්.

(යන්, ගමනය කරන්නොත්—අනියමාර්ථයි—මැනවිය, ඒ මනොඥමැයි.)

5. කිසි තැනෙක ඉත්‍යර්ථ සුවනය කෙරේ. නිදසුන්: –

රිවි රිය හයන් **ගෙන්වනා** යන සැක සිතිනි. මයූර.

6. කිසිතැනෙක වාක්‍යාවසානය සූචනය කෙරේ. නිදසුන්:-

දනු පසිඳු **වෙහෙරෙක** සැදි කැරගල. හංස.

යුදසට පැමිණ මෙහිරිඳු පැරදි තැන් **නැතා** හංස.

**සංලක්‍ෂ්‍යය.** — මේ අවසානාර්ථයෙහි වනාහි ක්‍රියාවෙන් පරවද අලඞ්ය වන්න කිව්හු විසින් යොද තිබේ. නිදසුන්: -

වි පු ල ගුණැති මහතුන් හට පත් වි ප ත

නි ස ල නැණින් යුතු උතුමෝම දුර ල තා.

(එහෙත් මෙය ආදර්ශයට ගතයුත්තක්සේ නොපැනේ.)

7. කිසි තැනෙක සුඛොච්චාරණය පිණිස වේ. නිදසුන්: –

අඹි – අඹ; දඹි – දඹ; කැඳි – කැද.

8. කිසිවිටෙක ජනෙ‍ෘ හෙතුයෙන්ද යොදනුලැබේ. **සාමාන්‍ය වශයෙන් එළිසමත්වය පිණිසය.** නිදසුන්: –

දු ත් මේ ම හ ස ග න- මනුවණ වනනී මෙලෙසි න
මැණිකක් මෙන් ප සි න- වැසුණු නොදනිනි නුවණ බවංග න
කව්සේ.

2. ආ. මේ තෙම අ කාරයෙන් පරවද හල් පරවද ඡන්ද හෙතුයෙන් යෙදේ. නිදසුන්: –

මෙංහු රණ ගෙද ර ණි නා
ගජ හය බලත් සි ඳු නා. කව්සේ.

පමණින් තම ග ලා ගත දිය තුශ ග ලා
සි වි නා මනකලා උවනත ම න ක ලා
ස යු රෙ කි පි රි ක ලා වැනි සඳ දිසි ක ලා
කෙලෙන ළඳුන් බලා පයෑද නොයැකි බ. ලා. හංස.

3. ඈ. මෙය වනාහි පුරාණ භාෂායෙහි වාක්‍යාවසාන සුවන යෙහි යෙදිණ. බොහෝ තැන එම ලක්ෂණයෙහිවූ 'ය' කාරයා හා සම්බන්ධවයෑ. නිදසුන්: –

"ඔස බමුණ සකස්කොට අසා. මම කියමි" වදලහ. "හේ ඉතා මැනවැ"යි ගිවිස්සෑ. අමාවතුරු පිරිසේ. 5.

තෝ මහත් ධන ඇත්තෙහි. ළදරුයෙහි. ඉතා මැනවැ. මහා යාග කරත්තෙයයි කීහු. එම.

පොළෝ තල හිතණයෙන් ගැවසිගත්තේ යෑ. වන ලැබ් සුපිපියේ යෑ.
අමාවතුරු පිරිසේ. 3.

4. ඉ. මේ වනාහි 1. කිව් බසෙහි නොයෙක් තැන හල් ;නකර සරවත් කෙරෙයි. විකල්පයෙනි. නිදසුන්: –

රෙන් ඇරුගෙන ම ලි ණි-මී බඳින බමරුන් මෙ ණි
ලොව නොපෙලා යෙහෙණි-අයින් දන රුස්කරන් නිරිඳුනි.
කව්සේ.

එකලැ කිසල රැඳි හැද තිසරුන් සණි. කව්සේ.

2. වත්මන් කිරියෙහි අන්‍යවූ හලුන් සරවත් කෙරෙයි. විකල්පයෙනි. නිදසුන්: –

කෙරෙම්- කෙරෙමි; දෙත්- දෙති.

සංලක්ෂ්‍යය.— සංස්කෘත මාගධීත්හි වනාහි වත්මන් කිරියැ උත්තම පුරුෂ එකවචනයෙහි ප්‍රත්‍යය 'මි' වේ; අන්‍ය පුරුෂ බහුවචනයෙහි ප්‍රත්‍යය 'න්ති' වේ. මෙහි ප්‍රස්තුත යෝගී. සිය බසට හණීහින් බිදී ඊමෙහිදී ! එක් ධර්ම යෙක් නම් අන්ත්‍යස්වර ලොපයයි. ඒ ධර්මය අනුව මේ ප්‍රත්‍යය යුග්මයද සිය බසට පැමිණීමෙහිදී භෙදය මෙසේ විය: –

| සං. මා. | | භෙද මූලය. | සිංහල. |
|---|---|---|---|
| මි | ... | අන්තස්වරලොපය. | ම් |
| ත්ති | ... | අන්තස්වරලොපයෙන් : ත් ත්; | |
| | | පූර්ව 'හල්' ලොපයෙන්... | ත් |

රශ්මි-රංසි-රැස්; ශාලි-සාලි-හැල්; කාන්ති-කන්ති-කැත්, කත්;- යනාදියද සමකර බලනු.

3. වාක්‍යාවසානය පිණිසද යෙදේ. නිදසුන්: –

සුරතුරතම් ග සෙ කි
සිතුරුවන තුම් ප හ ණෙ කි. සව්මුතුහර.

4. කිසි විටෙක සාමාන්‍ය වාක් පූරණය පිණිසද යෙදේ. නිදසුන්: –

නිත්- නිති; පිල්- පිලි; ලැස් - ලැසි .

5. කිසි විටෙක උච්චාරණ සුඛය පිණිසද යෙදේ. නිදසුන්:– මාගධී 'කුරුමාන' යනු සිංහලට බිඳී ඊමෙහිදී 'කරමින්' යයි සිටි කල්හි–

මේ වහලින් : 'කරමින්' කියා හෝ වේ. පූර්වහල සරවත් වීමෙනි.

'කරමිනි' කියා හෝ වේ. අපරහල සරවත් වීමෙනි.

මුසු කිරියැ අතික් තන්හිදු මෙසේමය.

| තවත් සාමාන්‍ය නිදසුන්: – | | අවහල්. (අන්ලොප්.) | | සවහල්. අලොප්. |
|---|---|---|---|---|
| බඳ් | ... | බත් | ... | බැඳි |
| හඳ් | ... | හත් | ... | හැඳි |
| විඳ් | ... | වින් | ... | විඳි |
| වලඳ් | ... | වලත් | ... | වැලඳි |
| පලඳ් | ... | පලත් | ... | පැලඳි. |

(සි. සා. 23. 8.)

**6. ඊ.** මේ තෙම ශබ්දාලංකාර පද්‍යයෙහි නොයෙක්විට ඡන්දො හෙතුයෙන් යෙදේ. හෙද වැඩිකොටම ලකාරාශ්‍රයණයෙනි.

නිදසුන්: –

එ කි පැ කි ලී දු ව න හැ ලි
පිපි වි පු ලී කර බුම ලී
කු රු මඩුලී සෙ ව ණ' වලී
වන එ කලී කුමරු බැ ලී. කව්සේ.

6. උ. මේ තෙම නොයෙක් විට ද්‍රවිඩයෙහි සේම ප්‍රත්‍යන්තවූ හල් වර්ණයා ආශ්‍රය කෙරෙයි. නිදසුන්:-

මත්- මතු, සිත්- සිතු, මුත්- මුතු, රුක්- රුකු, තොත්- තොතු, *ඇතුළ්- ඇතුළු, දුඹුල්- දුඹුළු, ලකළ- *ලකළ්- *ලකළු- ලකුළු.

2. එහෙත් මෙය නොහල් වර්ණස්ථානයෙහි ආදෙශයෙන් ලැබෙන බවක් නොපෙනේ. එසින්—

පෙනහෙල්ලෙන් ඇවු එ
පහතෙව් වතුන් අලු ක එ
ගුරුනුදු තොම හස එ
කුමරු සත දූත යසින් සුලකු එ

යනමේ පාඨයෙන් ලක සියලු මහාසූරීන් අතරෙහිද සාමාන්‍ය විද්ශ්‍රිතයන් අතරෙහිද චිර කල් සමාම්නායෙන් එන්නාවූ කව්සේකර පද්‍යයෙහි මේ වහල් වර්ණය පාදන්තයෙහි පෙනෙන නමුදු එය එහි අස්ථානෙවෙයි. පද්‍යයෙහි ශුද්ධ පාඨය මෙසේ විය යුතුයි:-

පෙනහෙල්ලෙන් ඇවි ළු
පහතෙව් වතුන් අලු ක ළු
ගුරුනුදු තොම හස ළු
කුමරු සත දූත යසින් සුලක ළු.

7. ඒ. මෙය වනාහි බොහෝ කොට ඡන්ද හෙතුයෙන් එළි වැටෙහි යෙදේ. නිදසුන්:-

උ දේ සැපත් සුරගුරු අලුකර අව ට්
ස ඳේ මුදුන් වන අස්විද නැකත සි ට
න ඳේ සිතින් තම කුලදෙවිය සිහිකො ට
යෙ දේ ගමන් යහළුව මෙපුරෙන් නොප ට. සැළු.

එ කි නෙ කි නේ මි ණි නි ද නේ නි ද න මෙ න
අ ද අ ද සේ පි ය ව ද සේ පි ය ව ද න
ඉ වු ස කි සේ ඝ වු ස කි සේ න ර ඹ ම් න
දෙ ර ව කි සේ හො ව ලු කි නේ ය න ග ම න

මයුර,

(නිදනේ, නිධානයෙක්හි; මිණි, මණිරත්නයන්; නිදන මෙන, නිධානයන් සම්බන්ධයෙහි මෙන්; එකිනෙකිනේ, එකින් එක කරණකොටගෙන; අද

අදනේ, හෘදයාකර්ෂණය කරන්නාවූ; පිය වදනේ, ප්‍රිය වචනයන් ඇති හෙවත් ප්‍රිය වචනයන් දෙන්නාවූ; පිය වදන, ප්‍රිය මූනින් හෙවත් ප්‍රියකර මුහුණු ඇති කාන්තාවන්;- අහෝ නොහොත්,- පිය, ප්‍රියාවන්ගේ; වදන, වක්ත්‍රයන්; තුටුසකිනේ, තුෂ්ට චක්‍ෂුසයෙන්; නරඹමින, අවලෝකනය කරමින්; ඉටුසකිනේ, එම්බා ඉෂ්ට මිත්‍රය! දෙරවකිනේ, එනම් ග්‍රාමයෙන්; යන, යානවූ; ගමන, ප්‍රයාණය; නොවලකිනේ, අනිරුඬ වන්නේයි හෙවත් බාධා රහිතව කටයුත්තේයි.)

8. ඕ. මේ තෙම ඡන්‍දො හෙතුයෙන් එළි වැටෙහි යෙදේ.

නිදසුන්: -

ලොව පරසිද්ධ සො ඕ
උන්නු සුවහස් ගණන් නිරි දෝ. ගුත්තිල.

9. ත්-ද්. සමුච්චයාදි අනෙකාර්ථයන්හි සංස්කෘත මාගධීන්හි වැටෙන්නාවූ 'ච' නම් නිපාතය තෙම සිංහලට 'ත්'යයිද 'ද්' යයිද බිඳී ඇවිත් තිබේ. මෙය මූල ප්‍රවෘත්තියෙන් බලනකල පදයකි. එහෙත් දැන් එකම හල් වර්ණයක් හෙයින් ව්‍යස්ත ප්‍රවෘත්ති නොහැකියෙන් යථොක්ත නිපාත පදයාගේ ව්‍යාපාරය පිණිස ප්‍රත්‍යයයකට සමානව යෙදෙන්නාවූ වහල් වණක් වී තිබේ. මෙයින් වර්තමාන ව්‍යවහාරයෙහි ලැබෙන්නේ 'ත්' යන්නයි 'ද්' යනු පුරාණ ව්‍යවහාරයෙහි ලැබේ.

නිදසුන්: -

පයත් නොපට ඉන් කීකරු නොවනා වැ නි
පයත් නගෙන් මුත් යා නොහැකි මෙපුරෙ නි. මයුර

"හැම මෙහෙතැන් වැස්සොද් එම නියාගෙන් නවුස් පාණන්
මුදුනෙහි කෙලද් දූවිටිද් මුවදෙම් දියද්
ඔත්න." අමාවතුරු පිරිසේ. 4.

2. මේ 'ද්' යන්න නොයෙක් විට වහල් වර්ණවූ 'උ' යන්නෙන්ද යුක්තවේ.

නිදසුන්: -

ඉඳුහොතේ කියම්-ගුණලොබිනි ලෝහිම්යා. මුවදෙව්.

3. තවද පුරාණ වර්තමාන උභය ව්‍යවහාරයෙහිම අකාරයෙන් යුක්තවද සිටී.

නිදසුන්: –

සිරද සඳද සිරසඳ. සිදත්.

මු දු ව ට සිහිඳු වෙඩරුද දුදනත් සඳ ද
සරිකොට කිවත් කිවිදන නොමවෙයි එලෙ ද සුභා.

4. පළමුකොට සිංහලට බිඳී ආවේ මේ ස්වරාන්තවූ ද කාර රූපයයි පිළිගත යුතු බවද පෙනේ. එයින් හෙද පරිපාටිය මෙසේ වෙයි: –

සං. පා. ව. සි. ද–ද්–ත්. (නී. සා. 23. 5. පිට 80 ද බලනු.)

**10. ස.** මේ තෙම පද්‍යයෙහි මාත්‍රා පූරණය පිණිසද එළි වැට පිණිසද නොයෙක් විට යොදගනු ලැබේ.

නිදසුන්: –

ද න කෑ ත් ගෙනෑ දමන ගොදුරට නොහැකි ළි ය
ප නි මි ත් දියෙන් ඔවුනොවු නැඟෙහි පෙර ළි ය
ලෙළෙ හලුත් කෙළෙන කරළ පෙන පිඩු රළ රළ ළි ය
එ ත නි ත් පියාසර සර දකු මස්කෙ ළි ය. සැළ.

2. කිසි විටෙක මේ වහල් 'ය' කාරය තෙම යට දක්වූ වහල් ස්වරයකු හා සමගද ඉන් පරව යෙදේ. නිදසුන් :–

සො ර සමදර නා ලි ය කො බ ළ ලි ය
ව ර එකුමර බෑ ලි ය සි තු ඇ ලි ය කව්සේ.

වහල්වණවූ ඊ යන්නෙන් පරව යෙදුණු තැනි.

3. වාක්‍යාවසාන සුවනයෙහිද යෙදේ. නිදසුන්: –

එවන දෙවන හිමවනයක් වැහිය ඉවු. හංස.

සිඛි පිල් සත් කෙ ළේ ය ගි රි කු ළේ ය
රොන් සක් සකා'ඹ ළේ ය තුරෑ බෙ ළේ ය. ගිර.

**11. ශා.** මෙය ඡන්ද හෙතුයෙන් එළි වැටෙහි යෙදේ. කිසි විටෙක එම හෙතුයෙන්ම පැමිණියාවූ වහල් ස්වරයකට පරවය.

නිදසුන්: –

අ ඹ ද ලු ප ල ර ඹා සිද තො න බා ශා
ගෙන තම පිය අ ඹා තුඞ්ග න බා ශා
සිඹ සිඹ රති ලො බා දෙපිය ග බා ශා
උ ත් ප ර පු ටු සු බා සකි න ර ඹා යා.

යැ. මෙය පුරාණ භාෂායෙහි වාක්‍යාවසාන සුවනයෙහි යෙදිණැ. නිදසුන්: –

"මහවිජිත නම් රජ අට අඟෙකින් සමුපෙතයැ. කවර අට අඟය යත්: අභිජාතයැ. අභිරූපයැ. මහත් ධන ඇත්තේයැ. මහත් සෑදෑ ඇත්තේයැ. බහුශ්‍රැතයැ. කී කී බස අර්ථ දන්නි. පණ්ඩිතයැ. ව්‍යක්තයැ. අතීත අනාගත වර්තමාන යන අර්ථයන් සිතන්නට සමර්ථයැ. අමාවතුරෑ පිරිසේ 5.

**සංලක්ෂ්‍යය.** —මේ නිපාතය නම් වාක්‍යාවසානයෙහිවූ 'ය' යන්නය එසේවූ 'ඇ' යන්නය යන දෙදෙනාම සංයුතකොට කරනලද්දක්බව පෙනේ.

**12. සි.** 1. මෙය ඉත්‍යර්ථ සුවනයෙහි යෙදේ. නිදසුන්: –

නොම ගත්ව යි වයි කියමින් එසවූ. කව්සේ.

තමන් දදගොත් පිහිට ලදුව යි සිතු පහළව කිම්සඳ. කව්සේ.
(ලදුවයි= ලදුවායි.) **නී. සා. 45– 46.** 10.

**සංලක්ෂ්‍යය.**—මේ නිපාතය සං. මා. "ඉති" යන්නෙන් භිනන යයි ඇතම්හු සලකති. එහෙත් "ඉති" යන්න එම රූපයෙන්ම සිය බසට ඇවිත් තිබේ. නිදසුන් :"ඉති දු හොතේ කියම්–ගුණ ලොබිති ලෝ හිමියා." තවද 'ඉති' යනු සිංහලට බිඳී ආවේ නම් පළමුකොට "ඉඉ" යයි බිඳී පසුව 'ඊ' වුණා වියයුතුයි. ඉත්‍යර්ථයෙහි 'ඊ' නිපාතයක් සිය බසෙහි නොමැත්තේය; කිසිකලෙක තිබුණු බවක් හෝ නොපැනේ. තවද ආදි සවරයට 'ය' කාරාගම යක්ද සිය බසෙහි නොමැත්තේය. එයින් මේ 'යි' යන්නෙහි සම්භවය "ඉති" යන්නෙන් විය නොහැකි. එයින් යථොක්ත සඞ්කල්පය අසම්භාව්‍යයෑ. එහෙත් සිය බසෙහි කථනාර්ථවාචිවූ 'ය' ධාතුවක් තිබේ. 'කර' යන ධාතුව "කෙරෙමි, කෙරෙහි" යනාදි වසයෙන් යම්සේ වරනැගීම ලබාද මේ 'ය' ධාතුවද එසේම "යෙමි, යෙහි" යනාදි වසයෙන් වරනැගීම ලබා. මෙහි පූර්ව ක්‍රියා රූපය තෙම 'යී' වේ. 'කියා' යනු එහි අර්ථයි.

දෙමළෙහි වනාහි ඉත්‍යර්ථයෙහි යෙදෙන්නාවූ නිපාතය නම් 'එන්' යන ධාතුවෙන් සිඬවූ පූර්ව ක්‍රියාවවේ; එනම් 'එණ්රු' යනුයි. 'කියා' යනු එහි ධාත්වර්ථයි. එහෙත් ධාත්වර්ථය දැන් නිලීනයැ; භාෂා ව්‍යවහාරයෙහි මුඛ්‍යව පෙනෙන්නේ නම් ඊට ආසන්නව රූඪි යෙන්වූ ඉත්‍යර්ථ යයි. "අවර් නල්ලදු එණ්රු ශොන්නාර්"යනු සිය බසට නැඟුකල මෙසේ වේ: – අවර්, හේතෙමේ, නල්ලදු එන්රු, සොඳය කියා; ශොන්නාර්, කීවේය.

මෙහි 'කියා' යන්න වෙනුවට 'සී' යන්න ලූවද වෙනසක් නොවේ. එයින් වාක්‍යය මෙසේ වේ: – "හේ තෙමේ සොඳ සී කීවේය."තුරිත භාෂණයෙහිදී මේ 'සී' යන්න හ්‍රස්වකොට කියනු ලැබේ. එයින් වාක්‍යය "හේ තෙමේ සොඳසි කීවේය" වේ. පසුව මෙය සුඛොච්චාරණයෙන් "සොඳැසි කීවේය" වේ.

මේ ඉත්‍යර්ථ සූචකවූ 'සි' නිපාතයෙහි ව්‍යුත්පත්තියයි.

2. වාක්‍යාවසානය සූචිත කෙරේ. නිදසුන්: –

"ගනකුරුද, ගාත්‍රාක්‍ෂරද; විස්සෙක් වේ, විංශතියෙක් වන්නේසී."

සිදත් : පුරාණ සන්නය.

"බිඳුද රුසී, බින්දු වණීයද අභිමතසී." එම.

**13. සී.** මේ වනාහි ඉත්‍යර්ථ සූචකවූ 'සි' නම් නිපාතයාගේ ප්‍රාචීන රූපයයි. කථනාර්ථවාචි 'ය' ධාතුවෙන් සිදුවූ පූර්ව ක්‍රියා පදයයි. 'ච' ධාතුවෙන් සිදුවූ 'චි' යන්න මෙහි, මීට පර්‍යායවූ 'චී' නිපාතයෙක්ද ඇත්. 'චිය' යන ධාතුවෙන් සිඬවූවකි. 'චී' චිසි වැදූ රැම්' යයි සිද තෙහි කී තන්හි පෙනෙන්නේ ඒ නිපාතයයි.

මේ 'සී' නිපාතයට නිදසුන්: –

"මාගේ ධන නට" සී කියා පසුවැ නොතැවුණ මැනවැ.

අමාවතුරැ පිරිසේ 5.

"ඔවුන් සඳහා යැ මා දන්නේ" සී සිත් පහදවන්නේ යැ. එම.

**14. යේ.** මේ තෙමේ ඡඤ්ද හෙතුයෙන් මාත්‍රාපූරණයෙහිද එළිසමයෙහිද යෙදේ. නිදසුන්: –

අත නොසන පා යේ– දූරු දුක වහල් මේ යේ
ය න ර් සි ය ආ යේ– සොඳුරු සරණෙක මෙමා ආ යේ. කව්සේ.

15. හ. මේ තෙම ඡන්‍දෝ හෙතුයෙන් යෙදේ. ප්‍රථමා විභක්ති බහුවචන සම්බන්ධයෙනි. නිදසුන්: –

තො හ ළ විරූ සි රි ය හ–රිපඳුරට රිවි උදය හ
ප බ ල මෙර දි රි ය හ–නැඟී රිඝ රියදුරෝ සිටිග හ

ගුත්තිල.

16. හා. මේ තෙම ඡන්‍දෝ හෙතුයෙන් මාත්‍රාපූරණ වසයෙන්ද

එළිවැට පිණිසද යෙදේ. නිදසුන්: –

පැහැදුම් රඟ වත්නම් නුදු ලා හා
සිව් සස් නිවහම් සුතු නිම ලා හා
සිතියම් වන මේ රස තෙප ලා හා
එළවී සවනා සබැ සිඳ ලා හා

කව්සේ.

**සංලක්ෂ්‍යය.** — වාග් දීප්තිය පිණිස යොදනු ලබන්නාවූ ‘ලා’ නම් නිපාතයක්ද ඇත්තේය. එය ව්‍යස්තව යෙදෙන හෙයින් පද සඞ්ඛ්‍යාවෙයි ගැනේ. නිදසුන් :-

උ දු සු නි ලා පැහැ ගෙන ගන වලා පෙ ළ
වි දු ලි ය ලා සහ බට තැන් තුලා කා ළ
තු නු උ දු ලා යන එන මන කලා ලෙ ළ
ම ග වි පු ලා වෙළ බල අල පලා වෙ ළ. මයුර.

“ගන වලා පෙළ, ඝන වලාහක පඞ්ක්තිය; උදු, හුදකලාවූ හෙවත් අමිශ්‍රවූ; සුනිලා පැහැ, අති නීල වර්ණය; ගෙන, ග්‍රහණය කොට; විදුලිය ලා සහ-විදුලිය සහ යනුයි, ලා යනු පදපූරණයි- විද්‍යුල්ලතාව හා සමග; බට තැන්, භූම්‍යව තීර්ණවූ ස්ථානයකට; තුලා කළ, (තම්‍ා) සදෘශකළාවූ; යළිදු- ලෙළ, ලීලාසහිත් හෙවත් කෙළිසෙල්ලම්න් යුක්තව; යනා එනා, ගමනාගමනය කරන්නාවූ; තුනු උදුලා, ශරීරෞජ්ජ්වලවූ හෙවත් දීප්තිමත් දෙහ ඇති; මන කලා, මනසකාන්තා වන් ඇත්තාවූ; අලපලාවෙළ, එනම් ග්‍රාමයෙහි; විපුලා, මහත්වූ; වෙළ, ක්‍ෂෙත්‍රා භොගය; මග, තොපගේ ගමන මාර්ගයෙහි; බල, අවලොකනය කර.”

(නීලවර්ණ ශස්‍යයෙන් යුත් ක්‍ෂෙත්‍රාභොගය ඝන වලාහක පඞ්ක්තියට සමානය. එහි ගමනාගමනයකරන්නාවූ උජ්ජ්වල දෙහයෙන් යුත් කාන්තාවන්ගේ ලීලොපෙත භාවය විදුලියෙහි අස්ථිරත්වයට සමානය. පරිකරයෙන් සඞ්කීර්ණවූ උපමාලඞ්කාර යයි.)

මෙහි 'ලා' නිපාතය එක වර්ණ හෙයින්ද වහල් ව්‍යාපාරයෙක්හි පවත්නා විනා සෙවරි ප්‍රවෘත්තියක් නොමැති හෙයින්ද මෙද වහල් වර්ණ ප්‍රසඞ්ගයෙහි සඳහන් කළ යුත්තකි.

මෙසේ වහල් වර්ණයන් හඳුන්වාදී දුන් ඇතම් වහල් වර්ණයන් ආධාරකොට ඇති ස්වරාගම සන්ධිය දක්වනු ලැබේ.

### 85. සරගම් සඳ. ස්වරාගම සන්ධිය.

පෙර පර දෙව්යදුන්-ඉසිරුම් වනුව ටිසියේ
ඉවහල් සරෙක් දෙයතුරු-පැමිණෙත් එසඳ සරගම්.

ව්‍යඤ්ජනයන් දෙදෙනකු පූර්වාපරව සිටි කල්හි ඔවුන්ගේ උච්චාරණය යොග්‍යවූ පරිද්දෙන් වනු පිණිස ඔවුන් අතුරට උපකාරිවූ ස්වරයකු පැමිණෙත් හොත් හේ වනාහි ස්වරාගම සන්ධියයි.

**සඳුවිකරණය.**—ව්‍යඤ්ජනයන් දෙදෙනකුන්ගේ සම්මුඛිභාවය පිණිස පූර්වයා හැමකල්හි හල් වර්ණයකු විය යුතු බව මොහොතක් විභාවනයෙන් පෙනේ. කිසි විටෙක දෙදෙනාම හල් වර්ණයන් හෝ විය හැකි. මේ විතීය ප්‍රසඞ්ගය ඇති කල්හි සිය බසෙහි ධර්මයෙක් තම් එක් වර්ණයක් උච්චාරණයට පැමිණ අතික අනුච්චාරණ හෙතුයෙන් විනාශභාක් වීමයි. ඊට නිදසුන් කිහිප යක් මින් පෙර දක්වනලදී. (නි. සා. ..3. 8. ආ.) තවත් නිදසුන් මෙසේය: –

(i) පූර්ව ලොපය.

| සංස්කෘත. | මාගධී. | හෙදමාරය. | සිංහල. |
|---|---|---|---|
| අත්ත | අත්ත | *අත්ත් | අත් |
| දන්ත | දන්ත | *දන්ත් | දත් |
| කන්ත | කන්ත | *කන්ත් | කත් |
| කුන්ත | කුන්ත | *කුන්ත් | කොත් |

(ii) අපර ලොපය.

| | | | |
|---|---|---|---|
| සමන්තභද්‍ර | සමන්තභද්ද | *සමන්ත්බහදුරු | සමන්බහදුරු |
| සමන්තකූට | සමන්තකූට | *සමන්ත්කුළු | සමන්කුළු |

එසේම : මාගධී 'භගවන්ත දාස' බෙංගාලි 'භගවන් දාස්.'

(*iii*) පූර්වාපර විකල්ප ලොපය.

| | | | |
|---|---|---|---|
| වසන්ත | වසන්ත | *වසන්ත් | වසත් / වසන් |
| පඤ්චන් | පඤ්ච | *පන්ස් | පස් / පන් |
| කාන්ති | කන්ති | *කන්ත් | කත් / කැන්. |

(2) මෙසේ සාමාන්‍ය ස්වභාෂා ධර්මයෙහි ප්‍රකාර නම් හල් දෙදෙනකුන් සහගත වුවහොත් එකකුගේ ලොපය නිත්‍ය මැයි. එහෙත් මීට අපවාදයෙක් ඇත්. එනම් යම් තැනෙක ලොපය කරණකොටගෙන අභිප්‍රෙතාර්ථයට බාධාවක් වන්නී නම් එහි ලොපය නොම වේ. ලොපය නොවනු පිණිස නම් උභය හල් වර්ණයාගේම සංරක්ෂණය යොග්‍ය වෙයි. ඒ සංරක්ෂණයට ප්‍රධාන උපාය කිම යත් ද්‍රවිඩ ධර්මානුසාරයෙන් උභය වර්ණාන්තරයට උප කාර ස්වරයකු පමුණුවා ගැන්මයි. ද්‍රවිඩයෙහි බොහෝ විශාල වශයෙන් ලැබෙන්නාවූ වහල් ස්වරය නම් 'උ' කාරය වේ. ශොල්-ශොල්ලු, ශේර්- ශේරු, මෝර්- මෝරු, ධර්ම්- තරුමම්, පද්මම්-පදුමම් යනාදි තන්හි මෙනි. මේ වහල් ස්වරය මේ ව්‍යාපාරය පිණිස සිංහලෙහිද යොදගනු ලැබේ.

**යොගය 1.**— (1) සමුච්චයාදි අනෙකාර්ථයන්හි සංස්කෘත මාගධීන්හි පෙනෙන්නාවූ 'ච' නිපාතය සිංහලට බිඳී ඇවිත් තිබෙන්නේ 'ත්', 'ද්', යන මේ වසයෙන් බව යට දක්වන ලදී. (අං **84.** 9. පිට 206.) මෙය එකම හල් වර්ණයක් වුවද පදයක් හෙයින් තමා යොදනලද තැනෙක්හි හලින් පරව සිටියත් ඉෂ්ටාර්ථය නොනසා ලොප් විය නොහැකි. පූර්වස්ථයාගේ ලොපයද උචිත විය නොහැකි. එබඳු තැන උභයවර්ණයාගේම සංරක්ෂණය පිණිස 'උ' කාරයා ඉවහල් කොට ඔවුනතුරෙහි සන්ධියක් ස්වයං සිඬ වේ. තවත් එබඳු තැන්හිද එසේමය. ස්වරයක්හුගේ ආගමයෙන් සිදු හෙයින් ස්වරාගම සන්ධියයි.

තිදසුන් මෙසේයි: –

"තල මිටක් අහසට දමූ කලැ **ඇටකුත්** බිම සිය නොහැක්කා සේ...... සිසාරා සිටගත්තාහ." පූජාවලිය : පොරිසාද කථාව.

සිඬය : ඇටක් + ත් = ඇටක් + උ + ත් = ඇටකුත්.

තවත් නිදසුන්: -

කි ව ත් තොම ගෙවෙන පිරි දිව තෙද ය සි නි
ලො ව ත් මෙපුර රඳුනුන් රැක සිටි වි සි නි
ප ව ත් වන පුදැති නිති නන් තුරු ගො සි නි
ස ව ත් සුරිඳු මැදුරට වැද වැද ගො සි නි. සං.ස.

"එකෙකුද් හොත් ශස්‍ය ඵල කැමැත්තාහු ගොඩ ද් දෙණ ද් අනුබු ගෙහි ද් බිජු වපුරති." අමාවතුර.

එසේම: -

ප්‍රකෘතිරූප : උරුවෙල් කසබ්.
බහුවචනයෙහි : උරුවෙල් කසුබෝ. අමාවතුර.
එකවචනයෙහි : උරුවෙල් කසුබි, එම.

(2) වැඩි වසයෙන් මේ 'ද්' යනු සන්ධියෙන් අතිරික්තව තෙමේමත් වහල් උ කාරයෙන් යුක්තව සිටී. (නි. සා. 23. 9.)

නිදසුන්: -

"මහා සම්මත වංශයෙහි එක රජෙකුදු සිඟු සේ නොවෙයි කීහ." අමාවතුර.

එකකුදු උවත් හිමි - සිල්ප සත්වෙනි දවස දක්වමි. ගුත්තිල.

(එකෙක් + ද් = එකෙක් + උ + ද් = එකෙක් + උද් + උ = {එකෙකුදු; එකකුදු.

කානුදු නැති වතක්-නොදෙනු දනුමෝ පුවතින්. සිදත්.

(කත් + ද්=කත් + උ + ද් + උ=කනුදු.)

යෝගය 2. — 1. (i) තවද කිසි තැනෙක පර ව්‍යඤ්ජනය නොකලෙක්වී තමුදු උභය ව්‍යඤ්ජනයන් අතුරෙහි ස්වරාගම සන්ධිය ලැබේ. වැඩි වසයෙන් එහි ප්‍රචාරය ඉත්‍යර්ථ සම්බන්ධයෙහි වේ. එහි ඉවහල් වර්ණයෝ නම් ඇ කාර ඉ කාරයෝ වෙත්. එයින්—

'කෙරෙම් + සි' යයි සිටි කල්හි
(අ) 'කෙරෙමැයි' කියා හෝ වේ. ඇ කාරාගම සන්ධියෙනි.
(ආ) 'කෙරෙමිසි' කියා හෝ වේ. ඉ කාරාගම සන්ධියෙනි.

තවත් නිදසුන්: -

1. ඇ කාරාගම සන්ධියට :

(i) ගමන යෙහෙකැයි සිතා වනයට. ගුත්තිල.

(iii) පූර්වාපර විකල්ප ලොපය.

| | | | |
|---|---|---|---|
| වසන්ත | වසන්ත | *වසන්ත් | {වසත්<br>වසන් |
| පඤ්චන් | පඤ්ච | *පන්ස් | {පස්<br>පන් |
| කාන්ති | කන්ති | *කන්ත් | {කත්<br>කැන්. |

(2) මෙසේ සාමාන්‍ය ස්වභාෂා ධර්මයෙහි ප්‍රකාර නම් හල් දෙදෙනකුන් සහගත වුවහොත් එකකුගේ ලොපය නිත්‍ය මැයි. එහෙත් මීට අපවාදයෙක් ඇත්. එනම් යම් තැනෙක ලොපය කරණකොටගෙන අභිප්‍රෙතාර්ථයට බාධාවක් වන්නී නම් එහි ලොපය නොම වේ. ලොපය නොවනු පිණිස නම් උභය හල් වර්ණයාගේම සංරක්ෂණය යොග්‍ය වෙයි. ඒ සංරක්ෂණයට ප්‍රධාන උපාය කිම යත් ද්‍රවිඩ ධර්මානුසාරයෙන් උභය වර්ණාන්තරයට උප කාර ස්වරයකු පමුණුවා ගැන්මයි. ද්‍රවිඩයෙහි බොහෝ විශාල වශයෙන් ලැබෙන්නාවු වහල් ස්වරය නම් 'උ' කාරය වේ. ශොල්- ශොල්ලු, ශේර්- ශේරු, මෝර්- මෝරු, ධර්ම්- තරුමම්, පද්මම්- පදුමම් යනාදි තන්හි මෙනි. මේ වහල් ස්වරය මේ ව්‍යාපාරය පිණිස සිංහලෙහිද යොදුගනු ලැබේ.

**යොගය 1.**— (1) සමුච්චයාදි අනෙකාර්ථයන්හි සංස්කෘත මාගධීන්හි පෙනෙන්නාවූ 'ච' නිපාතය සිංහලට බිඳී ඇවිත් තිබෙන්නේ 'ත්', 'ද්', යන මේ වසයෙන් බව යට දක්වන ලදී. (අං **84.** 9. පිට 206.) මෙය එකම හල් වර්ණයක් වුවද පදයක් හෙයින් තමා යොදනලද තැනෙක්හි හලින් පරව සිටියත් ඉෂ්ටාර්ථය නොනසා ලොප් විය නොහැකි. පූර්වස්ථයාගේ ලොපයද උචිත විය නොහැකි. එබඳු තැන උභයවර්ණයාගේම සංරක්ෂණය පිණිස 'උ' කාරයා ඉවහල් කොට ඔවුනතුරෙහි සන්ධියක් ස්වයං සිඬ වේ. තවත් එබඳු තැන්හිද එසේමය. ස්වරයක්හුගේ ආගමයෙන් සිද්ධ හෙයින් ස්වරාගම සන්ධියයි.

නිදසුන් මෙසේයි:—

"තල මිටක් අහසට දමූ කලැ ඇටකුත් බිම හිය නොහැක්කා සේ...... සිසාරා සිටගත්තාහ." පූජාවලිය : පොරිසාද කථාව.

සිඬිය : ඇටක් + ත් = ඇටක් + උ + ත් = ඇටකුත්.

තවත් නිදසුන්: -

කි ව ත් තොම ගෙවෙන පිරි දිව නෙද ය සි නි
ලො ව ත් මෙපුර රදුනුන් රැක සිටි වි සි නි
ප ව ත් වන පුදැති නිති නත් තුරු ගො සි නි
ස ව ත් සුරිඳු මැදුරට වැද වැද ගො සි නි. කා.ස.

"එතෙකුද් හොත් ශස්‍ය ඵල කැමැත්තාහු ගොඩ ද් දෙණ ද් අනුබු යෙහි ද් බිජු වපුරති." අමාවතුර.

එසේම: -

ප්‍රකෘතිරූප : උරුවෙල් කස්බ්.
බහුවචනයෙහි : උරුවෙල් කස්බෝ. අමාවතුර.
එකවචනයෙහි : උරුවෙල් කසුබ්, එම.

(2) වැඩි වසයෙන් මේ 'ද්' යනු සන්ධියෙන් අතිරික්තව තෙමේමත් වහල් උ කාරයෙන් යුක්තව සිටී. (නි. සා. 23. 9.)
නිදසුන්: -

"මහා සම්මත වංශයෙහි එක රජෙකුදු සිඟු සේ නොවෙයි කීහ."
අමාවතුර.

එතකුදු උවත් හිමි - සිල්ප සත්වෙනි දවස දක්වමි. ගුත්තිල.
(එතෙක්+ද් = එතෙක්+උ+ද් = එතෙක්+උද්+උ = {එතෙකුදු; එතකුදු.
කනුදු නැති වනක්-නොදෙනු දනුමෝ පුවතින්. සිදත්.
(කත්+ද්=කත් + උ + ද් + උ=කනුදු.)

යොගය 2. — 1. (i) තවද කිසි තැනෙක පර ව්‍යඤ්ජනය නොහලෙක්වී නමුදු උභය ව්‍යඤ්ජනයන් අතුරෙහි සවරාගම සන්ධිය ලැබේ. වැඩි වසයෙන් එහි ප්‍රචාරය ඉත්‍යර්ථ සම්බන්ධයෙහි වේ. එහි ඉවහල් වර්ණයෝ නම් ඇ කාර ඉ කාරයෝ වෙත්.
එයින්—

'කෙරෙමි + යි' යයි සිටි කල්හි
(අ) 'කෙරෙමැයි' කියා හෝ වේ. ඇ කාරාගම සන්ධියෙනි.
(ආ) 'කෙරෙමියි' කියා හෝ වේ. ඉ කාරාගම සන්ධියෙනි.

තවත් නිදසුන්: -

1. ඇ කාරාගම සන්ධියට :

(i) ගමන යෙහෙකැයි සිතා වනයට. ගුත්තිල.

(*ii*) කිසි විටෙක හල් වර්‍ණයාගේ විපර්‍යයෙන් වන්නාවූ දෙරූ සඳද සමගින් මේ සන්‍ධිය සිදු වේ. නිදසුන්: -

ඉන් නඹර මුවරද- **නොදෙම් මැයි** බිඟු නලෙව් විල් ලද. ගුත්තිල.

(නොදෙම් + යි = නොදෙම් + ඈ + යි = නොදෙම් + ම් + ඈ + යි = නොදෙම්මැයි.)

**සංලක්‍ෂ්‍යය 1.**—මෙහි ආගමය නම් යට 84. ඡ. 6 හි දක්වූ 'අ' යන්න බවද, මෙය සංවෘත ස්වරයාගේ අත්‍යන්‍තස්ථයවූ 'ය' යන්නට පූර්‍වවූ හෙයින් තුමූද සංවෘත භාවෝපගමයෙන් 'ඈ' යන්නවූ බවද පෙනේ. එය මෙයින් වඩාමත් පැහැදිලි වේ: -

මහතුන් හසළ නම හට යස පිහිට ලෙ ස
කියනින් නොහල යුතු බව පැමිණෙන වෙහෙ ස
සුදනන් පැවති **සිරිතැයි** දන්වන විල ස
නුබමින් සඟිග ගෙවුණෙය දවහල් දව ස. සැල.

(සිරිත් + අ + යි = සිරිතයි = සිරිතැයි.)

**සංලක්‍ෂ්‍යය 2.**— 'යි' යන්න වාක්‍ය සමාප්තිය පිණිස වූ කල්හි අවධාරණයෙහි මිස අන් තැන මේ සන්‍ධිය සිදු නොවේ.

නිදසුන් (අනවධාරණයෙහි): -

ඉති, මෙසේ; * * * අතාපස, අනාගත ප්‍රත්‍ය ය යි."

සිදත් : පූරණ සන්නය.

අවධාරණයෙහි මිස යයි කවරහෙයින්ද යත් :

ජය සිරි නම් **ඉම බිසෝ මැයි** මෙ සමයට. මයූර.

**සංලක්‍ෂ්‍යය 3.**— ඉත්‍යර්‍ථයෙහිදු පූර්‍ව 'අ' කාරය විධි ක්‍රියාව හෝ ආශිර්‍වාද ක්‍රියාව හෝ ආශ්‍රිත නම් මේ සන්‍ධිය සිදු නොවේ. නිදසුන් :

නොව **ගන්වයි** වයි කියමින් එසවූ. කව්සේ.

පසි රූසිරූ නරනිඳු මේ පැරකු ම් බා
විසි කර රූදුරූ විරිදුන් ලය න ම් බා
නිසි ලෙසින් **රකිවයි** ලකා ඕ ලො ම් බා
රසි ගුණැති අයදින් මම්තුර එ ම් බා. පරවි.

(රකිවයි = රකීවා + යි.

(*iii*) කිසි තැනෙක ස්වරයෙන් පරවද මේ සන්‍ධිය ව්‍යභිචාරයෙන් ලැබේ. ස්වරයාගේ ලොපයෙනි. නිදසුන්: -

**තැලිණැයි** කියා ලිය සිත්. කව්සේ.

(තැලිණි + අ + යි = තැලිණ + යි = තැලිණැයි.)

තවත් නිදසුන්, යටකී ඉකාරාගම සන්ධියට: -

(i) විඳිමියි සගසැපත්- නොවමියි අවාබිය පත්
ලබමියි මොක්සැපත්- පතා ලියවූ දහම් පොත් පත්.

ගුත්තිල.

මැණියන් වහන්ස! මම සත්තාලියෙක්මි. උම්මග්ග.

(ii) කිසි විටෙක සවරයෙන් පරවද ව්‍යභිචාරයෙන් දක්නා ලැබේ. 'ය' කාරාගමයෙන්ද යුක්තවය. එයින් -

(අ.) 'උඹ + ත්' = 'උ යි ත්'. | 'මේ + ත්' = 'මෙයි ත්'.
'ඒ + ත්' = 'එ යි ත්'. | 'ඹි + ත්' = 'ඔ යි ත්'.

නිදසුන්: -

උයිත් ගොස්......අමරාදේවීත්ට මහු දහස දික්කොට පිවාළහ. උම්මග්ග.

ඔයිත් වදල ලෙසම කළහ. එම (සත්‍රී ප්‍රශ්නය.)

'ද්' යන්න සම්බන්ධයෙහිද එසේමය.

එයිදු මෙයිදු තොකියා බණ දෙසනු යෙ හි
මෙඉදු මි සි දු මාහිමියන් පැමිණි වැ හි. හංස.

(අං. 84. 6. පිට 205; 9. පිට 206.)

ගිරාසන්දේශයෙහි :

පියකරු මෙරද රුසිරෙන් මද දිතා ලිය
සුරගුරු අවද ඉත් තොම හැකි වතා ලිය

යන තන්හි 'ඉත්' යනුද මේ සන්ධියෙන් හා පූර්වස්වර ලොප සන්ධියෙන්ද සිඩවූවකි. ඒ මෙසේයි: -

ඒ + ත් = එ + ඉ + ත් = එ + ඉත් = ඉත්. (පෙරසර ලොප්.)

---

ගුණවර්ධන වාසල මුදලි මහාමන්ත්‍රීශ්වර ප්‍රණීත
සිද්ධාන්ත පරීක්ෂණයෙහි හෙවත්
ස්වභාෂා නීතිසාරයෙහි
ප්‍රථම භාගය

නිමි.

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 7 | 31 | ධන හම්භාරය | ධන සම්භාරය |
| 9 | 8 | පතිජර | පතිරජ |
| 48 | 9 | දෙවදූරුම් | දෙවැදූරුම් |
| 60 | 12 | ප්‍රාදූර්භූත | ප්‍රාදුර්භූත |
| ,, | 21 | ආශාසත්‍රිය | අශාස්ත්‍රීය |
| 65 | 21 | මහවාලත්.. මහමාලයා | මණවාලත්...මණමාලයා |
| ,, | 22 | මහවාලි...මහමාලි | මණවාලි...මණමාලි |
| 67 | 18 | කූලි...කූලි | කූලී...කූලී |
| 68 | 18 | පරව් | පරව |
| ,, | 20 | කාමාචීයෙහි | කාමීචියෙහි |
| 72 | 10 | මාගදී | මාගධී |
| 74 | 1 | කාරකයන්හුගේ | කාරකයක්හුගේ |
| ,, | 18 | අතීතයෙහි | අත 'තීතයෙහි |
| ,, | 28 | නිරුතසාහිකයෙහි | නිරුත්සාහකයෙහි |
| 75 | 16 | කරණකොට | කාරණකොට |
| 79 | 27 | පිළිපෙරළී | පිළිපෙරළි |
| 80 | 4 | පිළිපෙරළී | පිළිපෙරළි |
| 81 | 12 | පූනරත් | පුනරුත් |
| 86 | 9 | ව්‍යුපතාතතිය | ව්‍යුත්පත්තිය |
| 89 | 6 | අනතසථඃශා | අනතඃසථශා |
| ,, | 9 | ගොත්ත අ | ගොත්ත් අ |
| 94 | 6 | සසිරි බර | සසිරි රැඳි |
| 98 | 29 | ව්‍යාපතියෙන් | ව්‍යාපතියෙන් |
| 99 | 12 | පාණාතිහු | පාණීතිහු |
| 105 | 9 | සිහිලේහි | සිහිලෙහි |
| ,, | 17 | පිහිටූවා | පිහිටුවා |
| 1.9 | 16 | සසකෘත් | සංස්කෘත |
| 110 | 3 | වෙනදහම් | වෙණදහම් |
| 1 1 | 13 | සම්බබන්ධ | සම්බන්ධ |

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 112 | 14 | මේසේ | මෙසේ |
| 118 | 12 | අදුරු | ඈදුරු |
| 127 | 26 | දෘසාන්තාදි | දෘෂ්ටාන්තාදි |
| 128 | 3 | සම්බබන්ධඃ | සම්බන්ධඃ |
| 131 | 4 | සාමාණ්‍ය | සාමාන්‍ය |
| 132 | 27 | කිරය | කිරිය |
| 139 | 15 | වකාරය | වකාරය |
| 149 | 20 | දුරටුව | දෙරටුව |
| 150 | 32 | හෙහිය් | හෙයින් |
| 154 | 27 | අධ්‍යාසය | අධ්‍යාශය |
| 181 | 14 | සමාහාර | සමාහාර |
| 182 | 19 | මේ | මේ |
| 185 | 29 | පභූතසතති | පභූත සතති, පහු සතත-හෝ |
| 186 | 27 | අවාධාරණාර්ථයෙහි | අවධාරණාර්ථයෙහි |
| 189 | 9 | දීගෙක | සුරණෙක |
| 190 | 24 | ව්‍යභිවාරය | ව්‍යභිචාරය |
| 191 | 3 | සාවෙක් | සාවෙක් |
| 192 | 9 | එහි = එඉ = ඊ – ඈ | (194 වෙනි පිටේ මෙම සන්ධියෙහි අපරස්වාකර්ණ විශේෂයට නිදසුන් කොට යොද ගත යුතුයි.) |
| „ | 12 | දහමෝද | දහමොද |
| 197 | 15 | නලී | කලී |
| 198 | 11 | කිත්‍ය | නිත්‍ය |
| 200 | 24 | චනාහි | ඬනාහි |
| 202 | 7 | 'අ' යනත | 'අ' යන්න |
| „ | 18 | සුවනය | සුවනය |
| 206 | 5 | ග්‍රාමයෙන් | ග්‍රාමයෙන් |
| 207 | 21 | එකූමර | එකුමර |
| 208 | 3 | පිය අඹා | පිය අඹා |
| „ | 5 | යැ. | 12. (1) යැ. |
| „ | 13 | 12. සි. | 12. (2) සි. |

සංලක්ෂ්‍යය. — තවත් මෙබඳු ප්‍රමාද භ්‍රමාදි දෝෂයන් ඇති විය හැකි. ඒවා දුටු තැන ශුද්ධ කරගත යුතුවේ.

# විෂය දර්ශනය.


පිටු.

අ. විවෘත සංවෘතයයි
විභෙද බව ... 34-35
වහල් වණ ... 200
එහි ප්‍රයොග ... 200-203
අගම් සද. රකාරාගමය
මූලාවක් බව ... 176
අග් = අං ... 82
අත්තම්. සිඩිය ... 172
අතුරු සිටි ... 34
අන්තවර්ණ ලොපය (ව්‍යඤ්ජන)76
(ස්වර; ව්‍යඤ්ජන) 211-212
අනර්ථ ශබ්ද ... 125; 142
අනන්තර ස්වරරූප සන්ධිය 196
අනවමදර්ශී මහා ස්වාමි 9
ප්‍රතිරාජ පරිවෙණාධි
පති බව ... 10-11
සිදත් සඟරා කර්තෘ බව 13-14
අනියත විධි }
අනියම් විදි } ... 118-19
අනුරූත් සද ... 142-3
අනුනාසිකය ... 31
අනුස්වාරය ... 31
අනුලොම සමාහාර සන්ධිය 185
අපර ව්‍යඤ්ජන ලොපය 211
අරුණු සද ... 143-50
අලුණු. ව්‍යුත්පත්තිය 76
අර් ක්‍රියා ... 139-40
අධිවර්ණනය (සන්ස්කෘත) 28
අල්ලවෙන්රුන්. දෙමළ
වකාරාගමය ... 87
අවිද්‍යමාන විධි: අයොග්‍ය
නාමයක් බව ... 37
විස්තරය හා නිදසුන් 119-123

පිටු.

අශොක සෝඩිය ... 37
ආ. වහල්වණ. ජනෙදු හෙතු
යෙන් යෙදෙන බව 203
ආකර්ෂණ සන්ධිය:
විස්තරය හා නිදසුන් 191-5
ආග්ම. යකාර වකාර පම
ණක් බව ... 86-87
මේ දෙකද බාහිර සන්ධි
යෙහි ද්‍රවිඩ බව 87-88
රකාරාගමයක් සියබසෙ
හි නොමැති බව 83-86
ආගම සන්ධිය ... 176
ආගම ස්වර. ප්‍රකෘතියෙහි
ද්‍රවිඩ ධර්ම බව ... 155
ආගම හකාරය. ආගමයක්
නොවන තැන් ... 155
ආදි. තත්සම ශබ්දප්‍රකෘති
යක් බව ... 117
ආදි වර්ණලොපය. නිදසුන් 76
ආදෙශය. ... 77-82
ආදෙශ ධර්ම ... 79-80
ආරූඪ ශබ්ද: විවෙචනය 125-143
ඇ. අකාරයාගේ වෘඩියක්
නොවන බව ... 106
වහල් වණ. වාක්‍යාවසාන
සූචක බව ... 203
ඇ-ඈ. සෝඩියට ඇතුලත්
කළයුතු බව ... 33
ඉ. වහල් වණ ... 203
ඉපැන්. පිළි පෙරළි 96
ඉලි. භාවක්‍රියා ප්‍රත්‍යය 138
ඉ = ය් = යි ... 81-88
ඊ. වහල් වණ ... 204

පිටු.

ඊල්හ. ආකාර්ණ සන්ධියට නිදසුන් ... 194
ඌ. වහල් වණ. ... 205
උත්. (වාක්‍යයෙක්හි උක්ත වස්තුව). අභිධෙය. 25
සමුච්චයාර්ථයෙහි 212
උච්චාරණ සංක්ෂිප්තිය, වර්ණ ලොපයට මූලහෙතුව බව 77
උත්සාහක ක්‍රියා ... 140
උන්. භාවක්‍රියාවට කී මේ ප්‍රත්‍යය භ්‍රමයක්බව 133
උපකාර වර්ණ ... 200-11
උපසර්ග (එකදෙශ අවිද්‍යමාන විධියෙහි ... 122-3
උ = ව් = වු ... 81-88
උචාරණ. සිංහලට බිඳෙන ක්‍රමය ... 107
උසුම් (උෂ්ම වර්ණ) ... 34
එරඬු. ට වර්ගාන්ත ඌන මාත්‍රයට නිදසුන් 33
ඒ. වහල් වණ ... 205
ඒකවර්ණ නාම ප්‍රකෘතීන්ට නිදසුන් ... 121
ඔ. වහල්වණ, එළිවැටෙහි 206
ඕර. ආදෙශයක් නොව ශබ්ද ප්‍රකෘතියක් බව 115
එහි සිඩිය ... 169; 186
කණ්ණාඩි. බාහිර විරූප සන්ධියට නිදසුන්. 197
කණ්ණාල්. අභ්‍යන්තර විරූප සන්ධියට නිදසුන් 93
කද් = කත්. ... 80
කරණී. මෙහි සිඩිය 68
මෙය අඥයාගත නිදසුනක් බව ... 69
කරතෙම්. පූර්ව හල් තකාර ලොපයෙන් සිදුවූ බව 23

පිටු.

කලිකාලසාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු. මෙහි අර්ථය. ... 18
කාව්සිළුමිණ ... 8-16
කළුවන් බිහු-ඈ. මෙහි ශුද්ධ පාඨය ... 160
කෑසුබ් / කෑසුබු } මෙහි සිඩිය 80-142
කියන්නී. අර්ථක්‍රියා ස්ත්‍රී ලිංගයෙහි ඊ ප්‍රත්‍යය. 139
කියනුයේ. අර්ථක්‍රියා පුංලිංගයෙහි ඒ ප්‍රත්‍යය. 139
කිරිය පෙරළි ... 97
කිසුම්. පිළි පෙරළි ... 96
කේරලයන්ගේ ප්‍රවෘත්තිය 3-7
කොත්තා යන්නෙහි සිඩිය 91
කොළඹ. ... 51; 148
ක්‍රියා ... 71-73
ක්‍රියාගුණ සමවායය 128
ක්‍රියා ශබ්ද ... 132-40
ගංරන්. මෙහි සිඩිය 174
ගතකුරු ලොප්සඳ : ලක්ෂණ කථනය අශාස්ත්‍රීය බව 171
සන්ධියද සංශය සහිතබව 175
ගත් පෙරළි ... 99
ගතකුරු විස්ස ... 29
ගතු ගතුද දුදනෝ- ඈ. පෙරළියක් නොවනබව 101
ගතදෙස් සඳ. විවෙචනය 169-72
ගබන් ලොපය. අශාස්ත්‍රීය කීමක් බව ... 174
ගරු නම් දීම. හාස්‍යයක් බව 6
ගාත්‍රාක්ෂර (ව්‍යඤ්ජන) 29
ගළපනු. අශාස්ත්‍රීය කීමක්බව 42
ගාල. ආකර්ණ සන්ධියට නිදසුන් ... 148-194
ගුණ ශබ්ද. ... 129-31

පිටු.

ගැබ් = ගැප් ... 80
ගුණය පිළිබඳ විස්තර ... 129
ගුණයෙහි භාවාභාව ලක්ෂණ 130
ගුවනී = ගුවනෙහි. මෙහි සිද්ධිය (ගුඩිපත්‍රයද බලනු) 192
ගෙත්තම්. මෙහි සිද්ධිය. 173
ග්‍රන්ථ ශොධනයෙහි බොරු චාරිත්‍රයක් .. 18
ග්‍රන්ථ සෝද්ධිය. සිංහල සෝද්ධියෙහි අනන්තර සම්භවය 36
ඝොෂා ඝොෂ විශෙෂ 80
ඝොෂයෝ, සියබසෙහි 81
ජයබාහු (මාඝහුගේ සහායයෙක්) ... 5
ජාති ශබ්ද ... 125-27
ටැඹ = ටැම්බ = ටැම් 82
ණය. මෙහි උද්භවය. 116
ත්. වහල් වණ ; නිපාතය. මෙහි ව්‍යුත්පත්තිය. 206-7
තත්සම. ධාතු ප්‍රකෘති හා ශබ්දප්‍රකෘති ... 51-62
දෙමළෙන් ... 64-65
අශාස්ත්‍රීය අභිධානයක් බව • ... 60
තද්භව. මෙහි අර්ථය . 60
ධාතු ප්‍රකෘති හා ශබ්ද ප්‍රකෘති ... 52
දෙමළෙන් ... 64-67
තඹපල්ලෙන්. මෙහි සිද්ධිය. 177
තම්මන්නා ... 55
තිසුඹු. නොගැලපෙන නිදසුනක් බව ... 165-6
තිළි. මෙහි සිද්ධිය ගැන මූලාමතය ... 68
ශාස්ත්‍රීය සිද්ධිය ... 70
තුලුර යනු තුලුරුවිය යුතු යයි ශඞ්කනීය බව 63

පිටු.

තෙත්තා. මෙහි සිද්ධිය 91
තෙනේ තොමෝ යන වහරට කරුණු වූයේ ලිඟු නම්- යයි කිවහොත් ශාස්ත්‍රීය බව ... 44
තෙල්බූ. මෙහි විවේචනය 143
තෝ කරනු යනු අව්‍යාකරණ බව ... 135
ද්. මේ නිපාතයෙහි ව්‍යුත්පත්තිය .. 206-7
දමෝරා ... 115
දූ. දූතාර්ථයෙහි මෙබඳු ධාතුවක් සියබසෙහි නොමැති බව ... 62-3
දූමෝදර. මෙහි ප්‍රවෘත්තිය 115
දූවි වෙසෙසනුයේ ගුණ නම් යයි කිවහොත් වඩා යොග්‍ය බව ... 131
දූළේ. ආකීර්ණ සඞ්ඛියට නිදසුන් ... 194
දිග් = දික් ... 80
දිගුසඳ ... 183-4
දිය යනු නිත්‍ය පුංලිඞ්ගික නොවන බව ... 44
දෝණියෝ. සිද්ධිය ද්‍රවිඩ ධර්ම යකින් බව ... 187
දිනී. මෙහි සිද්ධිය ... 72
දෙ. දූතාර්ථයෙහි සිංහල ධාතුව ... 63
දෙන්නෙම්. මෙහි සිද්ධිය 72
දෙරූ දූතවූම් යනු ශාස්ත්‍රීය නොවන බව ... 93
දෙරූසඳ : මීට කී ලක්ෂණ අශාස්ත්‍රීය බව 177
නිසි ධර්ම කථන්‍ය 88-9
දෙස්. අර්ථ විපර්යාසයට නිදසුන් ... 149

පිටු.

දේව ප්‍රතිරාජ ... 2, 3–9
දෛවඥ කාමධෙනු 13–14
ද්‍රව්‍ය ශබ්ද ... 127–8
ද්විරූපය හා එහි ධර්ම 91–4
ද්විරූප සන්ධිය 177; 196–8
ද්විරූප හේතු සන්ධිය 195
ධාතු ප්‍රකෘති 50–52; 61–64
න. භාවක්‍රියා ප්‍රත්‍යය. 138
නග්. ආරෝහණාර්ථයෙහි සිංහල ධාතුව ... 63
නමැසුරුව බෙදනු ලබනුයේ විබත් නම් යයි කිව හොත් ශාස්ත්‍රීය බව 44
නල්ලූර්. බාහිර ද්විරූප සන්ධියට නිදසුන් ... 93
නවම්. මෙහි සිද්ධිය ... 77
නවාම්. මෙහි සිද්ධිය ... 107
නා. භාවක්‍රියා ප්‍රත්‍යය 138
නාගයන් සිංහලයන්ගේ මුතුන් මිත්තන් බව 53–57
නිදෙස් (නිර්දේශය හෙවත් වාචකය). අභිධාන. 25
නිපතන්. නිපාතනය. 114
නිපන් පියවි (තාරක රාවණාදීන්ගේ භාෂාවෙන් එන බව). ... 59
නිපා නිපාතනය. බෞද්ධ ව්‍යාකරණ ක්‍රමයක් නොමැති බව. 26; 113-14
නිපාතන. විවේචනය හා නිදසුන්. 110-11; 113-14
සිදතෙහි කී නිදසුන් නොයෙදෙන බව 112–13
නියත විධි } නියම් විදි } ... 115–17
නියමුත් සිදු නිපතන් නම් 141

පිටු.

නියරි. මෙහි සිද්ධිය ... 68
මෙය අයෝග්‍ය නිදසුනක් බව ... 69
නිරලඹ. මෙහි ආගමයක් නොමැති බව ... 83-6
නිරුක්තිකාරයන් නිත්‍ය සම්භාව්‍ය නොවන බව 144-6
නිරුක්තිය. (ව්‍යාකරණයෙහි අනුශිෂ්ටියක් බව) 25
නිරුත්සාහක ක්‍රියා ... 140
නිෂ්පන්න ධාතු ප්‍රකෘති:
විස්තරය ... 49–59
නිදසුන් ... 61–2
නිෂ්පන්න ශබ්ද ප්‍රකෘති:
විස්තරය ... 49–59
නිදසුන් ... 64
නිඝණ්ඩු නම් ග්‍රන්ථය ... 8
නෙත්තා. මෙහි සිද්ධිය ... 91
නොහොත්. අභිනනාර්ථයෙහිද යෙදෙන බව 150
පගෝදි ශබ්දය. 'භගවතී' යන්නෙන් භින්න බව 149
පඤ්ච ශබ්ද යෝගය .. 142
පඤ්ච ස්ථානය (වර්ණෝත්පත්තියෙහි) ... 29
පණකුරු දසය ... 29–31
පණකුරුපා ... 156
පණපෙරළි: ශාස්ත්‍රීය නාමය විය යුතු බව ... 99
පඹු ඇඹුල්: එකදේශ අවිද්‍යමාන විධි. ... 199
පදය. (ව්‍යාකරණයෙහි අනුශිෂ්ටියක් බව.) ... 25
පද පෙරළි. අයෝග්‍ය නාමයක් බව ... 99
පන්නම්. මෙහි සිද්ධිය 173
පර රූප සන්ධිය ... 199–200

පිටු.

පර ස්වර ලොපසන්ධිය 165–6; ... 181–2
පරාක්‍රමබාහු II ... 6
පරිවෙණ යන්හෙහි පුරාණ ව්‍යවහාරය ... 10
පස්වග ... 34
පරොපකාරඃ ජ්‍යොතිර් ග්‍රන්ථය ... 10–13
පාලි දෙමළ ලියන් සිංහල යන්ගේ ආදිමාතෘන් බව ... 53-7
පාපිල්ල. මෙහි යොගය. 37
පැණි වෙසෙස් දූ නම්. තිසි ලක්ෂණය විය යුතු බව 127
පැන්. මෙහි ව්‍යුත්පත්තිය 142
පියවි. (ප්‍රකෘති බලනු.) 47; 50; 53-67
පියවි දෙවදූරුම් යනු ව්‍යපී බව ... 48
පියවි හකාර ... 156
පිලි ... ... 36
පිලි පෙරළි හා ඒවා නිදසුන් 96
පුරාණම යයි සියල්ල පිළි ගත නොයුතු බව 18
පූඩලු = කූඩලු ... 82
පූර්වරූපය: ශාස්ත්‍රීය හෙතුව;
නිදසුන් ... 88
සීමාසහිත බව ... 89
පූර්ව ව්‍යඤ්ජන ලොපය 211
පූර්ව ස්වර ලොප සන්ධිය 165-180
පූර්වාපර විකල්ප ව්‍යඤ්ජන ලොපය ... 212
පෙරරූ කාරනු. අශාස්ත්‍රීය කිමක් බව ... 90
පෙරරූ සඳ. 172–3; 198–9
පෙරසර ලොපා යනාදිය අශාස්ත්‍රීය කථා බව 177

පිටු.

පෙරළි ... 94–104
ප්‍රකෘති ... 47
එම භෙදය ... 50
එම ප්‍රවෘත්තිය ... 53–67
ප්‍රත්‍යය ... 67–71
ප්‍රතිලොම සමාහාර සන්ධිය 186
ප්‍රයත්නහානිය හා එහි ඵල 89
ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියායෙහි ධාතු ප්‍රකෘතිය පැහැදි ලිව පෙනෙන බව 63
ප්‍රාණාක්ෂර ... 29
බිදන්. (අභිධානය හෙවත් වාචකය.) ... 25
බහගර. (සූර) ... 28
බිදේ. (අභිධෙය හෙවත් උක්ත වස්තුව.) ... 26
බිඹු (ප වර්ගාන්ත ඌන මාත්‍ර යට නිදසුන්.) ... 33
බින්දුව. (එහි ශ්‍රාවයෝ.) 31
භාවක්‍රියා ... 133–9
බුද් = බුත් ... 80
මගුල්. ආරූඪ ශබ්දය 143
මණමාල; මණමාලි. දෙමළෙන් 87
මණියරුමෙයි. දෙමළ යකාරා ගම සන්ධිය. ... 87
මධ්‍යලොප. නිදසුන්... 76
මරකත. ශුද්ධ සිංහලෙහි. 117
මලවල කි තැන මාත්‍රා වෘද්ධියක් නොමැති බව 108
මාගධී. මූලභාෂා යනු මූලා වක් බව ... 86
මාන (විජයරජුගේ නෑයෙක්) 3–5
මාතෘ ශබ්දයෙහි නිරුක්තිය. 146
මාත්‍රාඃ විවෙචනය ... 105
වෘද්ධි ... 104-105
හානි ... 109-10

පිටු.

සමාසය ... 45
සම්ප්‍රාප්ත ප්‍රකෘති. 'තත්සම' වෙනුවට යොදාගතයුතු නාමය බව. ... 60
සරදෙස් සඳෙහි ලක්ෂණ කාව්‍යය අශාස්ත්‍රීය බව 168–9
සර පෙරළි ... 99
සා මාගධී මූලභාසා. මෙය මෝඝ මතයක් බව 86
සර සඳ යනු කිම? 167-180
සාරය (වර්ණයක්හුගේ ශ්‍රාවය) 34
සැරද. මෙහි සිද්ධිය .. 74
සැරදෙ. මූලාවක් බව. 74
සැරියුත්. ව්‍යුත්පත්තිය 79
සිංහයන් සිංහලයන්ගේ මුතුන් මිත්තන් බව 53–7
සිංහයන්ගේ භාෂාව ... 59
සිංහල ප්‍රත්‍යය තුනක් 71
සිංහල භාෂාවෙහි සම්භවය 53–67
එහි වාක්‍ය නීති (හෙවත් ව්‍යාකරණය) සාමාන්‍ය වශයෙන් ද්‍රවිඩ බව 61
ඝොෂය සාමාන්‍ය වශයෙන් ආර්ය බව 60 1
සිංහපුරය ... 56
සිංහ භූමිය ... 56
සිංහයෝ .. 56
සිංහල හෝඩිය. (මෙහි දූර සම්භවය අශෝක හෝඩිය ද අනන්තර සම්භවය දෙමළුන්ගේ ග්‍රන්ථ හෝඩියද බව ... 37
සිදත්සඟරා : නිර්මාණ ප්‍රවෘත්තිය ... 9
කර්තෘ විනිශ්චය ... 9–14
නිර්මාණ කාලය ... 15
පුරාණ සන්නය (ග්‍රන්ථ කර්තෘ හුගේම කෘතියක් බව) 19
සිද්ධාන්ත යන්නෙහි අර්ථය 1–23
සුහ (අල්ප ප්‍රමාණය) 149
සුද අත්. මෙහි භේදය 119
සුවඳ. න වර්ණාන්ත ඌන මාත්‍රයට නිදසුන් 33
සුස්මෙන්. නොගැළපෙන නිදසුනක් බව. ... 155
සෙබෙහි සිද්ධිය ... 45
සෙලු. අර්ථය ... 143
සොම්මරු. සිද්ධිය ... 173
සිහිළෙහි (මාත්‍රාවෘද්ධි දෙකක් ඇති බව) ... 108
සිරළ මෙහි සිද්ධිය ... 193
හෝඩි යනු පාලියෙන් නො බිදුණු බව ... 38
දෙමළ ශුවඩි යන්නෙන් බිඳුණු බව 38; 149-187
ස්වර ... 30
ස්වරාගමය. ද්‍රවිඩ ධර්මයෙන් 155
ස්වරාගම සන්ධිය ... 211–215
ස්වරාදේශ සන්ධිය ... 196
හ. වහල්වර්ණ ... 210
හාමැටි ... 28
හඩ = හණ්ඩ = හන්ඩ = හන් 82
හකාර විනිස ... 151–161
හකාර පාඨ (ආදේශ රූප) 153
හල් එකළොස (පදාන්තයෙහි සිටිය හැකිවූ) ... 81
හකාරය (උසුම් අනරෙහිද ගැනෙන බව) ... 34
හකාරාරෝහණය ... 155
හල් ඝොෂයන් ස්පර්ශ වර්ණ නම් අඝොෂ වන බව 80
හල් ... ... 35
හල් යුගමයෙන් එකක් ලොප් වන බව 82; 211–12
හල් ලකුණෙහි උත්පත්ති ස්ථානය ... 36
හුහ (බහු ප්‍රමාණය) 149
හෙබි = හෙප ... 80
හෝ (අශෝක) උභයාන්ත ලෝපයට නිදසුන් 77
හෙළ හෝඩිය (තෙතිස් වර්ණකින් යුත් බව)... 34
ළ. මෙය දන්තජ ('ල') වෙන තැන් ... 81
ළිද් = ළින්ද් = ළින් ... 82
ළු. මේ අක්ෂර පටහනෙහි සම්භව ප්‍රවෘත්තිය 37



